පරම මහා වෛය්‍යාකරණාචාර්ය

අනුරුද්ධ මහාස්වාමිපාදයන් විසින් විරචිත

# අභිධර්මාර්ථ සඞ්ග්‍රහය

( ප්‍රශ්න - උත්තර )

මූකලංගමුවේ සුවිසුද්ධාරාමාධිපතිව වැඩ වුසූ

යෝගියානේ ගණාචරිය සිරි නන්දාරාම තිස්ස

ස්ථවිර පාදයන් වහන්සේ විසින් සම්පාදිත
ප්‍රශ්නොත්තර ව්‍යාඛ්‍යානයෙන් හා

ඇම්. ධර්මරත්න

ලක්මිණි පහන් සත්‍ර සුධිශ ප්‍රණීත සංදෙපනයෙන් ද
සමුපෙත යි.

---

ගෞරවාර්හ ත්‍රිපිටක වාගීශ්වරාචාර්ය

හික්කඩුවේ ශ්‍රී සුමංගලාභිධාන

ප්‍රධාන නායක ස්ථවිර පාදයන් වහන්සේ විසින්
ප්‍රතිග්‍රහිත යි.

---

තෘතීය මුද්‍රණය

---

හුඩාවිල ජ. පි. ගුණරත්න
විසින්
කොළඹ බොරැල්ලේ
ලංකාභිනව විශ්‍රැත යන්ත්‍රාලයෙහි
මුද්‍රාපිත යි.

2481
---
1938

පරම මහා වෛය්‍යාකරණාචාර්‍ය

අනුරුද්ධ මහාස්වාමිපාදයන් විසින් විරචිත

# අභිධර්මාර්ථ සඞ්ග්‍රහය

මුහලංගමුවේ සුවිසුද්ධාරාමාධිපතිව වැඩ වුසූ

යෝගියානේ ගණාචරිය සිරි නන්දාරාම තිස්ස

ස්ථවිර පාදයන් වහන්සේ විසින් සම්පාදිත

ප්‍රශ්නෝත්තර ව්‍යාඛ්‍යානයෙන් හා

ඇම්. ධර්මරත්න

ලක්මිණි පහන් කර්තෘ සුධීශ ප්‍රණීත සංඥපනයෙන් ද

සමුපෙත යි

---

ගෞරවාර්හ ත්‍රිපිටක වාගීශ්වරාචාර්‍ය

හික්කඩුවේ ශ්‍රී සුමඞ්ගලාභිධාන

ප්‍රධාන නායක ස්ථවිර පාදයන් වහන්සේ විසින්

ප්‍රතිග්‍රාහිත යි

---

තෘතීය මුද්‍රණය

---

කුඹාවිල ඒ. පී. ගුණරත්න

විසින්

කොළඹ බොරැල්ලේ

ලංකාභිනව විශ්‍රැත යන්ත්‍රාලයෙහි

මුද්‍රාපිත යි

---

2481

1938

1--

මේ අභිධර්මාර්ථ සඞ්ග්‍රහයෙහි තෙවන මුද්‍රණය යි. ප්‍රථම මුද්‍රණයෙන් එකෙකුදු කොපියක් සොයාගත නො හැකි සේ වී කාලයක් ගත විය. ග්‍රන්ථ කාරක හිමිපාණන්ගේ අග්‍ර ශිෂ්‍ය කුඩාවිල බෝධිවංශාරාමාධිපති ශ්‍රී සුගත විනයාලඞ්කාර උපජ්ඣායවරිය යෝගියානේ පඤ්ඤාතිස්ස ස්ථවිර පාදයන් වහන්සේ තෙවන මුද්‍රණයක් කරවීමෙන් පොත සුලභ කොට ආචාර්ය්‍ය ගුණානුස්මරණයක් කිරීමට සිතුවෝ මේ මුද්‍රණයෙහි අප උනන්දු කළහ.

මුලදීම මේ ග්‍රන්ථයට ලක්මිණිපහනේ සංස්කාරක ඇම්. ධර්මරත්න පණ්ඩිතුමා විසින් ඓතිහාසික කරුණු ගැහුලා ලියැවුණු සංඥාපනය වටිනා එකකි. එහෙයින් අපි ද ඒ මෙහි ඇතුළත් කෙළෙමු. එහෙත් මෙම ග්‍රන්ථ කාරක යෝගියානේ ගණාචාරිය ශ්‍රී නන්දාරාම තිස්ස ස්ථවිර පාදයන් වහන්සේ හැඳිනැවීමෙහි ලා අවද්‍ය සත්‍යතා කීපයක් ඇත්තේයයි ද, එය ආචාර්ය්‍ය ගෞරවයට කැළැල් වන්නේයයි ද වදාළ අපේ අනුශාසක ස්ථවිර පාදයන් වහන්සේගේ අදහස් පරිදි මේ වර එහි සංශෝධනයක් කරන්නට සිදුවිය. මෙහි අන් තැනෙක දක්වෙන යෝගියානේ ඇල්. චාර්ල්ස් පතිරන්න හොරාමියේ රාළහාමිගේ නිවේදනය ඒ සම්බන්ධ සත්‍යය හෙළි කරන හෙයින් ඒ පිළිබඳව යමක් ලිවීමට අපි නො වෙහෙසෙමු.

මේ සංස්කරණයෙහි මුල් වූ අනුශාසක ස්වාමීන් වහන්සේගේ අදහස පෙරැ. සේම පොත මුද්‍රණය කරවාලීමෙන් ආචාර්ය්‍ය ගුණානුස්මරණය කිරීම බැවින් මෙහි අමුතු ශුද්ධියක් අප අතින් නො වීය. මුද්‍රණය ශෝභන එකක් කිරීම පමණකි අප සිතූ එකම කරුණ. ණ න ළ ල පිළිබඳව ද එක් ආචාර්ය්‍ය මතයක් අපි අනුගමනය කෙළෙමු. එක් එක් පිටෙහි ආ පෙළට ඒ ඒ පිටෙහිම ප්‍රයෝගාන්තර දුන් මුල් සංස්කරණයන්ගේ පිළිවෙළ පද වෙන් කිරීම නිසා ප්‍රථම පරිච්ඡේදයෙහි ඇතැම් තැනෙක අප අතින් මඳක් බැහැර වූ සේ පෙනේ. ග්‍රන්ථය පරිශීලනයට ඉන් බාධාවක් නො වේ මය.

මෙම සංස්කරණයෙහි ලා ශ්‍රී සුගත විනයාලඞ්කාර උපජ්ඣායවරිය යෝගියානේ පඤ්ඤාතිස්ස ස්ථවිර පාදයන් වහන්සේගේ කාලෝචිත උද්යෝගය අභිධර්මය උද්ග්‍රහණාභිලාෂීන්ගේ පමණක් නොව බණ දහම් පුහුණු වන පුහුණු කරවන හැමගේත් පැසසුම් ලැබිය යුත්තකි. මේ කර්තව්‍යයෙහිදී ශෝධ්‍ය පත්‍ර බලා දීමාදියෙන් සිංහල ශබ්දකෝෂ කාර්ය්‍යමණ්ඩලයෙහි වූ අප හිතවත් ඩී. ශී. දිසානායක මහතුන්ගෙන් ආරම්භයේ සිටම අපට ලැබුණු ආධාර ඉමහත් වී. ඒ මහතුන්ට අපගේ කෘතඥතා පූර්වක සතුතිය පිරිනමමු. ශුද්ධි පත්‍රයක් යෙදීමට තරම් වැරැදි ඇති නොවන සේ ශෝභන මුද්‍රණයක් කරදුන් කොළඹ බොරැල්ලේ ලඞ්කාභිනව විශ්‍රැත යන්ත්‍රාලයෙහි මහතුන්ට ද අපගේ හෘදයඞ්ගම සතුතිය හිමි වේ.

ජ්. පී. ගුණරත්න

කුඩාවිල,
යෝගියාන,
2481 වෙසක් පුර දියවස.

# විශෙෂ නිවේදනය

මෙම පොතේ කතෘ භූත මාහිමියාණන් වහන්සේගේ ශිෂ්‍ය ගණාවූ ද පටන් ගැනුමේ සිට අවසානය දක්වා මෙම පොත ලිවීමෙහි හා මුද්‍රණය කරවීමෙහිත් ව්‍යාවෘත වූ ද යෝගියානේ **ඇල්. චාර්ලස් පතිරත්න** නොතාරිස් තැන වන මට මෙම පොත නැවත අච්චු ගැස්වීමේ අයිතිවාසිකම තබා ගන්නා ලදී. ඊට අනතුරුව එම පොත දෙවෙනි වර මුද්‍රණය කරවීමට ඉදිරිපත්වූ භවතාණන්ගේ අයැදීම පරිදි ඒ වාරයද මගේ නමින්ම මුද්‍රණයකර වීමට අවසරය දෙන ලදින් ඒ භවතාණන් විසින් රිසිසේ සංඥාපනාදියපිළියෙල කොට සමහර තැනෙක පළමු පොතට වෙනස්වද මුද්‍රණය කරවන ලදී. ඒ දෙවරට මුද්‍රණය කරවන ලද එම පොතේ සංඥාපන දෙකේ වෙනස සිදුවී ඇත්තේ එහෙයිනි.

ඒ ඇර ඇම්. ධර්මරත්න ලක්ෂ්මිණී පහන් කතෘ මහත්මයා විසින් මෙම පොතේ පළමුවන වර මුද්‍රණය කරවීමේදී පිළියෙල කරන ලද සංඥාපනයේ V පිටේ "විමලසාර තිස්සාභිධාන නායක ස්ථවිර පාදයන් වහන්සේගෙන් හා අපෙන්ද ලබන ලද ආධාර ඇතිව මෙම පොත සම්පාදනය කරණ ලදී". යනුත්, VI පිටේ "මෙම පොත මුද්‍රණය කරවීමට ආරම්භ කළ නුමුත් ඊට ඉඩ නොලැබ පරලොකප්‍රාප්තවෙන්ට යෙදුනා" යනුත් "ලක්ෂ්මිණී පහන් යන්ත්‍රාලයේදී මුද්‍රණය කරවන ලදී." යනුත් සැබෑ නොවන බව මෙයින් ප්‍රකාශ කරමි. මක්නිසාද? එකම ආචාර්යයන් වහන් සේගේ සමකාලික ශිෂ්‍යයන් වූ මේ දෙදෙනා වහන්සේගේ අන්‍යොන්‍ය සැලකීම් හා ගෞරවාදරත් නිසා එම පොත සම්පාදනය කරන කාලයේදී පොතේ එක එක පෝර්මයක් පාසා ඒ විමලසාර තිස්සාභිධාන නායක ස්ථවිර පාදයාණන්ට පෙන්වන ලද බැවිනුත්, මෙම පොතේ කතෘන් වහන්සේ ජීවමාන කාලයේදීම මුද්‍රණය කරවා උන්වහන්සේගේ අභාවයෙන් පසු ශේෂවූ පෝර්ම දෙකේ ශුද්ධිපත්‍ර බැලීම හා සංඥාපනය පිළියෙළ කිරීම පමණක් ම ධර්මරත්න මහත්මයා විසින් කරන ලද බැවිනුත්, ඒ වර මෙම පොත කැළණියේ ශාස්ත්‍රාධාර යන්ත්‍රාලයෙහි මුද්‍රණය කරවන ලද බැවිනුත්ය.

මින් ඉදිරියට මෙම පොත මුද්‍රණය කරවීම පිළිබඳව මට ඇති අයිතිවාසිකම මෙයින් ප්‍රතික්ෂෙප කරමි. එම මුද්‍රණ බලය පොතේ කතෘ වූ මාහිමියාණන් වහන්සේගේ ප්‍රධාන ශිෂ්‍යයන් වහන්සේ වන කුඹාවිල බොධිවංසාරාමාධිපති ශ්‍රී සුගත විනයාලඞ්කාර උපාධ්‍යාචාර්ය යෝගීශාණන් පඤ්ඤාතිස්ස ස්ථවිර පාදයන් වහන්සේගේ අවසරය ලත් කෙනකුට පැවරෙනවා ඇත.

මීට,

1938-4-18
යෝගියාන

**ඇල්. චාර්ලස් පතිරත්න,**
ප්‍රසිද්ධ නොතාරිස් තැන

# සංඥාපනය.

## අභිධර්මාර්ථ සඞ්ග්‍රහය.

නානා නය විචිත්‍ර පරම ගම්භීර අභිධර්මසප්තප්‍රකරණෝක්ත අනවශේෂාර්ථයන් සංක්ෂේප නයින් සඞ්ගෘහීත වූ මේ ග්‍රන්ථය අභිධර්මාර්ථ සඞ්ග්‍රහ නම් විය.

මේ මාහැඟි ග්‍රන්ථය කවර කලෙක කවර රටක විසූ කවර ආචාර්යවරයකු විසින් විරචිතදැයි පුරාතන සන්න ටීකාදියෙන් නිශ්චය නො කළ හැකි වුවත් මේ අනුරුද්ධාචාර්ය මහා ස්වාමිපාදයන් විසින් රචිත යයි පෙනෙන අභිධර්මාර්ථ සඞ්ග්‍රහය, නාමරූප පරිච්ඡේදය, පරමාර්ථ විනිශ්චය යන අනිරුද්ධකෘත අභිධර්ම ප්‍රකරණත්‍රයත් හා අනුරුද්ධ ශතක නම් සංස්කෘත කාව්‍ය ප්‍රකරණයක්ද වර්තමාන කාලයෙහි ලොව ප්‍රචලිතව තිබේ. එයින් පරමාර්ථ විනිශ්චය නිගමනයෙහි—

"සෙට්ඨෙ කඤ්චිපුරීරට්ඨෙ, කාවීර නගරෙ වරෙ
කුලෙ සඤ්ජාතභූතෙන, බහුස්සුතෙන ඤාණිනා ෴

අනුරුද්ධෙන ථෙරෙන, අනිරුද්ධ යසස්සිනා
තම්බරට්ඨෙ වසන්තෙන, නගරෙ තඤ්ජනාමකෙ ෴

තත්සඞ්ඝවිසිට්ඨෙන, රාජිතෙන අනාකුලං
මහාවිහාරවාසීනං, වාචනාමග්ගනිස්සිතං ෴

පරමත්ථං පකාසෙතුං, පරමත්ථවිනිච්ඡයං
පකරණං කතං තෙන, පරමත්ථවෙදිනා" ෴

යනුවෙන් මේ අනුරුද්ධාචාර්ය මහා ස්වාමිපාදයෝ කාඤ්චිපුර නම් රට කාවේරී නුවර ශ්‍රේෂ්ඨ වංශයක ඉපිද පැවිදිව ධර්මවිනයධර බහුශ්‍රැතයෙක්ව තාම්‍රපර්ණී (තිණෙවලි) නම් රට (තඤ්ජපුරී) තඤ්ජා ඌර් නම් නුවර සඞ්ඝ නායකව වැඩ වසනුවෝ මහවෙහෙර වැසියන්ගේ වාචනාමාර්ගය ඇසුරු කොට පරමාර්ථ විනිශ්චය රචනා කළ බව පෙනේ. සමහර පොත්වල 'තඤ්ජ' යන්න 'රාජ' යයි වැරැදී තිබේ. මෙම අභිධර්මාර්ථ සඞ්ග්‍රහ නිගමනයෙහි

පුඤ්ඤෙන තෙන විපුලෙන තු මූලසොමං-
ධඤ්ඤාධිවාස මුදිතොදිත මායුගන්තං
පඤ්ඤාවදාත ගුණ සොභිත ලජ්ජි භික්ඛූ-
මඤ්ඤන්තු පුඤ්ඤ විභවොදය මඞ්ගලාය ෴

2-1

යනුවෙන් පොළොන්නරුවේ මූලසෝම විහාරයෙහි වැඩ වසන් නාහු මේ අභිධර්මාර්ථ සඞ්ග්‍රහය රචනා කළෝ යයි සමහරුන්ගේ මතයි. තවද එම ආචාර්යවරයන් විසින් සංස්කෘත කාව්‍ය භාෂා යෙන් රචිත අනුරුද්ධ ශතක නිගමනයෙහි—

ජ්‍යොත්ස්නා හිමාංශොරිව යන්මුඛෙන්දෝර්-
නිස්‍යන්දතෙ සූක්තිරසෞඝ සුධීරඃ
ඉදං ව්‍යධත්තෝත්තර මූලහාර-
රත්නාඞ්කුරොපසර්ව්විරානුරුද්ධඃ

අනුරුද්ධාචාර්ය මහා ස්වාමිපාදයෝ ලක්දිව මහාවිහාරයෙන් නිකුත් වූ විල්ගම්මුල උතුරු මූල යන අතිප්‍රසිද්ධ මහා සමාගම් දෙක අතු රෙන් උතුරු මූල සමාගමේ අනුනායක ධුරය දැරූ උත්තමයෙක් බව පෙනේ. බුද්ධඝෝෂාචාර්ය මහා ස්වාමිපාදයන්ට අනතුරුව පුරාතන බුද්ධශාසනයට මහෝපකාරවූ ග්‍රන්ථ රචනා කළාවූ ග්‍රන්ථ කර්තෘන් අතුරෙන් ධම්මපාල, බුද්ධදත්ත, අනුරුද්ධ යන ආචාර්ය තුන් නම ප්‍රථමයෙන් බුද්ධාගම චිරස්ථායි වනු පිණිස ඉතා පරිශ්‍රමයෙන් විශාල ග්‍රන්ථ රචනා කළ උත්තමයන් බව පෙනේ. ධර්මපාලාචාර්ය මහා ස්වාමිපාදයෝ ඛුද්දකනිකායේ පොත් දොළොසක අටුවාද දීඝ නිකායාදි නිකායාර්ථ කථා සහායේ පුරාණ ටීකාද විශුද්ධිමාර්ගටීකා නෙත්තිඅටුවා අභිධර්ම අනුටීකා සච්චසංඛෙප ප්‍රකරණ යනාදියද රචනාකර තිබෙන බව පෙනේ. බුද්ධදත්ත, අනුරුද්ධ යන ආචාර්ය දෙනම විසින් රචිත ග්‍රන්ථ ඒ ඒ ග්‍රන්ථයෙහි නිගමන ගාථාදියෙන් දත යුතුයි.

මේ ආචාර්ය තුන් නම දක්ෂිණ ඉන්දියාවේ ආර්ය ජාතියෙහි ඉපිද පැවිදිව ලක්දිව් වැඩ මහා විහාර වාසීන්ගේ වාචනා මාර්ගය සකසා ඉගෙණ කලින් කල දක්ෂිණ ඉන්දියාවේ ද ලක්දිව ද වැඩ වසමින් ශාසන සඞ්ග්‍රහ කළ බව පෙනේ. නෙත්තිඅටුවා නිගමනයෙහි—

"සද්ධම්මාවතරට්ඨානෙ, පට්ටනෙ නාගසව්හයෙ
ධම්මාසොක මහාරාජ, විහාරෙ වසතා මයා"

යනාදීන් නාග පට්ටනමෙහි ධර්මාශෝක රජහුගේ අණින් දඹදිව එකවර ගොඩනැගූ සුවාසූදහසක් විහාරවලට ඇතුළත් විහාරයෙහි වැඩ වසන ආචාර්ය ධම්මපාල ස්වාමිපාදයන් විසින් නෙත්ති අටුවාදී යථොක්ත ග්‍රන්ථ රාශිය රචනා කළ බව පෙනේ.

ආචාර්ය බුද්ධදත්ත මහා ස්වාමිපාදයන් විසින් විරචිත විනය විනිශ්චය නිගමනයෙහි—

"සෙට්ඨස්ස චොළරට්ඨස්ස, නාභිභූතෙ නිරාකුලෙ
සබ්බස්ස පන ලොකස්ස, ගාමෙ සම්පිණ්ඩිතෙ විය —

කාවීරජල සම්පාත, පරිපූත මහීතලෙ
ඉද්ධෙ සබ්බඞ්ගසම්පන්නෙ, මඞ්ගලෙ භූතමඞ්ගලෙ —

පවරාකාර පාකාර, පරිඛා පරිවාරිතෙ
විහාරෙ වෙණ්හුදාසස්ස, දස්සනීයෙ මනොරමෙ" —

යනාදි ගාථාපන්තියෙන් හා "උරගපුරෙන බුද්ධදත්තෙන" "තම්බ පණ්ණියෙන පරම මහා වෙය්‍යාකරණෙන" යනාදියෙන්ද මේ ආචාර්ය්‍ය මහා ස්වාමිපාදයෝ තාම්‍රපර්ණී (තිණෙවලි) යෙහි (නාගපුරි-නාගලෑර්)හා ඔරුවෙහි ඉපිද සසුන් වැද ලක්දිව් වැඩ මහා විහාර වාසීන්ගෙන් ධම්විනය ඉගෙණ බහුශ්‍රැතව මෑතභාගයෙහි සොලි රටට නාභියක් වැනිවූ කාවේරි පටුනෙහි විෂ්ණුදාස නම් කෙනකු විසින් කරවා පිළිගන්වන ලද විහාරයෙහි වැඩ වසන්නාහු විනය විනිශ්චය රචනා කළ බව හා උන්වහන්සේගේ අභිධර්මාවතාර නිගමනයෙහි—

"නානාරතන සම්පුණ්ණෙ, විවිධාපණ සඞ්කුලෙ
කාවීරපට්ටනෙ රම්මෙ, නානා ගාමොපසොභිතෙ —

කෙලාස සිඛරාකාර, පාසාද පතිමණ්ඩිතෙ
කාරිතෙ කණ්හදාසෙන, දස්සනීයෙ මනොරමෙ" —

යනාදි ගාථාපන්තියෙන් බුද්ධදත්තාචාර්ය්‍ය මහා ස්වාමිපාදයෝ කාවේරි පටුනෙහි කණ්හ (කුමාර) දාස නම් තැනැත්තහු විසින් කරවා දෙනලද විහාරයෙහි වැඩ වසන්නාහු අභිධර්මාවතාරය රචනා කොළෝ යයි පෙනේ.

මෙසේ අනුරුද්ධාචාර්ය්‍ය මහා ස්වාමිපාදයෝ කාඤ්චිපුරීරට කාවේරි පටුනෙහි ඉපිද සසුන් වැද ලක්දිව් වැඩ මහා විහාරවාසීන් ගෙන් ධම්විනය ඉගෙණ පූජ්‍ය ග්‍රන්ථ කාරකාචාර්ය්‍යයෙක්ව තිණෙවලි යෙහි තඤ්ජාලෑර් නම් නුවර සඞ්ඝනායක ධුරය ධරන සමයෙහි "පරමාර්ථ විනිශ්චය, නාමරූප පරිච්ඡේදය" යන ප්‍රකරණ ද්වයය හා නැවත ලක්දිව් වැඩ පොළොන්නරුවේ මූලසොම විහාරයෙහි වැඩවසමින් උතුරු මූල සමාගමේ අනුනායක තනතුර දරන්නාහු අනුරුද්ධ ශතකය හා නම්බ නම් උපාසකයාගේ අයදීමෙන් මෙ **"අභිධර්මාර්ථ සඞ්ග්‍රහය"** ද රචනා කොළෝ යයි පෙනේ. තවද මූලසොම විහාරය කාවේරි පටුනෙහි විහාරයකැයි ද 'නම්බ' යන නාමය සිංහලයන් අතරේ ව්‍යවහාර නාමයක් නොව කාවේරි පටුන්

වාසීන්ගේ ව්‍යවහාර භාෂාවේ නමක් යයි ද සමහරු කියත්. ඒ මතය වඩා ගැළපේ යයි සිතමි. උතුරුමූල සමාගමේ අනුනායක ධුරය කාවේරි පටුනෙහි මැඩහිඳ උසුලන්නට නුපුළුවන් කමක් නැත. මෙසේ අනුරුද්ධ බුද්ධදත්තාචාර්‍ය දෙනම විසින් රචිත ප්‍රකරණ වලින් කාඤ්චිපුරී රට හා සොලීරටත් එකක් බව ඔප්පුවේ. කාඤ්චිපුරී නගරය ශෛවයන්ගේ පාපප්‍රවාහය කරන තීර්ථස්ථාන හතෙන් එකක් බව:—

“අයොධ්‍යා මථුරා මායා, කාශි කාඤ්චි අවන්තිකෙ”

යනාදි පුරාණෝක්ත වචනයෙන් පෙනේ. එසේම, “පුරීෂු කාඤ්චි පුරුෂෙෂු විෂ්ණුඃ” යනාදියෙනුත් සියලු නගර අතුරෙන් මේ කාඤ්චිපුරය උතුම් නගරයක් බව පෙනේ. ඒ ප්‍රධාන නගරය කාරණ කොට ගෙන දක්ෂිණ ඉන්දියාවම “කාඤ්චිපුර” යයි ව්‍යවහාරයි. පුරාතන ලක්දිවට බොහෝ සෙයින් රෙදිපිළි ලැබුණේ මේ දක්ෂිණ ඉන්දියාවෙන් බැවින් ඒ නිමිත්ත හෙතු කොට ගෙන මුළුරටම චොලිය හෙවත් සොලීරට යයි ද ව්‍යවහෘතයි. මේ දක්ෂිණ ඉන්දියාවේ මුදුබඩ පළාත තාම්‍රරටය නොහොත් තාම්‍රපර්ණී රට යයි කියත්. තඤ්ජාපුරියා නාගපුරිය, නාග පට්ටනම, කාවේරි පට්ටනම යනාදි ප්‍රදෙශ පුරාතන ප්‍රසිද්ධ නගර බව පෙනේ. දැනට කාඤ්චිපුරිය කාඤ්ජිවරම් කියාද, තාම්‍ර නොහොත් තාම්‍රපර්ණීරට එයින් තද්භව වී තිනවල්ලි හෝ තිෂණපල්ලි කියාද තඤ්ජාපුරිය තඤ්ජාඋෘර් කියාද නාගපුරිය නාගොර් නොහොත් නාඹරු කියාද සෙසු ප්‍රදෙශ පුරාණ නම් වලින්ද ව්‍යවහාරයි. මේ බුද්ධදත්තාචාර්‍යයන් උපන් නාඹරුවෙහි පුරාණ බුද්ධාගම යහපත්ව පැවැති බවට සාක්ෂි දැනට දෙඹන්දූව ශෛලබිම්බාරාමයෙහි නාඹරුවෙන් ගෙනැවිත් පිහිටුවා තිබෙන කාලශෛලමය බුද්ධ ප්‍රතිබිම්බ යුග්මයෙන් ඔප්පුවේ. නමුත් ඉංග්‍රිසින්ගේ භූමි සංස්ථාන සිතුයම්හි ත්‍රිෂණපල්ලි තිනවල්ලි යන නම් දෙක එකම තාම්‍රපර්ණී ශබ්දයෙන් බිඳුණු බව නො දැන දෙතැනක සටහන්කර තිබේ. මේ ප්‍රදෙශ ලංකාවට නො දුරුවූ දක්ෂිණ ඉන්දියාවට අධුත්තුවූ ආර්‍ය ජාතිකයන්ගේ ප්‍රදෙශ බැවින් පුරාතන ලංකාව හා ඒ ප්‍රදෙශත් ආණ්ඩුවෙන් ද ආගමෙන් ද එකට සම්බන්ධ ව එක් රටක් ව බුද්ධාගම උජ්වලිතව පැවති බව පෙනේ. තවද මේ ග්‍රන්ථොත්පත්ති කථාවෙන් බෞද්ධයන් විසින් අවශ්‍ය යෙන් සැලකිය යුතු ප්‍රධානාර්ථයක් තිබේ. ඒ කුමක්ද යත්? මෙයින් වර්ෂ අටසියයකට පමණ පූර්ව භාගයෙහි ධම්මපාල, අනුරුද්ධ, බුද්ධදත්ත, බුද්ධප්පියාදි මහපොළොව මහමුහුද සේ විශාල ගැඹුරු ප්‍රඥා ඇති ග්‍රන්ථකාරාචාර්‍යයන් ඇතුළු වූ ලක්ෂ ගණන් සුපෙශල භික්ෂූන්ගේ කාෂායවස්ත්‍රාලෝකයෙන් එකාලෝකවූ සියදහස් ගණන් චෛත්‍ය ප්‍රතිමා ඝර සංඝාරාමයන්ගෙන් ගැවසී ගත්තාවූ එකා

මනුෂ්‍යයෙක් මිථ්‍යාදෘෂ්ටි නොව එකහෙළා ගලා යන මහ වතුරක් සේ රට මුළුල්ලෙහි බුද්ධාගම පැතිර ගියාවූ නිතවල්ලි, සොලිපුර, කාඤ්චිපුර, තඤ්ජාපුර, නාගපුර, නාගපට්ටනම, කාවේරිපට්ටනම යනාදි මහා නගරයන් අයුත්තු වූ දක්ෂිණ ඉන්දියාවේ දැනට එක චෛත්‍යයක් එක සඞ්ඝාරාමයක් එක භික්ෂු නමක් එක බෞද්ධයෙක් එක ධර්මපුස්තකයක් නැතිවන සේ බුද්ධාගම මුල්සුන්ව ගියේ කිසිවකු විසින් වළකාලිය නොහැකි සංස්කාර ධර්මයන්ගේ අනිත්‍යතාව බව මෙනෙහි කට යුතුයි.

මේ අභිධර්මාර්ථ සඞ්ග්‍රහයෙහි නාම් සඳහන්වූ මූල සෝම විහාරය ලක්දිව මුන්නේස්වරම පළාතේ මුන්වහන්සේ ළදරු කාලයෙහි ඉගෙණ ගත් විහාර යයි හැඟේ. තඹ නම් උපාසකයා සිංහල ජාතිකයෙක් නොව තෙළිඟු ජාතිකයෙකැයි ද හැඟේ.

මේ අනුරුද්ධාචාර්ය මහා ස්වාමිපාදයෝ කවර කලෙක මේ ප්‍රකරණය රචනා කොළෝ දැයි නිශ්චය නොකළ හැකි නුමුත් අඞ්ගුත්තරටීකා විනයටීකා පඤ්චිකාටීකාදි ප්‍රශස්ත මහා ග්‍රන්ථ නිර්මාණයෙන් සර්වඥ ශාසනය බොහෝ කල් සිටිනාසේ කළ ආචාර්ය ශාරිපුත්‍ර මහා ස්වාමිපාදයන් හා තච්ඡිෂ්‍ය සුමඞ්ගල ස්වාමිපාදයන් විසිනුත් මේ අභිධර්මාර්ථ සඞ්ග්‍රහයට විස්තර සිංහලාර්ථ ව්‍යාඛ්‍යානයක් හා අභිධර්මාර්ථ විභාවිනී නම් මාහැඟි ටීකාවක්ද ලියා තිබෙන බව පෙනෙන හෙයින්ද දිඹුලාගල විසූ සමන්තපාසාදිකා සන්නකාර මහා කාශ්‍යප ස්ථවිර ස්වාමිපාදයන් විසින් පළමුකොට සංක්ෂෙප ටීකාවක් ලියා තිබෙන හෙයින්ද ඒ කාලයෙන් ප්‍රමාණකොට ගිණුකල ඒ මේ අනුරුද්ධාචාර්ය මහා ස්වාමිපාදයෝ මීට වර්ෂ දහසකට පමණ පූර්වයෙහි වුසූ බව ඔප්පුවේ.

"පොරාණෙහි අනෙකාපි, කතා යාපන වණ්ණනා
න තාහි සක්කා සබ්බත්ථ, අත්ථොපිඤ්ඤාතවෙ ඉධ"

යන විභාවිනීටීකා ගාථාවෙන් මේ අභිධර්මාර්ථ සඞ්ග්‍රහයට ලක්දිව පෞරාණිකයන් විසින් ලියන ලද ටීකා කිපයක් පැවති බව පෙනෙන නුමුත් දිඹුලාගල මහා කාශ්‍යපස්ථවිරයන් විසින් රචිත පුරාණ ටීකාවද ශාරිපුත්‍ර මහා ස්වාමිපාදයන්ගේ සන්නයද සුමඞ්ගල මහා ස්වාමිපාදයන්ගේ ටීකාවද හැර වෙන පොතක් ඇති බව නො පෙනේ. මෙසේ ලක්දිව සම්භාවනීය ආචාර්යවරයන් විසින් සන්න ටීකා ලියමින් පුරාතන පටන් මේ ග්‍රන්ථය ආභිධර්මිකාචාර්යවරයන්ගේ හස්තසාර ධනයක් මෙන් පැවැත්තේය. බුරුම රටට මේ ග්‍රන්ථය කවර කලෙක ගෙනයන ලදදැයි නිශ්චය නොකළ හැකි නුමුත් ධම්මචේතිය නම් රාමඤ්ඤ රජු දවස (කොටගමු කාලේ)

ලක්දිවින් මහණ උපසම්පදා පොත්පත් ගෙනයාමට ප්‍රථමයෙන් ඊට අවුරුදු හයසියයකට පමණ පූර්වූ අරිමද්දන කාලයේදී මේ අභිධර්මාර්ථ සඞ්ග්‍රහයට පද යෝජනාවක් හා සන්නයක් ද ඒ රටේ සමර්ථ ස්ථවිරවරයන් විසින් ලියා තිබෙන බැවින් හා තොටගමුවේ ශ්‍රී රාහුල ස්වාමිපාදයන්ගේ පඤ්චිකා ප්‍රදීපයෙහි අරිමද්දන වාසී අග්ගවංසාචාර්යයන්ගේ මහා ශබ්ද නීතියෙන් උදාහරණ දක්වා තිබෙන හෙයින් ද අවුරුදු හයසියයකට පමණ පූර්වයේත් ලංකාවාසීන්ගේ හා අරිමද්දන වාසීන්ගේත් ගනුදෙනු පැවතුන බව හා මේ ග්‍රන්ථය එහි පැවැති බවද පෙනේ. මැතභාගයෙහි රාමඤ්ඤ රටින් ඡපද නම් කුඩා හෙරණ නමක් සුවර්ණ සොහන තෙරුන් සමග ලංකාවට අවුත් තොටගමුවේ රාහුලාදි ආචාර්යවරයන් ලඟ ධර්ම විනය පුහුණුකොට මෙහිදී උපසම්පදා ලැබ ස්ථවිර භාවයට පැමිණ සද්ධම්මජෝතිපාල යන නමින් ප්‍රකටව විජයබාහු නම් රජතුමකුගේ අයජමෙන් මේ අභිධර්මාර්ථ සඞ්ග්‍රහයට ලියන ලද සංඛෙපවර්ණනා නම් ටීකාවක් හා රතනාපුර නගර කාලයෙහි ලියන ලද මණිසාරමඤ්ජුසා නම් විභාවිනීටීකාවේ අනුටීකාවක් ද වෙන නොයෙක් ආචාර්යවරයන් විසින් ලියන ලද සන්න ගැටපද දිය ද ඇති බව පෙනේ. එමෙන් ම එරට වැසි ගෘහස්ථ ප්‍රව්‍රජිත සියලු පණ්ඩිත සමූහයා අභිධර්ම නමැති මහ සයුර තරණය කිරීම පිණිස මේ ප්‍රකරණය මනා පසුරකැයි විශෙෂයෙන් පිළිගෙන තිබේ.

තවද බුද්ධදත්ත මහා ස්වාමිපාදයන් හා අනුරුද්ධ මහා ස්වාමිපාදයෝත් නාගපුරය කාවේරිපට්ටනය යන සමීප රටවල ඉපිද කාවේරිපට්ටනෙහි එකම ආචාර්යවරයෙක් සමීපයෙහි පළමුවෙන් වැස මැතභාගයෙහි ලක්දිව් වැඩ පූජ්‍යාචාර්යව බුද්ධදත්තාචාර්යයන් සියලු අභිධර්ම පිටකය සඞ්ග්‍රහ කොට අභිධර්මාවතාරයත් අනුරුද්ධාචාර්යයන් එපරිද්දෙන්ම අභිධර්මාර්ථ සඞ්ග්‍රහයත් රචනා කොට ස්වකීය උපාධ්‍යායයන් දක්මට එකාවිට ගොස් මේ ග්‍රන්ථද්වය ගුරු පඬුරු පිණිස උපාධ්‍යායයන්ට දක්වූ කල "බුද්ධදත්තයා සත් රුවන් රැසක් ගබඩාවක පුරවා කිසිවකුට ප්‍රයෝජන නොවනයේ අගුල් හෙලීය, අනුරුද්ධයා සත්රුවන් රැසක් ගබඩාවෙක පුරවා සියලුදෙනාට කැමැති පරිද්දෙන් ප්‍රයෝජන විඳිනා පිණිස දොර අලේ"යයි ස්වකීය ගෝල දෙනම සඳහා උදන් ඇනූ යේකැයි පුරාවෘත්ත කථා ප්‍රබන්ධයක් මුමම ජන පදයෙහි ව්‍යවහාරතයි.

මේ ස්වකීය උපාධ්‍යායයන්ගේ උදන් ඇනීමෙන්ම අභිධර්මය සම්බන්ධව ලියවී තිබෙන පශ්චිම ප්‍රකරණ අතුරෙන් සියලු අභිධර්ම නය ක්‍රමානුගතව සංක්ෂෙපයෙන් හකුළුවා ලියනලද අන් ප්‍රකරණයක් මේ අභිධර්මාර්ථ සඞ්ග්‍රහය හැර කිසි තැනෙක නොමැතියි.

අභිධම් පෙළ අටුවාගී බණවර ගණනකින් දක්වන අර්ථ රාශියක් මේ ප්‍රකරණයෙහි එක වචනයකින් හකුළුවා සඞ්ග්‍රහ කරයි. අටුවා ටීකාදියෙහි අභයගිරි වාසි ආදී විතණ්ඩ වාදීන්ගේ මත නිරාකරණය පිණිස ලියන ලද බණවර ගණන් මේ ප්‍රකරණයෙහි වචන කීපයකින් සඞ්ග්‍රහ කරයි. මෙසේ ග්‍රන්ථ ලාඝවය අර්ථ බාහුල්‍යය පරවාද නිරාකරණය විභජ්ජවාද සඞ්ගීතය යන ගුණ චතුෂ්ටයෙන් කිසි තැනෙක ඌන නො කොට මේ ග්‍රන්ථය ගළපා තිබේ.

එහෙයින් අභිධර්ම මහා සාගරය එතරකරනුවන් විසින් පළමු කොට මේ ප්‍රකරණය වාචොද්ගතව ප්‍රගුණ කොට දෙවනුව මෙහි ප්‍රශ්නොත්තර ක්‍රමයෙන් දක්වා තිබෙන පමණට සියලු පරමාර්ථ ධර්මයන්ගේ නාම, සඞ්ඛ්‍යා, භූමි, ජාති, ප්‍රභෙද යන පස් ආකාරය පමණක් සිතේ ඇඳීයනාකාරයට පුහුණුකොට තුන්වෙනුව ටීකා නය චොද්‍යපරිහාර නයාදී විස්තර කථා මාර්ග සහිතව ගුරුමුඛයෙන් අර්ථ අස්වා ඉගෙණ ගත යුතුයි. මෙපමණකින් සියලු අභිධර්ම පිටකය සංක්‍ෂෙපයෙන් දුටුයේ නම් වේ. විස්තර කැමැත්තවුන් විසින් අනුක්‍රමයෙන් අභිධර්ම අටුවා මූලටීකා අභිධර්ම මාතෘකා ධාතුකථා යමක පට්ඨානාදිය ඉගෙණ ගත යුතුයි. මේ ප්‍රකරණයට අපරව තිබෙන මාහැඟි සිංහලාර්ථව්‍යාඛ්‍යානය අභිධර්ම නය නූගතුන්ට දුරවබොධ හෙයින් නූගතුන්ට පවා කොටින් අර්ථාවබොධ කිරීමට හා ගුරුශිෂ්‍යාදීන්ට පෘච්ඡාවිසර්ජන වශයෙන් යුහුව අර්ථාවබොධ කිරීමටත් පහසුවන පිණිස ඒ ඒ පිටුවල අඩඞ්ගුවූ පෙළේ ආ සියලු අර්ථ ඒ ඒ පිටුවල යටභාගයෙහි ප්‍රශ්නොත්තර වශයෙන් යොදා යලිත් දුර්බොධනීය ස්ථානයන්ගේ ටීකානය හා කාම රූපාරූප ලොකොත්තර අභිඥ සමාපත්ති ප්‍රත්‍යවෙක්‍ෂා මරණාසන්නාදීවූ අවස්ථාවන්හි අනෙකප්‍රකාරව උපදනා චිත්තවීථීන්ගේ සටහන් සිතියම්ද යොදා ඇත්තේයි.

මේ මහාර්ඝ ධර්මප්‍රකරණය මීට වර්ෂ කීපයකට පූර්වයෙහි මුතලංගමුවේ සුවිසුද්ධාරාමාධිවාසීව වැඩවුසු **යෝගීශාණෝ නන්දාරාම තිස්ස ස්ථවිර පාදයන් වහන්සේ** අඹගහ පිටියේ විහාරාධිවාසීවූ **අමරපුර ගණපාමොක්ඛාචාර්ය අරියවංශාලඞ්කාර විමරසාර තිස්සාභිධාන නායක ස්ථවිර පාදයන් වහන්සේගේ** ද අනුදැනීම ඇතිව ප්‍රශ්නොත්තර ලිවීම හා ශුද්ධියද මහත් පරිශ්‍රමයෙන් සම්පාදනය කොට ගෙන ලාභාදි නිරපෙක්‍ෂකව පර්යාප්ති ශාසනස්ථිතිය මුදුන්පත් කොටමුද්‍රණය භාරගෙන එන අතර පොතේ වැඩ කොළවර භාරන්නට මත්තෙන් නන්දාරාම තිස්ස ස්ථවිර පාදයෝ පරලෝකප්‍රාප්තවූහ.

මූන්වහන්සේ වනාහි දකුණු පිටිගල් කෝරළේ බද යෝගියානේ කුලගෙයක ඉපිද බාලාවස්ථාවෙහි ශ්‍රද්ධාසිතින් කිරිමැටියානේ සුධම්මවංසාරාමාධිවාසී **රේවතාභිධාන අනුනායක ස්ථවිරයන් වහන්සේගෙන්** ප්‍රව්‍රජ්‍යෝපසම්පදා ලැබ අම්බගහ පිටියේ විහාරාධිවාසීව වැඩ විසූ විබුධ ජන මෞලි මාණික්‍යරත්නායමාන වූ **කහවේ සිරි සද්ධම්ම ජෝතිපාල ඥානානන්ද තිස්ස ස්ථවිරපාදයන් වහන්සේගෙන්** ශබ්ද ශාස්ත්‍රය හා ධර්මවිනය ඉගෙණ අපරභාගයෙහි බුරුමරට රතනාපුණ්ණ මහා රාජධානියට වැඩමකර මුම්ම මණ්ඩලේශ්වර මහාධර්මරාජාධිරාජෝත්තම යන්ගෙන් සිව්පසය ලැබ **ඤෙයධම්මාභි මුනිවර ඤාණ කිත්ති සිරි ධජ මහාධම්මරාජාධි රාජගුරු** යන රාජදත්ත නාමෝධෙයෝපලක්ෂිත සඞ්ඝරාජතුමාණන් වහන්ගේ සමීපයෙහි වැස ධර්ම විනය නය ශාස්ත්‍ර ශක්තීන් පුහුණු කොට ලක්දිව් වැඩ ස්වකීය නිකාය නමැති අහස් කුස වොරජනා ඖෂධි තාරකාවමෙන්ද ස්ථවිරාන්වය නමැති මුක්තාහාරයට ලක්ෂණ සම්පන්න මුක්තාඵලයක් මෙන්ද බබලමින් චතුපාරිශුද්ධිශීලය නිජභාණ්ඩය මෙන් ආරක්‍ෂාකොට විසූවෝය.

මූන්වහන්සේ මීට ප්‍රථමයෙන් නොයෙක් ව්‍යාකරණ ග්‍රන්ථයන් අලලා නොයෙක් සන්ධික්‍රම උපුටා ලියනලද **සන්ධිදීපනී** නම් ග්‍රන්ථයක් මුද්‍රණය කරවා ශාසනෝපකාර කොට අවසාන කාලයේදී මේ අභිධර්මාර්ථ සඞ්ග්‍රහය සකස්කොට මුද්‍රණය කරවීමට ආරම්භ කළ නමුත් සර්ව සංස්කාරයන්ගේ අවාරණීය විපරිණාම ධර්මතාවට යටත්ව පරලොකප්‍රාප්ත වන්නට යෙදුණු බැවින් ශෙෂව තුබුණු භාණ්ඩය (පෝරම දෙක) ශුද්ධ පත්‍ර බලා මුද්‍රණය කරවා යලිත් පොත මුල පටන් කෙළවර දක්වා බලා කියා මේ සංඥාපනයද ලියා දෙන්ට යෙදුනා ඇත. මෙසේ මේ ශුද්ධිපත්‍රාදිය බලා අවසානයෙහි විද්වජ්ජන ශෙඛරායමාන වූ ශ්‍රීපාදේ ඇතුළුව පාහරට නවකෝරළේ ප්‍රධාන සඞ්ඝ නායක ස්ථානාන්තරප්‍රාප්ත ගෞරවාර්හ හික්කඩුවේ ශ්‍රී සුමඞ්ගලාභිධාන මහාස්ථවිර ස්වාමිපාදයන් වහන්සේට දක්වා මැනවැයි පිළිගන්නා ලදුව මුද්‍රණය කරවූමු.

මේ පරම ගම්භීර නය විචිත්‍ර අභිධර්ම ප්‍රකරණය සමාදරයෙන් භාවිත බහුලීකෘත කිරීමෙන් නාම රූප විභාගාවබෝධය කොට සමථ විදර්ශනාභාවනා ක්‍රමයෙන් ලොවී ලොවුතුරා සැප අත්පත් කටයුතු.

බු: ම: සෙ: ඇම්. ධර්මරත්න

(ලක්මිණිපහන් කර්තෘවම්හ.)

# අභිධම්මත්ථ සඞ්ගහො

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

සම්මා සම්බුද්ධමතුලං සසද්ධම්මගණුත්තමං
අභිවාදිය භාසිස්සං අභිධම්මත්ථ සඞ්ගහං.

තත්ථ වුත්තාභිධම්මත්ථා චතුධා පරමත්ථතො
චිත්තං චෙතසිකං රූපං නිබ්බානමිති සබ්බථා.

තත්ථ චිත්තං තාව චතුබ්බිධං හොති - කාමාවචරං රූපාවචරං අරූපාවචරං ලොකුත්තරඤ්චෙති.

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 1 | අභිධර්මය පරමාර්ථ වශයෙන් කොතෙක් ප්‍රකාර ද? | (විඥානස්කන්ධය යි කියන ලද) චිත්තය (වෙදනාදිස්කන්ධත්‍රය සංඛ්‍යාත) චෛතසිකය (භූතොපාදාය භෙද හෙයින් අට විසි වැදෑරුම්) රූපය (මාර්ගඵලාලම්බණ වූ) නිර්වාණය කියා සතර ප්‍රකාරයෙකි. |
| 2 | පළමු කොට සිත කොතෙක් ප්‍රකාර ද? | (කාමාවචර රූපාවචර අරූපාවචර ලොකොත්තර වශයෙන්) සතර ප්‍රකාරයෙකි. |
| 3 | කාමාවචර යනු කුමක් ද? | (සප්ත කාමස්වර්ගයෙහිද සතර අපායෙහිද යන එකොළොස්) කාම භවයෙහි බෙහෙවින් හැසිරෙන හෙයින් කාමාවචර නම් වේ. |
| 4 | රූපාවචර යනු කුමක් ද? | (බ්‍රහ්මපාරිෂද්‍යය පටන් අකනිට්ඨා බඹලොව දක්වා සොළොස්) රූතලයෙහි හැසිරෙන හෙයින් රූපාවචර නම් වේ. |
| 5 | අරූපාවචර යනු කුමක් ද? | (ආකාසානඤ්චායතනාදි සතර) අරූතලයෙහි හැසිරෙන හෙයින් අරූපාවචර නම් වේ. |
| 6 | ලොකොත්තර යනු කුමක් ද? | (උපාදානස්කන්ධය යි කියන ලද) ලොකයෙන් එතරවේනු යි ලොකොත්තර නම් වේ.- සෝවාන් ආදි සතර මාර්ග චිත්තයයි. |

3-1

තත්ථ කතමං කාමාවචරං:- සොමනස්සසහගතං දිට්ඨිගත සම්පයුත්තං අසංඛාරිකමෙකං, සසංඛාරිකමෙකං, සොමනස්ස සහගතං දිට්ඨිගත විප්පයුත්තං අසංඛාරිකමෙකං, සසංඛාරිකමෙකං, උපෙක්ඛා සහගතං දිට්ඨිගත සම්පයුත්තං අසංඛාරිකමෙකං, සසංඛාරිකමෙකං, උපෙක්ඛා සහගතං දිට්ඨිගත විප්පයුත්තං අසංඛාරික මෙකං, සසංඛාරිකමෙකන්ති ඉමානි අට්ඨපි ලොභ සහගත චිත්තානි නාම. දොමනස්ස සහගතං පටිඝ සම්පයුත්තං අසංඛාරික මෙකං, සසංඛාරිකමෙකන්ති ඉමානි ද්වෙපි පටිඝසම්පයුත්ත චිත්තානි නාම. උපෙක්ඛා සහගතං විචිකිච්ඡා සම්පයුත්තමෙකං උපෙක්ඛා සහගතං උද්ධච්චසම්පයුත්තමෙකන්ති ඉමානි ද්වෙපි මොමූහ චිත්තානි නාම.

ඉච්චෙවං සබ්බථාපි ද්වාදසාකුසලචිත්තානි සමත්තානි.

අට්ඨධා ලොභ මූලානි දොස මූලානි ච ද්විධා
මොහ මූලානි ච ද්වෙති ද්වාදසාකුසලා සියුං.

---

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 7 | කාමාවචර අකුසල් සිත් කොතෙක් ද? | (ලොභය මුල් කොට අටෙක, ද්වේෂය මුල් කොට දෙකෙක, මොහය මුල් කොට දෙකෙකැ යි ) දොළොසෙකි. |
| 8 | ලොභ මූල අකුසල් සිත් අට කෙසේ උපදිත් ද? | කාම සේවනය පර සතු දෙය ගැනීමය යනාදියෙහි දොස් නැතැයි මිථ්‍යා දෘෂ්ටිය පෙරටු කොට සතුටු සිත් ඇති ව අනුත්සාහිත සිතින් කාමසේවනාදිය කෙරේ ද එකල සොම්නස්ස සහගත වූ දෘෂ්ටි සම්ප්‍රයුක්ත අසංස්කාරික පළමුවන සිත ද, එසේ ම සොත්සාහිත සිතින් දෙවැනි සසංස්කාරික සිතද, දෘෂ්ටිවිප්‍රයුක්ත අසංස්කාරික සසංස්කාරික තුන්වන සතරවන සිත්ද, උපෙක්‍ෂා වෙදනා සහිත මෙසේ ම සිත් සතරෙක් දැයි ලොභ මූල අකුසල් සිත් අට උපදිති. |
| 9 | දෙස මූල දෙ සිත් කෙසේ උපදිත් ද? | නොසතුටු බව එක්ව පැමිණි ප්‍රතිඝයෙන් යුත් අසංස්කාරික සසංස්කාරික වශයෙන් දෙස මූල දෙ සිත් උපදිති. |
| 10 | මොහ මූල දෙ සිත් කෙසේ උපදිත් ද? | උපෙක්‍ෂා වෙදනාව එක්ව පැමිණි විචිකිච්ඡාව යයි කියන ලද සැකයෙන් යුත් සිත ද, එසේම උද්ධච්චය යි කියන ලද නො සන්සුන් පැවැත්ම ඇති සිත ද, යන මිසින් මොහ මූල දෙ සිත් උපදියි. |

උපෙක්ඛා සහගතං චක්ඛුවිඤ්ඤාණං, තථා සොතවිඤ්ඤාණං, ඝාණවිඤ්ඤාණං, ජිව්හාවිඤ්ඤාණං, දුක්ඛසහගතං කායවිඤ්ඤාණං, උපෙක්ඛා සහගතං සම්පටිච්ඡන චිත්තං, උපෙක්ඛා සහගතං සන්තීරණ චිත්තඤ්චෙති ඉමානි සත්තපි අකුසල විපාක චිත්තානි නාම.

උපෙක්ඛා සහගතං කුසල විපාකං චක්ඛුවිඤ්ඤාණං, තථා සොතවිඤ්ඤාණං, ඝාණවිඤ්ඤාණං, ජිව්හාවිඤ්ඤාණං, සුඛ සහගතං කායවිඤ්ඤාණං, උපෙක්ඛා සහගතං සම්පටිච්ඡන චිත්තං, සොමනස්ස සහගතං සන්තීරණ චිත්තං, උපෙක්ඛා සහගතං සන්තීරණ චිත්තඤ්චෙති ඉමානි අට්ඨපි කුසල විපාකාහෙතුක චිත්තානි නාම.

---

| ප්‍රශ්න | උත්තර |
|---|---|
| 11 මොහ මූල සිත්හි සංඛාර භෙදය නැත්තේ කුමක් හෙයින් ද? | අතිශයින් මූඪ බැවින් ද සැලෙන හෙයින් ද විසිරුණ හෙයින් ද එක හෙතුක බැවින් ද සංස්කාර භෙදයක් නැත්තේ ය. |
| 12 අකුසල විපාක සිත් කොතෙක් ද? | චක්ඛුවිඤ්ඤාණාදි පඤ්ච විඤ්ඤාණය ද, සම්පටිච්ඡන සන්තීරණ දෙ සිත ද, යන සත යි. |
| 13 කුසල විපාක අහෙතුක සිත් කොතෙක් ද? | කුසල විපාක චක්ඛුවිඤ්ඤාණාදි පඤ්ච විඤ්ඤාණය ද සම්පටිච්ඡන සිත ද උපෙක්ඛා සොමනස්ස වශයෙන් සන්තීරණ දෙ සිත ද යන අට යි. |
| 14 කායවිඤ්ඤාණය දුක්ඛ සුඛ සහගතව කුමක් හෙයින් උපදී ද? | චක්ඛුවිඤ්ඤාණාදිය උපාදාය රූප හෙයින් දුර්වලවය හෙතු කොට ගෙන උපෙක්ෂා සහගතව උපදී. කායවිඤ්ඤාණය වූ කලී භූත රූපයෙහි වැද සිටින හෙයින් අනිෂ්ට ඉෂ්ටාරම්මණ වශයෙන් දුක්ඛ සුඛ සහගතව උපදී. |
| 15 සම්පටිච්ඡන කොතෙක් ද? එහි අදහස කුමක් ද? | (අකුසල විපාක කුසල විපාක වශයෙන්) දෙකෙකි. (පඤ්චවිඤ්ඤාණයෙන් විසින් ගන්නා ලද රූපාදි අරමුණු) මනාව පිළිගන්නා සිත සම්පටිච්ඡන යි. |
| 16 සන්තීරණ කොතෙක් ද? එහි අදහස කුමක් ද? | (එක් උපෙක්ෂා සහගත අකුසල විපාක සන්තීරණයෙක් ද, උපෙක්ෂා සෞමනස්‍ය වශයෙන් කුසල විපාක සන්තීරණ දෙකෙක් ද, යන) තුන යි, මනාව තීරණය කරන (පිළිගත් ආකාර අරමුණු පරීක්ෂණය කරන) සිත සන්තීරණ යි. |

3-2

උපෙක්ඛා සහගතං පඤ්චද්වාරාවජ්ජන චිත්තං, තථා මනොද්වාරාවජ්ජන චිත්තං, සොමනස්ස සහගතං හසිතුප්පාදචිත්තඤ්චෙති ඉමානි තීණිපි අහෙතුක ක්‍රියා චිත්තානි නාම.

ඉච්චෙවං සබ්බථාපි අට්ඨාරස අහෙතුක චිත්තානි සමත්තානි.

සත්තාකුසල පාකානි පුඤ්ඤපාකානි අට්ඨධා
ක්‍රියා චිත්තානි තීණීති අට්ඨාරස අහෙතුකා.

---

පාපාහෙතුකමුත්තානි සොභනානීති වුච්චරෙ
එකූනසට්ඨි චිත්තානි අථෙකනවුතීපි වා.

සොමනස්ස සහගතං ඤාණ සම්පයුත්තං අසංඛාරිකමෙකං, සසංඛාරිකමෙකං, සොමනස්ස සහගතං ඤාණ විප්පයුත්තං අසංඛාරිකමෙකං, සසංඛාරිකමෙකං, උපෙක්ඛා සහගතං ඤාණ සම්පයුත්තං අසංඛාරිකමෙකං, සසංඛාරිකමෙකං, උපෙක්ඛා සහගතං ඤාණ විප්පයුත්තං අසංඛාරිකමෙකං, සසංඛාරිකමෙකන්ති ඉමානි අට්ඨපි කාමාවචර කුසල චිත්තානි නාම.

---

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 17 | එක් අකුසල විපාක සන්තීරණයක් හි කල කුසල විපාක සන්තීරණ දෙකක් කුමක් හෙයින් කියන ලද්දාහු ද? | අකුසල විපාක සන්තීරණ දෙකක් වුව හොත් උපෙක්‍ෂා දෞර්මනස්‍ය වශයෙන් විය යුතු ය, දෞර්මනස්‍යය වූ කලී පටිඝය විනා නූපදින හෙයින් උපෙක්‍ෂා සහගත එක් අකුසල විපාක සන්තීරණයක්ම වේ. කුසල විපාක සන්තීරණය වනාහි ඉෂ්ටාරම්මණ ඉෂ්ට මධ්‍යස්ථාරම්මණ, වශයෙන් උපෙක්‍ෂාසෞමනස්‍යසහගතව දෙකක් කියන ලදී. |
| 18 | ආවජ්ජන කොතෙක් ද? | පඤ්චද්වාරාවජ්ජන මනොද්වාරාවජ්ජන වශයෙන් දෙකෙකි. |
| 19 | පඤ්චද්වාරාවජ්ජන යනු කුමක් ද? | පඤ්චද්වාරයෙහි ගැටෙන ලද අරමුණු ආවජ්ජනය කරන සිත් සතන් (භවාඞ්ග වශයෙන් පැවැත්විය නොදී වීථිචිත්ත භාවයට පිරිණමන) සිත පඤ්චද්වාරාවජ්ජන නම් වේ. – ක්‍රියා අහෙතුක මනොධාතු චිත්තය යි. |
| 20 | මනොද්වාරාවජ්ජන යනු කුමක් ද? | (භවාඞ්ගචිත්ත නම් වූ) මනොද්වාරයෙහි (දිට්ඨාදි වශයෙන් ආපාථ ගත) අරමුණු ආවජ්ජනය කරන හෙයින් මනොද්වාරාවජ්ජන නම් වේ.– ක්‍රියා හෙතුක මනොවිඤ්ඤාණ ධාතු උපෙක්‍ෂා සහගත චිත්තයයි, |

සොමනස්ස සහගතං ඤාණසම්පයුත්තං අසංඛාරිකමෙකං, සසංඛාරිකමෙකං, සොමනස්ස සහගතං ඤාණ විප්පයුත්තං අසංඛාරිකමෙකං, සසංඛාරිකමෙකං, උපෙක්ඛා සහගතං ඤාණ සම්පයුත්තං අසංඛාරිකමෙකං, සසංඛාරිකමෙකං, උපෙක්ඛා සහගතං ඤාණ විප්පයුත්තං අසංඛාරිකමෙකං, සසංඛාරිකමෙකන්ති ඉමානි අට්ඨපි සහෙතුක කාමාවචර විපාකචිත්තානි නාම. සොමනස්ස සහගතං ඤාණ සම්පයුත්තං අසංඛාරිකමෙකං, සසංඛාරිකමෙකං, සොමනස්සසහගතං ඤාණ විප්පයුත්තං අසංඛාරිකමෙකං, සසංඛාරිකමෙකං, උපෙක්ඛා සහගතං ඤාණ සම්පයුත්තං අසංඛාරිකමෙකං, සසංඛාරිකමෙකං, උපෙක්ඛා සහගතං ඤාණ විප්පයුත්තං අසංඛාරිකමෙකං, සසංඛාරිකමෙකන්ති ඉමානි අට්ඨපි සහෙතුක කාමාවචර ක්‍රියා චිත්තානි නාම.

ඉච්චෙවං සබ්බථාපි චතුවීසති සහෙතුක කාමාවචර කුසල විපාක ක්‍රියා චිත්තානි සමත්තානි.

---

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 21 | අහේතුක සිත් කොතෙක් ද? | (අකුසල විපාක සත ද අහේතුක කුසල විපාක අට ද අහේතුක ක්‍රියා තුන ද යන) දහඅට යි. |
| 22 | සොභන සිත් කොතෙක් ද? | (පාපාහේතුක සිත් හැර කාමාවචර කුසල විපාක ක්‍රියා සිත් විසි හතර ද රූපාවචර පසළොස ද අරූපාවචර දොළොස ද ලෝකෝත්තර අට ද යන මේ එකුන් සැට එක් ක්‍රමයකින් සොභන චිත්තයෝ නම් වෙති. අනික් ක්‍රමයකින් ලෝකෝත්තර අට පඤ්ච ධ්‍යාන වශයෙන් සතළිසක් වූ කලැ එකානූවෙක් වේ. |
| 23 | කාමාවචර කුසල් සිත් අට කෙසේ උපදිත් ද? | සතුටු සහිත විපාක ඇත යන සම්‍යක් නුවණ පෙරටු කොට නො පසු බැස අන්‍යයකුගේ උත්සාහයෙක් හෝ නැතිව දන් දීම් ආදී කුසල් කෙරේ නම් එ කල සොමනස්ස සහගත ඤාණ සම්ප්‍රයුක්ත පළමුවැනි කුසල් සිතද, එසේ ම පසු බැස හෝ අන්‍යයකුගේ උත්සාහයෙන් හෝ දෙවැනි සිතද, මෙසේ ම ඤාණ රහිතව තුන්වන සතර වන සිත් ද, කියන ලද ක්‍රමයෙන් උපෙක්ෂා සහගතව සතරෙක් දැයි යන මේ කාමාවචර කුසල් සිත් අට මෙසේ උපදිති. විපාක ක්‍රියා සිත් ද මෙසේම ය. |

වේදනා ඤාණ සංඛාර භේදෙන චතුවීසති
සහෙතු කාමාවචර පුඤ්ඤපාක ක්‍රියා මතා.

කාමෙ තෙවීස පාකානි පුඤ්ඤාපුඤ්ඤානි වීසති
එකාදස ක්‍රියා චෙති චතුපඤ්ඤාස සබ්බථා.

විතක්ක විචාර පීති සුඛෙකග්ගතා සහිතං පඨමජ්ඣාන කුසල චිත්තං, විචාර පීති සුඛෙකග්ගතා සහිතං දුතියජ්ඣාන කුසල චිත්තං, පීති සුඛෙකග්ගතා සහිතං තතියජ්ඣාන කුසල චිත්තං, සුඛෙකග්ගතා සහිතං චතුත්ථජ්ඣාන කුසල චිත්තං, උපෙක්ඛෙකග්ගතා සහිතං පඤ්චමජ්ඣාන කුසල චිත්තඤ්චෙති ඉමානි පඤ්චපි රූපාවචර කුසල චිත්තානි නාම.

විතක්ක විචාර පීති සුඛෙකග්ගතා සහිතං පඨමජ්ඣාන විපාක චිත්තං, විචාර පීති සුඛෙකග්ගතා සහිතං දුතියජ්ඣාන විපාක චිත්තං, පීති සුඛෙකග්ගතා සහිතං තතියජ්ඣාන විපාක චිත්තං, සුඛෙකග්ගතා සහිතං චතුත්ථජ්ඣාන විපාක චිත්තං, උපෙක්ඛෙකග්ගතා සහිතං පඤ්චමජ්ඣාන විපාක චිත්තඤ්චෙති ඉමානිපඤ්චපි රූපාවචර විපාක චිත්තානි නාම.

---

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 24 | සහේතුක කාමාවචර කුසල විපාක ක්‍රියා සිත් කොතෙක් ද? | (සොමනස්සුපෙක්ඛා වේදනා ය ඥාන සම්ප්‍රයුක්ත ය විප්‍රයුක්ත ය අසංඛාර ය සසංඛාර ය යන භේදයෙන් කුසල් සිත් අටෙක, විපාක සිත් අටෙක, ක්‍රියා සිත් අටෙක යි) සූවිස්සෙකි. |
| 25 | කාම භවයෙහි විපාක සිත් කොතෙක් ද? | (අකුසල විපාක සතය, කුසල විපාක අහේතුක අටය, කුසල විපාක සහේතුක අටය යන) විසි තුන යි. |
| 26 | කාමාවචර කුසල් අකුසල් සිත් කොතෙක් ද? | (කුසල් සිත් අට ද, අකුසල් සිත් දොළොසද යන) විස්ස යි. |
| 27 | කාමාවචර ක්‍රියා සිත් කොතෙක් ද? | (අහේතුක ක්‍රියා සිත් තුනද සහේතුක ක්‍රියා සිත්. අටද යන) එකොළොස යි. |
| 28 | ප්‍රථමාදි ධ්‍යාන කොතෙක් කොතෙක් අඞ්ගයන්ගෙන් යුක්ත ද? | ප්‍රථමධ්‍යානය (විතර්කය, විචාරය, ප්‍රීතිය, සුඛය, එකාග්‍රතාය යන) අඞ්ග පසකින් යුක්ත යි. ද්විතීයාදිධ්‍යාන තුනෙහි විතර්කාදිය එකිනෙක හැර චතුරඞ්ගික ත්‍රියඞ්ගික ද්විඞ්ගිකාව ද පස්වැනි ධ්‍යානය චතුර්ථි උපෙක්ඛෙකාග්‍රතා සහිත ද්විඞ්ගිකාව ද යෙදේ. |

විතක්ක විචාර පීති සුඛෙකග්ගතා සහිතං පඨමජ්ඣාන ක්‍රියා චිත්තං, විචාර පීති සුඛෙකග්ගතා සහිතං දුතියජ්ඣාන ක්‍රියා චිත්තං, පීති සුඛෙකග්ගතා සහිතං තතියජ්ඣාන ක්‍රියා චිත්තං, සුඛෙකග්ගතා සහිතං චතුත්ථජ්ඣාන ක්‍රියා චිත්තං, උපෙක්ඛෙකග්ගතා සහිතං පඤ්චමජ්ඣාන ක්‍රියා චිත්තඤ්චෙති ඉමානි පඤ්චපි රූපාවචර ක්‍රියා චිත්තානි නාම.

ඉච්චෙවං සබ්බථාපි පන්නරස රූපාවචර කුසල විපාක ක්‍රියා චිත්තානි සමත්තානි.

පඤ්චධා ඣාන භෙදෙන රූපාවචර මානසං
පුඤ්ඤපාක ක්‍රියාභෙදා තං පඤ්චදසධා භවෙ.

ආකාසානඤ්චායතන කුසල චිත්තං, විඤ්ඤාණඤ්චායතන කුසල චිත්තං, ආකිඤ්චඤ්ඤායතන කුසල චිත්තං, නෙවසඤ්ඤානාසඤ්ඤායතන කුසල චිත්තඤ්චෙති ඉමානි චත්තාරිපි අරූපාවචර කුසල චිත්තානි නාම.

ආකාසානඤ්චායතන විපාක චිත්තං, විඤ්ඤාණඤ්චායතන විපාකචිත්තං, ආකිඤ්චඤ්ඤායතන විපාකචිත්තං, නෙවසඤ්ඤානාසඤ්ඤායතන විපාකචිත්තඤ්චෙති ඉමානි චත්තාරිපි අරූපාවචර විපාක චිත්තානි නාම.

---

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 29 | අරූපාවචර සිත් කොපමණ ද? | කසිණුග්ඝාටිමාකාසාලම්බණාදි අරමුණු භෙදයෙන් සතරෙකි. කුසල විපාක ක්‍රියා භෙදයෙන් දොළොසෙකි. |
| 30 | රූපාවචරයන් මෙන් අරූපාවචරයෝ අඞ්ග දුරු කිරීමෙන් උපදනාහු ද? | එසේ අඞ්ග දුරු කිරීමෙන් නූපදිති. පඤ්චමධ්‍යානාලම්බන කසිණ නිමිත්ත ඉක්මවා ඒ කසිණ ඉගිලූ ආකාශය අරමුණු කොට ආකාසානඤ්චායතනය උපදී. ඒ ආකාශයද ඉක්මවා එහි පැවැති විඤ්ඤාණය අරමුණු කොට විඤ්ඤාණඤ්චායතනය උපදී. එයද ඉක්මවා තද භාව ශූන්‍ය අකිඤ්චන්‍යය අරමුණු කොට ආකිඤ්චඤ්ඤායතනය උපදී. එයද ඉක්මවා එහි පැවැති තුන්වැනි ආරූප්‍යවිඤ්ඤාණය අරමුණු කොට සතරවැනි ආරූප්‍ය චිත්තය වශයෙන් නෙවසඤ්ඤානාසඤ්ඤායතනය උපදී. |
| 31 | රූපාවචර සිත් කොපමණ ද? | ප්‍රථමාදි ධ්‍යාන භෙදයෙන් පසෙකි. කුසල විපාක ක්‍රියා භෙදයෙන් පසළොසක් වෙත්. |

ආකාසානඤ්චායතන ක්‍රියා චිත්තං, විඤ්ඤාණඤ්චායතන ක්‍රියා චිත්තං, ආකිඤ්චඤ්ඤායතන ක්‍රියා චිත්තං, නෙවසඤ්ඤානාසඤ්ඤායතන ක්‍රියාචිත්තඤ්චේති ඉමානි චත්තාරිපි අරූපාවචර ක්‍රියා චිත්තානි නාම.

ඉච්චෙවං සබ්බථාපි ද්වාදස අරූපාවචර කුසල විපාක ක්‍රියා චිත්තානි සමත්තානි.

ආලම්බණප්පභේදෙන චතුධාරුප්ප මානසං
පුඤ්ඤපාක ක්‍රියා භේදා පුන ද්වාදසධා ඨිතං.

සොතාපත්ති මග්ග චිත්තං, සකදාගාමි මග්ග චිත්තං, අනාගාමි මග්ග චිත්තං අරහත්ත මග්ග චිත්තඤ්චේති ඉමානි චත්තාරිපි ලොකුත්තර කුසල චිත්තානි නාම.

සොතාපත්ති ඵල චිත්තං, සකදාගාමි ඵල චිත්තං, අනාගාමි ඵල චිත්තං, අරහත්ත ඵල චිත්තඤ්චේති ඉමානි චත්තාරිපි ලොකුත්තර විපාක චිත්තානි නාම.

---

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 32 | ශ්‍රොතාපත්ති මාර්ග චිත්ත යන්නෙහි අදහස කවරේ ද? | (නිවන් නැමැති මහ මුහුදට නිම්න බැවින්) ශ්‍රොතසංඛ්‍යා වැනි වූ ආර්‍ය්‍යාෂ්ටාංගික මාර්ගයට පළමු කොට පැමිණෙන්නහුගේ ඒ මාර්ගයෙන් යුත් සිතය යන අදහස යි. |
| 33 | ශ්‍රොතාපත්ති මාර්ග සිතින් කොතෙක් කෙලෙස් ප්‍රහීණ වේත් ද? | (විංශති ප්‍රභේද වූ) සත්කායදෘෂ්ටිය ද, (බුද්ධාදී අටතන්හි සැක කිරීම යයි කියන ලද) විචිකිච්ඡාව ද, (අන්‍යදෘෂ්ටිකයන්ගේ ශීලව්‍රත ගැනීම යයි කියන ලද) සීලබ්බත පරාමාසය ද, යන තුන ප්‍රහීණ වේත්. |
| 34 | සකෘදාගාමි මාර්ග චිත්ත යන්නෙහි අදහස කෙසේ ද? | වරක් මේ මිනිස් ලොවට ප්‍රතිසන්ධි වශයෙන් පැමිණ දුක් නසන්නහුගේ මාර්ගයෙන් යුත් චිත්තය යන අදහස යි. |
| 35 | සකෘදාගාමි මාර්ග සිතින් කොතෙක් කෙලෙස් ප්‍රහීණ වේත් ද? | රාග ද්වේෂ මෝහ යන තුන තුනී කිරීම විනා කෙලෙශ ප්‍රහීණයෙක් නො වේයි. |
| 36 | අනාගාමි මාර්ග චිත්ත යන්නෙහි අදහස කවරේද? | පිළිසිඳීම් වශයෙන් මෙම කාම ලොකයට නො පැමිණ ශුද්ධාවාසාදියෙහි දුක් කෙළවර කරන්නහුගේ මාර්ගයෙන් යුත් චිත්තය යන අදහස යි. |
| 37 | අනාගාමි මාර්ග සිතින් කොතෙක් කෙලෙස් ප්‍රහීණ වේත් ද? | (කාම රාග ව්‍යාපාද යන) කෙලෙස් දෙදෙනෙක් ප්‍රහීණ වේයි. |

ඉච්චෙවං සබ්බථාපි අට්ඨ ලොකුත්තර කුසල විපාක විඤ්ඤාණානි සමත්තානි.

චතුමග්ගප්පභෙදෙන චතුධා කුසලං තථා
පාකං තස්ස ඵලත්තාති අට්ඨධානුත්තරං මතං.

ද්වාදසාකුසලානෙවං කුසලානෙකවීසති
ඡත්තිංසෙව විපාකානි ක්‍රියා චිත්තානි වීසති.

චතුපඤ්ඤාසධා කාමෙ රූපෙ පණ්ණරසීරයෙ
චිත්තානි ද්වාදසාරූපෙ අට්ඨධානුත්තරෙ තථා.

ඉත්ථමෙකූනනවුතිප්පභෙදං පන මානසං
එකවීස සතං වාථ විභජන්ති විචක්ඛණා.

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 38 | අයත් මාර්ග චිත්ත යන්නෙහි අදහස කවරේ ද? | පූජාර්හ වූ කෙලෙස් නැමැති අරි නැසූ මා වූ රහසත් පව් නො කරන්නා වූ උත්තමයන්ගේ මාර්ගයෙන් යුත් චිත්තය යන අදහස යි. |
| 39 | අර්හත් මාර්ග සිතින් කොතෙක් කෙලෙස් ප්‍රහීණ වෙත් ද? | රූපරාග අරූපරාග මාන උද්ධච්ච අවිජ්ජා යන උද්ධම්භාගිය සංයෝජන පස ප්‍රහීණ වෙති. |
| 40 | ලොකොත්තර කුසල් සිත් කොතෙක් ද? | (සෝවාන් ආදි මාර්ග වශයෙන්) සතරෙක් වේ. |
| 41 | ලොකොත්තර ඵල සිත් කොතෙක් ද? | (සෝවාන් ආදි ඵල වශයෙන්) සතරෙකි. සියලු ලොකොත්තර මාර්ගඵල සිත් අටෙකි. |
| 42 | සියලු සිත් කොතෙක් ද? | එක් ක්‍රමයකින් අසූනවයෙකි. අනෙක් ක්‍රමයකින් එක්සිය විසි එකකි. |
| 43 | අසූනවයක් සිත් කෙසේ වේද? | අකුසල් සිත් දොළොස ද, කාමාවචර රූපාවචර අරූපාවචර කුසල් සිත් සතළොස ද මාර්ග සිත් සතර ද යන එක්විසි කුසල් සිත් ද, අකුසල විපාක සත ද අහේතුක කුසල විපාක අට ද සහේතුක කුසල විපාක අට ද රූපාවචර විපාක පස ද අරූපාවචර විපාක සතර ද ලොකොත්තර විපාක සතර ද යන සතිස් විපාක සිත් ද, අහේතුක ක්‍රියා තුන ද සහේතුක කාමාවචර ක්‍රියා අට ද රූපාවචර ක්‍රියා පස ද අරූපාවචර ක්‍රියා සතර ද යන විංශති ක්‍රියා සිත් ද යන මේ අසූ නවයක් සිත් වේ. |

14-1

කථමෙකූනනවුතිවිධං චිත්තං එකවීසසතං හොති ෴ විතක්ක විචාර පීති සුඛෙකග්ගතා සහිතං පඨමජ්ඣාන සොතාපත්තිමග්ග චිත්තං, විචාර පීති සුඛෙකග්ගතා සහිතං දුතියජ්ඣාන සොතාපත්ති මග්ගචිත්තං, පීති සුඛෙකග්ගතා සහිතං තතියජ්ඣාන සොතාපත්ති මග්ගචිත්තං, සුඛෙකග්ගතා සහිතං චතුත්ථජ්ඣාන සොතාපත්තිමග්ග චිත්තං, උපෙක්ඛෙකග්ගතා සහිතං පඤ්චමජ්ඣාන සොතාපත්ති මග්ගචිත්තඤ්චෙති ඉමානි පඤ්චපි සොතාපත්තිමග්ග චිත්තානි නාම ෴

තථා සකදාගාමිමග්ග අනාගාමිමග්ග අරහත්තමග්ග චිත්තඤ්චෙති සමවීසති මග්ගචිත්තානි තථා ඵලචිත්තානි චෙති සමචත්තාළීස ලොකුත්තර චිත්තානි භවන්තීති ෴

ඣානඞ්ග යොග භෙදෙන කත්වෙකෙකන්තු පඤ්චධා
වුච්චතානුත්තරං චිත්තං චත්තාළීස විධන්ති ච ෴

යථා ච රූපාවචරං ගය්හතානුත්තරං තථා
පඨමාදි ඣාන භෙදෙ ආරුප්පඤ්චාපි පඤ්චමෙ ෴

---

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 44 | අසූ නමයක් සිත් එක් සිය විසි එකක් වන්නේ කෙසේ ද? | අසූ නමයක් සිත් අතුරෙන් ලෝකෝත්තර සිත් අට ප්‍රථමධ්‍යාන ද්විතීය ධ්‍යානාදි ධ්‍යාන පසින් 'පඨමජ්ඣාන සොතාපත්ති මග්ග චිත්තං පඨමජ්ඣාන සොතාපත්ති ඵල චිත්තං' යනාදි වශයෙන් ගිණීමෙන් ලෝකෝත්තර සිත් සතළිසෙක් වේ. ඒ සතළිස අසූ එක හා යෙදූ කල එක් සිය විසි එකක් වේ. |
| 45 | ලෝකෝත්තර සිත් අට සාළිසක් ප්‍රභේද වන්නේ කෙසේ ද? | එකී එකී ලෝකෝත්තර සිතකට ප්‍රථම ද්විතීයාදි ධ්‍යාන පස යෙදූ කල සම සාළිසෙක් වේ. |
| 46 | අරූපාවචර සිත් කවර ධ්‍යානයකින් ලැබෙත් ද? | උපෙක්ඛෙකග්ගතා සහිතව පඤ්චමධ්‍යානයෙන් අරූපාවචර සිත් දොළොසම ලැබෙත්. |
| 47 | එකී එකී ධ්‍යානයෙක් කොතෙක් ප්‍රකාර ද? | ලෞකික රූපාවචර කුසල විපාක ක්‍රියා වශයෙන් එක් ධ්‍යානයෙක් තුන් ප්‍රකාරයෙක් ද මාර්ග ඵල සිත් වශයෙන් අට ප්‍රකාරයෙක් ද යි එකොළොස් ප්‍රකාරයෙක් වේ යි. පඤ්චමධ්‍යානය වූ කලී ඒ එකොළොස සමඟ අරූපාවචර සිත් දොළොස ද යන විසිතුන් ප්‍රකාරයෙක් වේ. |

එකාදස විධං තස්මා පඨමාදිකමීරිතං
ඣානමෙකෙකමන්තෙ තු තෙවීසති විධං භවෙ.

සත්තතිංස විධං පුඤ්ඤං ද්වීපඤ්ඤාස විධං තථා
පාකමිච්චාහු චිත්තානි එකවීස සතං බුධා.

ඉති අභිධම්මත්ථසඞ්ගහෙ චිත්තසඞ්ගහ විභාගො නාම

## පඨමො පරිච්ඡෙදො.

---

එකුප්පාදනිරොධා ච එකාලම්බණවත්ථුකා
චෙතොයුත්තා ද්විපඤ්ඤාස ධම්මා චෙතසිකා මතා.

---

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 48 | එක් සිය විසි එකේ ක්‍රමයට කුසල් සිත් කොතෙක් ද? | (කාමාවචර රූපාවචර අරූපාවචර කුසල් සිත් සතළොස ද ධ්‍යාන වශයෙන් ලොකොත්තර මාර්ග සිත් විස්ස ද යන) කුසල් සිත් තිස් හත යි. |
| 49 | එක් සිය විසි එකේ ක්‍රමයට විපාක සිත් කොතෙක් ද? | (කාමාවචර අහේතුක විපාක සිත් පසළොස ද සහේතුක විපාක සිත් අට ද රූපාවචර අරූපාවචර විපාක සිත් නවය ද ධ්‍යාන වශයෙන් ලොකොත්තර ඵල සිත් විස්ස ද යන මේ) විපාක සිත් දෙපනස යි. |

## පළමුවන පරිච්ඡේදය නිමියේ යි.

---

| | | |
|---|---|---|
| 1 | චෛතසික යනු කුමක් ද? | සිත හා එක්ව ඉපැදීම් නිරුද්ධ වීම් ඇත්තා වූ ද එක් අරමුණක් හා වස්තුවක් ඇත්තා වූ ද සිත හා යෙදුණු දෙපනස් ධර්මයෝ චෛතසිකයෝ යි. |

4-2

පාඨං:— ඵස්සො වෙදනා සඤ්ඤා චෙතනා ඒකග්ගතා ජීවිතින්ද්‍රියං මනසිකාරො චෙති සත්තිමෙ චෙතසිකා සබ්බචිත්තසාධාරණා නාම. විතක්කො විචාරො අධිමොක්ඛො විරියං පීති ඡන්දො චාති ඡ ඉමෙ චෙතසිකා පකිණ්ණකා නාම.

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 2 | සබ්බචිත්ත සාධාරණ චෛතසිකයෝ කොතෙක් ද? | (සියලු සිත්හි උපදින 1ස්පර්ශය 2වේදනාය 3සංඥාය 4චේතනාය 5ඒකාග්‍රතාය 6ජීවිතේන්ද්‍රියය 7මනස්කාරය කියා සතෙකි. |
| 3 | ප්‍රකීර්ණක චෛතසිකයෝ කොතෙක් ද? | (8විතර්කය 9විචාරය 10අධිමෝක්ෂය 11වීර්යය 12ප්‍රීතිය 13ඡන්දය කියා) සයෙකි. |

1 අරමුණෙහි වැද ගන්නා ආකාරයෙන් උපදනේ 'ස්පර්ශ' යි. ඇඹුල් කන්නවුන් බලන්නහුගේ ජලෝත්පාදය මෙනි.

2 අරමුණු රස අනුභව කිරීම 'වේදනා' යි. අග්‍රරස අනුභව කරන රජකු මෙනි.

3 (නීලපීතාදි භේද වූ අරමුණු) හැඳිනීම 'සංඥා' යි. දූව ආදින්ගේ පසුව හැඳිනීමට කරන ලකුණක් මෙනි.

4 රැස් කිරීම (හෙවත් තමා හා සම්ප්‍රයුක්ත ධර්මයන් ඒ ඒ කෘත්‍යයෙහි යෙදවීම) 'චේතනා' යි. ස්ව කෘත්‍ය පර කෘත්‍යසාධක ප්‍රධාන ශිෂ්‍යයකු මෙනි.

5 එක් අරමුණක සම්ප්‍රයුක්ත ධර්මයන් පවත්වන ධර්මය 'ඒකාග්‍රතා' යි.

6 (අරූප ධර්ම පාලනයෙහි) අධිපති බව 'ජීවිතේන්ද්‍රිය' යයි.

7 සිත්හි කිරීම (හෙවත් අරමුණට නැගීම් ලක්ෂණ කොට ඇත්තේ) 'මනස්කාර' යයි. – අරමුණට අභිමුඛව යොදන හෙයින් ආජානේයයන් මෙහෙයන රථාචාර්යයකු මෙනි.

8 කල්පනා කිරීම (හෙවත් සම්ප්‍රයුක්ත ධර්මයන් අරමුණට නැංවීම කරනුයේ) 'විතර්ක' යි.

9 සිත අරමුණෙහි හැසිරී වීම (හෙවත් අරමුණු පිරිමැදීම) 'විචාර' යි.

10 අරමුණු නිශ්චය කිරීම 'අධිමෝක්ෂ' යි.

11 සම්ප්‍රයුක්ත ධර්මයනට රුකුළු දෙන්නා වූ උත්සාහ ධර්මය 'වීර්ය' යි.

12 (ආරම්මණ ප්‍රතිලාභයෙහි) සම්ප්‍රයුක්ත ධර්මයන්ගේ පිනැවීම කිරීම 'ප්‍රීතිය' යි.

13 (කිරීමට) කැමැති බව 'ඡන්ද' යි.

එවමෙතෙ තෙරස චෙතසිකා අඤ්ඤසමානාති වෙදිතබ්බා.

මොහො අහිරිකං අනොත්තප්පං උද්ධච්චං ලොභො දිට්ඨි මානො දොසො ඉස්සා මච්ඡරියං කුක්කුච්චං ථිනං මිද්ධං විචිකිච්ඡා චෙති චුද්දසිමෙ චෙතසිකා අකුසලා නාම.

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 4 | ප්‍රකීර්ණක යනු කුමක් ද? | ශොභන අශොභන සිත්හි මිශ්‍රව යෙදෙන හෙයින් ප්‍රකීර්ණක නම් වේ. |
| 5 | අඤ්ඤසමාන යනු කුමක් ද? | ශොභනාපෙක්ෂාවෙන් ඉතර අශොභනයන් කෙරෙහි ද අශොභනාපෙක්ෂාවෙන් ඉතර ශොභනයන් කෙරෙහි ද සමව උපදනා හෙයින් ස්පර්ශාදි තෙළෙස අඤ්ඤසමානයෝ යි. |
| 6 | අකුශල චෛතසික කෝ කොතෙක් ද? | ([1]මෝහය [2]අහිරිකය [3]අනොත්තප්පය [4]උද්ධච්චය [5]ලෝභය [6]දිට්ඨිය [7]මානය [8]දෝසය [9]ඉස්සාය [10]මච්ඡරිය [11]කුක්කුච්චය [12]ථිනය [13]මිද්ධය [14]විචිකිච්ඡා යි) තුදුසෙකි. |

1 (අරමුණු ස්වභාව වැසීමෙන්) මුළා වීම 'මෝහ'ය යි.

2 පාපයෙහි පිළිකුල් නො කිරීම 'අහිරික' යි. අශුචියෙහි ග්‍රාම සූකරයකු මෙනි.

3 (පාපයෙහි) භය නො වීම 'අනොත්තප්ප' යි. ගින්නෙහි පළඟැටියකු මෙනි.

4 (නොසන්හුන් පැවැතුම් ඇති) ස්වභාව 'උද්ධච්ච' යි. පාෂාණ ස්පර්ශයෙන් නැඟි භස්මයක් මෙනි.

5 (අරමුණෙහි) ඇලීම 'ලෝභ' යි. වඳුරු ලහටුවක් මෙනි.

6 (මෙම සත්‍ය යැ අනිකක් හිස් යැ යි) මිථ්‍යාභිනිවේශය 'දෘෂ්ටි' යි.

7 (ශ්‍රේෂ්ඨොහමස්මි යනාදීන්) උන්නති ස්වභාව 'මාන' යි.

8 චණ්ඩ ස්වභාව 'ද්වේෂ' යි. පහටාශීවිෂයකු මෙනි.

9 (පර ලාභ සත්කාරාදියෙහි) නො ඉවැසීම 'ඊර්ෂ්‍යා' යි.

10 තම සම්පත් සැඟවීම් ස්වභාව 'මාත්සර්ය' යි.

11 (කෘතාකෘත දුශ්චරිත සුචරිතයන්හි පසුතැවීම හෙවත්) කුකුස් කිරීම 'කුක්කුච්ච' යි.

12 (අරමුණු ගැනීමෙහි චිත්තයාගේ) හැකිළෙන ස්වභාවය 'ථින'යි.

13 වේදනාදි ස්කන්ධ ත්‍රයයාගේ ක්‍රියා කාරණයෙහි අශක්‍යතාව 'මිද්ධ' යි.

14 (බුද්ධාදි අට තැන්හි) සැක කිරීම 'විචිකිච්ඡා' යි.

සද්ධා සති හිරි ඔත්තප්පං අලොභො අදොසො තත්‍රමජ්ඣත්තතා කායපස්සද්ධි චිත්තපස්සද්ධි කායලහුතා චිත්තලහුතා කායමුදුතා චිත්තමුදුතා කායකම්මඤ්ඤතා චිත්තකම්මඤ්ඤතා කායපාගුඤ්ඤතා චිත්තපාගුඤ්ඤතා කායුජ්ජුකතා චිත්තුජ්ජුකතා චෙති එකූනවීසතිමෙ චෙතසිකා සොභනසාධාරණා නාම.

| ප්‍රශ්න | උත්තර |
|---|---|
| 7 සොභන සාධාරණ චෛතසිකයෝ කොතෙක් ද? | ([1]ශ්‍රද්ධාය [2]සමෘතිය [3]හිරිය [4]ඔත්තප්පය [5]අලොභය [6]අද්වේෂය [7]තත්‍රමජ්ඣත්තතාය [8]කායචිත්තපස්සද්ධි දෙකය [9]කායචිත්තලහුතා දෙකය [10]කායචිත්තමුදුතා දෙකය [11]කාය චිත්ත කම්මණ්‍යතා දෙකය [12]කාය චිත්තපාගුඤ්ඤතා දෙකය [13]කාය චිත්තුජ්ජුකතා දෙකය යන) එකුන් විස්සෙකි. |

---

1 (සම්ප්‍රයුක්ත ධර්මයන් පැහැදීම ලක්ෂණ කොට ඇති බුද්ධාදීන් කෙරෙහි) ප්‍රසාදය ‘ශ්‍රද්ධා’ යි. උදක ප්‍රසාදක මාණික්‍යයක් මෙනි.

2 (ආලම්බණ) සමරණය කිරීම ‘සමෘති’ යි. ප්‍රගුණ ග්‍රන්ථයක් මෙනි.

3 (කාය දුශ්චරිතාදීන් කෙරෙහි) ජුගුප්සාකාරයෙන් පැමැත්ම ‘හිරි’ යි.

4 (පාප ධර්මයන් කෙරෙහි) ත්‍රස්තාකාරයෙන් පැමැත්ම ‘ඔත්තප්ප’ යි.

5 අරමුණෙහි නො ඇලීම ‘අලොභ’ යි. පියුම්පත ජලබිඳුවක් මෙනි.

6 අවිරොධ ලක්ෂණ වූයේ ‘අද්වේෂ’ යි. අනුකූල මිත්‍රයකු මෙනි.

7 ඒ ඒ ධර්මයන්හි මැදහත් පැවැතුම් ඇති බව ‘තත්‍රමජ්ඣත්තතා’ යි. සමව පැවැති අසුන්ට මද්ධ්‍යස්ථ රථාචාර්‍ය්‍යයකු මෙනි.

8 කාය (යයි කියන ලද වෙදනාදි ස්කන්ධත්‍රය) යාගේ ද චිත්ත (යයි කියන ලද විඥානස්කන්ධ) යාගේ ද (ඖද්ධත්‍යාදි කෙලශ දරථ යන්) සංසිඳීම ‘කායපස්සද්ධි චිත්තපස්සද්ධි’ නම් වේ.

9 කාය චිත්ත * දෙදෙනාගේ (ගුරුත්ව සංඛ්‍යාත ථීන මිද්ධයන් සංසිඳීම් ලක්ෂණ වූ) ලඝුත්වය ‘කාය ලහුතා චිත්ත ලහුතා’ යි.

10 කාය චිත්ත දෙ දෙනාගේ (ස්තබ්ධ භාවසංඛ්‍යාත දෘෂ්ටි මානාදීන් සංසිඳීම් ලක්ෂණ වූ)මෘදුත්වය ‘කායමුදුතා චිත්තමුදුතා’ යි.

11 කාය චිත්ත දෙ දෙනාගේ (දානාදි පින් කම්හි අයොග්‍යතා සංඛ්‍යාත කාමච්ඡන්දාදි කෙලෙස් සංසිඳීම් ලක්ෂණ වූ) කම්හියෙහි යොග්‍යත්වය ‘කායකම්මඤ්ඤතා චිත්තකම්මඤ්ඤතා’යි.

12 කාය චිත්ත දෙ දෙනාගේ (ගිලන් බව යයි කියන ලද අශ්‍රද්ධාදීන් සංසිඳීම් ලක්ෂණ වූ)ප්‍රගුණත්වය ‘කායපාගුඤ්ඤතා චිත්තපාගුඤ්ඤතා’ යි.

13 කාය චිත්ත දෙ දෙනාගේ (කුටිල භාව සංඛ්‍යාත මායාදීන් සංසිඳීම් ලක්ෂණ වූ) ඍජු භාවය ‘කායුජ්ජුකතා චිත්තුජ්ජුකතා’ යි.

---

*කාය යන්නෙන් වෙදනාදි ස්කන්ධත්‍රයය ද චිත්ත යන්නෙන් විඥානස්කන්ධය ද ගත යුතු බව දත යුතු.

සම්මාවාචා සම්මාකම්මන්තො සම්මාආජීවො චෙති තිස්සො විරතියො නාම.

කරුණා මුදිතා අප්පමඤ්ඤායො නාමාති සබ්බථාපි පඤ්ඤින්ද්‍රියෙන සද්ධිං පඤ්චවීසතිමෙ චෙතසිකා සොභනාති වෙදිතබ්බා.
එත්තාවතා ච.

තෙරසඤ්ඤසමානා ච චුද්දසාකුසලා තථා
සොභනා පඤ්චවීසාති ද්විපඤ්ඤාස පවුච්චරෙ.

තෙසං චිත්තාවියුත්තානං යථායොගමිතො පරං
චිත්තුප්පාදෙසු පච්චෙකං සම්පයොගො පවුච්චති.

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 8 | විරති චෛතසිකයෝ කොතෙක් ද? | (¹සම්‍යක් වචනය ²සම්‍යක් කර්මාන්තය ³සම්‍යක් ආජීවය යන) තුනයි* |
| 9 | අප්‍රමාණ්‍ය චෛතසික කොතෙක් ද? | (කරුණා ය මුදිතා යි) දෙකෙකි. |
| 10 | ශෝභන චෛතසික කොතෙක් ද? | (එකුන්විසි ශෝභන සාධාරණයෝ ද විරති තුන ද අප්‍රමාණ්‍යද්වයය ද ප්‍රඥ වදි ද යන) පස් විස්ස යි. |
| 11 | සියලු චෛතසිකයෝ කොතෙක් ද? | (අන්‍ය සමාන තෙළෙස ය තුදුස් අකුසල ය පස්විසි ශෝභන ය යන) දෙපනසෙකි. |

1 මුසාවාදාදි වූ චතුර්විධ වාග්දුශ්චරිතයෙන් වැළැක්ම 'සම්‍යක් වචන' යි.

2 ප්‍රාණවධාදි ත්‍රිවිධ දුශ්චරිතයෙන් වැළැක්ම 'සම්‍යක් කර්මාන්ත' යි.

3 මිථ්‍යා ආජීවයෙන් පහවීම 'සම්‍යක් ආජීව' යි.

* මුසාවාද වෙරමණී යනාදි වශයෙන් ඒ ඒ ශික්ෂාපද සමාදන්වන කල සමාදාන විරති ය ද, ප්‍රාණවධාදියක් කිරීමට පැමිණි තන්හි එය නොකොට වැළැක්ම සම්පත්තවිරති ය ද ලෝකෝත්තර සිත්හි මුසාවාදාදීන් සමුච්ඡේදනය කල සමුච්ඡේදවිරති ය ද යන විරති තෙවැදෑරුම සැලැකිය යුතු.

§ සංඥා හොත් නිලාදිය හැඳිනීම මාත්‍රයක් ද, විඥානය හැඳිනීම සහ ලක්ෂණාවබෝධය ද, ප්‍රඥා, වනාහි හැඳිනීම ලක්ෂණාවබෝධ කිරීම සහ මාර්ගාදීන්ට පැමිණ වීම ද යොදා යුතු බැවින් 'සංඥා' 'විඥාන' 'ප්‍රඥා' යන තුන් දෙනාගේ වෙනස් අවබෝධ කට යුතු.

සත්තා සබ්බත්ථ යුජ්ජන්ති යථා යෝගං පකිණ්ණකා
චුද්දසාකුසලෙසේව සෝභණෙසේව සෝභණා.

කථං:-සබ්බචිත්තසාධාරණා තාව සත්තිමෙ චෙතසිකා සබ්බෙසුපි එකූනනවුති චිත්තුප්පාදෙසු ලබ්භන්ති, පකිණ්ණකෙසු පන විතක්කො තාව ද්විපඤ්චවිඤ්ඤාණවජ්ජිත කාමාවචර චිත්තෙසුචෙව එකාදසසු පඨමජ්ඣානචිත්තෙසු චෙති පඤ්චපඤ්ඤාස චිත්තෙසු උප්පජ්ජති.

| | ප්‍රශ්න | | උත්තර |
|---|---|---|---|
| 12 | දෙපනස් චෛතසිකයෝ කොතෙක් ප්‍රකාරව යෙදෙද්ද? | | සර්වචිත්ත සාධාරණ සත සියලු සිත්හි ද, විතර්කාදි ප්‍රකීර්ණක සය සුදුසු පරිද්දෙන් ද, අකුසල චෛතසික තුදුස දොළොස් අකුසල් සිත්හි ද, පස්විසි ශෝභනයෝ එකුන්සැටක් ශෝභන සිත්හි ද යන ) සතරාකාරයකින් යෙදෙත්. |
| 13 | විතර්කය කොතෙක් සිත්හි උපදී ද? | | (අකුසල් සිත් දොළොසෙහි ද ද්විපඤ්ච විඤ්ඤාණය‡ හැර අහේතුක අටෙහි ද කාමාවචර කුසලාදි සූවිසි සිත්හි ද ප්‍රථමධ්‍යාන එකොළොස් සිත්හි ද යන) පනස් පසෙක්හි උපදී. |
| 14 | විතර්ක චෛතසිකය කොතෙක් සිත්හි නූපදී ද? | | (ද්විපඤ්ච විඤ්ඤාණයෙහි ද ප්‍රථමධ්‍යානය හැර රූපාවචර සිත් දොළොසෙහි ද ප්‍රථමධ්‍යාන ලෝකෝත්තර සිත් අට හැර සෙසු දෙතිස් සිත්හි ද යන සැට සයක් සිත්හි නූපදී. |
| 15 | විචාර චෛතසිකය කොතෙක් සිත්හි උපදී ද? | | විතර්කය උපදින සිත් පනස්පසෙහි ද ද්විතීය ධ්‍යාන සිත් එකොළොසෙහි ද යන)සැට සයක් සිත්හි උපදී. |
| 16 | විචාර චෛතසිකය කොතෙක් සිත්හි නූපදී ද? | | ද්විපඤ්ච විඤ්ඤාණයෙහි ද ප්‍රථම ද්විතීය ධ්‍යාන හැර රූපාවචර සිත්හි ද අරූපාවචර දොළොසෙහි ද ලෝකෝත්තර ප්‍රථම ද්විතීය ධ්‍යාන සිත් සොළොස හැර ඉතිරි සූවිසි සිත්හි ද යන) සිත් පස් පනසෙහි නූපදී. |

‡අකුසල විපාක කුසල විපාක චක්ඛුවිඤ්ඤාණාදී පංචවිධ ප්‍රභේදය ද්විපඤ්ච විඤ්ඤාණයි.

විචාරො පන තෙසුචෙව එකාදසසු දුතියජ්ඣාන චිත්තෙසුචාති ඡසට්ඨිචිත්තෙසු, අධිමොක්ඛො ද්විපඤ්චවිඤ්ඤාණ විචිකිච්ඡා සහගත වජ්ජිත චිත්තෙසු, විරියං පඤ්චද්වාරාවජ්ජන ද්විපඤ්චවිඤ්ඤාණ සම්පටිච්ඡනසන්තීරණවජ්ජිත චිත්තෙසු, පීති දොමනස්සුපෙක්ඛා සහගත කායවිඤ්ඤාණ චතුත්ථජ්ඣානවජ්ජිත චිත්තෙසු ඡන්දො අහෙතුක මොමූහවජ්ජිත චිත්තෙසු චාති. තෙ පන චිත්තුප්පාද යථාක්කමං.

ඡසට්ඨි පඤ්ච පඤ්ඤාස එකා දස ච සොළස
සත්තති වීසති චෙව පකිණ්ණක විවජ්ජිතා.

---

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 17 | අධිමොක්ෂ චෛතසිකය කොතෙක් සිත්හි උපදී ද? | (විචිකිත්සාසම්ප්‍රයුක්ත සිත හැර එකොළොස් අකුසල් සිත්හි ද, ද්විපඤ්චවිඤ්ඤාණය හැර අහේතුක සිත් අටෙහි ද, සහේතුක කාමාවචර සූවිසි සිත්හි ද, පසළොස් රූපාවචර දෙළොස් අරූපාවචර සිත්හි ද යන) සැත්තෑඅටෙක්හි උපදී. |
| 18 | අධිමොක්ෂ චෛතසිකය කොතෙක් සිත්හි නූපදී ද? | (විචිකිත්සාසම්ප්‍රයුක්ත සිත්හි ද, ද්විපඤ්චවිඤ්ඤාණයෙහි ද යන) එකොළොසෙක්හි නූපදී. |
| 19 | වීර්ය්‍ය චෛතසිකය කොතෙක් සිත්හි උපදී ද? | (දොළොස් අකුසල් සිත්හි ද, මනෝද්වාරාවජ්ජන හසිතුප්පාද දෙ සිත්හි ද, සහේතුක කාමාවචර සූවිසි සිත්හි ද, පසළොස් රූපාවචර දොළොස් අරූපාවචර සිත්හි ද, ලොකොත්තර අට සිත්හි දැයි යන) සිත් සැත්තෑතුනෙක්හි උපදී. |
| 20 | වීර්ය්‍ය චෛතසිකය කොතෙක් සිත්හි නූපදී ද? | (මනොද්වාරාවජ්ජන හසිතුප්පාදද්වය හැර සෙසු අහේතුක) සොළොසෙහි නූපදී. |
| 21 | ප්‍රීති චෛතසිකය කොතෙක් සිත්හි උපදී ද? | (සොමනස්ස සහගත ලෝභ සිත් සතරෙහි ද, සොමනස්ස සහගත සන්තීරණ හසිතුප්පාද දෙ සිත්හි ද, සොමනස්ස සහගත සහේතුක කාමාවචර සිත් දොළොසෙහි ද, ප්‍රථම ද්විතීය තෘතීය ධ්‍යාන තෙතිස් සිත්හි ද යන) එක්පනස් සිත්හි උපදී. |
| 22 | ප්‍රීති චෛතසිකය කොතෙක් සිත්හි නූපදී ද? | (උපෙක්ෂා සම්ප්‍රයුක්ත ප්‍රතිඝ සම්ප්‍රයුක්ත අකුසල් සිත් අටෙහි ද, සොමනස්ස සහගත සන්තීරණ හසිතුප්පාද දෙ සිත හැර අහේතුක සොළොස් සිත්හි ද, උපෙක්ඛා සහගත සහේතුක කාමාවචර දොළොස් සිත්හි ද, චතුර්ථධ්‍යාන එකොළොස් සිත්හි ද, පඤ්චමධ්‍යාන තෙවිසි සිත්හි ද යන) සැත්තෑ සිතෙක්හි නූපදී. |

පඤ්චපඤ්ඤාස ඡ සට්ඨි අට්ඨසත්තති තිසත්තති
එකපඤ්ඤාසචෙකූන සත්තතිස පකිණ්ණකා.

අකුසලෙසු පන මොහො අහිරිකං අනොත්තප්පං උද්ධච්චං චාති චත්තාරොමෙ චෙතසිකා සබ්බාකුසල සාධාරණා නාම, සබ්බෙසුපි ද්වාදසාකුසලෙසු ලබ්භන්ති. ලොභො අට්ඨසු ලොභ සහගත චිත්තෙසෙව ලබ්භති. දිට්ඨි චතූසු දිට්ඨි ගත සම්පයුත්තෙසු, මානො චතූසු දිට්ඨි ගත විප්පයුත්තෙසු.

දොසො ඉස්සා මච්ඡරියං කුක්කුච්චඤ්චාති ද්වීසු පටිඝසම්පයුත්ත චිත්තෙසු, ථිනමිද්ධං පඤ්චසු සසංඛාරික චිත්තෙසු, විචිකිච්ඡා විචිකිච්ඡා සහගත චිත්තෙ යෙවාති.

---

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 23 | ඡන්ද චෛතසිකය කොතෙක් සිත්හි උපදී ද? | (මොමූහද්වය යහැර අකුසල් සිත් දසයෙහි ද, සහෙතුක කාමාවචර සූවිසි සිත්හි ද, රූපාවචර අරූපාවචර ලොකොත්තර පන්තිස් මහග්ගත සිත්හි ද යන) එකුන් සැත්තෑවෙක්හි උපදී. |
| 24 | ඡන්ද චෛතසිකය කොතෙක් සිත්හි නූපදී ද? | මොමූහද්වයයෙහි ද අහෙතුක දස අටෙහි ද යන විංශති සිත්හි නූපදී. |
| 25 | සියලු අකුසල් සිත්හි චෛතසික කොතෙක් උපදී ද? | (සියලු අකුසල් සිත්හි මෝහය, අහිරිකය, අනොත්තප්පය, උද්ධච්චය යන) සතරෙක් උපදී. |
| 26 | ලොභ චෛතසිකය කොතෙක් සිත්හි උපදී ද? | ලොභ සහගත සිත් අටෙහි ම උපදී. |
| 27 | දෘෂ්ටිය කොතෙක් සිත්හි උපදී ද? | ලොභ මූලක දෘෂ්ටිසම්ප්‍රයුක්ත සතරෙහි උපදී. |
| 28 | මානය කොතෙක් සිත්හි උපදී ද? | ලොභ මූල දෘෂ්ටිවිප්‍රයුක්ත සතරෙහි උපදී. |
| 29 | ප්‍රතිඝ සිත්හි කොතෙක් අකුසල චෛතසිකයෝ ලැබෙත් ද? | (ප්‍රතිඝ සිත්හි ද්වේෂය ඊර්ෂ්‍යාය මාත්සර්ය්‍යය කුකුසය යන) චෛතසික සතරෙක් ලැබෙත්. |
| 30 | ථිනමිද්ධය කොතෙක් සිත්හි ලැබේ ද? | (ලොභමූල සසංඛාරික සතරය ද්වේෂමූල සසංඛාරික එකය යන) සිත් පසෙක්හි ලැබේ. |

සබ්බාපුඤ්ඤෙසු චත්තාරො ලොභමූලෙ තයො ගතා
දොසමූලෙසු චත්තාරො සසංඛාරෙ ද්වයං තථා.

විචිකිච්ඡා විචිකිච්ඡා චිත්තෙ චාති චතුද්දස
ද්වාදසාකුසලෙස්වෙව සම්පයුජ්ජන්ති පඤ්චධා.

සොභනෙසු පන සොභනසාධාරණා තාව එකූනවීසති මෙ චෙතසිකා සබ්බෙසුපි එකූනසට්ඨි සොභනචිත්තෙසු සංවිජ්ජන්ති. විරතියො පන තිස්සොපි ලොකුත්තරචිත්තෙසු සබ්බථාපි නියතා එකතොව ලබ්භන්ති. ලොකියෙසු පන කාමාවචරකුසලෙස්වෙව කදාචි සන්දිස්සන්ති විසුං විසුං. අප්පමඤ්ඤායො පන ද්වාදසසු පඤ්චමජ්ඣානවජ්ජිත මහග්ගත චිත්තෙසුචෙව කාමාවචර

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 31 | විචිකිච්ඡාව කවර සිත්හි ලැබේ ද? | විචිකිච්ඡාව මෝමූහ විචිකිච්ඡා සහගත චිත්තයෙහි ම ලැබේ. |
| 32 | දොළොස් අකුසල් සිත්හි තුදුස් අකුසල චෛතසිකයෝ කී පරිද්දෙකින් යෙදෙද්ද? | (මෝහය අහිරිකය අනොත්තප්පය උද්ධච්චය යන) සතර සියලු අකුසල් සිත්හි ද ලොභ දිට්ඨි මාන යන තුන ලොභමූලික අටෙහි ද දෝස ඉස්සා මච්ඡරිය යන සතර දෝස මූල දෙ සිත්හි ද ථීන මිද්ධ ද්වය ය සසංඛාරික අකුසල් සිත් පසෙහි ද විචිකිච්ඡාව මෝමූහ විචිකිච්ඡා සිතෙහි දැයි යන ද්වාදස අකුසල සිත්හි) පස් පරිද්දෙකින් යෙදෙත්. |
| 33 | ශ්‍රද්ධාදි ශොභන සාධාරණ චෛතසිකයෝ කොතෙක් සිත්හි පවතිත් ද? | (කාමාවචර කුසල විපාක ක්‍රියා සූවිසි සිත්හි ද එසේම පසළොස් රූපාවචර දොළොස් අරූපාවචර සිත්හි ද ලොකුත්තර සිත් අටෙහි දැයි යන) එකුන් සැටක් ශොභන සිත්හි පවතිත්. |
| 34 | විරති ත්‍රය කවර සිත්හි ලැබේ ද? | විරති තුන එක්ව නියතවම ලොකුත්තර සිත් අටෙහි ලැබෙති.* ලොකිය කාමාවචර කුසල් සිත් අටෙහි ද සමහර කලෙක වෙන් වෙන්ව ලැබෙත්.‡ |

* මුසාවාදාදිය සමුච්ඡෙද වශයෙන් එකාමෙණෙහි වලක්නා හෙයින් විරති ත්‍රය එක්ව නියතව ලැබෙන බව කියන ලදී.

‡ මුසාවාදාදියකින් වලක්නා කලැ හෝ සමාදාන වශයෙන් වලක්නා කලැ හෝ විරති ත්‍රයම නො ලැබෙන බැවින් ඒ ඒ විරතියම වෙන් වෙන්ව ලැබෙන බව දත යුතු.

5-2

කුසලෙසුච සහෙතුක කාමාවචර ක්‍රියා චිත්තෙසුචාති අට්ඨවීසති චිත්තෙසෙව කදාචි නානා හුත්වා ජායන්ති, උපෙක්ඛාසහගතෙසු පනෙත්ථ කරුණා මුදිතා න සන්තීති කෙචි වදන්ති, පඤ්ඤා පන ද්වාදසසු ඤාණසම්පයුත්ත කාමාවචර චිත්තෙසුචෙව සබ්බෙසුපි පඤ්චතිංස මහග්ගත ලොකුත්තර චිත්තෙසුචාති සත්තචත්තාළීස චිත්තෙසු සම්පයොගං ගච්ඡතීති.

එකූනවීසති ධම්මා ජායන්තෙකූනසට්ඨිසු
තයො සොළස චිත්තෙසු අට්ඨවීසතියං ද්වයං.

පඤ්ඤා පකාසිතා සත්ත චත්තාළීස විධෙසුපි
සම්පයුත්තා චතුද්ධෙවං සොභනෙසෙව සොභනා.

ඉස්සා මච්ඡෙර කුක්කුච්ච විරතී කරුණාදයො
නානා කදාචි මානො ච ථීනමිද්ධං තථා සහ.

යථා වුත්තානුසාරෙන සෙසා නියත යොගිනො
සඞ්ගහඤ්ච පවක්ඛාමි තෙසං දානි යථාරහං.

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 35 | කරුණා මුදිතා ද්වය ය කොතෙක් සිත්හි උපදී ද? | (පඤ්චමධ්‍යානය හැර මහග්ගත* සිත් දොළොසෙහි ද කාමාවචර සහෙතුක කුසල ක්‍රියා සිත්හි ද යන) අට විසි සිත්හි (කිසි කලෙක වෙන් වෙන්ව) උපදී. උපෙක්ෂා සහගත සිත්හි නූපදී යයි ද සමහරු කියත්.‡ |
| 36 | ප්‍රඥා චෛතසිකය කොතෙක් සිත්හි උපදී ද? | (ඥාන සම්ප්‍රයුක්ත කාමාවචර සිත් දොළොසෙහි ද පසළොස් රූපාවචරය දොළොස් අරූපාවචරය අට ලොකොත්තරය යන පන්තිස් සිත්හි දැයි යන) සත්සාළිස් සිත්හි උපදී. |
| 37 | පස්විසි ශොභන චෛතසිකයෝ එකුන් සැටක් ශොභන සිත්හි කවර ප්‍රකාරයකින් යෙදෙත් ද? | (එකුන්විසි ශොභන සාධාරණයෝ සියලු ශොභන සිත්හි ද විරති ත්‍රය ය, ලොකොත්තර සිත් අටය, කාමාවචර කුසල් සිත් අටය, යන සොළොස් සිත්හි ද අප්‍රාමාණ්‍ය ද්වය ය ද්වාදස රූපාවචර පඤ්චමධ්‍යානය හැර සහෙතුක කාමාවචර කුසල ක්‍රියා යන අටවිසි සිත්හි ද ප්‍රඥා තොමෝ යථොක්ත සත් සාළිස් සිත්හි දැයි යන) සතර ප්‍රකාරයකින් යෙදෙත්. |

* මහග්ගත යනු රූපාවචර අරූපාවචර චිත්තයනට නාමයකි. මෙහි පඤ්චම ධ්‍යානය හැර යන්නෙන් රූපාවචර සිත් දොළොසම ගැනෙත්.

‡ අභිඥාවෙන් පෙරටුව පරිචය වශයෙන් උපදින හෙයින් උපෙක්ෂා සහගත සිත්හි ද අභිඥා වීථියෙහි සෞමනස්‍ය සහගත සිත්හි ද උපදින බව 'අභිධම්මත්ථ විභාවනියෙහි' කියන ලදී.

ඡත්තිංසානුත්තරෙ ධම්මා පඤ්චතිංස මහග්ගතෙ
අට්ඨතිංසාපි ලබ්භන්ති කාමාවචර සොභණෙ.....

සත්තවීසත්‍යපුඤ්ඤම්හි ද්වාදසාහෙතුකෙති ච
යථා සම්භව යොගෙන පඤ්චධා තත්ථ සඞ්ගහො.....

කථං:- ලොකුත්තරෙසු තාව අට්ඨසු පඨමජ්ඣානික චිත්තෙසු අඤ්ඤසමානා තෙරස චෙතසිකා අප්පමඤ්ඤා වජ්ජිතා තෙවීසති සොභණ චෙතසිකාචෙති ඡත්තිංස ධම්මා සඞ්ගහං ගච්ඡන්ති, තථා දුතියජ්ඣානික චිත්තෙසු විතක්ක වජ්ජා, තතියජ්ඣානික චිත්තෙසු විතක්ක විචාර වජ්ජා, චතුත්ථජ්ඣානික චිත්තෙසු විතක්ක විචාර පීති වජ්ජා, පඤ්චමජ්ඣානික චිත්තෙසු පි උපෙක්ඛා සහගතා තෙ එව සඞ්ගය්හන්තීති, සබ්බථාපි අට්ඨසු ලොකුත්තර චිත්තෙසු පඤ්චක ජ්ඣාන වසෙන පඤ්චධාව සඞ්ගහො හොතීති.....

---

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 38 | අනියත චෛතසික කොතෙක් ද? | (ඊර්ෂ්‍යා ය මාත්සර්‍ය්‍ය ය කුක්කුච්ච ය විරති ත්‍රය ය අප්‍රාමාණ්‍ය ද්වය ය ථීන මිද්ධ ද්වය ය යන) අනියත එකොළොසෙකි. |
| 39 | නියත චෛතසික කොතෙක් ද? | (දෙපනස් චෛතසිකයන් ගෙන් ඊර්ෂ්‍යාදි අනියත එකොළොස හැර සෙසු) නියත චෛතසික එක් සාළිසෙකි. |
| 40 | ලෝකෝත්තර ප්‍රථම ධ්‍යාන සිත් අටෙහි කොතෙක් චෛතසික යෙදෙත් ද? | (සර්වචිත්ත සාධාරණ සත ද ප්‍රකීර්ණක සය ද අප්‍රාමාණ්‍ය ද්වය ය හැර තෙවිසි ශෝභනයෝ ද යන) සතිසෙක් යෙදෙත්. |
| 41 | ද්විතීයධ්‍යාන අටෙහි චෛතසික කොතෙක් යෙදෙත් ද? | (විතර්කය හැර දොළොස් අන්‍යසමානයෝ ද අප්‍රාමාණ්‍ය ද්වය ය හැර තෙවිසි ශෝභනයෝ ද යන) පන්තිසෙක් යෙදෙත්. |
| 42 | තෘතීයධ්‍යාන අටෙහි චෛතසික කොතෙක් ද? | විතර්ක විචාර ද්වය ය හැර එකාදස අන්‍ය සමානයෝ ද අප්‍රාමාණ්‍ය ද්වය ය හැර තෙවිසි ශෝභනයෝ ද යන) සූතිසෙකි. |
| 43 | චතුර්ථධ්‍යාන අටෙහි චෛතසික කොතෙක් ද? | (විතර්ක විචාර ප්‍රීති තුන හැර අන්‍ය සමාන දසය ද අප්‍රාමාණ්‍ය ද්වය ය හැර තෙවිසි ශෝභනයෝ ද යන තෙතිසෙකි. |
| 44 | පඤ්චමධ්‍යාන අටෙහි චෛතසික කොතෙක් යෙදෙත් ද? | පඤ්චමධ්‍යාන සිත් අටෙහි ද චතුර්ථ ධ්‍යානයට කියන ලද තෙතිස්සම උපෙක්ෂා සහගතව යෙදෙත්. |

ඡත්තිංස පඤ්චතිංසාච චතුත්තිංස යථාක්කමං
තෙත්තිංස ද්වයමිච්චෙවං පඤ්චධානුත්තරෙ ඨිතා.

මහග්ගතෙසු පන තීසු පඨමජ්ඣානික චිත්තෙසු තාව අඤ්ඤසමානා තෙරසචෙතසිකා විරතිත්තයවජ්ජිතා ද්වාවීසති සොභනචෙතසිකාචෙති පඤ්චතිංස ධම්මා සඞ්ගහං ගච්ඡන්ති, කරුණාමුදිතා පනෙත්ථ පච්චෙකමෙව යොජෙතබ්බා, තථා දුතියජ්ඣානික චිත්තෙසු විතක්කවජ්ජා, තතියජ්ඣානික චිත්තෙසු විතක්ක විචාර වජ්ජා, චතුත්ථජ්ඣානික චිත්තෙසු විතක්ක විචාර පීති වජ්ජා, පඤ්චමජ්ඣානික චිත්තෙසු පන පණ්ණරසසු අප්පමඤ්ඤායො න ලබ්භන්තීති සබ්බථාපි සත්තවීසති මහග්ගත චිත්තෙසු පඤ්චක ජ්ඣාන වසෙන පඤ්චධාව සඞ්ගහො හොතීති.

---

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 45 | ලෝකෝත්තර අටෙහි චෛතසිකයෝ කවර ප්‍රකාරයකින් යෙදෙත් ද? | (සපත්‍රිංශාදි සතිසෙක, ද්වාදශ අන්‍යසමානාදි පන්තිසෙක, එකාදශ අන්‍යසමානාදි සූතිසෙක, අන්‍යසමාන දශය යනාදි තෙතිසෙක නැවත එසේම තෙතිසෙකැයි යථොක්ත) පස් ප්‍රකාරයකින් යෙදෙත්. |
| 46 | ප්‍රථමධ්‍යාන මහද්ගත සිත් තුනෙහි කොතෙක් චෛතසික යෙදෙත් ද? | අන්‍යසමාන තෙළෙස ද විරතිද්වය ය හැර දෙවිසි ශොභනයෝ ද යන පන්තිස් චෛතසිකයෝ යෙදෙති.* |
| 47 | ද්විතීයධ්‍යාන මහද්ගත සිත්හි කොතෙක් චෛතසික යෙදෙත් ද? | (විතර්කය හැර අන්‍යසමාන දොළොස ද විරති ත්‍රය ය හැර දෙවිසි ශොභනයෝ ද) යන සූතිසෙක් යෙදෙත්. |
| 48 | තෘතීයධ්‍යාන මහද්ගත සිත්හි කොතෙක් චෛතසික යෙදෙත් ද? | (විතර්ක විචාර ද්වය ය හැර අන්‍ය සමාන එකොළොස ද විරති ත්‍රය ය හැර දෙ විසි ශොභනයෝ ද යන) තෙතිසෙක් යෙදෙත්. |
| 49 | චතුර්ථධ්‍යාන මහද්ගත සිත්හි කොතෙක් චෛතසික යෙදෙත් ද? | (විතර්ක විචාර ප්‍රීති ත්‍රය ය හැර අන්‍ය සමාන සය ද විරති ත්‍රය ය හැර දෙ විසි සොභනයෝ ද යන) දෙතිසෙක් යෙදෙත්. |
| 50 | පඤ්චමධ්‍යාන පස ලොස් රූ අරූසිත්හි කොතෙක් චෛතසික යෙදෙත් ද? | (විතර්ක විචාර ප්‍රීති ත්‍රය ය හැර අන්‍ය සමාන දශය ද විරති සහ අප්‍රමාණ්‍ය ද්වය ය ද හැර විංශති ශොභනයෝ ද යන) සම තිස් චෛතසිකයෝ යෙදෙත්. |

* කරුණා මුදිතා දෙදෙනා පඤ්චමධ්‍යානිකමහද්ගත සිත් හැර සෙසු මහද්ගත සිත්හි යෙදෙති. මෙහි පන්තිසෙක යනාදි වශයෙන් සංඛ්‍යා පුරූ කලෝ යළින් වෙන් වෙන්වූ උපදින බව ද කියන ලදි. එහෙයින් යෙදෙන කලැ එක් චෛතසිකයක් ඌනව පන්තිස් යන්නාට සූතිස් යනාදි වශයෙන් සංඛ්‍යා කට යුතු.

පඤ්චතිංස චතුත්තිංස තෙත්තිංස ච යථාක්කමං
බත්තිංසචෙව තිංසෙති පඤ්චධාව මහග්ගතෙ.

කාමාවචර සොභණෙසු පන කුසලෙසු තාව පඨමද්වයෙ අඤ්ඤසමානා තෙරස චෙතසිකා පඤ්චවීසති සොභණ චෙතසිකාචෙති අට්ඨතිංස ධම්මා සඞ්ගහං ගච්ඡන්ති, අප්පමඤ්ඤා විරතියො පනෙත්ථ පඤ්චපි පච්චෙකමෙව යොජෙතබ්බා, තථා දුතියද්වයෙ ඤාණ වජ්ජිතා, තතියද්වයෙ ඤාණ සම්පයුත්තා පීති වජ්ජිතා, චතුත්ථද්වයෙ ඤාණ පීති වජ්ජිතා තෙ එව සඞ්ගය්හන්ති, ක්‍රියා චිත්තෙසුපි විරති වජ්ජිතා තථෙව චතූසුපි දුකෙසු චතුධාව සඞ්ගය්හන්ති, තථාවිපාකෙසුච අප්පමඤ්ඤා විරති වජ්ජිතා තෙ එව සඞ්ගය්හන්තීති, සබ්බථාපි චතුවීසති කාමාවචර සොභණ චිත්තෙසු දුකවසෙන ද්වාදසධාව සඞ්ගහො හොතීති.

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 51 | මහග්ගත සිත්හි චෛතසිකයෝ කොතෙක් ප්‍රකාරයකින් යෙදෙත් ද? | (පන්තිසක, සූතිසක, තෙතිසක, දෙතිසක, තිසකැයි යථොක්ත ක්‍රමයෙන්) පස් ප්‍රකාරයකින් යෙදෙත්. |
| 52 | කාමාවචර කුශලයන් අතුරෙන් ප්‍රථම කුසල් සිත් දෙකෙහි කොතෙක් චෛතසික යෙදෙත් ද? | (ස්පර්ශාදි අන්‍යසමාන තෙළෙස ද ශ්‍රද්ධාදි පස්විසි ශොභනයෝ ද) යන අටතිසෙක් යෙදෙත්.‡ අප්‍රාමාණ්‍ය ද්වයය ද විරති ත්‍රයය ද වෙන වෙනම යෙදිය යුතු. |
| 53 | දෙවෙනි කුසල් සිත් දෙකෙහි කොතෙක් චෛතසික යෙදෙත් ද? | අන්‍යසමාන තෙළෙස ද ඥානය හැර සූවිසි ශොභනයෝ ද යන) සත්තිසෙක් යෙදෙත්. |
| 54 | තුන්වැනි කුසල් සිත් දෙකෙහි කොතෙක් චෛතසික යෙදෙත් ද? | (අන්‍යසමාන තෙළෙස ද ප්‍රීතිය හැර ඥානයෙන් යුත් සූවිසි ශොභනයෝ ද යන) සත් තිසෙක් යෙදෙත්. |
| 55 | සතරවැනි කුසල් සිත් දෙකෙහි කොතෙක් චෛතසික යෙදෙත් ද? | (අන්‍යසමාන තෙළෙස ද ඥාන ප්‍රීති ද්වයය හැර තෙවිසි ශොභනයෝ ද යන) සතිසෙක් යෙදෙත්. |
| 56 | සහෙතුක ක්‍රියා සිත් අටෙහි චෛතසික කොතෙක් ප්‍රකාරයකින් යෙදෙත් ද? | (විරති ත්‍රයය හැර කුසල් සිත්හි යෙදුණු සෙසු චෛතසිකයෝ පන්තිසක, සූතිස, සූතිස දෙකෙක, තෙතිසැයි) සතර ප්‍රකාරයකින් යෙදෙත්. |

‡ කරුණා මුදිතා දෙදෙන සත්වයන් අරමුණු කොට පවත්නා හෙයින් ද විරතීහු තමන් තමන් විසින් ව්‍යතික්‍රමණය කට යුතු වස්තු විෂය කොට ඇති හෙයින් ද ඔවුන්ගේ ඉපැදීම එක් සිතෙක්හි නො ලැබෙන හෙයින් වෙන වෙනම යෙදිය යුතු යයි කියන ලදි.

අට්ඨතිංස සත්තතිංස ද්වයං ඡත්තිංසකං සුභෙ
පඤ්චතිංස චතුත්තිංස ද්වයං තෙත්තිංසකං ක්‍රියෙ॥

තෙත්තිංස පාකෙ බත්තිංස ද්වයෙක තිංසකං භවෙ
සහෙතුකාමාවචර පුඤ්ඤපාක ක්‍රියා මනෙ॥

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 57 | සහේතුක විපාක සිත්හි චෛතසිකයෝ කොතෙක් ප්‍රකාරයකින් යෙදෙත් ද? | (අන්‍යසමාන තෙළෙස ද අප්‍රමාණ්‍ය ද්වයය සමග විරති ත්‍රයය හැර විංශති ශෝභනයෝ ද යන චෛතසිකයෝ තෙතිසෙක, දෙතිස් දෙකෙක, එක් තිසෙකැයි ක්‍රියා සිත්හි මෙන් සතර ප්‍රකාරයකින් යෙදෙත්. |
| 58 | සහේතුක ක්‍රියා සිත්හි විරතීහු කුමක් හෙයින් නූපදී ද? | ලෞකික විරතීහු ඒකාන්ත කුශල ස්වභාව හෙයින් කුසල් සිත්හි විනා කෙලෙස් මුල් සුන් නිකෙලෙශී සන්තානයෙහි උපදනා වූ අව්‍යාකෘත ක්‍රියා සිත්හි නූපදී. |
| 59 | මහද්ගත සිත්හි විරතීහු කුමක් හෙයින් නූපදී ද? | විරතීහු වනාහි මිථ්‍යා කර්මාන්තාදීන්ගේ ව්‍යතික්‍රමණ අවස්ථායෙහි සහේතුක කුසල් සිත්හි ද සානුශයාවස්ථායෙහි ඒ අනුශය ප්‍රහීණ කරන ලෝකෝත්තර සිත්හි ද උපදින හෙයින් පර්‍ය්‍යුත්ථාන අවස්ථාවක් නැත්තෙන් මහද්ගත සිත්හි නූපදී* |
| 60 | අප්‍රමාණ්‍යයෝ කුමක් හෙයින් ලෝකෝත්තර සිත්හි නූපදනාහු ද? | කරුණා මුදිතා යන අප්‍රමාණ්‍ය චෛතසිකයෝ නානාලම්බණික හෙයින් ලෝකෝත්තර සිත්හි නූපදනාහුය. |
| 61 | කාමාවචර විපාක සිත්හි අප්‍රමාණ්‍ය විරතීහු කුමක් හෙයින් නූපදනාහු ද? | අප්‍රමාණ්‍යයෝ වනාහි සත්ත්වයන් අරමුණු කොට පැවැති බැවින් ඒකාන්ත පරිත්තාරම්මණ වූ කාම විපාක සිත්හි නූපදිති. විරතීහු ද ඒකාන්ත කුශල ස්වභාව හෙයින් විපාක සිත්හි නූපදිත්. |

* ප්‍රාණඝාතාදි දුශ්චරිත කිරීමට පැමිණි තැනෙක්හි වැළැකීම හෝ 'පාණාතිපාතා වෙරමණී' යනාදි වශයෙන් සමාදන්ව වැළැකීම හෝ ව්‍යතික්‍රමණ අවස්ථාව වේ. ඒ අවස්ථායෙහි කාමාවචර කුසල් සිත්හි ම උපදී. රාගාදි කෙලෙස් ඇති පෘථග්ජන සන්තානයෙහි සිත එක්වැ සයනය කිරීම අනුශය අවස්ථාව වේ. අනුශය ප්‍රහීණ කරන කල ලෝකෝත්තර සිත්හි ම උපදී. මෙම ව්‍යතික්‍රමණ අනුශය අවස්ථා දෙකෙන් මිදුණු තැනී සිටීම යයි කියන ලද පර්‍ය්‍යුත්ථාන අවස්ථාවක් නැති හෙයින් කාමාවචර රූපාවචර මහද්ගත සිත්හි නූපදී. යනු මෙහි අභිප්‍රාය යි.

න විජ්ජන්තෙත්ථ විරතී ක්‍රියාසු ච මහග්ගතෙ
අනුත්තරෙ අප්පමඤ්ඤා කාමපාකෙ ද්වයං තථා.

අනුත්තරෙ ඣානධම්මා අප්පමඤ්ඤා ච මජ්ඣිමෙ
විරතී ඤාණ පීති ච පරිත්තෙසු විසෙසකා.

අකුසලෙසු පන ලොභමූලෙසු තාව පඨමෙ අසඞ්ඛාරිකෙ අඤ්ඤසමානා තෙරස චෙතසිකා අකුසලසාධාරණා චත්තාරො චාති සත්තරස ලොභදිට්ඨීහි සද්ධිං එකූනවීසති ධම්මා සඞ්ගහං ගච්ඡන්ති, තථෙව දුතියෙ අසඞ්ඛාරිකෙ ලොභමානෙන, තතියෙ තථෙව පීතිවජ්ජිතා ලොභදිට්ඨීහි සහ අට්ඨාරස, චතුත්ථෙ තථෙව ලොභමානෙන, පඤ්චමෙ පන පටිඝසම්පයුත්තෙ අසඞ්ඛාරිකෙ දොසො ඉස්සා

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 62 | ලෝකෝත්තර මහද්ගත සහේතුක කාමාවචර සිත් හෙද කරන්නා වූ විශෙෂ කාරක ධර්මයෝ කවරහු ද? | ලෝකෝත්තර සිත්හි විතර්ක විචාරාදි පඤ්චමධ්‍යාන ධර්මයෝ ද මහද්ගත සිත්හි අප්‍රාමාණ්‍යද්වය ය සමග විතර්කාදි ධ්‍යාන ධර්මයෝ ද කාමාවචර කුසල විපාක ක්‍රියා සිත්හි විරති ඥාන ප්‍රීති අප්‍රාමාණ්‍යද්වය ය යන මේ ධර්මයෝ දෙලොස් දෙන ද ඒ ඒ සිත් වෙසෙසන හෙයින් විශෙෂ කාරක ධර්මයෝ වෙත්. |
| 63 | ලෝභමූල පළමුවන දෙවන අසංස්කාරික දෙ සිත්හි චෛතසික කොතෙක් වෙත් ද?* | (ලෝභ දෘෂ්ටි දෙක සමග අන්‍ය සමාන තෙළෙස ද අකුසල සාධාරණ මෝහාදි සතර ද යන එකුන් විසි චෛතසිකයෝ පළමුවැනි අසංස්කාරික සිත්හි ද, එසේ ම දෘෂ්ටිය හැර ලෝභ මාන දෙක සමග එකුන්විසි චෛතසිකයෝ දෙවන අසංස්කාරික සිත්හි දැයි මෙසේ) එකුන්විසි එකුන් විසි චෛතසිකයෝ වෙති. |
| 64 | ලෝභමූල තුන්වැනි සතරවැනි අසංස්කාරික සිත්හි චෛතසික කොතෙක් වෙත් ද? | (ප්‍රීතිය හැර අන්‍යසමාන දොළොස ද අකුසල සාධාරණ සතර ද ලෝභ දෘෂ්ටි දෙක ද යන දසඅටෙක් තුන්වැනි අසංස්කාරික සිත්හි ද, සතර වැනි සිත්හි දෘෂ්ටිය හැර මානය සමග එසේම දසඅටෙක් දැයි මෙසේ) දසඅට දසඅට චෛතසිකයෝ වෙති. |

* ඒ ඒ කාර්‍ය්‍යයන්හි නියුක්ත සිතකට අනුබල දීම් වශයෙන් තමාගේ හෝ අනුන්ගේ හෝ පැවැති පූර්ව ප්‍රයෝගයක් නැත්තේ 'අසඞ්ඛාරික' යි. පළමු උපන් සිතට අනුබල දීමක් හෝ අන්‍යයකුගේ පෙළඹවීමක් හෝ නැතිවැ කිරීමය යන අභිප්‍රාය යි.

මච්ඡරියං කුක්කුච්චඤ්චාති චතූහි සද්ධිං තෙ එව වීසති ධම්මා සඞ්ගය්හන්ති, ඉස්සාමච්ඡරියකුක්කුච්චානි පනෙත්ථ පච්චෙකමෙව යොජෙතබ්බානි.

සසඞ්ඛාරිකපඤ්චකෙපි තථෙව ථිනමිද්ධෙන විසෙසෙත්වා යොජෙතබ්බා, ඡන්දපීතිවජ්ජිතා පන අඤ්ඤසමානා එකාදස අකුසලසාධාරණා චත්තාරො චාති පණ්ණරස ධම්මා උද්ධච්චසහගතෙ සම්පයුජ්ජන්ති, විචිකිච්ඡාසහගතචිත්තෙ ච අධිමොක්ඛවිරහිතා විචිකිච්ඡාසහගතා තථෙව පණ්ණරස ධම්මා සමුපලබ්භන්තීති සබ්බථාපි ද්වාදසාකුසලචිත්තුප්පාදෙසු පච්චෙකං යොජියමානාපි ගණනවසෙන සත්තධාව සඞ්ගහිතා භවන්තීති.

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 65 | ද්වෙෂමූල අසංස්කාරික සිත්හි චෛතසික කොතෙක් යෙදෙත් ද? | (ද්වෙෂ ඊර්ෂ්‍යා මාත්සර්‍ය කෞකෘත්‍ය යන සතර ද ප්‍රීතිය හැර අන්‍යසමාන දොළොස ද අකුසල සාධාරණ සතර ද යන) විංශති චෛතසිකයෝ වෙති. (ඊර්ෂ්‍යා කෞකෘත්‍යයෝ වෙන වෙන ම යෙදිය යුත්තාහ.) ‡ |
| 66 | ලොභමූල ප්‍රථම ද්විතීය සසංස්කාරික *සිත්හි චෛතසික කොතෙක් ද? | (ප්‍රථම ද්විතීය සසංස්කාරික සිත්හි යෙදුණු එකුන්විස්ස ද ථිනමිද්ධ ද්වය ය ද යන) එක්විස්සෙක් වේ. |
| 67 | තෘතීය චතුර්ථ සසංස්කාරික චිත්තයන්හි චෛතසික කොතෙක් ද? | (තෙවන සතරවන අසංස්කාරික සිත්හි යෙදුණු දසඅට ද ථිනමිද්ධ දෙදෙනා ද යන) විංශතියෙක් වේ. |
| 68 | ද්වෙෂ මූල සසංස්කාරික සිත්හි චෛතසික කොතෙක් ද? | (ද්වෙෂ මූල අසංස්කාරික සිත්හි යෙදුණු විස්ස ද ථිනමිද්ධ ද්වය ය ද යන) දෙවිස්සෙක් වේ. |

‡ ඊර්ෂ්‍යා චෛතසිකය යෙදෙන කල්හි මාත්සර්‍ය කෞකෘත්‍යද්වය ය නො යෙදේ. මාත්සර්‍යය යෙදෙන කල ද කෞකෘත්‍යය යෙදෙන කල ද එසේම අනිකුදු චෛතසික ද්වය ය නො යෙදේ. කුමක් හෙයින් ද භින්නාලම්බනික හෙයිනි. ඊර්ෂ්‍යාදීනු නැවෙන ස්වභාව හෙයින් ද්වෙෂමූල සිත්හි ම ඒ ඒ අරමුණු වශයෙන් යෙදිය යුතු.

* තමා විසින් හෝ අන්‍යයකු විසින් හෝ සිතට අනුබල දීමක් ඇතිව ප්‍රාණඝාතාදියක් කරන කල්හි සසංස්කාරික යි. මෙය කුසල් පක්ෂයෙහි ද ලැබේ. 'දෙව' යනාදි අන්‍යයකුගේ මෙහෙයීමක් හෝ පසුබට සිතක් හෝ ඇතිව දනාදි උත්සාහ කොට් නම් ඒ සසංස්කාරික කුශලය වේ. මෙහෙයීම් අනුබල දීම නැතිව සිත උපන් කෙණෙහි කෙරේ නම් ඒ අසංස්කාරික කුශලය වේ. මේ සසංස්කාරික අසංස්කාරික භේදය ත්‍රිකායාංගේ ඉතා සියුම් වෙනසකි.

එකූනවීසට්ඨාරස වීසෙකවීස වීසති
ද්වාවීස පණ්ණරසෙති සත්තධා කුසලෙ ඨිතා.

සාධාරණා ච චත්තාරො සමානා ච දසාපරෙ
චුද්දසෙතෙ පවුච්චන්ති සබ්බාකුසලයොගිනො.

අහෙතුකෙසු පන හසනචිත්තෙ තාව ඡන්දවජ්ජිතා අඤ්ඤසමානා ද්වාදස ධම්මා සඞ්ගහං ගච්ඡන්ති, තථා වොට්ඨපනෙ ඡන්ද පීති වජ්ජිතා, සුඛසන්තීරණෙ ඡන්ද විරිය වජ්ජිතා, මනොධාතුත්තිකාහෙතුක පටිසන්ධියුගලෙ ඡන්ද පීති විරිය වජ්ජිතා, ද්විපඤ්චවිඤ්ඤාණෙ පකිණ්ණක වජ්ජිතා තෙයෙව සඞ්ගය්හන්තීති, සබ්බථාපි අට්ඨාරස අහෙතුකෙසු ගණන වසෙන චතුධාව සඞ්ගහො හොතීති.

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 69 | මොහ මූල උද්ධච්ච සිත්හි චෛතසික කොතෙක් ද? | (ඡන්ද ප්‍රීති දෙක හැර අන්‍යසමාන එකොළොස ද අකුසල සාධාරණ සතර ද යන) පසළොසෙකි. |
| 70 | විචිකිච්ඡා සිත්හි චෛතසික කොතෙක් ද? | (ඡන්ද ප්‍රීති අධිමොක්ෂ ත්‍රය ය හැර අන්‍ය සමාන දසය ද අකුසල සාධාරණ සතර ද විචිකිච්ඡාව ද යන) පසළොසෙකි. |
| 71 | අකුසල සිත්හි යෙදුණු චෛතසික සංඛ්‍යා වශයෙන් කොතෙක් ප්‍රකාර ද? | (එකුන්විස්සෙක, දසඅටෙක, විස්සෙක, එක්විස්සෙක, විස්සෙක, දෙවිස්සෙක, පසළොසකැයි යථොක්ත ක්‍රමයෙන්) සත් ප්‍රකාරයෙකි. |
| 72 | සියලු අකුසල් සිත්හි යුක්ත චෛතසික කොතෙක් ද? | (මොහ ය අහිරික ය අනොත්තප්ප ය උද්ධච්ච ය යන සතර ද ඡන්ද ප්‍රීති අධිමොක්ෂ ත්‍රය ය හැර අන්‍යසමාන දසය ද යන) තුදුසෙකි. |
| 73 | හසිතුප්පාද සිත්හි චෛතසික කොතෙක් ද? | (ඡන්දය හැර අන්‍යසමාන) දොළොසෙක් පමණෙකි. |
| 74 | වොත්ථපනයෙහි චෛතසික කොතෙක් ද? | (ඡන්ද ප්‍රීති දෙක හැර අන්‍යසමාන) එකොළොසෙක් පමණෙකි. |
| 75 | සුඛසන්තීරණයෙහි චෛතසික කොතෙක් ද? | (ඡන්ද විරිය දෙක හැර අන්‍යසමාන) එකොළොසෙකි. |

6-2

ද්වාදසෙකාදස දස සත්තචාති චතුබ්බිධො
අට්ඨාරසාහෙතුකෙසු චිත්තුප්පාදෙසු සඞ්ගහො.

අහෙතුකෙසු සබ්බත්ථ සත්ත සෙසා යථාරහං
ඉති විත්ථාරතො වුත්තො තෙත්තිංසවිධ සඞ්ගහො.

ඉත්ථං චිත්තාවියුත්තානං සම්පයොගඤ්ච සඞ්ගහං
ඤත්වා භෙදං යථායොගං චිත්තෙන සමමුද්දිසෙ.

ඉති අභිධම්මත්ථ සඞ්ගහෙ චෙතසිකසඞ්ගහ විභාගො නාම

## දුතියො පරිච්ඡෙදො.

---

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 76 | මනොධාතු ත්‍රිකයෙහි ද* අහෙතුක ප්‍රතිසන්ධි යුගලයෙහි ද‡ චෛතසික කොතෙක් ද? | (ඡන්ද පීති විරිය හැර අන්‍යසමාන) දශයෙකි. |
| 77 | ද්විපඤ්චවිඤ්ඤාණයෙහි චෛතසික කොතෙක් ද? | (සබ්බචිත්ත සාධාරණ) සතක් පමණෙකි. |
| 78 | අට ලොස් අහෙතුක සිත්හි චෛතසික කී ප්‍රකාරයෙකින් යෙදෙත් ද? | (හසිතොත්පාද සිත්හි දොළොසෙක, වොත්ථපන සුඛසන්තීරණ දෙ සිත්හි එකොළොස එකොළොසය, මනොධාතුත්‍රික අහෙතුක ප්‍රතිසන්ධි යුගලයෙහි දසයෙක, ද්විපඤ්චවිඤ්ඤාණයෙහි සතෙකැයි) සතර ප්‍රකාරයකින් යෙදෙත්. |
| 79 | එක්සිය විසි එකක් සිත්හි දෙ පනස් චෛතසික කොතෙක් ප්‍රකාරයකින් සඞ්ග්‍රහය යට යේ ද? | (ලොකොත්තරධ්‍යාන රූපාරූප මහද්ගත ධ්‍යාන හෙයින් පස් පස් ආකාරයෙන් ද කාමාවචර ශොභන සිත්හි දොළොස් ආකාරයකින් ද අකුසල සිත්හි සත් ආකාරයකින් ද අහෙතුක සිත්හි සතර ආකාරයකින් දැයි) තෙතිස් ප්‍රකාරයකින් සඞ්ග්‍රහය යට යේ. |

## දෙවන පරිච්ඡේදය නිමියේ යි.

---

* සම්පටිච්ඡන දෙක ද පඤ්චද්වාරාවජ්ජනය ද යන තුන මනොධාතු ත්‍රිකය යි.
‡ උපෙක්ඛාසන්තීරණ ද්වය ය අහෙතුක ප්‍රතිසන්ධි යුගලය යි.

සම්පයුත්තා යථා යොගං තෙපඤ්ඤාස සභාවතො
චිත්ත චෙතසිකා ධම්මා තෙසං දානි යථාරහං॥
වෙදනා හෙතුතො කිච්ච ද්වාරාලම්බන වත්ථුතො
චිත්තුප්පාද වසෙනෙව සඞ්ගහො නාම නීයතෙ॥

තත්ථ වෙදනා සඞ්ගහෙ තාව තිවිධා වෙදනා සුඛා දුක්ඛා අදුක්ඛමසුඛා චෙති, සුඛං දුක්ඛං සොමනස්සං දොමනස්සං උපෙක්ඛාති ච භෙදෙන පන පඤ්චධා හොති, තත්ථ සුඛ සහගතං කුසල විපාකං කායවිඤ්ඤාණමෙකමෙව, තථා දුක්ඛ සහගතං අකුසල

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 1 | චිත්තචෛතසික ධර්මයෝ ස්වභාව වශයෙන් කොතෙක් ද? | (එකූනානූ වැදෑරුම් වූ චිත්තය තෙම අරමුණු විජානන ස්වභාව සාමාන්‍ය යෙන් එකවිධය, ස්පර්ශය ස්පර්ශන ස්වභාවයෙන් එකවිධය යනාදී නම තමන්ගේ ස්වභාවයෙන්) තෙපනසෙකි.* |
| 2 | තෙපනස් ධර්මයෝ චිත්තොත්පාද වශයෙන් කොතෙක් සංග්‍රහවලට යේ ද? | (සුඛාදී) වෙදනා ය (ලොභාදී) හෙතු ය (ප්‍රතිසන්ධි ආදී) කෘත්‍ය ය (චක්ෂුරාදී) ද්වාර ය (රූපාදී) ආරම්මණ ය (චක්ෂුරාදී) වස්තු ය යනාදී විභාග හෙයින් ෂට් ප්‍රකාර සංග්‍රහවලට යේ. |
| 3 | වේදනාව කොතෙක් ප්‍රකාර ද? | (ඉෂ්ටස්ප්‍රෂ්ටව්‍යානුභවන ලක්ෂණ§ වූ) සුඛ වේදනා ය (අනිෂ්ටස්ප්‍රෂ්ටව්‍යානුභවන ලක්ෂණ වූ) දුක්ඛ වේදනා ය (මධ්‍යස්ථ භවන ලක්ෂණ වූ) උපෙක්ෂා වේදනා යයි කියා තුන් ප්‍රකාර යෙක් ද ඒ තුන් ප්‍රකාරය සමග (ඉෂ්ටානුභවන ලක්ෂණ වූ) සොම්නස්ස වේදනා ය (අනිෂ්ටානුභවන ලක්ෂණ වූ) දොම්නස්සවේදනා යයි ද පස් ප්‍රකාර යෙකි.† |
| 4 | සුඛවේදනාව කොතෙක් ප්‍රකාර ද? | (සුඛ සහගත කුසල විපාකය එක් කාය විඥානයෙක්ම හෙයින්) එක් ප්‍රකාරයෙකි. |
| 5 | දුක්ඛවේදනාව කොතෙක් ප්‍රකාර ද? | (දුක්ඛ සහගත අකුසල විපාක ය එක් කාය විඥානයෙක් ම හෙයින්) එක් ප්‍රකාරයෙකි. |

* සියලු සිත්ම අරමුණු හැඳිනීම ප්‍රකාරයෙන් එක් ස්වභාවයෙක් ද ස්පර්ශ කෙරේ නූ යි 'ස්පර්ශ' නම. විඳිනු යි 'වේදනා' නම යනාදී වශයෙන් දෙපනස් චෛතසිකයන්ගේ එකී එකී ස්වභාව ද යන චිත්ත චෛතසිකයන්ගේ තෙපනස් ස්වභාව දත යුතු.

§ සිතට ඉෂ්ට වූ මනා ස්පර්ශ විඳීම 'ඉෂ්ටස්ප්‍රෂ්ටව්‍යානුභවන ලක්ෂණ' යි.

† ඉන්ද්‍රිය දෙශනායෙහි 'සුඛින්ද්‍රියං දුක්ඛින්ද්‍රියං සොමනස්සින්ද්‍රියං දොමනස්සින්ද්‍රියං උපෙක්ඛින්ද්‍රියං' යි වදාළ හෙයින් මෙහි දු ඒ පස් ප්‍රකාර වේදනාව දක්වන ලදි.

විපාකං කාය විඤ්ඤාණං, සොමනස්ස සහගත චිත්තානි පන ලොභමූලානි චත්තාරි ද්වාදස කාමාවචර සොභනානි සුඛසන්තීරණ හසනානි ච ද්වෙති අට්ඨාරස කාමාවචර චිත්තානිචෙව පඨම දුතිය තතිය චතුත්ථජ්ඣාන සඞ්ඛාතානි චතුචත්තාළීස මහග්ගත ලොකුත්තර චිත්තානිචෙති ද්වාසට්ඨි විධානි භවන්ති෴ දොමනස්ස සහගත චිත්තානි පන ද්වෙ පටිඝ සම්පයුත්ත චිත්තානෙව, සෙසානි සබ්බානිපි පඤ්චපඤ්ඤාස උපෙක්ඛා සහගත චිත්තානෙවාති෴

සුඛං දුක්ඛමුපෙක්ඛාති තිවිධා තත්ථ වෙදනා
සොමනස්සං දොමනස්සමිති භෙදෙන පඤ්චධා෴

සුඛමෙකත්ථ දුක්ඛඤ්ච දොමනස්සං ද්වයෙ ඨිතං
ද්වාසට්ඨීසු සොමනස්සං පඤ්චපඤ්ඤාසකෙතරා෴

හෙතුසඞ්ගහෙ හෙතු නාම ලොභො දොසො මොහො අලොභො අදොසො අමොහො චාති ඡබ්බිධා භවන්ති෴ තත්ථ පඤ්චද්වාරාවජ්ජන ද්විපඤ්චවිඤ්ඤාණ සම්පටිච්ඡන සන්තීරණ වොත්ථපන හසන වසෙන අට්ඨාරස අහෙතුක චිත්තානි නාම෴

---

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 6 | සොම්නස් සහගත සිත් කොතෙක් ද? | (ලොභ මූල සිත් සතර ය කාමාවචර කුශල විපාක ක්‍රියා සිත් දොළොස ය සන්තීරණ චිත්තය දැයි සොම්නස් සහගත අටළොස් කාමාවචර සිත් ද, ප්‍රථමධ්‍යානාදි රූපාවචර ද්වාදස මහද්ගත සිත් ද, ප්‍රථම ද්විතීය තෘතීය චතුර්ථධ්‍යානික ලොකොත්තර කුසල විපාක දෙතිස් සිත් ද යන) දෙසැටෙකි. |
| 7 | දොම්නස් සහගත සිත් කොතෙක් ද? | (ප්‍රතිඝ සම්ප්‍රයුක්ත අසංස්කාරික සසංස්කාරික වශයෙන්) දෙකෙකි. |
| 8 | උපේක්ෂා සහගත සිත් කොතෙක් ද? | (ලොභමූල සිත් සතර ය මොහමූල සිත් දෙක ය යන ෂට් අකුසල් සිත් ද, කාය විඤ්ඤාණය හැර චක්ෂුරාදි කුශලාකුශල විපාක සිත් අට ද, සම්පටිච්ඡන ද්වය ය සහ සන්තීරණ ද්වය ය ද, පඤ්චද්වාරාවර්ජන මනොද්වාරාවර්ජන දෙක ද යන මේ තුදුස් අහෙතුක සිත් ද, කාමාවචර කුශල විපාක ක්‍රියා සිත් දොළොස ද, පඤ්චමධ්‍යානික මහද්ගත සිත් පසළොස ද, පඤ්චමධ්‍යානික ලොකොත්තර සිත් අට ද යන) පනස් පසෙකි. |
| 9 | හෙතු කොතෙක් ද? | (ලොභ ය ද්වෙෂ ය මොහ ය අලොභ ය අද්වෙෂ ය අමොහ ය කියා) සයෙකි. |
| 10 | අහෙතුක සිත් කොතෙක් ද? | (පඤ්චද්වාරාවර්ජනය චක්ඛාදි ද්විපඤ්චවිඤ්ඤාණය සම්පටිච්ඡන ද්වය ය සන්තීරණ ත්‍රය ය වොත්ථපන ය හසිතුප්පාද ය යන) දස අටෙකි. |

සෙසානි සබ්බානිපි එකසත්තති චිත්තානි සහෙතුකානෙව. තත්ථාපි ද්වෙ මොමූහචිත්තානි එකහෙතුකානි, සෙසානි දස අකුසලචිත්තානි චෙව ඤාණවිප්පයුත්තානි ද්වාදස කාමාවචර සොභනානි චෙති ද්වාවීසති ද්විහෙතුක චිත්තානි, ද්වාදස ඤාණසම්පයුත්ත කාමාවචර සොභනානි චෙව පඤ්චතිංස මහග්ගත ලොකුත්තර චිත්තානි චෙති සත්තචත්තාළීස තිහෙතුක චිත්තානීති.

ලොභො දොසො ච මොහො ච හෙතු අකුසලා තයො
අලොභො දොසො මොහො ච කුසලාබ්‍යාකතා තථා.
අහෙතුකට්ඨාරසෙකහෙතුකා ද්වෙ ද්වාවීසති
ද්විහෙතුකා මතා සත්ත චත්තාළීස තිහෙතුකා.

කිච්චසඞ්ගහෙ කිච්චානි නාම පටිසන්ධි භවඞ්ග ආවජ්ජන දස්සන සවන ඝායන සායන ඵුසන සම්පටිච්ඡන සන්තීරණ වොට්ඨපන ජවන තදාලම්බන චුති වසෙන චුද්දස විධානි භවන්ති.

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 11 | සහෙතුක සිත් කොතෙක් ද? | (අට්ඨාරස අහෙතුක සිත් හැර ඉතිරි) සහෙතුක සිත් සැත්තෑ එකෙකි. |
| 12 | එකහෙතුක සිත් කොතෙක් ද? | (විචිකිච්ඡා සම්ප්‍රයුක්ත ඖද්ධත්‍ය සම්ප්‍රයුක්ත වූ මොමූහ) සිත් දෙකෙකි. |
| 13 | ද්විහෙතුක සිත් කොතෙක් ද? | (මොමූහ ද්වය ය හැර අකුසල් සිත් දසය ද ඥාන විප්‍රයුක්ත කාමාවචර ශොභන දෙළොස ද යන) දෙ විස්සෙකි |
| 14 | තිහෙතුක සිත් කොතෙක් ද? | (ඥානසම්ප්‍රයුක්ත කාමාවචර ශොභන සිත් දෙළොස ය සත් විසි මහද්ගත සිත් ය ලොකොත්තර අට ය යන) සිත් සතළිස් සතෙකි. |
| 15 | කෘත්‍ය කොතෙක් වෙත් ද? | (ප්‍රතිසන්ධි කෘත්‍ය ය භවාඞ්ග කෘත්‍ය ය ආවර්ජන කෘත්‍ය ය දර්ශන කෘත්‍ය ය ශ්‍රවණ කෘත්‍ය ය ඝායන කෘත්‍ය ය සායන කෘත්‍ය ය ස්පර්ශන කෘත්‍ය ය සම්ප්‍රතීච්ඡන කෘත්‍ය ය සන්තීරණ කෘත්‍ය ය ව්‍යවස්ථාපන කෘත්‍ය ය ජවන කෘත්‍ය ය තදාලම්බන කෘත්‍ය ය චුති කෘත්‍ය ය යි) තුදුස් කෘත්‍යයෙක් වෙති* |

*මේ තුදුස් කෘත්‍යයන්ගේ විශේෂ මෙසේ දත යුතු. භවයෙන් භවය ගැලපීම 'ප්‍රතිසන්ධිකෘත්‍ය' යි. උපපත්ති භවයාගේ නො සිඳ පැවැත්මට හේතු බව 'භවාඞ්ග කෘත්‍ය' යි. අරමුණට යොමු කිරීම 'ආවර්ජන කෘත්‍ය' ය යි. රූප දැකීම ය 'දර්ශන කෘත්‍ය' යි. ශබ්ද ශ්‍රවණය 'ශ්‍රවණ කෘත්‍ය' යි. ගන්ධාඝ්‍රාණය 'ඝායන කෘත්‍ය' යි. රසාස්වාදය 'සායන කෘත්‍ය' යි. ස්පර්ශය 'ස්පර්ශන කෘත්‍ය' යි. රූපාදි අරමුණු පිළිගැනීම 'සම්ප්‍රතීච්ඡන කෘත්‍ය' යි. පිළිගත් අරමුණු ස්වභාව තීරණය කිරීම 'සන්තීරණ කෘත්‍ය' යි. තීරණය කරගත් අරමුණ නිශ්චය කිරීම 'ව්‍යවස්ථාපන කෘත්‍ය' යි. අරමුණෙහි ඒ ඒ කෘත්‍ය සාධන වශයෙන් කොයෙක් වර හෝ එක් වරක හෝ ද්‍රවත්භාවයගේ මෙන් පැවැත්ම 'ජවන කෘත්‍ය' යි. ජවනයන් විසින් ගන්නා ලද ඒ ඒ ආලම්බන අරමුණු කිරීම 'තදාලම්බන කෘත්‍ය' යි. උපන් භවයෙන් ශිලිහී යාම 'චුතිකෘත්‍ය' යි.

පටිසන්ධිභවඞ්ගාවජ්ජන පඤ්චවිඤ්ඤාණට්ඨානාදි වසෙන පන තෙසං දසධා ඨාන භෙදෙ, වෙදිතබ්බා...... තත්ථ ද්වෙ උපෙක්ඛාසහගත සන්තීරණානි චෙව අට්ඨ මහා විපාකානි ච නව රූපාරූප විපාකානි චෙති එකූනවීසති චිත්තානි පටිසන්ධි භවඞ්ග චුති කිච්චානි නාම, ආවජ්ජන කිච්චානි පන ද්වෙ,

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 16 | චිත්ත චෛතසික ධර්මයෝ ස්ථාන භේද යෙන් කොතෙක් ද? | ([1]ප්‍රතිසන්ධි ස්ථාන ය [2]භවාඞ්ග ස්ථාන ය [3]ආවර්ජන ස්ථාන ය [4](දර්ශනාදි) පඤ්ච විඥානස්ථාන ය [5]සම්ප්‍රත්‍යේෂණ ස්ථාන ය [6]සන්තීරණ ස්ථාන ය [7]ව්‍යවස්ථාපන ස්ථාන ය [8]ජවන ස්ථාන ය [9]තදාලම්බන ස්ථාන ය [10]චුති ස්ථාන ය යි) දශයෙකි. |
| 17 | කොතෙක් සිත් ප්‍රතිසන්ධි භවාඞ්ග චුති කෘත්‍යයන් කෙරෙත් ද? | (උපේක්ෂා සහගත සන්තීරණ දෙසිත ද අට මහා විපාක නම් වූ කාමාවචර විපාක සිත් අට ද රූපාවචර අරූපාවචර විපාක සිත් නවය ද යන) එකුන් විසි චිත්තයෝ ප්‍රතිසන්ධි භවාඞ්ග චුති කෘත්‍යයන් කෙරෙත්. |
| 18 | කොතෙක් සිත් ආවර්ජන කෘත්‍ය ය කෙරෙත් ද? | පඤ්චද්වාරාවර්ජන මනොද්වාරාවර්ජන යන දෙ සිත්හු ආවර්ජන කෘත්‍ය ය කෙරෙත්. |

1 චුතිචිත්ත භවාඞ්ගචිත්ත යන දෙදෙනා අතර 'ප්‍රතිසන්ධි ස්ථාන' යි.

2 ප්‍රතිසන්ධි ආවර්ජන දෙදෙන අතරය, එසේම ජවන ආවර්ජන තදාලම්බන ආවර්ජන ව්‍යවස්ථාපන ආවර්ජන කිසිකලෙක ජවනචුති තදාලම්බනචුති යන මේ ෂට් අනන්තරය 'භවාඞ්ග ස්ථාන' යි.

3 භවාඞ්ග පඤ්චවිඥාන භවාඞ්ගජවන අනන්තර ද්වය ය 'ආවර්ජන ස්ථාන' යි.

4 පඤ්චද්වාරාවර්ජන සම්ප්‍රත්‍යේෂණ ද්වයානන්තරය 'පඤ්ච විඥාන ස්ථාන යි.

5 පඤ්චවිඥාන සන්තීරණ ද්වයානන්තරය සම්ප්‍රත්‍යේෂණ ස්ථාන' යි.

6 සම්පටිච්ඡන වොට්ඨපන ද්වයානන්තරය 'සන්තීරණ ස්ථාන' යි.

7 සන්තීරණ ජවන සන්තීරණ භවාඞ්ගානන්තර ද්වය ය 'ව්‍යවස්ථාපන ස්ථාන' යි.

8 වොට්ඨපන තදාලම්බන වොට්ඨපන භවාඞ්ග වොට්ඨපනචුති මනොද්වාරාවර්ජන තදාලම්බන මනොද්වාරාවර්ජන භවාඞ්ග මනොද්වාරාවර්ජනචුති යන මේ ෂට්විධ අනන්තරය 'ජවන ස්ථාන' යි.

9 ජවන භවාඞ්ග ජවනචුතීන්ගේ ද අතර 'තදාලම්බන ස්ථාන' යි.

10 ජවනපටිසන්ධි තදාරම්මණපටිසන්ධි භවාඞ්ගපටිසන්ධි යන අනන්තර ත්‍රය ය 'චුතිස්ථාන' යි. [අනික් පිට බලනු.]

තථා දස්සන සවන ඝායන සායන ඵුසන සම්පටිච්ඡන කිච්චානි ච, තීණි සන්තීරණ කිච්චානි. මනොද්වාරාවජ්ජනමෙව පඤ්චද්වාරෙ වොත්ථපන කිච්චං සාධෙති, ආවජ්ජන ද්වය වජ්ජිතානි කුසලාකුසල ඵලක්‍රියා චිත්තානි පඤ්චපඤ්ඤාස ජවනකිච්චානි,

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 19 | කොතෙක් සිත් දර්ශන ශ්‍රවණ ඝායන සායන ස්පර්ශන සම්ප්‍රත්‍යෙෂණ කෘත්‍යයන් කෙරෙත් ද? | (අහේතුක කුශලාකුශල විපාක චක්ෂුරාදි පඤ්ච විඥානද්වය ද එසේම සම්පටිච්ඡන ද්වය ය ද යන) දෙලොස් සිත්හු දර්ශනාදි ෂට් කෘත්‍යයන් කෙරෙත්. |
| 20 | කොතෙක් සිත් සන්තීරණ කෘත්‍යය කෙරෙත් ද? | (අහේතුක කුශලාකුශල විපාක උපෙක්ෂා සෞමනස්‍ය භේද) ත්‍රිවිධ සන්තීරණ සිත්හු සන්තීරණ කෘත්‍යය කෙරෙත්. |
| 21 | කවර සිතෙක් ව්‍යවස්ථාපන කෘත්‍යය කෙරෙත් ද? | පඤ්චද්වාරයෙහි ව්‍යවස්ථාපන කෘත්‍යය මනොද්වාරාවර්ජන චිත්තයම කෙරේ. |
| 22 | කොතෙක් සිත් ජවන කෘත්‍යය කෙරෙත් ද? | (එක්විසි කුසල් සිත් ය, අකුසල් සිත් දොළොස ය, ලොකොත්තර ඵල සිත් සතර ය, ආවර්ජන ද්වය ය හැර ඉතිරි කාමරූපාරූප ක්‍රියා සිත් අටළොස ය යන) පස්පනස් සිත්හු ජවන කෘත්‍යය කෙරෙති. |

මෙහි දක්වූ ජවන ස්ථාන ෂට්කය සහ භවාඞ්ගස්ථාන ෂට්කය ද අසුමල් අසුමල් තන්හි ලැබේ යයි විජානනය පිණිස සැකෙවින් දක්වම්හ. පිළිසඳ සිතට අනතුරුව භවාඞ්ගය ද, ඊට අනතුරුව මනොද්වාරාවර්ජනය ද උපදින හෙයින් ප්‍රතිසන්ධි ආවර්ජන අතර 'භවාඞ්ගස්ථාන' වේ. සෝවාන් ඵලාදිය ප්‍රත්‍යවේක්ෂා කරණ කල ජවන භවාඞ්ග මනොද්වාරාවර්ජන උපදනෙන් ජවන ආවර්ජන අතර ද 'භවාඞ්ගස්ථාන' යි. වීථි සිත්හි තදාලම්බන භවාඞ්ග ඉපිද ආවර්ජනාදිය උපදින කල තදාලම්බන ආවර්ජන අතර ද 'භවාඞ්ග ස්ථාන' වේ.

ජවන් නො පොහොනා වීථියෙහි වොත්ථපනයට අනතුරුව භවාඞ්ගය ද භවාඞ්ගානන්තරව ආවර්ජනය ද වන්නෙන් වොත්ථපන ආවර්ජන අතර ද 'භවාඞ්ග ස්ථාන' යි. කිසි කලෙක ජවන භවාඞ්ග ඉපිද තදනන්තරව චුතිචිත්තය උපදින හෙයින් ජවනචුති අතර ද 'භවාඞ්ග ස්ථාන' වේ. ඇතැම් කලෙක තදාලම්බන භවාඞ්ගානන්තරව චුති වන හෙයින් තදාලම්බනචුති අතර ද 'භවාඞ්ග ස්ථාන' යි. වීථි සිත්හි වොත්ථපනානන්තරව ජවන් ද ඊට අනතුරුව තදාලම්බනය ද

[අනික් පිට හා සම්බන්ධයි.]

7-1

අට්ඨ මහා විපාකානිචෙව සන්තීරණත්තයඤ්චෙති එකාදස තදාලම්බන කිච්චානි… සෙසු පන ද්වෙ උපෙක්ඛා සහගත සන්තීරණ චිත්තානි පටිසන්ධි භවඞ්ග චුති තදාලම්බන සන්තීරණ වසෙන පඤ්ච කිච්චානි නාම…

මහා විපාකානි අට්ඨ පටිසන්ධි භවඞ්ග චුති තදාලම්බන වසෙන චතුකිච්චානි නාම, මහග්ගත විපාකානි නව පටිසන්ධි භවඞ්ග චුති වසෙන තිකිච්චානි නාම… සොමනස්ස සන්තීරණං සන්තීරණ තදාලම්බන වසෙන දුකිච්චං, තථා වොත්ථපනං වොත්ථපනාවජ්ජන වසෙන, සෙසානි පන සබ්බානිපි ජවන මනොධාතුත්තික ද්විපඤ්ච විඤ්ඤාණානි යථාසම්භවමෙක කිච්චානීති…

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 23 | කොතෙක් චිත්තයෝ තදාලම්බන කෘත්‍ය ය කෙරෙත් ද? | (කාමාවචර අට මහා විපාක සිත් ය සන්තීරණ ත්‍රය ය යන) එකාදස චිත්තයෝ තදාලම්බන කෘත්‍ය ය කෙරෙති. |
| 24 | උපෙක්ෂා සන්තීරණ දෙ සිත්හු කොතෙක් කෘත්‍ය ඇත්තාහු ද? | (ප්‍රතිසන්ධි කෘත්‍ය ය එසේම භවාඞ්ග චුති තදාලම්බන සන්තීරණ කෘත්‍ය යයි) පඤ්ච කෘත්‍යයෙන් ඇත්තාහු ය. |
| 25 | අට මහා විපාකයන්ගේ කෘත්‍ය කොතෙක් ද? | (පටිසන්ධි භවාඞ්ග චුති තදාලම්බන වශයෙන්) කෘත්‍ය සතරෙකි. |
| 26 | මහද්ගත විපාකයන්ගේ කෘත්‍ය කොතෙක් ද? | (ප්‍රතිසන්ධි කෘත්‍ය ය භවාඞ්ග කෘත්‍ය ය චුති කෘත්‍ය යයි) කෘත්‍ය තුනෙකි. |
| 27 | සොම්නස්ස සන්තීරණයාගේ කෘත්‍ය කොතෙක් ද? | (සන්තීරණ කෘත්‍ය ය තදාලම්බන කෘත්‍ය ය වශයෙන්) කෘත්‍ය දෙකෙකි. |
| 28 | වොත්ථපනයාගේ කෘත්‍ය කොතෙක් ද? | (ව්‍යවස්ථාපන කෘත්‍ය ය ආවර්ජන කෘත්‍ය ය වශයෙන්) දෙකෙකි. |
| 29 | එකි එකි කෘත්‍ය ඇති සිත් කොතෙක් ද? | එක්විසි කුසල් ය දොළොස් අකුසල් ය ලොකොත්තර ඵල සතර ය අටලොස් ක්‍රියා ය (යන) පස්පනස් ජවනයෝ ද, මනොධාතු ත්‍රිකය හා දෙපස් විඤ්ඤාණයෝ ද (යන) ස සැටෙක් වෙත්. |

උපදනෙන් වොත්ථපන තදාලම්බන අතර 'ජවනස්ථාන' යි. තදාලම්බන නො පොහොනා වීථියෙහි වොත්ථපන ජවන භවාඞ්ග උපදනෙන් වොත්ථපන භවාඞ්ගානන්තරව ද 'ජවන ස්ථාන' වේ. ජවනානන්තරව චුති වන්නෙන් වොත්ථපන චුති අතර ද 'ජවන් තැනි' විභූතාරම්මණ වීථියෙහි මනොද්වාරාවජ්ජනානන්තරව තදාලම්බන උපදනෙන් මනොද්වාර තදාලම්බන අතර 'ජවනස්ථාන' වේ. අවිභූතාරම්මණ වීථියෙහි ද මනොද්වාරාවජ්ජනානන්තර ජවනභවාඞ්ග උපදනෙන් මනොද්වාරාවජ්ජන භවාඞ්ග අතර ද 'ජවන් තැනි' මනොද්වාරාවජ්ජනයට අනතුරුව ජවන් ඉපිද චුති වන හෙයින් මනොද්වාරාවජ්ජනචුති අතර ද 'භවාඞ්ග ස්ථාන' වේ.

පටිසන්ධාදයො නාම කිච්චභෙදෙන චුද්දස
දසධා ඨානභෙදෙන චිත්තුප්පාද පකාසිතා.

අට්ඨසට්ඨි තථා ද්වෙ ච නවාට්ඨ ද්වෙ යථාක්කමං
එකද්විති චතුපඤ්ච කිච්චට්ඨානානි නිද්දිසෙ.

ද්වාර සඞ්ගහෙ ද්වාරානි නාම චක්ඛුද්වාරං සොතද්වාරං ඝාන ද්වාරං ජිව්හාද්වාරං කායද්වාරං මනොද්වාරං චෙති ඡබ්බිධානි භවන්ති, තත්ථ චක්ඛුමෙව චක්ඛුද්වාරං තථා සොතාදයො සොත ද්වාරාදීනි, මනොද්වාරං පන භවඞ්ගන්ති පවුච්චති. තත්ථ පඤ්ච ද්වාරාවජ්ජන චක්ඛුවිඤ්ඤාණ සම්පටිච්ඡන සන්තීරණ වොට්ඨපන කාමාවචර ජවන තදාලම්බන වසෙන ඡ චත්තාලීස චිත්තානි චක්ඛු ද්වාරෙ යථාරහං උප්පජ්ජන්තීති, තථා පඤ්චද්වාරාවජ්ජන සොත විඤ්ඤාණාදි වසෙන සොතද්වාරාදීසුපි ඡ චත්තාලීසෙව භවන්තීති සබ්බථාපි පඤ්චද්වාරෙ චතුපඤ්ඤාස චිත්තානි කාමාවචරානෙවාති වෙදිතබ්බානි. මනොද්වාරෙ පන මනොද්වාරාවජ්ජන පඤ්ච පඤ්ඤාස ජවන තදාලම්බන වසෙන සත්තසට්ඨි චිත්තානි භවන්ති,

| ප්‍රශ්න | | උත්තර |
|---|---|---|
| 30 | ද්වාර කොතෙක් ද? | චක්ෂුර්ද්වාරාදි ෂට් ද්වාරයෙකි. |
| 31 | චක්ෂුර්ද්වාරය යනු කුමක් ද? | ප්‍රසාද චක්ෂුසම චක්ෂුර්ද්වාර යි. ශ්‍රොත්‍රාදි සෙසු ද්වාර ද එසේ මැ යි. |
| 32 | මනොද්වාරය යනු කුමක් ද? | ආවර්ජනයන්ට අනන්තර ප්‍රත්‍යය වන්නා වූ භවාඞ්ග චිත්තය මනොද්වාර යයි කියනු ලැබේ. |
| 33 | චක්ෂුර්ද්වාරයෙහි කොතෙක් සිත් උපදිත් ද? | (පඤ්චද්වාරාවර්ජන ය ද, චක්ෂුර්විඥාන සම්පටිච්ඡන සන්තීරණ වොට්ඨපන යන සිත් නවය ද, කුශල ක්‍රියා සොළොස ය අකුසල් දොළොස ය හසිතුප්පාද ය යන එකුන්තිස් කාමාවචර ජවනයෝ ද, තදාලම්බන වූ මහා විපාක අට ද යි) *ෂට් සාළිස් සිත්හු උපදිත්. |
| 34 | පඤ්චද්වාරයෙහි කාමාවචර සිත් කොතෙක් ද? | (චක්ෂුර්ද්වාරයෙහි දක්වන ලද සිත් ස සාළිස ද ඉතිරි ද්වාරයන්හි යුත් ශ්‍රොත්‍ර විඤ්ඤාණාදි සතර යුගලය බහාලීමෙන්) කාමාවචර සිත් සිව් පනසෙකි. |
| 35 | මනොද්වාරයෙහි කොතෙක් සිත් වෙත් ද? | (මනොද්වාරාවර්ජන ය පස්පනස් ජවන් සිත් ය තදාලම්බන එකොළොස ය යන) සිත් සැට සතෙක් වෙත්. |

*සෙසු ද්වාරයන්හි ද මෙසේ යි. ශ්‍රොත්‍ර විඥාන යනාදීන් යෙදිය යුතු.

7-2

එකූනවීසති පටිසන්ධි භවඞ්ග චුති වසෙන ද්වාරවිමුත්තානි, තෙසු පන ද්විපඤ්චවිඤ්ඤාණානිචෙව මහග්ගත ලොකුත්තර ජවනානි චෙති ඡත්තිංස යථාරහ මෙකද්වාරික චිත්තානි නාම॥ මනොධාතුත්තිකං පන පඤ්චද්වාරිකං, සුඛසන්තීරණ වොට්ඨපන කාමාවචර ජවනානි එකතිංස ඡද්වාරික චිත්තානි, උපෙක්ඛා සහගත සන්තීරණ මහා විපාකානි ඡද්වාරිකානිචෙව ද්වාර විමුත්තානි ච මහග්ගත විපාකානි ද්වාර විමුත්තානෙවාති॥

එකද්වාරික චිත්තානි පඤ්ච ඡද්වාරිකානි ච
ඡද්වාරික විමුත්තානි විමුත්තානි ච සබ්බථා॥
ඡත්තිංසති තථා තීණි එකතිංස යථාක්කමං
දසධා නවධා චෙති පඤ්චධා පරිදීපයෙ॥

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 36 | ද්වාර විමුක්ත සිත් කොතෙක් ද? | (ප්‍රතිසන්ධි භවාඞ්ග චුති වශයෙන් පැවැති උපෙක්‍ෂා සහගත සන්තීරණ දෙක ය, මහා විපාක අට ය, රූපාරූප විපාක නවය ය යන) එකුන් විස්සෙකි. |
| 37 | එකද්වාරික සිත් කොතෙක් වෙත් ද? | (ඒ ඒ ද්වාරානුරූපව කුශලාකුශල විපාක ද්විපඤ්චවිඤ්ඤාණ ය, මහද්ගත යයි කියනලද රූපාරූප කුශල ක්‍රියා අටළොස ය යන) සතිසෙක් වෙත්. |
| 38 | පඤ්චද්වාරික සිත් කොතෙක් ද? | (මනොධාතු ත්‍රික නම් වූ පඤ්චද්වාරාවර්ජන ය සම්පටිච්ඡන දෙක ය යන) තුනෙකි. |
| 39 | ෂට් ද්වාරික සිත් කොතෙක් ද? | (සොමනස්ස සන්තීරණ ය ව්‍යවස්ථාපන චිත්ත ය එකුන්තිස් කාමාවචර ජවන් ය යන) එක්තිසෙකි. |
| 40 | ෂට් ද්වාරික වූ ද ෂට් ද්වාර විමුක්ත වූ ද සිත් කොතෙක් වෙත් ද? | (උපෙක්‍ෂා සහගත සන්තීරණ දෙසිත ය කාමාවචර මහා විපාක අට ය යන) සිත් දසයෙක් වෙති. |
| 41 | ද්වාර විමුක්ත සිත් කොතෙක් ද? | (මහද්ගත විපාක) සිත් නවය ද්වාර විමුක්ත ම වේ. |
| 42 | චක්‍ෂුර්ද්වාරාදි ද්වාර යන්හි සිත්හු කොතෙක් ප්‍රකාර දක්වන ලද්දාහු ද? | එකද්වාරික චිත්තයෝ සතිසෙක, පඤ්චද්වාරික චිත්තයෝ තුන් දෙනෙක, ෂට් ද්වාරික චිත්තයෝ එක්තිසෙක, ෂට්ද්වාරික වූ ද ෂට්ද්වාර විමුක්ත වූ ද චිත්තයෝ දසයෙක, සර්ව ප්‍රකාරයෙන් ද්වාර විමුක්ත චිත්තයෝ නව දෙනෙක යි) පස් ප්‍රකාරයෙකින් දක්වන ලද්දාහු ය. |

* මෙයි සන්තීරණ දෙ සිත්හු පඤ්චද්වාරයෙහි සන්තීරණ වශයෙන් ද පඤ්ච ද්වාර මනොද්වාරයන්හි තදාලම්බන වශයෙන් ද පවත්නා හෙයින් ෂට් ද්වාරික ද පිළිසිඳීමෙයි පවත්නා හෙයින් ද්වාර විමුක්ත ද වේ. අට මහා විපාක සිත්හු ද පඤ්චද්වාර මනොද්වාරයන්හි තදාලම්බන වශයෙන් පවත්නා හෙයින් පඤ්චද්වාරිකා ද ප්‍රතිසන්ධි වශයෙන් පවත්නා හෙයින් ද්වාර විමුක්ත ද වෙත් යනු භාවයි.

ආලම්බන සඞ්ගහෙ ආලම්බනානි නාම රූපාරම්මණං සද්දාරම්මණං ගන්ධාරම්මණං රසාරම්මණං ඵොට්ඨබ්බාරම්මණං ධම්මාරම්මණං චෙති ඡබ්බිධානි භවන්ති. තත්ථ රූපමෙව රූපාරම්මණං තථා සද්දාදයො සද්දාරම්මණාදීනි ධම්මාරම්මණං පන පසාද සුඛුම රූප චිත්ත චෙතසික නිබ්බාන පඤ්ඤත්තිවසෙන ඡධා සඞ්ගය්හන්ති තත්ථ චක්ඛුද්වාරික චිත්තානං සබ්බෙසම්පි රූපමෙව ආරම්මණං තඤ්ච පච්චුප්පන්නං තථා සොතද්වාරික චිත්තාදීනම්පි සද්දාදීනි තානිච පච්චුප්පන්නානියෙව මනොද්වාරික චිත්තානම්පන ඡබ්බිධම්පි පච්චුප්පන්නමතීතං අනාගතං කාලවිමුත්තඤ්ච යථාරහමාලම්බනං හොති.

---

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 43 | අරමුණු කොතෙක් ප්‍රකාර ද? | (රූපාරම්මණය පටන් ධම්මාරම්මණය දක්වා) ෂට් ප්‍රකාරයෙකි. |
| 44 | රූපාරම්මණ යනු කුමක් ද? | (වර්ණායතන සඞ්ඛ්‍යාත) රූපයම රූපාරම්මණ යි, ශබ්දාරම්මණාදීහු ද එසේ යි. |
| 45 | ධම්මාරම්මණ ය කොතෙක් ප්‍රකාර ද? | (පඤ්ච ප්‍රසාද රූප ය සොළොස් සූක්ෂ්ම රූප ය* චිත්ත චෛතසිකයෝ ය නිර්වාණ ය [කසිණාදි ප්‍රඥප්ති ය යන මොවුන්ගේ වශයෙන්) ෂට් ප්‍රකාර යි. |
| 46 | චක්ෂුර්ද්වාරාදි පඤ්චද්වාරික විඥානයන්ට කුමක් කුමක් අරමුණු වෙත් ද? | චක්ෂුර්ද්වාරයෙහි පැවැති සියලු විඥානයන්ට (අතීත නො වූ අනාගත නො වූ) වර්තමාන වූ රූපය ම අරමුණු වේ. සෙසු ශ්‍රොත්‍රාදි ද්වාරික විඥානයන්ට ද එසේම ක්‍රමයෙන් ශබ්දාදීහු අරමුණු වෙත්. |
| 47 | මනොද්වාරික විඥාන යන්ට කුමක් අරමුණු වේ ද? | රූපාදි ෂඩ්විධ ආලම්බන ප්‍රත්‍යුත්පන්න අතීත අනාගත වූයේ ද නිර්වාණ ප්‍රඥප්ති සඞ්ඛ්‍යාත කාලවිමුක්ත වූයේ ද සුදුසු පරිද්දෙන් අරමුණු වේ. |

---

* ආපො ධාතු ය ස්ත්‍රීත්ව පුරුෂත්ව සඞ්ඛ්‍යාත භාව රූප ද්වය ය, හෘදය රූප ය, ජීවිත රූප ය, ආහාර රූප ය, පරිච්ඡේද රූප ය, කායවිඤ්ඤත්ති වචීවිඤ්ඤත්ති සඞ්ඛ්‍යාත විඤ්ඤත්ති රූපද්වය ය, ලඝුත්ව මෘදුත්ව කර්මණ්‍යත්ව සඞ්ඛ්‍යාත ත්‍රිවිධ විකාර රූප ය, උපචය සන්තති ජරතා අනිච්චතා සඞ්ඛ්‍යාත වූ චතුර්විධ ලක්ෂණ රූපය ය යන මේ සොළොස 'සූක්ෂ්ම රූප' යි.

ද්වාර විමුත්තානඤ්ච පටිසන්ධි භවඞ්ග චුති සඞ්ඛාතානං ඡබ්බිධම්පි යථාසම්භවං යේභුය්‍යේන භවන්තරෙ ඡද්වාර ගහිතං පච්චුප්පන්නමතීතං පඤ්ඤත්තිභූතං වා කම්ම කම්මනිමිත්ත ගතිනිමිත්ත සම්මතං ආලම්බනං හොති.......... තෙසු චක්ඛුවිඤ්ඤාණාදීනි යථාක්කමං රූපාදි එකෙකාලම්බනානෙව මනොධාතුත්තිකං පන රූපාදි පඤ්චාලම්බනං,

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 48 | ප්‍රතිසන්ධි භවාඞ්ග චුති චිත්ත සඞ්ඛ්‍යාත ද්වාර විමුක්ත චිත්තයන්ට කොතෙක් ආලම්බන යෝ අරමුණු වෙත් ද? | [ද්වාරවිමුක්ත චිත්තයන්ට [1]සම්භව වන පරිද්දෙන් [2]බෙහෙවින් අතීත භවයෙහි(මරණාසන්න කාල)ෂට්ද්වාර (ජවන) යන් විසින් ගන්නා ලද වර්තමාන වූ ද අතීත වූ ද (කසිණාදි) ප්‍රඥප්ති වූ ද [3]කර්ම ය [4]කර්මනිමිත්ත ය [5]ගතිනිමිත්ත ය යන මොවුන්ගේ වශයෙන්]ෂඩ්විධ ආලම්බනයෝ අරමුණු වෙත්.* |
| 49 | චක්ෂුර්විඥානාදීන්ට කොතෙක් ආලම්බන අරමුණු වෙත් ද? | රූපාලම්බනාදි වශයෙන් එකි එකි ආලම්බනයෙක් ම අරමුණු වේ. |
| 50 | මනොධාතු ත්‍රිකයට කුමක් අරමුණු වේ ද? | රූප ශබ්ද ගන්ධ රස ස්පර්ශ යන පඤ්චාලම්බනය ම අරමුණු වෙත්. |

1 'සම්භව වන පරිද්දෙන්' යනු කාමාදි ත්‍රෛභූමික ප්‍රතිසන්ධි භවාඞ්ගචුතීන්ගේ ඒ ඒ ද්වාරයන් විසින් ගැනීම් වශයෙනි.

2 'බෙහෙවින්' යනු අසංඥ භවයෙන් චුත වන්නහුගේ පිළිසිඳීමට විෂය වූ අනතුරු භවයෙහි කිසි ද්වාරයකින් ගන්නා ලද දෙයක් නැති හෙයින් ඒ වළකනු පිණිස ය, හුදෙක් එහි කර්ම බලයෙන් කාමභවයෙහි පිළිසිඳීම පිණිස කර්මනිමිත්තාදි අරමුණෙක් වේ.

3 'කර්ම' නම් ප්‍රතිසන්ධි ජනක කුශලාකුශල චේතනා යි.

4 'කර්ම නිමිත්ත' නම් දානාදි පුණ්‍ය කර්මයන්ට ද ප්‍රාණවධාදි අකුශල කර්මයන්ට ද උපකරණ වූ දානවස්තු සිවුපා ආදී ද්‍රව්‍ය යි.

5 'ගතිනිමිත්ත' නම් උපදිනු ලබන සුගති දුර්ගති භවයන්හි දක්නා ලද්දා වූ කප්රුක් මව්කුස් අරණ්‍ය නිරයාග්නි යනාදිය යි.

* මෙයින් කාමාවචර ප්‍රතිසන්ධි භවාඞ්ග චිත්තයන්ට සදොරින් ගන්නාලද රූපාදි පස් අරමුණු වර්තමාන වූ ද අතීත වූ ද සුදුසු පරිද්දෙන් කර්ම නිමිත්ත වශයෙන් අරමුණු වේ. ධම්මාරම්මණය වූ කලි මනොද්වාරයෙන් ගන්නා ලදුව ම ප්‍රතිසන්ධි භවාඞ්ග චුති සඞ්ඛ්‍යාත ත්‍රිවිධ චිත්තයන්ටම අතීතව කර්මනිමිත්ත වශයෙන් අරමුණු වේ. එසේම මනොද්වාරයෙන් ගන්නා ලද්දා වූ එකම රූපාලම්බනය එකාන්තයෙන් වර්තමානව ගතිනිමිත්ත වශයෙන් අරමුණු වේ. රූපාවචර ප්‍රතිසන්ධීන්ට ද ආකාසානඤ්චායතන ආකිඤ්චඤ්ඤායතන සඞ්ඛ්‍යාත අරූපාවචරද්වයයට ද මනොද්වාරයෙන් ගන්නා ලද ප්‍රඥප්ති වූ ධර්මාලම්බනයම කර්මනිමිත්ත වශයෙන් අරමුණු වේ. එසේම විඤ්ඤාණඤ්චායතන නෙවසඤ්ඤානාසඤ්ඤායතනයන්ට ද අතීතව කර්මනිමිත්ත වශයෙන් අරමුණු වේ.

තෙවීසති කාමාවචර විපාකානි හසන චිත්තඤ්චාති සබ්බථාපි කාමාවචරාලම්බනානෙව, අකුසලානි චෙව ඤාණවිප්පයුත්ත කාමාවචර ජවනානි චෙති ලොකුත්තරවජ්ජිත සබ්බාලම්බනානි, ඤාණ සම්පයුත්ත කාමාවචර කුසලානි චෙව පඤ්චමජ්ඣාන සංඛාත මභිඤ්ඤා කුසලඤ්චාති අරහත්ත මග්ගඵල වජ්ජිත සබ්බාලම්බනානි, ඤාණසම්පයුත්ත කාමාවචර ක්‍රියාචිත්තානි චෙව ක්‍රියාභිඤ්ඤා වොට්ඨපනඤ්චාති සබ්බථාපි සබ්බාලම්බනානි.........

| ප්‍රශ්න | උත්තර |
| --- | --- |
| 51 කාමාවචරාලම්බනික චිත්තයෝ කවරහු ද? | (ද්විපඤ්ච විඤ්ඤාණ සම්පටිච්ඡන ද්වය ය හැර) අවශෙෂ වූ සන්තීරණ තුන ය මහා විපාක අට ය යන එකාදස කාලම්බනයෝ ද, හසන චිත්තය ද යන දොළොස් සිත්හු සර්වප්‍රකාර යෙන්* කාමාවචරාලම්බනිකයෝ යි. |
| 52 ලොකොත්තර ධර්ම හැර සර්වාලම්බනික චිත්තයෝ කවරහු ද? | ද්වාදශාකුසල චිත්තයෝ† ද, ඤාණවිප්‍රයුක්ත කාමාවචර ක්‍රියා ජවන් අට ද යන දෙවිසි සිත්හු ලොකොත්තර ධර්ම හැර (ත්‍රෛභූමික ප්‍රඥප්ති ධර්ම යන් අරභයා පවත්නා හෙයින්) සර්වාලම්බනිකයෝ යි. |
| 53 අග්‍රමාර්ග ඵල සිත් හැර සර්වාලම්බනික චිත්තයෝ කවරහු ද? | ඤාණ සම්ප්‍රයුක්ත කාමාවචර කුසල් සිත් සතර ද, පඤ්චමධ්‍යාන යයි කියන ලද අභිඥා කුශල චිත්තය ද යන මොහු පස්දෙන අග්‍රමාර්ග ඵල වර්ජිත සර්වාලම්බනිකයෝ යි. |
| 54 කාමාවචර මහද්ගත ලොකොත්තර ප්‍රඥප්ති වශයෙන් සර්වාලම්බනික චිත්තයෝ කවරහු ද? | ඤාණ සම්ප්‍රයුක්ත කාමාවචර ක්‍රියා සතර ද, ක්‍රියාභිඥා චිත්තය ද, වොට්ඨපන සංඛ්‍යාත වූ මනොද්වාරාවර්ජනය ද යන සදෙන සර්වප්‍රකාර යෙන් සර්වාලම්බනිකයෝ යි. |

* මෙයි විපාකයෝ සන්තීරණාදි වශයෙන් පඤ්චාලම්බනයෙයි ද පිළිසිඳීම් වශයෙන් ෂඩාලම්බන සඞ්ඛ්‍යාත කාමාවචරාලම්බනයෙයි ද පවතිත්, හසන සිත් තෙමේ ද විදර්ශනා වඩන පිණිස රම්‍යස්ථාන දැක මේ සෙනාසුන විදර්ශනාවට සුදුසු යයි ද භාණ්ඩ භාජන ස්ථානයෙහි මහත් ශබ්ද අසා මා භාෂණාව ප්‍රහීන වූයේ යයි ද චෛත්‍යාදියෙහි සුවඳදීන් පුදන කල ද රසවත් පිඬු සබ්‍රහ්මචාරීන් හා බෙදා වළඳන කල ද ආභිසමාචාරික වත් පුරණ කල ද පූර්වේනිවාසානුස්මෘතිඥානාදීන් විසින් ගන්නා ලද කාමාවචර ධර්මයන් අරභයා ද යන මෙකී තන්හි සතුටුවන්නානට රූප ශබ්ද ගන්ධ රසස්ප්‍රෂ්ටව්‍ය ධර්ම යන ෂඩාලම්බනයන්හි පවත්නා හෙයින් සර්වප්‍රකාර යෙන් යයි කියනලදී.

† දෘෂ්ටිසම්ප්‍රයුක්ත ලොභ සහගත සිත් සතර පරිත්තාදීන් අරභයා පරාමර්ශාභිනිවේශ වශයෙන් ද විප්‍රයුක්ත සතර ද ආස්වාදනාභිනන්දන වශයෙන් ද පැවැත්මෙන් පරිත්තාලම්බනයෝ වෙත්. ද්වේෂ සහගත දෙක ද මහද්ගත ප්‍රඥප්ත්‍යාලම්බනයෝ වෙති. එසේම ප්‍රතිඝද්වය ය දෞර්මනස්‍ය විප්‍රතිසාර වශයෙන් ද මොමූහද්වය ය සංශය විචිකිච්ඡා වශයෙන් ද පරිත්තාලම්බනාදියෙහි පැවැත්මෙන් පරිත්තාදි ආලම්බනයෝ වෙති.

ආරුප්පෙසු දුතිය චතුත්ථානි, මහග්ගතාලම්බනානි, සෙසානි පන මහග්ගත විඤ්ඤාණානි සබ්බානිපි පඤ්ඤත්තාලම්බනානි ලොකුත්තර විඤ්ඤාණානි නිබ්බානාලම්බනානීති.

පඤ්චවීස පරිත්තම්හි ඡ චිත්තානි මහග්ගතෙ
එකවීසති වොහාරෙ අට්ඨ නිබ්බාන ගොචරෙ.

වීසානුත්තරමුත්තම්හි අග්ගමග්ගඵලුජ්ඣිතෙ
පඤ්ච සබ්බත්ථ ඡච්චෙති සත්තධා තත්ථ සඞ්ගහො.

---

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 55 | කවර සිත්හු මහද්ගතාලම්බනයෝ වෙත් ද? | අරූපාවචර සිත්හි (ප්‍රථම තෘතීයාරූප්‍යය යි කියන ලද ආකාසානඤ්චායතන ආකිඤ්චඤ්ඤායතන සිත් අරමුණු කොට ඇති හෙයින්) ද්විතීය චතුර්ථාරූප්‍ය යයි කියන ලද විඤ්ඤාණඤ්චායතන නෙවසඤ්ඤානාසඤ්ඤායතන කුසල විපාක ක්‍රියා සිත්හු මහද්ගතාලම්බනයෝ වෙත්. |
| 56 | කවර සිත්හු ප්‍රඥප්ති ආලම්බනයෝ වෙත් ද? | (ද්විතීය චතුර්ථාරූප්‍ය සිත් හැර අවශෙෂ වූ (රූපාවචර අරූපාවචර කුසල විපාක ක්‍රියා යයි කියන ලද) සියලු මහද්ගත සිත්හු (කසිණාදි) ප්‍රඥප්ති ආලම්බනයෝ වෙත්. |
| 57 | කවර සිත්හු නිර්වාණාලම්බනයෝ වෙත් ද? | ලොකොත්තර කුශල විපාක සිත්හු නිර්වාණාලම්බනයෝ වෙත්. |
| 58 | සියලු සිත්හු ආලම්බන වශයෙන් කොතෙක් ප්‍රකාර සඞ්ග්‍රහයට යෙත් ද? | කාමාවචර තෙවිසි විපාක සිත්හු ය පඤ්චද්වාරාවජ්ජන හසිතුප්පාද දෙසිත ය යන පස්විසි සිත්හු පරිත්ත යයි කියන ලද කාමාවචරාලම්බනයෙහි ද, ද්විතීය චතුර්ථාරූප්‍ය සිත් ස දෙන මහද්ගතාලම්බනයෙහි ද, සෙසු එක්විසි මහද්ගත සිත්හු වොහාර යයි කියන ලද ප්‍රඥප්ත්‍යාලම්බනයෙහි ද, ලොකොත්තර සිත් අට නිර්වාණාලම්බනයෙහි ද, දෙලොස් අකුසල් සිත්හු ය ඥානවිප්‍රයුක්ත කාමාවචර කුසලාදි අට ය යන විංශති සිත්හු ලොකොත්තර සිත් හැර සියලු ආලම්බනයන්හි ද, ඥානසම්ප්‍රයුක්ත කාමාවචර කුසල් සිත් සතර ය ප්‍රථම ධ්‍යානික කුසල චිත්ත ය යන සිත් පස අර්හත්මාර්ග ඵල ද්වය ය හැර අවශෙෂාලම්බනයන්හි ද, ඥානසම්ප්‍රයුක්ත කාමාවචර ක්‍රියා සතර ය පඤ්චමධ්‍යානික ක්‍රියාභිඥාචිත්ත ය මනොද්වාරාවර්ජනය යන ස දෙන සියලු ආලම්බනයන්හි දැයි මෙසේ සත් ප්‍රකාරයකින් සඞ්ග්‍රහයට යෙත්. |

වත්ථුසඞ්ගහෙ වත්ථූනි නාම චක්ඛු සොත ඝාන ජිව්හා කාය හදය වත්ථුචෙති ඡබ්බිධානි භවන්ති......තානි කාමලොකෙ සබ්බානිපි ලබ්භන්ති, රූපලොකෙ පන ඝානාදිත්තයං නත්ථි, අරූපලොකෙ පන සබ්බානිපි නසංවිජ්ජන්ති, තත්ථ පඤ්චවිඤ්ඤාණ ධාතුයො යථාක්කමං එකන්තෙන පඤ්චප්පසාදවත්ථූනි නිස්සායෙව පවත්තන්ති, පඤ්චද්වාරාවජ්ජන සම්පටිච්ඡන සඞ්ඛාතා මනොධාතු ච හදයං නිස්සිතායෙව පවත්තන්ති......

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 59 | කවර හෙයකින් චක්ෂුරාදීහු වස්තු නම් වෙත් ද? | චිත්ත චෛතසිකයන් චක්ෂුරාදීන් ඇසුරු කොට ගෙණ වාසය කරන හෙයින් චක්ෂුශ්ශ්‍රොත්‍රාදීහු වස්තු නම් වෙත්. |
| 60 | වස්තූහු කොතෙක් ප්‍රකාර ද? | (චක්ෂුශ්ශ්‍රොත්‍ර ඝ්‍රාණ ජිහ්වා කාය හෘදයවස්තු වශයෙන් ෂට්) ප්‍රකාර යි. |
| 61 | කාම ලොකයෙහි වස්තු කොතෙක් ද? | පරිපූර්ණ ඉන්ද්‍රියයන් ඇත්තවුන් එහි ලැබෙන බැවින් චක්ෂුරාදි හැම වස්තු හුම ලැබෙත්. |
| 62 | රූප ලොකයෙහි කොතෙක් වස්තු ද? | [ඝ්‍රාණ ජිහ්වා කාය (ප්‍රසාද) වස්තු ත්‍රය ය හැර චක්ෂුශ්ශ්‍රොත්‍ර (ප්‍රසාද) වස්තු ද්වය ය හෘදය වස්තු ය යන] වස්තු ත්‍රයයක් ලැබේ.* |
| 63 | අරූප ලොකයෙහි කිසි වස්තුවෙක් පවතී ද? | අරූපීන්ගේ රූපවිරාග භාවනා බල යෙන් සර්වප්‍රකාරයෙන් එහි රූප පැවැත්මක් නැති හෙයින් කිසි වස්තුවෙක් නො පවතී. |
| 64 | පඤ්චවිඥාන ධාතූහු කුමන වස්තුවක් නිසා පවත්නාහු ද? | පඤ්චවිඥාන ධාතූහු එකාන්ත යෙන් චක්ෂුශ්ශ්‍රොත්‍ර ඝ්‍රාණ ජිහ්වා කාය යන පඤ්චප්‍රසාද වස්තූන් නිසා යථා ක්‍රමයෙන් පවත්නාහු ය. |
| 65 | මනොධාතුව කුමන වස්තු නිසා පවතී ද? | පඤ්ච ද්වාරාවර්ජන සම්පටිච්ඡන සඞ්ඛ්‍යාත මනොධාතුව හෘදයවස්තුව නිසාම පවතී. |

* බ්‍රහ්මයන්ගේ කාමවිරාග භාවනා වශයෙන් ගන්ධ රස ස්ප්‍රෂ්ටව්‍යයන්හි නො ඇලි බැවින් එයට විෂය වූ ප්‍රසාදයන් නොරෙයි ද නො ඇලීම ලැබෙන හෙයින් ඝ්‍රාණාදි ත්‍රය ය නැත්තේ ය. බුද්ධ දර්ශන ධර්ම ශ්‍රවණාදියට ඕනෑස චක්ෂුශ්ශ්‍රොත්‍රයන්හි නො ඇලි බැවින් එහි චක්ෂුශ්ශ්‍රොත්‍ර වස්තු ද්වය ය ලැබේ. එයින් කීහ:- අභිධර්මාර්ථ විභාවනියෙහි, "බ්‍රහ්මානං කාම විරාග භාවනා වසෙන ගන්ධ රස ඵොට්ඨබ්බෙසු විරත්තතාය ඝානාදිත්තය පසාදෙසුපි විරාග සම්භවතො බුද්ධ දස්සන ධම්ම සවණාදි අත්ථිතාය චක්ඛු සොතෙසු අවිරත්ත භාවතො චක්ඛාදි ද්වයං තත්ථ උපලබ්භන්ති."

අවසෙසා පන මනොවිඤ්ඤාණධාතු සඞ්ඛාතා ච සන්තීරණ මහාවිපාක පටිඝද්වය පඨම මග්ග හසන රූපාවචර වසෙන හදයං නිස්සායෙව පවත්තන්ති.

අවසෙසා කුසලාකුසල ක්‍රියානුත්තර වසෙන පුන නිස්සාය වා අනිස්සාය වා, ආරුප්පවිපාක වසෙන හදයං අනිස්සායෙවාති.

ඡවත්ථුං නිස්සිතා කාමෙ සත්ත රූපෙ චතුබ්බිධා
තිවත්ථුං නිස්සිතා රූප්පෙ ධාත්වෙකා නිස්සිතා මතා.

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 66 | හෘදය වස්තුව නිසා කොතෙක් ධර්ම පවතිත් ද? | (සන්තීරණ ත්‍රිතය, මහා විපාක අටය, ප්‍රතිඝ දෙකය, ප්‍රථම මාර්ගය, හසිතුප්පාදය, පසළොස් රූපාවචරය යන මොවුන්ගේ වසයෙන් පැවැති මනොධාතු පඤ්චවිඤ්ඤාණ ධාතු හැරෙන් අවශෙෂ වූ මනොවිඤ්ඤාණ ධාතු සඞ්ඛ්‍යාත) තිස් ධර්මයෝ හෘදය වස්තුව නිසා ම පවතිත්. |
| 67 | හෘදය වස්තුව නිසාද නො නිසා ද කොතෙක් සිත් පවත්නාහු ද? | (අවශෙෂ කාමාවචර අරූපාවචර කුසල් දෙළොසය, ප්‍රතිඝ ද්වය ය හැර අකුසල් දස ය, මනොද්වාරාවර්ජන සහිත කාමාවචර අරූපාවචර ක්‍රියා තෙලෙස ය, ප්‍රථම මාර්ගය හැර ලොකොත්තර සතය යන) දෙ සාළිස් සිත්හු කාම රූප ලොක වශයෙන් හෘදය වස්තුව නිසාද අරූපලොක වශයෙන් හෘදය වස්තුව නො නිසා ද පවතිත්. |
| 68 | අරූප විපාකයෝ හෘදය නිසා පවතිත් ද? | (අරූපලොකයෙහි රූප පැවැත්මක් නැත්තෙන්) හෘදය වස්තුව නො නිසා ම පවතිත්. |
| 69 | කාමභවයෙහි කොතෙක් ධාතුහු කොතෙක් වස්තු නිසා පවතිත් ද? | (චක්ෂුරාදි පඤ්චවිඥාන ධාතුය මනොධාතු ය මනොවිඥාන ධාතු ය යන) සප්ත ධාතුහු ෂඩ් වස්තූන් නිසා පවතිත්. |
| 70 | රූපභවයෙහි කොතෙක් ධාතුහු කොතෙක් වස්තු නිසා පවතිත් ද? | (ඝ්‍රාණාදි ත්‍රය ය හැර චක්ෂුශ්ශ්‍රොත්‍ර විඥාන දෙක ය මනොධාතු ය මනොවිඥාන ධාතු ය යන) සතර ධාතුහු චක්ෂුශ්ශ්‍රොත්‍ර හෘදය යන වස්තු තුන නිසා පවතිත්. |
| 71 | අරූපභවයෙහි කොතෙක් ධාතු පවතී ද? | කිසි වස්තුවෙක් ඇසුරු නො කොට එකම මනොවිඤ්ඤාණ ධාතුවෙක් පවතී. |
| 72 | හෘදය වස්තුව ඇසුරු නොකොට කොතෙක් සිත් උපදනාහු ද? | (කාමාවචර තෙවිසි විපාක ද පඤ්චද්වාරාවර්ජන හසන ද්වයය ද ප්‍රතිඝ ද්වය ද යන සත්විසි කාමාවචර චිත්තයෝය ද, පසළොස් රූපාවචර සිත්හු ද, ප්‍රථම මාර්ග සිත ද යන) තෙසාළිස් සිත්හු උපදනාහු ය. |

තෙචත්තාලීස නිස්සාය ද්වෙචත්තාලීස ජායරෙ
නිස්සාය ච අනිස්සාය පාකාරුප්පා අනිස්සිතාති.

ඉති අභිධම්මත්ථ සඞ්ගහෙ පකිණ්ණක සඞ්ගහ විභාගො නාම

## තතියො පරිච්ඡෙදො.

---

විත්තුප්පාදාන මිච්චෙවං කත්වා සඞ්ගහමුත්තරං
භූමි පුග්ගල භෙදෙන පුබ්බාපර නියාමිතං.

පවත්ති සඞ්ගහං නාම පටිසන්ධිපවත්තියං
පවක්ඛාමි සමාසෙන යථා සම්භවතො කථං.

| | ප්‍රශ්න | උත්තර |
| --- | --- | --- |
| 73 | හෘදය වස්තුව නිසා ද නො නිසා ද කෙතෙක් සිත් උපදනාහු ද? | ප්‍රතිඝ ද්වය හැර අකුසල දසය ද කාමාවචර කුසල ක්‍රියා සොළොස ද එසේම අරූපාවචර අට ද මනොද්වාරාවර්ජනය ද ප්‍රථම මාර්ග ය හැර ලොකොත්තර සත ද යන දෙසාළිස් සිත්හු පඤ්චවොකාර චතුවොකාර භව වශයෙන් හෘදය වස්තුව නිසා ද නො නිසා ද උපදනාහු ය. |
| 74 | හෘදය වස්තුව ඇසුරු නො කොට සිත් උපදනාහු ද? | අරූපාවචර විපාක සිත් සතර හෘදය වස්තුව ඇසුරු නො කොට උපදනාහු ය. |

## තුන්වන පරිච්ඡේදය නිමියේ යි.

---

| | | |
| --- | --- | --- |
| 1 | භූමි භෙදය කුමක් ද? | කාමාවචර රූපාවචරාදි භූමින්ගේ භෙදය භූමිභෙද නම් වේ. |
| 2 | පුද්ගල භෙදය යනු කුමක් ද? | ද්විහෙතුකාදි භෙදය පුද්ගල භෙද නම් වේ. |
| 3 | පූර්වාපර නියමය යනු කුමක් ද? | මේ මෙතෙක් චිත්තයන් සොරෙන් උපදින් මේ සිතට අනතුරුව මෙතෙක් සිත් උපදින් යයි පූර්වාපර චිත්තයන්ගේ නියමය පූර්වාපර නියමය නම් වේ. |

8-2

ඡ වත්ථූනි ඡ ද්වාරානි ඡ ආලම්බනානි ඡ විඤ්ඤාණානි ඡ වීථියො ඡධා විසයප්පවත්ති චෙති වීථිසඞ්ගහෙ ඡ ඡක්කානි වෙදිතබ්බානි.

වීථිමුත්තානං පන කම්ම කම්මනිමිත්ත ගතිනිමිත්ත වසෙන තිවිධා හොති විසයප්පවත්ති, තත්ථ වත්ථු ද්වාරාලම්බනානි පුබ්බෙ වුත්තනයානෙව චක්ඛුවිඤ්ඤාණං සොතවිඤ්ඤාණං ඝාන විඤ්ඤාණං ජිව්හාවිඤ්ඤාණං කායවිඤ්ඤාණං මනොවිඤ්ඤාණංචෙති ඡ විඤ්ඤාණානි.

වීථියො පන චක්ඛුද්වාරවීථි සොතද්වාරවීථි ඝානද්වාරවීථි ජිව්හාද්වාරවීථි කායද්වාරවීථි මනොද්වාරවීථි චෙති ද්වාර වසෙනවා, චක්ඛු විඤ්ඤාණවීථි සොතවිඤ්ඤාණවීථි ඝානවිඤ්ඤාණවීථි ජිව්හා විඤ්ඤාණවීථි කායවිඤ්ඤාණවීථි මනොවිඤ්ඤාණවීථි චෙති විඤ්ඤාණ වසෙන වා ද්වාරප්පවත්තා චිත්තප්පවත්තියො යොජෙතබ්බා.

---

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 4 | ෂට්ක කොතෙක් ද? | (ෂඩ්වස්තු ය ෂඩ්ද්වාර ය ෂඩාලම්බන ය ෂඩ්විඥාන ය ෂඩ්වීථි ය ෂඩ්විධ විෂයප්‍රවෘත්ති යයි) ෂට්ක සයෙක් වේ. |
| 5 | වීථිමුක්ත විෂය ප්‍රවෘත්ති කොතෙක් ප්‍රකාර ද? | වීථිමුක්ත (යයි කියන ලද ප්‍රතිසන්ධි භවාඞ්ග චුති චිත්ත)යන්ගේ කර්ම කර්ම නිමිත්ත ගතිනිමිත්ත වශයෙන් විෂය ප්‍රවෘත්ති තුන් ප්‍රකාරයෙක් වේ.* |
| 6 | ෂඩ් විඥානයෝ කවරහු ද? | චක්ඛුවිඤ්ඤාණ ය සොතවිඤ්ඤාණ ය ඝානවිඤ්ඤාණ ය ජිව්හාවිඤ්ඤාණ ය කායවිඤ්ඤාණ ය මනොවිඤ්ඤාණ ය යන මොහු ෂඩ් විඤ්ඤාණයෝ යි. |
| 7 | වීථිචිත්තයෝ කොතෙක් ප්‍රකාර වෙත් ද? | (චක්ඛුද්වාර වීථි‡ සොතද්වාර වීථි ඝානද්වාර වීථි ජිව්හා ද්වාර වීථි කාය ද්වාර වීථි මනොද්වාර වීථි යයි ද්වාර වශයෙන් ද, චක්ඛුවිඤ්ඤාණ වීථි යනාදි වශයෙන් ද) ෂට් ප්‍රකාර වෙත්. |

---

*විෂය වූවන්ගේ ද්වාරයන්හි ද විෂය වූවන් කෙරෙහි ද චිත්තයන්ගේ පැවැත්ම විෂය ප්‍රවෘත්ති නම් වේ.

‡ චක්ෂුද්වාරයෙහි පැවැති චිත්ත පරම්පරා තොමෝ චක්ෂුද්වාරවීථි නම් වේ. සෙසු ද්වාරවීථිහු ද මෙසේම දත යුත්තාහ.

අති මහන්තං මහන්තං පරිත්තං අතිපරිත්තඤ්චෙති පඤ්චද්වාරෙ මනොද්වාරෙ විභූතමවිභූතඤ්චෙති ඡධා විසයප්පවත්ති වෙදිතබ්බා............

කථං උප්පාදට්ඨිති භඞ්ග වසෙන ඛණත්තයං එකචිත්තක්ඛණං නාම,

| ප්‍රශ්න | උත්තර |
| --- | --- |
| 8 විෂය ප්‍රවෘත්ති සඞ්ඛ්‍යාත ආලම්බන කොතෙක් ප්‍රකාර ද? | ([1]අති මහන්ත ය [2]මහන්ත ය [3]පරිත්ත ය [4]අති පරිත්ත ය කියා පඤ්චද්වාර වශයෙන් සතරෙක් ද, [5]විභූත ය අවිභූත ය කියා මනොද්වාර වශයෙන් දෙකෙක් දැයි) ෂට් ප්‍රකාර වෙත්. |
| 9 එක් සිතකට ක්ෂණ කොතෙක් ද? | (උත්පාදක්ෂණ ය ස්ථිතික්ෂණ ය භඞ්ග ක්ෂණ යයි ක්ෂණ) ත්‍රයයෙක් වේ.* |

1 “ඒකචිත්තක්ඛණාතීතානි භුත්වා ආපාථගතං සොළස චිත්තක්ඛණායුකං අතිමහන්තං නාම” එක් චිත්තක්ෂණයක් ඉක්ම සොළොස් චිත්තක්ෂණයකට ආයු ඇතිව හමුවූ අරමුණ ‘අතිමහන්ත’ නම් වේ.

2 “ද්විතිචිත්තක්ඛණාතීතං හුත්වා පඤ්චදස චුද්දස චිත්තක්ඛණායුකං මහන්තං නාම” දෙ තුන් චිත්තක්ෂණයක් ඉක්ම පසළොස් තුදුස් චිත්තක්ෂණයකට ආයු ඇතිව හමුවූ අරමුණ ‘මහන්ත’ නම් වේ.

3 “චතු චිත්තක්ඛණතො පට්ඨාය යාව නව චිත්තක්ඛණායුකං තෙරස චිත්තක්ඛණතො පට්ඨාය යාව අට්ඨ චිත්තක්ඛණායුකං පරිත්තං නාම” සතර චිත්තක්ෂණයෙහි පටන් නව චිත්තක්ෂණය දක්වා ඉක්ම තෙළෙස් චිත්තක්ෂණයෙහි පටන් අට චිත්තක්ෂණය දක්වා ආයු ඇතිව හමුවූ අරමුණ ‘පරිත්ත’ නම් වේ.

4 “දස චිත්තක්ඛණතො පට්ඨාය යාව පඤ්චදස චිත්තක්ඛණාතීතං සත්තචිත්තක්ඛණතො පට්ඨාය යාව ද්වි චිත්තක්ඛණායුකං අතිපරිත්තං නාම” දස චිත්තක්ෂණයෙහි පටන් පසළොස් චිත්තක්ෂණය දක්වා ඉක්ම සත් චිත්තක්ෂණයෙහි පටන් ද්වි චිත්තක්ෂණය දක්වා හමුවූ අරමුණ ‘අති පරිත්ත’ නම වේ.

5 ප්‍රකටාලම්බන ය ‘විභූත, යි අප්‍රකටාලම්බන ය ‘අවිභූත’ යි.

* එක් චිත්තයක්හුගේ උත්පාදය උත්පාදක්ෂණය වේ. නිරුද්ධය භඞ්ගක්ෂණය වේ. උත්පාද නිරොධාන්තරය ස්ථිතික්ෂණ නාම වේ. මේ ශූක්ෂ්මාතිශූක්ෂ්මතර වූ චිත්තක්ෂණ ආචාර්යයන්ගේ ද ඇතිව බුදුවරුන් විනා අවබොධ කට නුහු.

තානි පන සත්තරස චිත්තක්ඛණානි රූපධම්මානමායු. එකචිත්තක්ඛණාතීතානි වා බහුචිත්තක්ඛණාතීතානි වා ඨිතිප්පත්තානෙව පඤ්චාලම්බනානි පඤ්චද්වාරෙ ආපාථමාගච්ඡන්ති, තස්මා යදි එකචිත්තක්ඛණාතීතකං රූපාරම්මණං චක්ඛුස්ස ආපාථමාගච්ඡති තතො ද්වික්ඛත්තුං භවඞ්ගෙ චලිතෙ භවඞ්ගසොතං වොච්ඡින්දිත්වා තමෙව රූපාරම්මණං ආවජ්ජන්තං පඤ්චද්වාරාවජ්ජනචිත්තං උප්පජ්ජිත්වා නිරුජ්ඣති,

| | ප්‍රශ්න | උත්තර |
| --- | --- | --- |
| 10 | රූපධර්මයන්ට ආයු කොපමණ ද? | සත්‍ලොස් චිත්තක්ෂණයෙක් රූපධර්මයන්ගේ ආයු වේ.‡ |
| 11 | පඤ්චාලම්බනයෝ කොතෙක් සිත් ඉක්ම ගොචර භාවයට යෙත් ද? | එක් චිත්තක්ෂණයක් ඉක්ම හෝ බොහෝ චිත්තක්ෂණ ඉක්ම හෝ ස්ථිතිප්‍රාප්ත වූ රූපාදි පඤ්චාලම්බනයෝ චක්ෂුඃ ප්‍රසාදාදි පඤ්චද්වාරයෙහි ගොචර භාවයට යෙත්.* |
| 12 | එක් සිතක් ඉක්ම රූපාරම්මණය ඇසට ගොචර වන කල්හි භවාඞ්ග සිතට කුමක් වේ ද? | රූපාරම්මණය ඇසට ගොචර වන කල්හි මනොද්වාර ප්‍රතිසන්ධිචිත්ත සඞ්ඛ්‍යාත භවාඞ්ග චිත්තය දෙවරක් චලනය වේ.§ |
| 13 | භවාඞ්ග චලිත වූ කල කුමක් වේ ද? | භවාඞ්ග ප්‍රවාහ යයි කියන ලද ප්‍රතිසන්ධි චිත්ත පරම්පරාව සිඳේ. |
| 14 | භවාඞ්ගස්‍රොතස සිඳි කල්හි කුමක් කෙරේ ද? | භවාඞ්ග ස්‍රොතස සිඳි කල්හි ඇසට හමු වූ රූපාරම්මණය මේ කිමෙක් දැයි ආවර්ජනය කරන්නාක් මෙන් පඤ්චද්වාරාවර්ජනය ඉපිද, නිරුද්ධ වේ. |

‡ අරූපධර්ම ලඝුපරිණාම බැවින් ද රූපධර්ම ගරුපරිණාම බැවින් ද එක් චිත්තොත්පාදයෙක්හි උපන් රූපධර්ම සත්‍ලොස්වන චිත්තයාගේ නිරුද්ධය සමග නිරුද්ධ වේ. එහෙයින් සත්‍ලොස් චිත්තක්ෂණයෙක් රූපධර්මයන්ගේ ආයුස යයි කියනු ලැබේ. "රූපධම්මානායු විඤ්ඤත්තිද්වය ලක්ඛණ රූපවජ්ජානං රූපධම්මානං" යි යු බැවින් මෙයි රූපධර්ම යනු කායවිඤ්ඤප්ති වචීවිඤ්ඤප්ති සඞ්ඛ්‍යාත විඤ්ඤප්ති ද්වය ය "උපචය සන්තති ජරතා අනිච්චතා" යන ලක්ෂණ රූපය ද හැර යි.

* 'ගොචර භාවයට යෙත්' යනු රූපාරම්මණ ශබ්දාරම්මණ දෙ දෙනා තම තමන්ගේ ස්ථානයෙහි සිටම ගොචර බවට යෙති. සෙසු ගන්ධ රස ස්ප්‍රෂ්ටව්‍යාලම්බනයෝ වනාහි ඝ්‍රාණ ජිහ්වා කාය යන ඉන්ද්‍රියයන්හි ඇලුනාහුම ඝ්‍රාණාදි විඥානයන්ගේ උත්පත්තියට හෙතු වෙති.

§ "යථා වෙගෙන ධාවන්තස්ස ඨාතුකාමස්ස පුරිසස්ස එකපදවාරෙ අභික්කමිත්වා ඨිතස්සාපි එවමෙවප්පවත්තිද්වික්ඛත්තුං උප්පජ්ජිත්වාව චලවිච්ඡිජ්ජති" යමසේ වේගයෙන් දුවමින් සිටිනු කැමති පුරුෂ තෙම එක් දෙපද වාරයෙක් ඉක්මවාම සිටි ද එසේම දෙවරක් ඉපදම සිඳේ. මෙහි ප්‍රථම චිත්තය භවාඞ්ග සන්තතිය චලනය කරන්නාක් මෙන් උපදින බැවින් භවාඞ්ග චලන යයි ද දෙවැනි සිත ඒ භවාඞ්ග සන්තතිය සිඳිනාකාරයෙන් උපදනා හෙයින් භවඞ්ගුපච්ඡෙද යයි ද ව්‍යවහාර කෙරෙති. මෙසේ වනාහි අට්ඨකථායෙන් කියන ලදී.

තතො තස්සානන්තරං තමෙව රූපං පස්සන්තං චක්ඛුවිඤ්ඤාණං සම්පටිච්ඡන්තං සම්පටිච්ඡනචිත්තං සන්තීරයමානං සන්තීරණචිත්තං වවත්ථපෙන්තං වොට්ඨබ්බනචිත්තඤ්චෙති යථාක්කමං උප්පජ්ජිත්වා නිරුජ්ඣන්ති.

තතො පරං එකූනතිංස කාමාවචරජවනෙසු යංකිඤ්චි ලද්ධප්පච්චයං යෙභුය්‍යෙන සත්තක්ඛත්තුං ජවති, ජවනානුබන්ධානි ච ද්වෙ තදාලම්බනපාකානි යථාරහං පවත්තන්ති, තතො පරං භවඞ්ගපාතො. එත්තාවතා චුද්දස වීථිචිත්තුප්පාදා ද්වෙ භවඞ්ගචලනානි පුබ්බෙවාතීතකමෙකචිත්තක්ඛණන්ති කත්වා සත්තරස චිත්තක්ඛණානි පරිපූරෙන්ති තතො පරං නිරුජ්ඣති, ආලම්බනමෙතං අතිමහන්තං නාම ගොචරං.

| ප්‍රශ්න | උත්තර |
|---|---|
| 15 පඤ්චද්වාරාවර්ජනයට අනතුරුව ජවනය දක්වා කොතෙක් සිත්හු ඉපද නිරුද්ධ වෙත් ද? | [තදනන්තරව එම රූපය (ප්‍රත්‍යක්ෂ ලෙසින් බලන්නාක් මෙන්) චක්ෂුර් විඥානය ද, (මනාව පිළිගන්නාක් මෙන්) සම්පටිච්ඡනය ද, (මනාව තීරණය කරන්නාක් මෙන්) සන්තීරණය ද, (ව්‍යවස්ථාපන කරන්නාක් මෙන්) වොට්ඨපනය ද යන] සතර සිත්හු ඉපිද නිරුද්ධ වෙති. |
| 16 ජවන චිත්තය කොතෙක් වර දිවේ ද? | (විංසති කුශලාකුශල ය, අට මහ ක්‍රියා ය, හසිතුප්පාද ය යන එකුන්තිස් කාමාවචර ජවන් අතුරෙහි ලබන ලද ප්‍රත්‍යය* ඇති යම් කිසි ජවනයෙක් බෙහෙවින්) සත් වරෙක් දිවේ. |
| 17 ජවනානුබන්ධව කොතෙක් සිත්හු පවතිත් ද? | තදාලම්බන නම් වූ විපාක සිත් දෙ දෙනෙක් සුදුසු පරිද්දෙන් (ආලම්බන ජවනානුරූපව) පවතිත්. |
| 18 තදාලම්බනානන්තරව කවර චිත්තයෙක් උපදී ද? | (වීථි චිත්ත වශයෙන් නො පැවැත තදාලම්බනයට අනතුරුව) භවාඞ්ග චිත්තය උපදී. |
| 19 අතිමහන්තාලම්බනය යනු කුමක් ද? | පඤ්චද්වාරාවර්ජනය පටන් ද්විතීය තදාලම්බනය දක්වා පැවැති චුද්දස වීථි චිත්තුප්පාදයෝ ද, භවාඞ්ගචලන ද්වය ද, ප්‍රථම අතීත භවාඞ්ග චිත්තක්ෂණය ද යන සතළොස් සිත් පරිපූර්ණව නිරුද්ධ වන ආලම්බනය අතිමහන්තාලම්බන නම් වේ. ‡ |

* ලබන ලද ප්‍රත්‍යය නම් යොනිසො අයොනිසො වශයෙන් කුශලාකුශල ජවන් ද ක්ෂීණාශ්‍රව සන්තාන වශයෙන් ක්‍රියා ජවන් ද වේ.

‡ වීථිචිත්තයන්ගේ ප්‍රවෘත්තිය පිණිස පිළිවෙළින් උපදනා ආකාරය සටහනින් දක්වමු. එහි පද සංස්ථානාක්ෂර මෙසේ යි. 'තී' අතීත භවාඞ්ගය, 'ල' භවාඞ්ගචලනය,

[අනිත් පිට හා සම්බන්ධයි.]

යාව තදාලම්බනුප්පාදා පන අප්පහොන්තාතීතකමාපාථමාගතමාලම්බනං මහන්තං නාම, තස්ස ජවනාවසානෙ භවඞ්ග පාතොව හොති නත්ථි තදාලම්බනුප්පාදො......

| ප්‍රශ්න | උත්තර |
| --- | --- |
| 20 මහන්තාලම්බනය යනු කුමක් ද? | තදාලම්බනොත්පාදය තෙක් නො පොහොනා සේ ඉකුත් චිත්තක්ෂණ ඇති ප්‍රකටත්වයට පැමිණි ජවන අවසන්හි භවඞ්ගපාතය වූ තදාලම්බනොත්පාදයකුදු අවිද්‍යමාන අරමුණ මහන්තාලම්බන නම් වේ. * |

'ද' භවඞ්ගුපච්ඡේදය, 'ප' පඤ්චද්වාරාවජ්ජනය, 'ච' චක්ඛුවිඤ්ඤාණය, 'සං' සම්පටිච්ඡනය, 'ණ' සන්තීරණය, 'වො' වොට්ඨපනය, 'ජ' ජවනය, 'ද' තදාලම්බනය 'භ' භවඞ්ගය, යන මොහු යි. මුල අග භවාඞ්ග නම් එක් විථිපරම්පරාවකට පෙර පසු පැවැති අප්‍රමාණ භවාඞ්ගයෝ යි. සම්බන්ධ බිඳු ත්‍රය ය නම් උත්පාද ස්ථිති භඞ්ග ලක්ෂණොපෙත චිත්තොත්පාදයකට ලකුණ යි.

### අතිමහන්තාලම්බන වීථි

භ භ | තී, න, ද, ප, ච, සං, ණ, වො, ජ ජ ජ ජ ජ ජ ජ, ද, ද | භ භ
ooo ooo | ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo | ooo ooo

භවාඞ්ග නම්:—අතීත භවයෙහි ගත් කර්මාදි අරමුණෙක්හි පැවැති හෘදය වස්තුව ඇසුරු කළ ප්‍රතිසන්ධි චිත්තයට බඳු චිත්ත යයි. භවාඞ්ග චලන නම් භවාඞ්ග සන්තානය චලනාකාරයෙන් පැවැත්ම යි. භවාඞ්ගුපච්ඡේද නම් භවාඞ්ග පරම්පරාව සිඳීම යි. ඉක්බිති පඤ්චද්වාරාවජ්ජනාදීහු වෙත්.

* මහන්තාලම්බනය දෙවරක් තුන්වරක් ඉකුත් වූ භවාඞ්ග විශෙෂයෙන් ප්‍රථම ද්විතීය මහන්තාලම්බන යයි ද්විප්‍රකාර වේ. ප්‍රථම මහන්තාලම්බනය ආරම්මණයාගේ දුබලත්වයෙන් චක්ෂුද්වාරයෙහි අනාපාථගතවම දෙවරක් භවාඞ්ගය ඉක්මවා උපදින හෙයින් තදාලම්බන ද්වයකට අවකාශ නැත්තෙන් "ද්විසත්තවාරමෙව හි තදාලම්බනුප්පත්ති පාලියං නියමිතා" යි වූ බැවින් එකෙක් නූපදී. එහෙයින් පසුව පතිත භවාඞ්ගය සමග රූපාරම්මණය නිරුද්ධ වේ.

### ප්‍රථම මහන්තාලම්බන වීථි

භ භ | තී, තී, න, ද, ප, ච, සං, ණ, වො, ජ ජ ජ ජ ජ ජ ජ, භ | භ භ
ooo ooo | ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo | ooo ooo

### ද්විතීය මහන්තාලම්බන වීථි

භ භ | තී, තී, තී, න, ද, ප, ච, සං, ණ, වො, ජ ජ ජ ජ ජ ජ ජ | භ භ
ooo ooo | ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo | ooo ooo

තුන්වරක් අතීත වූයෙන් ජවනාවසානයෙහි ම අරමුණ නිරුද්ධ වේ.

යාව ජවනුප්පාදම්පි අප්පහොන්තාතීතකමාපාථමාගතමාලම්බනං පරිත්තං නාම, තත්ථ ජවනම්පි අනුප්පජ්ජිත්වා ද්විත්තික්ඛත්තුං වොට්ඨපනමෙව පවත්තති තතො පරං භවඞ්ගපාතො හොති.

යාව වොට්ඨපනුප්පාදා ච පන අප්පහොන්තාතීතකමාපාථමාගතං නිරොධාසන්නමාලම්බනං අති පරිත්තං නාම තත්ථ භවඞ්ගචලනමෙව හොති නත්ථි වීථිචිත්තුප්පාදො.

| ප්‍රශ්න | උත්තර |
|---|---|
| 21 පරිත්තාලම්බනය යනු කුමක් ද? | ජවනොත්පාදය දක්වා නො පොහොනා සේ ඉක්ම ගියා වූ චිත්තක්ෂණ ඇති විෂය බවට පැමිණි ජවන් ද නො ඉපැද දෙතුන් වරක් ව්‍යවස්ථාපන චිත්තය පැවැත භවාඞ්ග පාතය වන අරමුණ පරිත්තාලම්බන නම් වේ. * |
| 22 අතිපරිත්තාලම්බන යනු කුමක් ද? | ව්‍යවස්ථාපන චිත්තය දක්වා නො පොහොනා සේ ඉකුත් වූ චිත්තක්ෂණ ඇති විෂය බවට පැමිණි නිරුද්ධ වීමට සමීප භවාඞ්ග චලන මාත්‍රයක් වන වීථිචිත්තොත්පාද රහිත අරමුණ අතිපරිත්තාලම්බන නම් වේ. ‡ |

*පරිත්තාලම්බනය ද සතර චිත්තක්ෂණාදි වශයෙන් ෂට් ප්‍රකාර වේ. මෙයි අතීත භවාඞ්ග බහුලත්වයෙන් ජවනොත්පත්තියට ද නො පොහොනේ ය.

“ජවනාපි උප්පජ්ජමානං නියමෙනෙව සත්තචිත්තක්ඛණායුකමෙව උප්පජ්ජති” යි යු බැවින් (මරණ කාලාදිය හැර මෙබඳු තන්හි) ජවන් උපදිනු ලබන්නේ නියමයෙන් ම සත චිත්තක්ෂණායු විද්‍යමාන කල ම උපදී. ඉන් මදව නූපදින හෙයින් ව්‍යවස්ථාපනය ම දෙතුන් වරක් ඉපිද නිරුද්ධව ඉක්බිති භවාඞ්ග පාතය වේ. මේ පරිත්තාලම්බනයට වොට්ඨපන වාර යයි ද කියනු ලැබේ.

## පඨම පරිත්තාලම්බන වීථි

භ භ | තී තී තී තී ල ඡෙ ප ච සං ණ වො වො භ භ භ භ භ | භ භ

## දුතිය පරිත්තාලම්බන වීථි

භ භ | තී තී තී තී තී ල ඡෙ ප ච සං ණ වො වො භ භ භ භ | භ භ

## තතිය පරිත්තාලම්බන වීථි

භ භ | තී තී තී තී තී තී ල ඡෙ ප ච සං ණ වො වො භ භ භ | භ භ

## චතුත්ථ පරිත්තාලම්බන වීථි

භ භ | තී තී තී තී තී තී තී ල ඡෙ ප ච සං ණ වො වො භ භ | භ භ

## පඤ්චම පරිත්තාලම්බන වීථි

භ භ | තී තී තී තී තී තී තී තී ල ඡෙ ප ච සං ණ වො වො භ | භ භ

## ඡට්ඨ පරිත්තාලම්බන වීථි

භ භ | තී තී තී තී තී තී තී තී තී ල ඡෙ ප ච සං ණ වො වො | භ භ

‡ අතිපරිත්තාලම්බනය ද දශ චිත්තක්ෂණාදි වශයෙන් ෂට් ප්‍රකාරයෙකි. අතීත භවාඞ්ගයන්ගේ අති බහුලත්වයෙන් ව්‍යවස්ථාපන චිත්තොත්පාදයට නො පොහොනා හෙයින් වීථිචිත්තොත්පාදයකුදු නැත්තේ හිස් බැවින් මේ අති පරිත්තාලම්බනයට මොඝ වාරය යි ද කියනු ලැබේ.

ඉච්චෙවං චක්ඛුද්වාරෙ තථා සොතද්වාරාදීසු චෙති සබ්බථාපි පඤ්චද්වාරෙ තදාලම්බන ජවන වොට්ඨපන මොඝවාර සඞ්ඛාතානං චතුන්නං වාරානං යථාක්කමං ආරම්මණභූතා විසයප්පවත්ති චතුධා වෙදිතබ්බා.

| ප්‍රශ්න | උත්තර |
|---|---|
| 23 ශ්‍රොත්‍රද්වාරාදී වීථිහු කෙසේ ද? | ඝ්‍රාණාදිද්වාරික විඤ්ඤාණ විශෙෂය හැර සෙසු ශ්‍රොත්‍රද්වාරාදී වීථිහු ද චක්ෂුර්ද්වාර වීථිය මෙනි. |
| 24 පඤ්චද්වාරයෙහි අරමුණු පැවැත්ම කොතෙක් ප්‍රකාර ද? | (තදාලම්බන වාර ය, ජවන වාර ය, වොත්ථපන වාර ය, මොඝ වාර ය යි අරමුණු පැවැත්ම) සතර ප්‍රකාර යෙකි. |

පඨම අතිපරිත්තාලම්බන වීථි

භ භ | ති ති ති ති ති ති ති ති ති ති ල ල භ භ භ භ භ | භ භ
ooo ooo | ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo | ooo ooo

දුතිය අතිපරිත්තාලම්බන වීථි

භ භ | ති ති ති ති ති ති ති ති ති ති ති ල ල භ භ භ භ | භ භ
ooo ooo | ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo | ooo ooo

තතිය අතිපරිත්තාලම්බන වීථි

භ භ | ති ති ති ති ති ති ති ති ති ති ති ති ල ල භ භ භ | භ භ
ooo ooo | ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo | ooo ooo

චතුත්ථ අතිපරිත්තාලම්බන වීථි

භ භ | ති ති ති ති ති ති ති ති ති ති ති ති ති ල ල භ භ | භ භ
ooo ooo | ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo | ooo ooo

පඤ්චම අතිපරිත්තාලම්බන වීථි

භ භ | ති ති ති ති ති ති ති ති ති ති ගි ති ති ගි ල ල භ | භ භ
ooo ooo | ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo | ooo ooo

ඡට්ඨ අතිපරිත්තාලම්බන වීථි

භ භ | ති ති ති ති ති ති ති ති ති ති ති ති ති ති ති ල ල | භ භ
ooo ooo | ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo | ooo ooo

මේ පඤ්චද්වාරයෙහි වීථි සිත් පවත්නා ක්‍රමය යි.

වීථිචිත්තොත්පත්තිය හුව යේ ග්‍රහණය පිණිස අම්බොපමාදි උදාහරණ කෙරෙත්. අම්බොපමාව මෙසේය, එක් පුරුෂයෙක් පල ඇති අඹ රුකක් මුල හිස වසා පෙරව නිදන්නේ එහි ඉදුණු අඹ ඵලයක හඬින් පිබිදී හිස වැසි වස්ත්‍රය හැර ඇස දල්වා බලා එය රැගෙන මැඩ සිඹ පැසුණු බව දැන වළඳ මුවගත කෙළ සහිත අඹරසය ගිලැ නැවැතත් නිදන්නේ ය. එහි උපමා සංසන්දනය මෙසේ ය.

පුරුෂයා නිදන කාල මෙන් භවාඞ්ග කාලය ද, අඹ ඵලය හුණු කාල මෙන් අරමුණු ප්‍රසාදයෙහි ගැටුණු කාලය ද, ඒ හඬින් පිබිදී ගිය කාල මෙන් ආවර්ජන කාලය ද, ඇස හැර බැලූ කාල මෙන් චක්ෂුර්විඥාන කාලය ද, රැගත් කාල මෙන් සම්පටිච්ඡන කාලය ද, අතින් මැඩි කාල මෙන් සන්තීරණ කාලය ද, පැසුණු බව නියම දැනුම් පිණිස සිඹි කාල මෙන් වොත්ථපන කාලය ද, අඹඵල බුදින කාල මෙන් ජවනකාලය ද, මුව ගත කෙළ සහිත රසය ගිලි කාල මෙන් තදාලම්බනකාලය ද, නැවැත ගොස් වසා පෙරව නිදිගත් කාල මෙන් භවාඞ්ග කාලය ද දත යුතු.

වීථි චිත්තානි සත්තෙව චිත්තුප්පාදා චතුද්දස
චතුපඤ්ඤාස විත්ථාරා පඤ්චද්වාරෙ යථාරහං.

අයමෙත්ථ පඤ්චද්වාරෙ වීථිචිත්තප්පවත්තිනයො.

මනොද්වාරෙ පන යදි විභූතමාලම්බනමාපාථමාගච්ඡති තතො පරං භවඞ්ගචලන මනොද්වාරාවජ්ජන ජවනාවසානෙ තදාලම්බන පාකානි පවත්තන්ති, තතොපරං භවඞ්ග පාතො.

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 25 | වීථි සිත් කොතෙක් ද? | (පඤ්චද්වාරාවර්ජන ය චක්ඛුවිඤ්ඤාණ ය සම්පටිච්ඡන ය සන්තීරණ ය වොට්ඨපන ය ජවන ය තදාලම්බන ය කියා) සතෙකි. |
| 26 | වීථිහු චිත්තොත්පාද වශයෙන් කොතෙක් ද? | (පඤ්චද්වාරාවර්ජන ය චක්ඛුවිඤ්ඤාණ ය සම්පටිච්ඡන ය සන්තීරණ ය වොට්ඨපන ය ජවන් සත ය තදාලම්බනද්වය යයි චිත්තොත්පාද වශයෙන්) තුදුසෙකි. |
| 27 | පඤ්චද්වාරයෙහි සිත් කොතෙක් ද? | (විස්තර වශයෙන් කාමාවචර සියලු සිත් සම්භාව වන පරිද්දෙන්)සිව් පනසෙක් වෙත්. |
| 28 | පරිත්ත ජවන් වාර කොතෙක් ප්‍රකාර ද? | (විභූතාලම්බන අවිභූතාලම්බන වශයෙන්) ද්විප්‍රකාර වේ. |
| 29 | විභූතාලම්බනය යනු කුමක් ද? | මනොද්වාරයෙහි ප්‍රකටව හමු වූ මනොද්වාරාවර්ජන ජවන තදාලම්බන පැවැත්ත භවඞ්ගපාතය වූ අරමුණ විභූතාලම්බන නම් වේ.* |

* විභූතාලම්බන වීථිය ද ප්‍රථම ද්විතීයාදි වශයෙන් පඤ්ච ප්‍රකාර වේ. එක් වරක් භවාඞ්ගාතික්‍රමාදි වශයෙන් පස් වරක් භවාඞ්ගාතික්‍රමණය පමණක් විශෙෂ යි. ප්‍රථම විභූතාලම්බන හැරින් අවශෙෂ සතර ද සුබොධ වේ.

ප්‍රථම විභූතාලම්බන වීථි

| | | | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| භ | භ | \| | ති | ල | ඡේ | ම॥ | ජ | ජ | ජ | ජ | ජ | ජ | ජ | ද | ද | භ | භ | භ | භ | \| | භ | භ |
| ooo | ooo | \| | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | \| | ooo | ooo |

॥ 'ම' මනොද්වාරාවර්ජනය යි.

9-2

අවිභූතෙ පනාලම්බනෙ ජවනාවසානෙ භවඞ්ගපාතොව හොති, නත්ථි තදාලම්බනුප්පාදොති.

වීථිචිත්තානි තීණෙව චිත්තුප්පාදා දසෙරිතා
විත්ථාරෙන පනෙත්ථෙකචත්තාළීස විභාවයෙ.

අයමෙත්ථ පරිත්ත ජවන වාරො.

අප්පනා ජවන වාරෙ පන විභූතාවිභූත භෙදො නත්ථි, තථා තදාලම්බනුප්පාදො ච.

---

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 30 | අවිභූතාලම්බනය යනු කුමක් ද? | තදාලම්බන නො ඉපැදී ජවන අවසන්හි භවඞ්ගපතිත අරමුණ අවිභූතාලම්බන නම් වේ.‡ |
| 31 | මනොද්වාරයෙහි වීථි සිත් කොතෙක් ද? | (මනොද්වාරාවජ්ජන ය ජවන ය තදාලම්බනය යි) තුනෙකි. |
| 32 | වීථිචිත්තොත්පාද කොතෙක් ද? | (මනොද්වාරාවජ්ජන ය ජවන් සත ය තදාලම්බන ද්වය යයි) දසයෙකි. |
| 33 | විස්තර වශයෙන් මනොද්වාරයෙහි වීථි සිත් කොතෙක් ද? | (පඤ්චද්වාරයෙහි නියත ද්විපඤ්චවිඤ්ඤාණය ද මනොධාතු ත්‍රිකය ද යන තෙළෙස හැර අවශෙෂ) වීථි සිත් එක් සාළිසෙකි. |
| 34 | අර්පණා ජවන් වාරයෙහි විභූතාවිභූත තදාලම්බන භෙද ඇත්තේ ද? | (මහද්ගත ලොකොත්තර) අර්පණා ජවන් වාරයෙහි ආරම්මණයාගේ ප්‍රකට බැව්හි අර්පණා ලැබෙන බැවින් විභූත අවිභූත භෙදයෙක් ද තදාලම්බන භෙදයෙක් ද නැත්තේ ය. |

---

‡ අවිභූතාලම්බන වීථිය ද ප්‍රථම අවිභූතාලම්බන වීථිය ද්විතීය අවිභූතාලම්බන වීථිය දැයි ද්විවිධ වේ. අරමුණ අප්‍රකට බැවින් බොහෝ සිත් ඉක්ම සප්තම ජවනය සමග ද්විතීය අවිභූතාලම්බනය ද පසුව පතිත භවාංගය සමග ප්‍රථම අවිභූතාලම්බනය ද නිරුද්ධ වේ.

### ප්‍රථම අවිභූතාලම්බන වීථි

භ භ | ති ති ති ති ති ති ල ජෙ ම ජ ජ ජ ජ ජ ජ ජ භ | භ භ
ooo ooo | ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo | ooo ooo

ද්විතීය අවිභූතාලම්බනය ද සත්වරක් ඉකුත් භවාඞ්ග වශයෙන් වේ.

තත්ථ හි ඤාණසම්පයුත්ත කාමාවචර ජවනානමට්ඨන්නං අඤ්ඤතරස්මිං පරිකම්මොපචාරානුලොම ගොත්‍රභූ නාමෙන චතුක්ඛත්තුං තික්ඛත්තුමෙව වා යථාක්කමං උප්පජ්ජිත්වා නිරුද්ධානන්තරමෙව යථාරහං චතුත්ථං පඤ්චමං වා ඡබ්බීසති මහග්ගත ලොකුත්තර ජවනෙසු යථාභිනීහාර වසෙන යංකිඤ්චි ජවනං අප්පනා වීථිමොතරති, තතොපරං අප්පනාවසානෙ භවඞ්ගපාතොව හොති.

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 35 | අර්පණාවට පෙරද්දීම කීනම් සිත් ඉපිද නිරුද්ධවේ ද? | සෞමනස්සෝපේක්ෂා භේද ඥාන සම්ප්‍රයුක්ත කාමාවචර අෂ්ට කුශල ක්‍රියා චිත්තයන්ගෙන් එක්තරා ජවනයෙක් "පරිකම් උපචාර අනුලොම ගොත්‍රභූ" යන නාමයෙන්* සතර වරෙක් හෝ තුන් වරෙක්§ හෝ ඉපිද නිරුද්ධ වේ. |
| 36 | පරිකර්මාදීන් නිරුද්ධ කල්හි අර්පණාවීථියට කෙසේ බසී ද? | සුදුසු පරිද්දෙන් (ක්ෂිප්‍රාභිඥ දන්ධාභිඥයන්ගේ වශයෙන්) සතරවනුව හෝ පස්වනුව රූපාවචර කුශලක්‍රියා දස ය එසේ ම අරූපාවචර අට ය ලොකොත්තර අට ය යන ෂඩ්විංශති මහද්ගත ලොකොත්තර ජවන් අතුරෙන් ප්‍රාර්ථනානුරූප පරිද්දෙන්‡ යම් කිසි ජවනයෙක් අර්පණා වීථියට බසී. |
| 37 | ජවනය අර්පණාවට වන් කල්හි භවාඞ්ග පාතය කොතැන්හි වේ ද? | (උපචාරාදි වූ ද පරිකර්මාදි වූ ද තුන් සතර සිතකින් මතු සතර වැනිව පස්වැනිව හෝ උපන්) අර්පණා සිත කෙළවරම භවාඞ්ග පාතය වේ.† |

* අර්පණාවට පෙරටුව පරිකර්ම වූයෙන් 'පරිකර්මය' ද අර්පණාවට සමීපචාරී හෙයින් 'උපචාරය' ද පූර්වවූ පරිකර්මයට ද මතු අර්පණාවට ද අනුකූල වූයෙන් 'අනුලොමය' ද පරිත්ත පෘථග්ජනගොත්‍ර අභිභවනය කරන හෙයින් ද මහද්ගත ලොකොත්තර ගොත්‍ර වඩන හෙයින් ද 'ගොත්‍රභූ' ද යන නාමයෝ ලැබෙත්.

§ දන්ධාභිඥ ක්ෂිප්‍රාභිඥයන්ට පරිකර්මාදි සිත් තුන ද උපචාරාදි සිත් සතර ද සඳහා තුන්වරෙක් සතරවරෙක් යයි කියන ලදි.

‡ ප්‍රාර්ථනානුරූප පරිද්දෙන් යනු රූපාරූප මාර්ගඵලයනට සුදුසු වූ සමථ විපශ්‍යනා භාවනා චිත්ත වශයෙනි.

† මාර්ගයට අනතුරු ඵල සිත් මෙන් ද සමාපත්ති වීථියෙහි ධ්‍යාන ඵල සිත් මෙන් ද නැවත නැවත නො ඉපැද එක් අර්පණා සිතක්හුගේ අවසන්හි ම වන හෙයින් අර්පණා කෙළවර ම භවාඞ්ගපාතය කියන ලදි.

තත්‍ථ සොමනස්ස සහගත ජවනානන්තරං අප්පනාපි සොමනස්ස සහගතාව පාටිකංඛිතබ්බා, උපෙක්ඛා සහගත ජවනානන්තරං උපෙක්ඛා සහගතාව, තත්‍ථාපි කුසල ජවනානන්තරං කුසල ජවනඤ්චෙව හෙට්ඨිමඤ්ච ඵලත්තයමප්පෙති, ක්‍රියා ජවනානන්තරං ක්‍රියා ජවනං අරහත්තඵලඤ්චාති.

ද්වත්තිංස සුඛපුඤ්ඤම්හා ද්වාදසොපෙක්ඛකා පරං
සුඛිත ක්‍රියතො අට්ඨ ඡ සම්භොන්ති උපෙක්ඛකා.

පුථුජ්ජනාන සෙක්ඛානං කාමපුඤ්ඤතිහෙතුතො
තිහෙතු කාමක්‍රියතො වීතරාගානමප්පනා.

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 38 | සොමනස්සසහගත ජවනානන්තරව අර්පණා චිත්තය කුමන වෙදනා සහගත ද? | (සොම්නස් සහ ගියා වූ චතුර්විධ කුශල ක්‍රියා) ජවනයන්ට එක්බිති (ධ්‍යාන වශයෙන් ද ශුෂ්කවිදර්ශකාදීන්ගේ මාර්ගඵල වශයෙන් ද) අර්පණා චිත්තය ද සොමනස්ස වෙදනා සහගත වේ.† |
| 39 | උපෙක්ෂා ජවනානන්තර වූ අර්පණා චිත්තය කුමන වෙදනා සහගත ද? | උපෙක්ෂා සහගත කාමාවචර (කුශල ක්‍රියා) ජවනයන්ට එක්බිතිව (අර්පණා චිත්තය ද) උපෙක්ෂා වෙදනා සහගත ම වේ. |
| 40 | කුශල ජවනයන්ට අනතුරුව කිනම් ජවන් සිත් උපදිත් ද? | චතුර්විධ ඥානසම්ප්‍රයුක්ත කාමාවචර කුශල ජවනයන්ට අනතුරුව (මහද්ගත ලොකොත්තර) කුශල ජවන් ද ස්‍රොතාපත්ත්‍යාදි ඵල ත්‍රයය ද අර්පණා වශයෙන් උපදිත්. |
| 41 | ක්‍රියාජවනයන්ට අනතුරුව කිනම් ජවන් උපදිත් ද? | (චතුර්විධ ඥානසම්ප්‍රයුක්ත ක්‍රියා ජවනයන්ට එක්බිති) මහද්ගත ක්‍රියා ජවන්ද අර්හත් ඵලචිත්තය ද අර්පණා වශයෙන් උපදිත්. |
| 42 | සොමනස්ස ත්‍රිහෙතුක කුශල චිත්තද්වයයට අනතුරුව කොතෙක් අර්පණාචිත්තයෝ උපදිත් ද? | (සොමනස්ස සහගත ත්‍රිහෙතුක කුශල චිත්තයට අනතුරුව සොම්නස් සහ ගියා වූ ලෞකික ධ්‍යාන සතරය, තද්ගුණිත මාර්ග සිත් සොළොසය, එසේ ම අර්හත්ඵල වර්ජිත ස්‍රොතාපත්ත්‍යාදි ඵලසිත් දොළොසයයි) දෙතිස් අර්පණා චිත්තයෝ උපදිත්. |
| 43 | උපෙක්ෂා ත්‍රිහෙතුක කුසල් සිත් දෙදෙනාට අනතුරුව කොතෙක් අර්පණා සිත් උපදිත් ද? | [ලෞකික පඤ්චම ධ්‍යානය ද, (අර්හත් ඵලය හැර) මාර්ගඵල සත ද, අරූපාවචර සතර ද යන] දොළොස් අර්පණා චිත්තයෝ උපදිත්. |

† පරිකර්මාදි නාමයෙන් සොම්නස් සහ ගියා වූ කාමාවචර කුශලක්‍රියා සතරට ඉක්බිති උපෙක්ෂා සහගත අර්පණා සිත් නො උපදිත්. කුමක් හෙයින් ද වෙදනාවන්ගේ අන්‍යොන්‍ය ආසෙවනයක් නැති බැවිනි.

අයමෙත්ථ මනොද්වාරෙ වීථිචිත්තප්පවත්තිනයො. — සබ්බත්ථාපි පනෙත්ථ අනිට්ඨෙ ආලම්බනෙ අකුසලවිපාකානෙව පඤ්චවිඤ්ඤාණ සම්පටිච්ඡනසන්තීරණ තදාලම්බනානි, ඉට්ඨෙ කුසලවිපාකානි, අති ඉට්ඨෙ පන සොමනස්සසහගතානෙව සන්තීරණ තදාලම්බනානි. —

| ප්‍රශ්න | | උත්තර |
|---|---|---|
| 44 | සොම්නස් සහගත ත්‍රිහෙතුක ක්‍රියා ජවනයට එක්බිති කොතෙක් අර්පණාවෝ වෙත් ද? | (ලෞකික ක්‍රියා ධ්‍යාන සතර ය, එම ක්‍රියා ධ්‍යාන පාදක කොට ඇති අර්හත් ඵලයින් සතර යයි) අෂ්ට අර්පණා ජවනයෝ වෙත්. |
| 45 | උපෙක්ෂා ත්‍රිහෙතුක ක්‍රියාජවනයට එක්බිති කොතෙක් අර්පණාවෝ වෙත් ද? | (ලෞකික පඤ්චමධ්‍යාන ක්‍රියා ජවන ය අරූපාවචර ක්‍රියා සිත් සතර ය අර්හත් ඵල ජවන යයි) ෂඩර්පණා ජවන යෝ වෙත්. |
| 46 | පෘථග්ජන ශෛක්ෂ යන්ට කිනම් සිත් කෙරෙන් ධ්‍යානයෝ වෙත් ද? | පෘථග්ජනයන්ට හා ස්‍රොතාපන්නාදි වූ ශෛක්ෂයන්ට ද ත්‍රිහෙතුක කාමාවචර කුශලජවනයන් කෙරෙන් ධ්‍යානයෝ වෙත්. |
| 47 | රහතුන්ට කිනම් සිතින්පරව ධ්‍යාන යෝ වෙත් ද? | රහතුන්ට ත්‍රිහෙතුක කාමාවචර ක්‍රියා ජවනයන් කෙරෙන් ධ්‍යානයෝ වෙත්. |
| 48 | අනිෂ්ටාලම්බනයෙහි පඤ්චවිඤ්ඤාණාදීහු කුමන විපාක ඇත්තාහු ද? | ෂඩ් ද්වාරයෙහි වූ අනිෂ්ටාලම්බනයෙහි පඤ්චවිඤ්ඤාණ සම්පටිච්ඡන සන්තීරණ තදාලම්බනයෝ අකුශල විපාක ඇත්තාහු වෙත්. |
| 49 | ඉෂ්ටමධ්‍යස්ථාලම්බනයෙහි පඤ්චවිඤ්ඤාණාදීහු කුමන විපාක ඇත්තාහු ද? | ඉෂ්ටමධ්‍යස්ථාලම්බනයෙහි * පඤ්චවිඤ්ඤාණ සම්පටිච්ඡන සන්තීරණ තදාලම්බනයෝ කුශල විපාක ඇත්තාහුම වෙත්. |
| 50 | අතීෂ්ටාලම්බනයෙහි සන්තීරණාදීහු කිනම් වේදනා ඇත්තාහු ද? | අතීෂ්ටාලම්බනයෙහි සන්තීරණ තදාලම්බනයෝ සොම්නස්ස වේදනා ඇත්තාහු ම වෙත්.‡ |

* “ඉට්ඨෙ” යන්නෙහි “ඉට්ඨමජ්ඣත්තෙ” යනු විනා යි.

‡ අතිඉෂ්ටාලම්බනයෙහි සොම්නස් වේදනා කී හෙයින් ඉෂ්ටමධ්‍යස්ථාලම්බනයෙහි උපෙක්ෂා වේදනා කීවා නම් වේ. අප්‍රහීන කෙලෙස් ඇති සත්ත්වයන්හි කුසල් අකුසල් පැවැත්ම හෙතු කොට අතිඉෂ්ටාලම්බනයෙහි ඉෂ්ටමධ්‍යස්ථාකාරයෙන් ද අනිෂ්ටාකාරයෙන් ද අනිෂ්ටාලම්බනයෙහි ඉෂ්ටමධ්‍යස්ථාකාරයෙන් ද ගනිත්. ඒ මෙසේ යි, බුද්ධාදි අතිඉෂ්ටාලම්බනයෙහි දු නැදුහැනැත්තවුනට උපෙක්ෂාජවනයෝ ද තීර්ථකාදීන්ට දෞර්මනස්‍යජවනයෝ ද ගම්භීර ඥානාව ඇත්තවුනට හා උපෙක්ෂා ප්‍රතිසංඛ්‍යානයනට හා ප්‍රතිකූල අරමුණෙහි උපෙක්ෂාජවනයෝ ද එම අරමුණෙහි සූකරාදීන්ට සොම්නස්ස ජවනයෝ ද උපදිත්. එසේ වුව ද පූර්ව පැවැති සංස්කාරවිශේෂකාදීහු ද පසුව පැවැති තදාලම්බනයෝ ද ආලම්බන මු පරිද්දෙන් විපාකයෝ වෙත් යයි දත යුතු.

තථාපි සොමනස්ස සහගත ක්‍රියා ජවනාවසානෙ සොමනස්ස සහගතානෙව තදාලම්බනානි භවන්ති, උපෙක්ඛා සහගත ක්‍රියා ජවනාවසානෙච උපෙක්ඛා සහගතානෙව හොන්ති, දොමනස්ස සහගත ජවනාවසානෙච පන තදාලම්බනානිචෙව භවඞ්ගානිච උපෙක්ඛා සහගතානෙව භවන්ති, තස්මා යදි සොමනස්ස පටිසන්ධිකස්ස දොමනස්ස සහගත ජවනාවසානෙ තදාලම්බනසම්භවො නත්ථි, තදා යංකිඤ්චි පරිචිතපුබ්බං පරිත්තාරම්මණමාරබ්භ උපෙක්ඛා සහගත සන්තීරණං උප්පජ්ජති තමනන්තරිත්වා භවඞ්ගපාතො හොතීති වදන්ති ආචරියා, තථා කාමාවචර ජවනාවසානෙ කාමාවචර සත්තානං කාමාවචර ධම්මෙස්වෙව ආලම්බනභූතෙසු තදාලම්බනං ඉච්ඡන්තීති.

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 51 | සොම්නස්ස ක්‍රියා ජවනාවසානයෙහි කිනම් වෙදනා ඇති තදාලම්බනයෝ වෙත් ද? | (සොම්නස් කාමාවචර ක්‍රියා ජවන් සතරය, හසිතුප්පාදය සහ ක්‍රියා සිත් පස කෙළවරැ) සොම්නස් වෙදනා ඇති තදාලම්බනයෝ ම වෙත්.* |
| 52 | උපෙක්ෂා ක්‍රියා ජවනාවසානයෙහි කිනම් වෙදනා ඇති තදාලම්බනයෝ වෙත් ද? | (උපෙක්ෂා සහගත වූ ක්‍රියා ජවන් සතර කෙළවරැ) උපෙක්ෂා සහගත වූ ම වෙදනා ඇති තදාලම්බනයෝ වෙත්. |
| 53 | දොම්නස් ජවන් අවසන්හි වූ තදාලම්බනයෝ කිනම් වෙදනා සහිත වෙත් ද? | (දොමනස්ස සහගත ජවනාවසානයෙහි වනාහි තදාලම්බනයෝ ද භවාඞ්ගයෝ ද) උපෙක්ෂා සහගතයෝ ම වෙත්.‡ |
| 54 | දොම්නස් ජවන් අවසන්හි සොම්නස් පිළිසඳ ඇත්තහුට කිනම් තදාලම්බනයෝ වෙත් ද? | සොම්නස් පිළිසඳ ඇත්තහුට දොම්නස් ජවන් අවසන්හි කිසි තදාලම්බන සම්භවයෙක් නො වේ. එ කල බහුලව පුරුදු කරන ලද කාමාවචර ආලම්බනයක් අරභයා උපෙක්ෂා සහගත සන්තීරණ චිත්තය ඉපිද නිරුද්ධානන්තරව භවාඞ්ග පාතය වේ යයි අර්ථකථාචාර්‍යවරයෝ කියත්. |
| 55 | කිනම් සත්ත්වයකුට කවර ධර්මයක් අරමුණු වූ කල තදාලම්බන කැමැති වෙත් ද? | (කාමාවචර සත්ත්වයන්ට පරිත්ත ජවනාවසානයෙහි) කාමාවචර ධර්මයක්ම අරමුණු වූ කලැ තදාලම්බන කැමැති වෙත්. |

*සර්වඥයන්ගේ චිත්ත විපර්‍යාස නැත්තෙන් ආලම්බන ගත වෙදනා පරිද්දෙන් තදාලම්බනයෝ වෙත් යයි දතයුතු.

‡දොම්නස් සොම්නස්නු අන්‍යොන්‍ය විරුද්ධ ස්වභාව ඇති හෙයින් සොම්නස් සහගත නො වෙත් යයි කියන ලදී.

කාමෙ ජවන සත්තාලම්බනානං නියමෙ සති
විභූතෙ'තිමහන්තෙ ච තදාලම්බනමීරිතං —
අයමෙත්ථ තදාලම්බන නියමො

---

ජවනෙසු ච පරිත්ත ජවන වීථියං කාමාවචර ජවනානි සත්තක්ඛත්තුං ඡක්ඛත්තුමෙව වා ජවන්ති, මන්දප්පවත්තියං පන මරණකාලාදීසු පඤ්චවාරමෙව, භගවතො පන යමක පාටිහාරිය කාලාදීසු ලහුකප්පවත්තියං චත්තාරි පඤ්චවා පච්චවෙක්ඛණ චිත්තානි භවන්තීතිපි වදන්ති — ආදිකම්මිකස්ස පන පඨමකප්පනායං මහග්ගත ජවනානි අභිඤ්ඤා ජවනානි ච සබ්බදාපි එකවාරමෙව ජවන්ති, තතො පරං භවඞ්ගපාතො — චත්තාරො පන මග්ගුප්පාද එකචිත්තක්ඛණිකා,

---

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 56 | කවර ආලම්බනයෙක්හි තදාලම්බන කියන ලද්දේ ද? | (කාම භවයෙහි ජවන සත්ත්ව ආලම්බනයන්ගේ නියමයක් ඇති කල) විභූතාලම්බනයෙහි හා අතිමහන්තාලම්බනයෙහි හා තදාලම්බන කියන ලදී. |
| 57 | කිනම් වීථියෙක්හි කවර ජවනයෝ කොතෙක් වර උපදනාහු ද? | පරිත්ත ජවන වීථියෙහි කාමාවචර ජවනයෝ සත්වරෙක හෝ සවරෙක හෝ ජවනය කෙරෙත්. |
| 58 | මරණ කාලාදියෙහි කොතෙක් වර ජවනයෝ උපදනාහු ද? | මරණ කාල මූර්ඡා කාලයෙහි හෘදය (වස්තු දුර්වල හෙයින්) මන්ද වශයෙන් පවත්නාහු පස් වරක් ම ජවනය කෙරෙත්. |
| 59 | යමක ප්‍රාතිහාර්‍ය්‍ය කාලාදියෙහි කොතෙක් වර ජවනයෝ වෙත් ද? | (භාග්‍යවතුන්ගේ යමාමහ පෙළහර කාලාදියෙහි ලඝු පැවැත්මක් ඇති කල්හි) සතර පස් වරෙක ප්‍රත්‍යවෙක්ෂා ජවනයෝ වෙත් යයි අචාර්‍ය්‍යයෝ කියත්. |
| 60 | ආදි කාර්මිකයාහට කොතෙක් වර අර්පණා ජවන් පැවැති කල්හි භවාඞ්ගවේ ද? | (ආදි කාර්මිකයාහට චිත්තාභි පළමු අර්පණාවෙහි මහද්ගත ජවනයෝ ද සැම කල්හි අභිඥා ජවනයෝ ද) එක් වරක්ම පැවැත භවාඞ්ග වේ. |
| 61 | සතර මාර්ගයෝ කොතෙක් චිත්තක්ෂණ ඇත්තාහු වෙත් ද? | (ඒ ඒ මගින් නැසිය යුතු කෙලෙස් එක් එක් වරම නසන හෙයින්) චතුර්විධ මාර්ගයෝ එක් එක් චිත්තක්ෂණ ඇත්තාහු ම වෙත්. |

10-1

තතොපරං ද්වෙ තීණි ඵලචිත්තානි යථාරහං උප්පජ්ජන්ති තතොපරං භවඞ්ගපාතො, නිරොධසමාපත්ති කාලෙ ද්වික්ඛත්තුං චතුත්ථාරුප්ප ජවනං ජවති තතොපරං නිරොධං ඵුසති, උට්ඨාන කාලෙච අනාගාමි ඵලං වා අරහත්තඵලං වා යථාරහමෙකවාරං උප්පජ්ජිත්වා නිරුද්ධෙ භවඞ්ගපාතොව හොති.

සබ්බත්ථාපි සමාපත්ති වීථියං භවඞ්ගසොතො විය වීථි නියමො නත්ථීති කත්වා බහූනිපි ලබ්භන්තීති.

සත්තක්ඛත්තුං පරිත්තානි මග්ගාභිඤ්ඤා සකිං මතා
අවසෙසානි ලබ්භන්ති ජවනානි බහූනිපි.

අයමෙත්ථ ජවන නියමො.

---

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 62 | චතුර්විධ ඵල සිත්හු කොතෙක් ඉපැද නිරුද්ධවූ කාලැ භවාංග පාතය වේ ද? | මාර්ගානන්තරව දෙ තුන් ඵලසිත්හු සුදුසු පරිද්දෙන්* ඉපිද නිරුද්ධ වූ කාලැ භවාංගපාතය වේ. |
| 63 | නිරොධයට සමවැදීම් නැගීම් දෙක්හි කෙසෙක් ජවන් පැවැති කාලැ භවාංග පාතය වේ ද? | නිරොධ සමාපත්ති කාලයෙහි සතර වැනි අරූපාවචර ජවනය දෙවරක් පැවැති කල්හි චිත්ත නිරොධය වේ. නැවැත නැගි කල ද අනාගාමි ඵල චිත්තය හෝ අර්හත් ඵල චිත්තය හෝ යථානුරූපව එක් වරක් ඉපිද නිරුද්ධ වූ කාලැ භවාංගපාතය වේ |
| 64 | සමාපත්ති වීථිචිත්ත නියමයෙක් ඇත්තෝ ද? | ධ්‍යානසමාපත්ති ඵලසමාපත්ති වීථි දෙක්හි භවාංග ප්‍රවාහයක් මෙන් වීථිචිත්ත නියමයෙක් නැත්තේය. මහද්ගත වූ ද ලොකොත්තර වූ ද බොහෝ ජවනයෝ ලැබෙති. |
| 65 | කාමාවචරාදි ජවන නියමය කෙසේ දත යුතු ද? | කාමාවචර ජවනයෝ උත්කෘෂ්ට වශයෙන් සත් වරෙක් ද මාර්ගාභිඥා ජවනයෝ එක් එක් වරද අභිඥාමාර්ග ජවන හැර ඉතිරි මහද්ගත ලොකොත්තර ජවනයෝ බොහෝ වූ වාරද ලැබෙත් යයි දත යුත්තු. |

*පරිකර්මාදියට පස්වැනිව උපන් මාර්ගචිත්තයට අනතුරුව ඵලසිත් දෙකෙක් ද උපචාරාදියට සතරවැනිව උපන් මාර්ග සිතට අනතුරුව ඵල සිත් තුනෙක් ද ඉපිද ජවන් ගත පරිපූර්ණව භවාංග වීම සඳහා සුදුසු පරිද්දෙන් යයි කියන ලදි.

දුහෙතුකානමහෙතුකානඤ්ච පනෙත්ථ ක්‍රියාජවනානි චෙව අප්පනා ජවනානි ච න ලබ්භන්ති, තථා ඤාණසම්පයුත්ත විපාකානි ච සුගතියං, දුග්ගතියං පන ඤාණවිප්පයුත්තානි ච මහාවිපාකානි න ලබ්භන්ති, තිහෙතුකෙසු ච ඛීණාසවානං කුසලාකුසල ජවනානි ච න ලබ්භන්ති, තථා සෙක්ඛ පුථුජ්ජනානං ක්‍රියාජවනානි, දිට්ඨිගත සම්පයුත්ත විචිකිච්ඡා ජවනානි ච සෙක්ඛානං.

අනාගාමි පුග්ගලානං පන පටිඝ ජවනානි ච න ලබ්භන්ති,

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 66 | ක්‍රියාජවනයෝ ද අප්පණාජවනයෝ ද කවරක්හට නො ලැබෙත් ද? | (අලොභ අදොෂ වශයෙන්) ද්විහෙතුක පුද්ගලයන්ට ද (අලොභාදි හෙතු විරහිත) අහෙතුකයන්ට ද ක්‍රියාජවනයෝ ද (විපාකාවරණ භාවයෙන්) අප්පණාජවනයෝ ද නො ලැබෙත්. |
| 67 | සුගතියෙහි ද්විහෙතුක අහෙතුකයන්ට ඥාන සම්ප්‍රයුක්ත විපාකයෝ ලැබෙත් ද? | (කාමාවචර සුගතියෙහි මූල ප්‍රතිසන්ධි හුගේ ඤාණවිප්‍රයුක්ත භාවයෙන් ද්විහෙතුක අහෙතුක දෙ දෙනාටම ත්‍රිහෙතුක තදාලම්බන නැති බැවින්) ඥාන සම්ප්‍රයුක්ත විපාකයෝ ද නො ලැබෙත්. |
| 68 | දුගතියෙහි අහෙතුකයන්ට මහාවිපාකයෝ ලැබෙත් ද? | (දුගති නම් වූ සතර අපායෙහි උපන් අහෙතුකයන්ට) ඥාන විප්‍රයුක්ත වූ ද මහාවිපාකයෝ නො ලැබෙත්. |
| 69 | කවරක්හට කුසලාකුසල ජවනයෝ ලැබෙත් ද? | ත්‍රිහෙතුක පෘථග්ජනාදි පුද්ගලයන් අතුරෙන් ක්ෂීණාශ්‍රව රහතුන්ට කුසලාකුසල ජවනයෝ නො ලැබෙත්. |
| 70 | කවරක්හට ක්‍රියා ජවනයෝ නො ලැබෙත් ද? | සෝවාන් ආදි ශෛක්ෂයන්ට හා පෘථග්ජනයන්ට ද ක්‍රියා ජවනයෝ නො ලැබෙත්. |
| 71 | ශෛක්ෂයන්ට කිනම් ජවනයෝ නො ලැබෙත් ද? | (ප්‍රථම මාර්ගයෙන් ම සත්කායදෘෂ්ට්‍යාදීන් ප්‍රහීණ හෙයින්) දෘෂ්ටිසම්ප්‍රයුක්ත විචිකිත්සා සම්ප්‍රයුක්ත ජවනයෝ ද ක්‍රියා ජවනයෝ ද නො ලැබෙත්. ‡ |
| 72 | අනාගාමීන්ට කිනම් ජවනයෝ නො ලැබෙත් ද? | (අනාගාමීන්ට ඒ මගින් ව්‍යාපාදය නැසූ හෙයින්) දොමනස් ජවනයෝ ද දිට්ඨි සම්ප්‍රයුක්ත ජවන් හා විචිකිච්ඡා ජවනයෝ ද නො ලැබෙත්. |

‡ ක්‍රියාජවනයෝ ජවනානි 'ච' යන චකාරයෙන් ආකර්ෂණය කරන ලදි.

10-2

ලොකුත්තර ජවනානි ච යථා සකමරියානමෙව සමුප්පජ්ජන්තීති.

අසෙක්ඛානං චතු චත්තාළීස සෙක්ඛානමුද්දිසෙ
ඡ පඤ්ඤාසාවසෙසානං චතු පඤ්ඤාස සම්භවා.

අයමෙත්ථ පුග්ගල භෙදො.

---

කාමාවචර භූමියං පනෙතානි සබ්බානිපි වීථි චිත්තානි යථාරහමුපලබ්භන්ති, රූපාවචර භූමියං පටිඝ ජවන තදාලම්බන වජ්ජිතානි,

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 73 | ලොකෝත්තර ජවනයෝ කවරන් හට උපදිත් ද? | (අට වැදෑරුම් වූ ලොකෝත්තර ජවනයෝ ස්වකීය මාර්ගඵලස්ථ) ආර්‍ය්‍ය පුද්ගලයන්ට ම උපදිත්. |
| 74 | අශෛක්ෂ සඞ්ඛ්‍යාත රහතුන්ට කොතෙක් වීථිචිත්තයෝ ලැබෙත් ද? | (කුශලාකුශල තෙතිස් සිත් ය, ස්‍රොතාපත්ත්‍යාදි ඵලත්‍රය ය, නව මහද්ගත විපාක ය යන පන්සාළිස් සිත් හැර ඉතිරි තෙවිසි කාමාවචර විපාකයෝ ය, ක්‍රියා විස්ස ය, අර්හත් ඵලය යන) සුසාළිස් වීථිචිත්තයෝ ලැබෙත්. |
| 75 | ශෛක්ෂයන්ට කොතෙක් වීථිචිත්තයෝ ලැබෙත් ද? | (අටළොස් ක්‍රියා ජවන් ය, දෘෂ්ටිසම්ප්‍රයුක්ත සතර ය, විචිකිත්සා චිත්ත ය, අර්හත්ඵල ය, නවමහද්ගත විපාක ය යන තෙතිස් සිත් හැර තෙවිසි කාමාවචර විපාක ය, ආවර්ජනාද්වය ය, එක්විසි කුසල් සිත් ය, අකුසල් සත ය, ඵලත්‍රය ය යන) ස පනස් වීථිචිත්තයෝ ලැබෙත්. |
| 76 | අවශෙෂ ද්විහෙතුකාදි පෘථග්ජනයන්ට කොතෙක් වීථිචිත්තයෝ ලැබෙත් ද? | (අටළොස් ක්‍රියා ජවන් ය, සියලු ලොකෝත්තර මහද්ගත සතළොස් විපාක ය යන පන්තිස් සිත් හැර තෙවිසි කාමාවචර විපාකයෝ ය, ආවර්ජනාද්වය ය, ලෞකික කුසල් සතළොස ය, අකුසල් දොළොස ය යන) සිව් පනස් වීථිසිත්හු ලැබෙත්. |
| 77 | කාමාවචර භූමියෙහි කොතෙක් වීථි ලැබෙත් ද? | කාමාවචර භූමියෙහි යථානුරූපව සියලු වීථිහු ලැබෙත්. |
| 78 | රූපාවචර භූමියෙහි කොතෙක් වීථිචිත්තයෝ ලැබෙත් ද? | (ප්‍රතිඝ සම්ප්‍රයුක්ත චිත්තද්වය ය ද, එකොළොස් තදාලම්බනයෝ ද හැර යථානුරූපව) සියලු වීථිසිත්හු ලැබෙත්. |

අරූපාවචර භූමියං පඨම මග්ග රූපාවචර හසන හෙට්ඨිමාරූප්ප වජ්ජිතානි ච ලබ්භන්ති, සබ්බථාපි ච තං තං පසාද රහිතානං තං තං ද්වාරික වීථි චිත්තානි න ලබ්භන්තෙව.

අසඤ්ඤ සත්තානං පන සබ්බථාපි චිත්තප්පවත්ති නත්ථෙවාති.

අසීති වීථිචිත්තානි කාමෙ රූපෙ යථාරහං
චතුසට්ඨි තථාරූපෙ ද්වෙචත්තාලීස ලබ්භරෙ.

අයමෙත්ථ භූමි විභාගො

---

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 79 | අරූපාවචර භූමියෙහි කොතෙක් වීථිචිත්ත යෝ ලැබෙත් ද? | ප්‍රථම මාර්ග ය රූපාවචර පසළොස ය හසිතුප්පාද ය යට යට අරූපාවචර ය යන මොවුන් වර්ජිත චිත්ත යෝ ලැබෙත්. |
| 80 | ඒ ඒ ප්‍රසාද විරහිත වූවන්ට තද් තද් ද්වාර නියුක්ත චිත්තයෝ ලැබෙත් ද? | කාමරූපාරූප යන සියලු තන්හි තත් තත් ප්‍රසාද විරහිත පුද්ගලයන්ට ඒ ඒ ද්වාර නියුක්ත චිත්තයෝ නො ලැබෙත් ම ය. |
| 81 | අසඤ්ඤතල සත්ත්වයන්ට සිත් පැවැත්මෙක් ඇත්තේ ද? | ('සඤ්ඤාරොගො සඤ්ඤාගණ්ඩො' යනාදීන් නාමයෙහි ප්‍රතිකූල කොට කරන ලද භාවනා බලයෙන් උපන්) අසඤ්ඤතල සත්ත්වයන්ට සර්වප්‍රකාරයෙන් සිත් පැවැත්මෙක් නැත්තේ ම ය. |
| 82 | කාමභවයෙහි කොතෙක් වීථි චිත්තයෝ ලැබෙත් ද? | (වීථිමුක්ත මහද්ගත නව විධ චිත්තයන් හැර අවශෙෂ) අසීති වීථිචිත්ත යෝ ම ලැබෙත්. |
| 83 | රූපභවයෙහි කොතෙක් වීථි චිත්තයෝ ලැබෙත් ද? | (ප්‍රතිඝ ද්වයය ද අෂ්ට මහාවිපාක ද අහෙතුක කුශලාකුශල ඝ්‍රාණ විඥානාදි ෂට් විඥාන ද ද්වාරවිමුක්ත නව මහද්ගත ද යන පස්විසි චිත්තයන් හැර අවශෙෂ වූ ආවර්ජන ද්වය ය නව අහෙතුකවිපාක හා අභිඥා තෙපනස් ජවනයන්ගේ වශයෙන්) සූසැට චිත්තයෝ ලැබෙත්. |
| 84 | අරූපභවයෙහි කොතෙක් වීථිචිත්තයෝ ලැබෙත් ද? | (අරූපභවයෙහි තෙවිසි කාමාවචර විපාක ද, ප්‍රථම මාර්ගය ද, රූපාවචර පසළොස ද, ප්‍රතිඝද්වය ද, සතර අරූපවිපාක ද, පඤ්චද්වාරාවර්ජනය ද, හසිතොත්පාදය ද යන) සත් සාළිස් සිත් හැර (ඉතිරි කාමාවචර කුසල ක්‍රියා සොළොස ය අකුසල් දස ය යන ෂඩ් විංශති කාමාවචර ජවනයෝ ය, අරූපාවචර කුශල ක්‍රියා ජවනයෝ ය, සප්ත ලොකොත්තර ජවනයෝ ය, මනොද්වාරාවර්ජන ය යන) දෙසාළිස් සිත්හු ලැබෙත්. |

ඉච්චෙවං ඡ ද්වාරික චිත්තප්පවත්ති යථාසම්භවං භවඞ්ගන්තරිතා යාවතායුකමබ්බොච්ඡින්නා පවත්තතීති.

ඉති අභිධම්මත්ථ සඞ්ගහෙ වීථිසඞ්ගහ විභාගො නාම

## චතුත්ථො පරිච්ඡෙදො.

---

වීථිචිත්තවසෙනෙවං පවත්තියමුදීරිතො
පවත්තිසඞ්ගහො නාම සන්ධියං දානි වුච්චති.

චතස්සො භූමියො, චතුබ්බිධා පටිසන්ධි, චත්තාරි කම්මානි, චතුධා මරණුප්පත්ති චෙති චත්තාරි චතුක්කානි වෙදිතබ්බානි.

තත්ථ අපාය භූමි කාමසුගති භූමි රූපාවචර භූමි අරූපාවචර භූමි චෙති චතස්සො භූමියො නාම, තාසු නිරයො තිරච්ඡානයොනි පෙත්තිවිසයො අසුරකායො චෙති අපාය භූමි චතුබ්බිධා හොති.

---

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 45 | ෂඩ් ද්වාරයෙහි නියුක්ත චිත්තප්‍රවෘත්ති තොමෝ නො සිඳ පවත්නී ද? | [ෂඩ්ද්වාරික චිත්තප්‍රවෘත්ති තොමෝ ඒ ඒ භවයෙහි සම්භව වන පරිද්දෙන් භවාඞ්ගයන් විසින් ව්‍යවහිතව(වෙන් කරන ලදුව)ආයු ඇතිතෙක් හෙවත් පිළිසඳ සිතට අනතුරු භවනිකාන්ති වශයෙන් පැවති මනොද්වාරික වීථි චිත්තය පටන් චුති චිත්තය දක්වා] නිරොධසමාපත්තියක් නැති කල්හි නො සිඳ පවත්නී ය. |

## සතරවන පරිච්ඡෙදය නිමියේ යි.

---

| | | |
|---|---|---|
| 1 | වීථිමුක්ත සඞ්ග්‍රහයෙහි චතුෂ්ක කොතෙක් ද? | (භූමි චතුෂ්ක ය, ප්‍රතිසන්ධි චතුෂ්ක ය, කර්ම චතුෂ්ක ය, මරණොත්පත්ති චතුෂ්ක යයි) චතුෂ්ක සතරෙක් වෙත්. |
| 2 | භූමි කොතෙක් ද? | (අපාය භූමි ය, කාමසුගති භූමි ය, රූපාවචර භූමි ය, අරූපාවචර භූමි යයි) භූමිහු සතරෙක් වෙත්. |
| 3 | අපාය භූමිය කොතෙක් ප්‍රකාර ද? | (නරක ය, තිරිසන්යෝනි ය, ප්‍රෙත විෂය ය, අසුරකාය* යයි) අපාය භූමි ය සතර ප්‍රකාරයෙකි. |

---

*'අසුර' ය යනු දෙව අසුර ප්‍රෙත අසුර යයි දුවිධ වේ—"තාවතිංසෙසු දෙවෙසු වෙපචිත්තාසුරා ගතා කාලකඤ්ජාසුරා නාම ගතා පෙතෙසු සබ්බථා"—යන්හෙයින් දිව්‍යයොනි ඇති වෙපචිත්තාදී අසුරයන් තව්තිසා වැසි දෙවියන්ට ඇතුළත් කොට ද කාලකඤ්ජ අසුරයන් ප්‍රෙතවිෂයට ඇතුළත් කොට ද පූර්වාචාර්යයන් විසින් කියන ලදී.

මනුස්සා චාතුමහාරාජිකා තාවතිංසා යාමා තුසිතා නිම්මාන රතී පරනිම්මිතවසවත්ති චෙති කාමසුගති භූමි සත්තවිධා හොති, සා පනායමෙකා දසවිධාපි කාමාවචර භූමිච්චෙව සඞ්ඛං ගච්ඡති. බ්‍රහ්මපාරිසජ්ජා බ්‍රහ්මපුරොහිතා මහාබ්‍රහ්මා චෙති පඨමජ්ඣාන භූමි, පරිත්තාභා අප්පමාණාභා ආභස්සරා චෙති දුතියජ්ඣාන භූමි, පරිත්තසුභා අප්පමාණසුභා සුභකිණ්හා චෙති තතියජ්ඣාන භූමි.

වෙහප්ඵලා අසඤ්ඤසත්තා සුද්ධාවාසා චෙති චතුත්ථජ්ඣාන භූමීති රූපාවචර භූමි සොළසවිධා හොති, අවිහා අතප්පා සුදස්සා සුදස්සී අකනිට්ඨා චෙති සුද්ධාවාස භූමි පඤ්චවිධා හොති.

---

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 4 | කාමසුගති භූමිය කොතෙක් ප්‍රකාර ද? | (මනුෂ්‍ය ය චාතුර්මහාරාජික ය තාවතිංස ය යාම ය තුසිත ය නිර්මාණ රති ය පරනිර්මිතවසවර්ති යයි) කාම සුගති භූමිය සත් ප්‍රකාර වේ. |
| 5 | කාමාවචර භූමිහු කොතෙක් ද? | (සප්ත කාම සුගති භූමි ය සතර අපාය භූමි ය යි) කාමාවචර භූමිහු එකොළොසකි. |
| 6 | ප්‍රථමධ්‍යාන භූමි යනු කුමක් ද? | බ්‍රහ්මපාරිසජ්ජ ය බ්‍රහ්මපුරෝහිත ය මහා බ්‍රහ්ම ය යන තුන් තලය ප්‍රථම ධ්‍යාන භූමි නම් වේ. |
| 7 | ද්විතීයධ්‍යාන භූමි යනු කුමක් ද? | පරිත්තාභ ය, අප්පමාණාභ ය, ආභස්සර ය යන තුන් තලය ද්විතීය ධ්‍යාන භූමි නම් වේ. |
| 8 | තෘතීයධ්‍යාන භූමි යනු කුමක් ද? | පරිත්තසුභ ය, අප්පමාණසුභ ය, සුභකිණ්හ ය යන බඹතල තුන තෘතීයධ්‍යාන භූමි නම් වේ. |
| 9 | චතුර්ථධ්‍යාන භූමි යනු කුමක් ද? | වේහප්ඵල ය, අසඤ්ඤසත්ත ය, සුද්ධාවාසය යන මොහු චතුර්ථධ්‍යාන භූමි නම්. |
| 10 | රූපාවචර භූමිය කොතෙක් ප්‍රකාර ද? | (බ්‍රහ්මපාරිසජ්ජ ය පටන් අකනිට්ඨා බඹලොව දක්වා) රූපාවචර භූමි සොළොස් ප්‍රකාර වේ. |
| 11 | සුද්ධාවාස භූමිය කොතෙක් ප්‍රකාර ද? | (අවිහ ය අතප්ප ය සුදස්ස ය සුදස්සී ය අකනිට්ඨ යයි) පිරිසිදු අනාගාමි රහතුන්හට ආවාස වූ සුද්ධාවාස භූමිය පස් ප්‍රකාර වේ. |

ආකාසානඤ්චායතන භූමි විඤ්ඤාණඤ්චායතන භූමි ආකිඤ්චඤ්ඤායතන භූමි නෙවසඤ්ඤානාසඤ්ඤායතන භූමි චෙති ආරුප්ප භූමි චතුබ්බිධා හොති.

පුථුජ්ජනා න ලබ්භන්ති සුද්ධාවාසෙසු සබ්බථා
සොතාපන්නා ච සකදාගාමිනො චාපි පුග්ගලා.

අරියා නොපලබ්භන්ති අසඤ්ඤාපාය භූමිසු
සෙසට්ඨානෙසු ලබ්භන්ති අරියානරියාපිච.

ඉදමෙත්ථ භූමි චතුක්කං.

---

අපාය පටිසන්ධි කාමසුගති පටිසන්ධි රූපාවචර පටිසන්ධි අරූපාවචර පටිසන්ධි චෙති චතුබ්බිධා පටිසන්ධි නාම. තත්ථ අකුසල විපාකොපෙක්ඛා සහගත සන්තීරණං අපාය භූමියං ඔක්කන්තික්ඛණෙ පටිසන්ධි හුත්වා තතොපරං භවඞ්ගං පරියොසානෙ චවනං ච හුත්වා වොච්ඡිජ්ජති, අයමෙකාපාය පටිසන්ධි නාම.

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 12 | අරූප භූමිය කොතෙක් ප්‍රකාර ද? | (ආකාසානඤ්චායතන භූමි ය, විඤ්ඤාණඤ්චායතන භූමි ය, ආකිඤ්චඤ්ඤායතන භූමි ය, නෙවසඤ්ඤානාසඤ්ඤායතන භූමි යයි) අරූප භූමිය සතර ප්‍රකාර වේ. |
| 13 | සුද්ධාවාසයෙහි කවරෙක් නො ලැබෙත් ද? | පෘථග්ජනයෝ ද සොවාන් සෙද ගැමිහු ද සුද්ධාවාස භූමියෙහි නො ලැබෙත්. |
| 14 | ආර්‍ය්‍ය අනාර්‍ය්‍යයෝ කොතැන්හි ලැබෙත් ද? | සුද්ධාවාස අපාය අසඤ්ඤසත්ත යන තුන් තැන හැර සෙසු සියලු තන්හි ආර්‍ය්‍යයෝ හා අනාර්‍ය්‍යයෝ ද ලැබෙත්. |
| 15 | ප්‍රතිසන්ධිය කොතෙක් ප්‍රකාර ද? | (අපාය ප්‍රතිසන්ධි ය, කාමසුගති ප්‍රතිසන්ධි ය, රූපාවචර ප්‍රතිසන්ධි ය, අරූපාවචර ප්‍රතිසන්ධි යයි) ප්‍රතිසන්ධිය චතුර්විධ වේ. |
| 16 | අපාය ප්‍රතිසන්ධිහු කොතෙක් ද? | (අකුශල විපාක උපෙක්ෂා සහගත සන්තීරණ චිත්තය සතර අපායෙහි ප්‍රතිසන්ධික්ෂණයෙහි පිළිසඳ ද ඉක්බිති භවාඞ්ගය ද, අවසානයෙහි චුති ය ද වී සිදෙන්නා වූ) අපාය ප්‍රතිසන්ධි ය එකෙක් ම වේ. |

කුසලවිපාකොපෙක්ඛා සහගත සන්තීරණං පන කාමසුගතියං මනුස්සානඤ්චෙව ජච්චන්ධාදීනං භුම්මනිස්සිතානඤ්ච විනිපාතිකාසුරානං පටිසන්ධි භවඞ්ග චුති වසෙන පවත්තති, මහා විපාකානි පන අට්ඨ සබ්බත්ථාපි කාමසුගතියං පටිසන්ධි භවඞ්ග චුති වසෙන පවත්තන්ති, ඉමා නව කාමසුගති පටිසන්ධියො නාම, සාපනායං දසවිධාපි කාමාවචර පටිසන්ධිච්චෙව සංඛ්‍යං ගච්ඡති.

තෙසු චතුන්නං අපායානං මනුස්සානං විනිපාතිකාසුරානඤ්ච ආයුප්පමාණ ගණනාය නියමො නත්ථි

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 17 | කුසල විපාක අහේතුක ප්‍රතිසන්ධිය කවරක්හට පවතී ද? | (කුශලවිපාක උපෙක්ෂාසහගත සන්තීරණ ය කාමසුගතියෙහි මිනිසුන් අතුරෙන් ජාත්‍යන්ධාදීන්ට ද* පෘථිවිය ආශ්‍රිත විනිපාතික අසුර සඞ්ඛ්‍යාත මලප්‍රෙත ගෙවල යක්ෂයන්ට ද ප්‍රතිසන්ධි භවාඞ්ග චුති වශයෙන් පවතී† |
| 18 | අට මහාවිපාකයෝ කොතන්හි පවතිත් ද? | (සහෙතුක කාමාවචර මහාවිපාක අට) සප්තවිධ කාමසුගතියෙහි ප්‍රතිසන්ධි භවාඞ්ග චුති වශයෙන් පවතිත්. |
| 19 | කාමසුගති ප්‍රතිසන්ධිහු කොතෙක් ද? | (කුශල විපාක අහෙතුක ප්‍රතිසන්ධිය ද, සහෙතුක මහාවිපාක අට ද යන) කාමසුගති ප්‍රතිසන්ධිහු නවයෙක් වෙත්. |
| 20 | කාමාවචර ප්‍රතිසන්ධිහු කොතෙක් ද? | (කාමසුගති ප්‍රතිසන්ධි නවය ද, අපාය ප්‍රතිසන්ධිය ද යන) කාමාවචර ප්‍රතිසන්ධි දශයෙක් වේ. |
| 21 | ආපායිකාදි සත්ත්වයන්ට ආයු ප්‍රමාණයෙක් ඇත්තේ ද? | (සතර අපායෙහි උපන් සත්ත්වයන්ට ද මනුෂ්‍යයන්ට හා විනිපාතික අසුරයන්ට ද) ආයු ප්‍රමාණ ගණනෙක් නැත්තේ ය.‡ |

* ආදි ග්‍රහණයෙන් ජාති බධිර ජාති උම්මත්තක ජාති එළමූග උභතොව්‍යඤ්ජනක නපුංසකාදීහු ද කියන ලදහ.

† සමහර විනිපාතිකයෝ සතර අපායෙන් මිදුණාහු උත්තර මාතු නම් යක්ෂණී ආදීහු මෙන් ද්විහෙතුක තිහෙතුකයෝ ද වෙත්. තිහෙතුකයන්ට ධර්මාභිසමය ද වෙතැයි දීඝනිකායට්ඨකථායෙහි කියන ලදී. මෙහි 'විනිපාතිකා අසුරානං' යනු බාහුල්‍ය වශයෙනි.

‡ අපායෙහි උපන් නිරිසතුන්ට කර්මය ඇතිතාක් චුතිය නො වී කර්මයම ප්‍රමාණ හෙයින් ආයු ප්‍රමාණ නියමයක් නැත්තේ ය. එසේ ම භුම්මට්ඨ දෙවියන්ගෙන් ඇතැම් කෙනෙක් සත් දවසක් අඩමසක් මසක් කල්පයක් ද සිටිති.

මිනිසුන්ට ඇතැම් කාලෙක අසඞ්ඛ්‍යායු ප්‍රමාණ ද දශවර්ෂ ප්‍රමාණ ද වන හෙයින් අනියම මැයි. එහින් කීහ, "ආපායිකා මනුස්සායු පරිච්ඡෙද නාඤ්ඤිජති, තත්ථ හි කාලො මන්දානං යක්ඛා හොව් චිරායුකො".

19-1

චාතුමහාරාජිකානං පන දේවානං දිබ්බානි පඤ්චවස්සසතානි මනුස්සගණනාය නවුති වස්සසතසහස්සප්පමාණං හොති.

තතො චතුග්ගුණං තාවතිංසානං තතො චතුග්ගුණං යාමානං තතො චතුග්ගුණං තුසිතානං තතො චතුග්ගුණං නිම්මාණරතීනං තතො චතුග්ගුණං පරනිම්මිතවසවත්තීනං.

නවසතඤ්චෙකවීස වස්සානං කොටියො තථා
වස්සසතසහස්සානි සට්ඨි ච වසවත්තිසු.

---

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 22 | චාතුර්මහාරාජික දෙවියන්ට ආයු කොතෙක් ද? | දිව්‍ය වර්ෂ පන්සියයෙකි. §මනුෂ්‍ය වර්ෂ ගණනින් හවුරුදු අනූ ලක්ෂයෙක් වේ. |
| 23 | තව්තිසා වැසි දෙවියන්ට ආයු කොතෙක් ද? | චාතුර්මහාරාජිකයෙහි ආයු පමණින් දිවස සංවත්සරයන්ගේ වශයෙන් චතුර්ගුණව* දිව්‍ය වර්ෂ දහසෙකි. මනුෂ්‍ය ගණනින් හවුරුදු තුන්කෝටි සැට ලක්ෂයෙක් වෙත්. |
| 24 | යාම දෙවියන්ට ආයු කොතෙක් ද? | දිව්‍ය වර්ෂ දෙ දහසෙකි. මනුෂ්‍ය වර්ෂ ගණනින් තුදුස් කෝටි හතළිස් ලක්ෂයෙකි. |
| 25 | තුසිත දෙවියන්ට ආයු කොතෙක් ද? | දිව්‍ය වර්ෂ සාරදහසෙකි. මනුෂ්‍ය ගණනින් සත් පනස් කෝටි සැට ලක්ෂයෙකි. |
| 26 | නිර්මාණරතී දෙවියන්ට ආයු කොතෙක් ද? | දිව්‍ය වර්ෂ අට දහසෙකි. මනුෂ්‍ය ගණනින් දෙසියතිස් කෝටි හතළිස් ලක්ෂයෙකි. |
| 27 | පරනිර්මිතවසවර්ති දෙවියන්ට ආයු කොතෙක් ද? | දිව්‍ය වර්ෂ සොළොස් දහසෙකි. මනුෂ්‍ය ගණනින් හවුරුදු නවසිය එක්විසි කෝටි සැට ලක්ෂයෙකි. |

---

§ මෙයි මනුෂ්‍ය වර්ෂ ගණනින් පනස් හවුරුද්දෙක් චාතුර්මහාරාජික දිව්‍ය ලොකයෙහි එක් රෑ දවලෙක් වේ. එබඳු රෑ දවල් තිසෙක් මසෙක් ද එසේ වූ මාස දොළොසෙක් හවුරුද්දෙක් ද එබඳු හවුරුදු පන්සියයෙක් චාතුර්මහාරාජික දෙවියන්ගේ ආයු වර්ෂ ගණන ද වේ. මෙම කීන, "යානි පඤ්ඤාස වස්සානි මනුස්සානං දිනො නිසං, තිංස රත්තිදිවො මාසො මාසා ද්වාදස වච්ඡරං; තෙන සංවච්ඡරෙනායු දිබ්බං පඤ්චසතං මිතං." අභිධම්මත්ථ විභාවනී, සෙසු දෙව්ලොව දිව්‍ය වර්ෂ ගණන ද මිනිස් ලොවට හවුරුදු සියයෙක දෙ සියයෙක ආදි යට කී නයින් එකිනෙකා දෙගුණ කොට ගිණිය යුතු.

* දිවස සංවච්ඡරාදි ගණනා වසෙන චතුග්ගුණං නං පන දිබ්බ ගණනාය වස්සසහස්සං.

පඨමජ්ඣාන විපාකං පඨමජ්ඣාන භූමියං පටිසන්ධි භවඞ්ග චුති වසෙන පවත්තති, තථා දුතියජ්ඣාන විපාකං තතියජ්ඣාන විපාකඤ්ච දුතියජ්ඣාන භූමියං, චතුත්ථජ්ඣාන විපාකං තතියජ්ඣාන භූමියං, පඤ්චමජ්ඣාන විපාකං චතුත්ථජ්ඣාන භූමියං.

අසඤ්ඤසත්තානං පන රූපමෙව පටිසන්ධි හොති, තථා තතොපරං පවත්තියං චවනකාලෙ ච රූපමෙව පවත්තිත්වා නිරුජ්ඣති, ඉමා ඡ රූපාවචර පටිසන්ධියො නාම.

තෙසු බ්‍රහ්මපාරිසජ්ජානං දෙවානං කප්පස්ස තතියො භාගො ආයුප්පමාණං, බ්‍රහ්මපුරොහිතානං උපඩ්ඪ කප්පො, මහා බ්‍රහ්මානං එකො කප්පො,

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 28 | ප්‍රථමධ්‍යානාදි පඤ්චකධ්‍යාන විපාකයෝ කොතැන්හි ප්‍රතිසන්ධ්‍යාදි වශයෙන් පවතිත් ද? | ප්‍රථමධ්‍යාන විපාකය බ්‍රහ්මපාරිෂද්‍යාදි ප්‍රථමධ්‍යාන භූමියෙහි ද ද්විතීය තෘතීය ධ්‍යාන විපාක ද්වයය ද්විතීය ධ්‍යාන භූමියෙහි ද චතුර්ථධ්‍යාන විපාකය තෘතීයධ්‍යාන භූමියෙහි ද පඤ්චමධ්‍යාන විපාකය චතුර්ථධ්‍යාන භූමියෙහි ද ප්‍රතිසන්ධි භවාඞ්ග චුති වශයෙන් පවතිත්. |
| 29 | අසඤ්ඤතල සත්ත්වයන්ට කුමක් ප්‍රතිසන්ධි වේ ද? | අසඤ්ඤතල සත්ත්වයන්ට රූපය ම ප්‍රතිසන්ධි වේ. එසේ ම පැවැත්මෙහි හා චුති කාලයෙහි ද රූපය ම භවාඞ්ග චුති වශයෙන් පැවැත නිරුද්ධ වේ. |
| 30 | රූපාවචර ප්‍රතිසන්ධි කොතෙක් ද? | (ප්‍රථමධ්‍යානාදී සතර භූමියෙහි ප්‍රථමධ්‍යානාදි පඤ්ච විපාක ප්‍රතිසන්ධි ද අසඤ්ඤතලයෙහි රූප ප්‍රතිසන්ධි ද යන) ප්‍රතිසන්ධි සයෙකි. |
| 31 | බ්‍රහ්මපාරිෂද්‍යාදි තලත්‍රයෙහි දෙවියන්ට ආයු කොතෙක් ද? | බ්‍රහ්මපාරිෂද්‍ය දෙවියන්ට කල්පයක්හුගේ තුනෙන් කොටසෙක් ද බ්‍රහ්මපුරොහිත දෙවියන්ට අඩ කපෙක් ද මහාබ්‍රහ්මයන්ට එක් කපෙක් ද ආයු වේ.* |

* බ්‍රහ්මපාරිෂද්‍යාදි තුන් තෙලෙහි ආයු ප්‍රමාණය මහා කල්ප වශයෙන් නොව අසඞ්ඛ්‍ය කල්ප වශයෙනි. අසඞ්ඛ්‍ය කල්පය නම් මහාකල්පයාගේ සතරෙන් කොටසෙක් වේ. එක් කපෙක්හි ම ඔවුන්ගේ විනාශය වන හෙයින් කප නැස්ම කාරණ කොට ගෙණ මහාකල්ප වශයෙන් ආයු නො ලැබේ. කප නැස්ම වනාහි සත් සත් වරෙක් ගින්නෙන් ද අටවැනි අටවැනි වර ජලයෙන් ද මෙසේ අෂ්ටවක අටක් පිරුණු කල්හි සූසැට වැනි වර වාතයෙන් නසී. හෙද ආභස්සරයෙන් යට ප්‍රථමධ්‍යාන තල තුන ඇතුළුව ගින්නෙන් ද සුභකිණ්හයෙන් යට ද්විතීය ධ්‍යාන තල තුන ඇතුළුව ජලයෙන් ද වේහප්ඵලයෙන් යට තෘතීය ධ්‍යාන තල තුන ඇතුළුව වාතයෙන් ද නස්නේ ය. මෙම කීහු.

“සත්ත සත්තග්ගිනා වාරා අට්ඨමෙ අට්ඨමෙ දකා, චතුසට්ඨි යදා පුණ්ණා එකො වායු වරොසියා; අග්ගිනාභස්සරා හෙට්ඨා ආපෙන සුභකිණ්හතො, වෙහප්ඵලතො වාතෙන එවං ලොකො විනස්සති.”

සම්මොහ විනොදනී අට්ඨකථා.

ආභස්සර සුභකිණ්හ යන්නෙන් ද්විතීය තෘතීය ධ්‍යාන තල තුන ගැණේ.

පරිත්තාභානං ද්වෙ කප්පානි, අප්පමාණාභානං චත්තාරි කප්පානි, ආභස්සරානං අට්ඨ කප්පානි, පරිත්තසුභානං සොළස කප්පානි, අප්පමාණසුභානං ද්වත්තිංස කප්පානි, සුභකිණ්හානං චතුසට්ඨි කප්පානි,

වෙහප්ඵලානං අසඤ්ඤසත්තානඤ්ච පඤ්ච කප්ප සතානි, අවිහානං කප්ප සහස්සං අතප්පානං ද්වෙ කප්ප සහස්සානි, සුදස්සානං චත්තාරි කප්ප සහස්සානි, සුදස්සීනං අට්ඨ කප්ප සහස්සානි, අකනිට්ඨානං සොළස කප්ප සහස්සානි — පඨමාරුප්පාදි විපාකානි පඨමාරුප්පාදි භූමිසු යථාක්කමං පටිසන්ධි භවඞ්ග චුති වසෙන පවත්තන්ති, ඉමා චතස්සො ආරුප්ප පටිසන්ධියො නාම —

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 32 | පරිත්තාභාදි තුන් තලෙහි දෙවියන්ට ආයු කොතෙක් ද? | පරිත්තාභ නම් දෙවියන්ට කල්ප දෙකෙක් ද අප්පමාණාභ දෙවියන්ට සතර කපෙක් ද ආභස්සර දෙවියන්ට අට කපෙක් ද ආයු වේ. |
| 33 | පරිත්තසුභාදි තුන් තලෙහි දෙවියන්ට ආයු කොතෙක්ද? | පරිත්තසුභ දෙවියන්ට සොළොස් කපෙක් ද අප්පමාණසුභ දෙවියන්ට දෙතිස් කපෙක් ද සුභකිණ්හ දෙවියන්ට සිව්සැට කපෙක් ද වේ. |
| 34 | වෙහප්ඵල අසංඥ තල දෙක්හි ආයු කොතෙක් ද? | වෙහප්ඵල වාසීන්ට හා අසඤ්ඤතල වැසි දෙවියන්ට හා මහාකල්ප පන්සියයෙක් ආයු ප්‍රමාණ වේ. |
| 35 | අවිහාදි පඤ්චසුද්ධාවාස දෙවියන්ට ආයු කොතෙක් ද? | අවිහ නම් දෙවියන්ට කප් දහසෙක් ද අතප්ප නම් දෙවියන්ට කප් දෙදහසෙක් ද සුදස්ස නම් දෙවියන්ට කප් සාරදහසෙක් ද සුදස්සී නම් දෙවියන්ට කප් අටදහසෙක් ද අකනිට්ඨක නම් දෙවියන්ට කප් සොළොස් දහසෙක් ද ආයු ප්‍රමාණය වේ. |
| 36 | ආරූප්‍ය විපාකයෝ ප්‍රතිසන්ධ්‍යාදි වශයෙන් කොතැන්හි පවතිත් ද? | ආරූප්‍ය විපාකයෝ ප්‍රථම ආරූප්‍ය ද්විතීය ආරූප්‍යාදි භූමි සතරෙහි ක්‍රමයෙන් ප්‍රතිසන්ධි භවාඞ්ග චුති වශයෙන් පවතිත්. |
| 37 | ආරූප්‍ය ප්‍රතිසන්ධිහු කොතෙක් ද? | (ප්‍රථමාරූප්‍ය ප්‍රතිසන්ධි ය, ද්විතීයාරූප්‍ය ප්‍රතිසන්ධි ය, තෘතීයාරූප්‍ය ප්‍රතිසන්ධි ය, චතුර්ථාරූප්‍ය ප්‍රතිසන්ධි යයි) ප්‍රතිසන්ධිහු සතරෙක් වෙත්. |

තෙසු පන ආකාසානඤ්චායතනූපගානං දෙවානං වීසති කප්ප සහස්සානි ආයුප්පමාණං, විඤ්ඤාණඤ්චායතනූපගානං දෙවානං චත්තාළීස කප්ප සහස්සානි, ආකිඤ්චඤ්ඤායතනූපගානං දෙවානං චතුරාසීති කප්ප සහස්සානි.

පටිසන්ධි භවඞ්ගඤ්ච තථා චවන මානසං
එකමෙව තථෙවෙකවිසයං චෙකජාතියං.

ඉදමෙත්ථ පටිසන්ධි චතුක්කං.

---

ජනකමුපත්ථම්භකමුපපීළකමුපඝාතකඤ්චෙති කිච්චවසෙන, ගරුකමාසන්නමාචිණ්ණං කටත්තා කම්මඤ්චෙති පාකදාන පරියායෙන,

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 38 | ආකාසානඤ්චායතනූපගාදී සතර අරූපාවචර දෙවියන්ගේ ආයු ප්‍රමාණ කොතෙක් ද? | ආකාසානඤ්චායතනූපග දෙවියන්ට කප් විසිදහසෙක් ද විඤ්ඤාණඤ්චායතනූපග දෙවියන්ට කප් සතළිස් දහසෙක් ද ආකිඤ්චඤ්ඤායතනූපග දෙවියන්ට කප් සැටදහසෙක් ද නෙවසඤ්ඤානාසඤ්ඤායතනූපග දෙවියන්ට කප් අසූසාර දහසෙක් ද ආයු ප්‍රමාණය වේ. |
| 39 | ප්‍රතිසන්ධි භවඞ්ග චුති සිත් තුනේ වෙනසෙක් තිබේ ද? | එක් ජාතියෙක්හි ප්‍රතිසන්ධ්‍යාදී සිත් තුන (ජාති භූමි සම්ප්‍රයුක්ත ධර්ම සංස්කාර හෙයින්) සමාන ම ය කර්ම නිමිත්තාදී එක් අරමුණෙක් ද වේ. |
| 40 | කෘත්‍ය වශයෙන් කර්ම කොතෙක් ද? | (ප්‍රතිසන්ධිය උපදවන කුශලාකුශල වූ ජනක කර්මය ද ප්‍රතිසන්ධි කර්මයට රුකුල් දෙන්නා වූ උපස්තම්භක කර්මය ද සුවදුක් කල් පැවත නොදී බාධා කරන්නා වූ උපපීඩක කර්මය ද දුබල ජනක කර්මයාගේ විපාක සිඳින්නා වූ උපඝාතක කර්මය දැයි) කෘත්‍ය වශයෙන්* සතරෙකි. |
| 41 | විපාක දාන ක්‍රමයෙන් කර්ම කොතෙක් ද? | (අනතුරු භවයෙහි විපාක දෙන සුලු වූ ගරුක කර්මය ද, ‡ මරණාසන්න කල සිතන ලද හෝ කරණ ලද හෝ ආසන්නකර්මය ද ගරුකාදි භාවයකට නො පැමිණි කටත්තා නම් කර්මය ද නිරතුරු පුරුදු කරන ලද්දා වූ ආචිණ්ණ කර්මය දැයි) විපාක දාන පරියායයෙන් †සතරෙකි. |

* කෘත්‍ය වශයෙන් යනු ජනක කෘත්‍යාදි චතුෂ්කෘත්‍ය වශයෙනි.

‡ කුශල පක්ෂයෙහි මහානුභාව වූ මහද්ගත කර්මය ද, අකුශල පක්ෂයෙහි මහාසාවද්‍ය වූ ආනන්තර්‍ය්‍ය කර්මය ද ගරුකර්ම යි.

† සියලු කර්මයන්ට ප්‍රථම කොට ගරුකර්මය ද, එය නැති කල්හි ආසන්න කර්මය ද, එයද නැති කල්හි ආචිණ්ණකර්මය ද, එයද නැති කල්හි කටත්තා නම් කර්මය ද විපාක දේ හෙයින් විපාකදාන පරියායයෙන් යයි කියන ලදි.

දිට්ඨධම්ම වෙදනීයං උපපජ්ජ වෙදනීයං අපරාපරිය වෙදනීයං අහොසිකම්මඤ්චෙති පාකකාල වසෙනෙව චත්තාරි කම්මානි නාම — තථා අකුසලං කාමාවචර කුසලං රූපාවචර කුසලං අරූපාවචර කුසලඤ්චෙති පාකට්ඨාන වසෙන, තත්ථ අකුසලං කාය කම්මං වචීකම්මං මනොකම්මඤ්චෙති කම්මද්වාර වසෙන තිවිධං හොති —

තත්ථ පාණාතිපාතො අදින්නාදානං කාමෙසු මිච්ඡාචාරොචෙති කායවිඤ්ඤත්ති සඞ්ඛාතෙ කායද්වාරෙ බාහුල්ල වුත්තිතො කාය කම්මං නාම —

මුසාවාදො පිසුණා වාචා ඵරුසා වාචා සම්ඵප්පලාපොචෙති වචීවිඤ්ඤත්ති සඞ්ඛාතෙ වචීද්වාරෙ බාහුල්ල වුත්තිතො වචීකම්මං නාම,

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 42 | විපාකදාන කාල වශයෙන් කර්ම කොතෙක් ද? | (මේ අත්බැව්හි වින්ද යුතු දෘෂ්ටධර්ම වේද්‍ය කර්මය ද, අනතුරු භවයෙහි වින්දයුතු උපපද්‍ය වේද්‍ය කර්මය ද, යම්කිසි භවයෙක්හි වින්ද යුතු අපරාපර්‍ය්‍යා වේද්‍ය කර්මය ද, ඒ ඒ කල් ඉක්ම ගිය හෙයින් විපාක විරහිත වූ අහොසි කර්මය දැයි) විපාක කාල වශයෙන් * සතරෙකි. |
| 43 | විපාකස්ථාන වශයෙන් කර්ම කොතෙක් ද? | (අකුශල ය කාමාවචර කුශල ය රූපාවචර කුශල ය අරූපාවචර කුශල යයි) විපාකස්ථාන වශයෙන් කර්මයෝ සතර දෙනෙක් වෙත්. |
| 44 | අකුශල ය ද්වාර වශයෙන් කොතෙක් ප්‍රකාර ද? | (කායකර්ම ය වාක්කර්ම ය මනොකර්ම යයි) ද්වාර වශයෙන් තුන් ප්‍රකාර වේ. |
| 45 | කාය කර්ම යනු කුමක් ද? | ප්‍රාණ ඝාතය ද අදත්තාදානය ද කාම මිථ්‍යාචාරය ද (කායවිඥප්ති යයි කියන ලද* කායද්වාරයෙහි බහුලව පවත්නා හෙයින්) ‡ කාය කර්ම නම් වේ. |
| 46 | වාක් කර්ම යනු කුමක් ද? | මුසා වාදය ද පෛශුන්‍ය වචනය ද පරුෂවචනය ද සම්ඵප්පලාපය ද (වාක්විඥප්ති සඞ්ඛ්‍යාත වාග්ද්වාරයෙහි බහුලව පවත්නා හෙයින්) වාක් කර්ම නම් වේ. |

* ඒ ඒ කල්හි වින්ද යුතු කර්ම හෙයින් කාල වශයෙනැයි කියන ලදි.

‡ කයින් අභිප්‍රාය හඟවන හෙයින් ද තමා කයින් දත යුතු හෙයින් ද කාය විඥප්ති යයි කියන ලදි. වාග්විඥප්තිය ද මෙසේ ම.

§ ‘බහුලව පවත්නා හෙයින්’ යනු ප්‍රාණඝාතාදිය වචනයෙන් අණවන්නා හට ද්වාර වශයෙන් වාග්ද්වාරයෙහි දු මදව පවත්නා හෙයිනි.

අභිජ්ඣා ව්‍යාපාදො මිච්ඡාදිට්ඨි චෙති අඤ්ඤදත්‍රාපි විඤ්ඤත්තියා මනස්මිං යෙව බාහුල්ල වුත්තිතො මනො කම්මං නාම෴ තෙසු පාණාතිපාතො ඵරුසා වාචා බ්‍යාපාදො ච දොසමූලෙන ජායන්ති, කාමෙසු මිච්ඡාචාරො අභිජ්ඣා මිච්ඡාදිට්ඨි ච ලොභ මූලෙන, සෙසානි චත්තාරිපි ද්වීහි මූලෙහි* සම්භවන්ති෴

චිත්තුප්පාද වසෙන පනෙතං අකුසලං සබ්බථාපි ද්වාදසවිධං හොති, කාමාවචර කුසලම්පි කායද්වාරෙ පවත්තං කායකම්මං වචීද්වාරෙ පවත්තං වචීකම්මං මනොද්වාරෙ පවත්තං මනොකම්මඤ්චෙති කම්මද්වාර වසෙන තිවිධං හොති, තථා දාන සීල භාවනා වසෙන, චිත්තුප්පාද වසෙන පනෙතං අට්ඨවිධං හොති, දාන සීල භාවනා අපචායන වෙය්‍යාවච්ච පත්තිදාන පත්තානුමොදනා ධම්ම සවණ ධම්මදෙසනා දිට්ඨිජ්ජුකම්ම වසෙන දසවිධං හොති෴

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 47 | මනො කර්ම යනු කුමක් ද? | අනුන් සම්පත් අභිමුඛ කොට ලොභ වශයෙන් චින්තනය කරන්නා වූ අභිධ්‍යාව ද (මේ සත්ත්ව තෙම විනාශ වූයේ නම් යෙහෙකැ යි) සිත නො පැහැදුම් සඞ්ඛ්‍යාත ව්‍යාපාදය ද විපරීතාකාරයෙන් දක්නා වූ නාස්තිකාදි මිථ්‍යාදෘෂ්ටිය ද කාය වාග් විඥප්ති රහිතව ද සිත්හිම බහුලව පවත්නා හෙයින් මනොකර්ම නම් වේ. |
| 48 | ද්වෙෂ මූලයෙන් කිනම් අකුශලයෝ උපදිත් ද? | ප්‍රාණඝාත ය පරුෂවචන ය ව්‍යාපාද ය යන මොහු ද්වෙෂ මූලයෙන් හෙවත් ද්වෙෂය මුල්කොට උපදිත්. |
| 49 | ලොභ මූලයෙන් කිනම් අකුශලයෝ උපදිත් ද? | කාම මිථ්‍යාචාරය ද අභිධ්‍යාව ද මිථ්‍යාදෘෂ්ටිය ද යන මොහු ලොභය මුල් කොට උපදිත්. |
| 50 | මොහ මූලයෙන් කිනම් අකුශලයෝ උපදිත් ද? | අදත්තාදාන ය මෘෂාවාද ය පෛශුන්‍ය වචන ය සම්ඵප්පලාප ය යන සතර දෙන ලොභ ද්වෙෂ මොහ යන ත්‍රි මූලයෙන් උපදිත්. |
| 51 | චිත්තොත්පාද වශයෙන් අකුශලය කොතෙක් ප්‍රකාර ද? | (ලොභ ය මුල්කොට අටෙක, ද්වෙෂය මුල්කොට දෙකෙක, මොහ ය මුල් කොට දෙකෙකැ යි) දොළොස් ප්‍රකාර වෙත්. |
| 52 | කාමාවචර කුසලය දානාදි වශයෙන් කොතෙක් ප්‍රකාර ද? | (දන් දීම ය සිල් රැකීම ය භාවනා කිරීම ය ජ්‍යෙෂ්ඨාපචායන ය වතාවත් කිරීම ය පින්දීම ය පින් අනුමෝදන් වීම ය බණ ඇසීම ය බණ කීම ය දෘෂ්ටිය ඍජුකිරීම ය යන මොවුන්ගේ වශයෙන්) දශ ප්‍රකාර වේ. |

* "තීහිමූලෙහි" යනු ඇතැම් පොතෙක පෙණේ.

තං පනෙතං වීසතිවිධම්පි කාමාවචර කම්මමිච්චෙව සඞ්ඛං ගච්ඡති, රූපාවචර කුසලම්පන මනොකම්මමෙව, තඤ්ච භාවනාමයං අප්පනාප්පත්තං ඣානඞ්ග භෙදෙන පඤ්චවිධං හොති, තථා අරූපාවචර කුසලඤ්ච මනොකම්මං තම්පි භාවනාමයං අප්පනාප්පත්තං ආලම්බන භෙදෙන චතුබ්බිධං හොති, එත්ථාකුසල කම්මමුද්ධච්ච රහිතං අපාය භූමියං පටිසන්ධිං ජනෙති පවත්තියං පන සබ්බම්පි ද්වාදසවිධං, සත්තාකුසලවිපාකානි සබ්බත්ථාපි කාමලොකෙ රූපලොකෙ ච යථාරහං විපච්චන්ති, කාමාවචර කුසලම්පි කාමසුගතියමෙව පටිසන්ධිං ජනෙති තථා පවත්තියඤ්ච මහාවිපාකානි,

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 53 | රූපාවචර කුශලය කිනම් කර්මයෙක් ද? | කායද්වාරාදියෙහි නො පවත්නා හෙයින් මනඃ කර්ම නම් වේ. |
| 54 | රූපාවචර කුශලය අඞ්ග භෙදයෙන් කොතෙක් ප්‍රකාර ද? | (අර්පණාප්‍රාප්ත භාවනාමය වූ රූපාවචර කුශල ය විතර්ක විචාරාදි ධ්‍යානාඞ්ග භෙදයෙන්) පස් ප්‍රකාර වේ. |
| 55 | අරූපාවචර කුශලය කිනම් කර්මයෙක් ද? | කායද්වාරාදියෙහි නො පවත්නා හෙයින් මනඃ කර්ම වේ. |
| 56 | අරූපාවචර කුශලය ආලම්බන භෙදයෙන් කොතෙක් ප්‍රකාර ද? | (භාවනාමය වූ අර්පණාවට පැමිණි අරූපාවචර කුශලය තෙමේ කසිණොද්ඝාටිමාකාශාදි ආලම්බන භෙදයෙන්) චතුර්විධ වේ.* |
| 57 | ද්වාදශාකුශල කර්මයාගේ පිළිසිඳීම් පැවැතිම් කෙසේ ද? | උද්ධච්ච සහගත චෙතනාව හැර† සෙසු එකාදශ අකුශල කර්මයම් සතර අපායයෙහි පිළිසිඳීම දේ, පැවැත්මෙහි ද උද්ධච්ච සහගත චිත්තය සමඟ දොළොස් වැදෑරුම් වූ අකුශල චිත්තය ම විපාක දේ. |
| 58 | සප්තාකුශලවිපාකයෝ කොතැන්හි විපාක දෙත් ද? | (චක්ෂුර්විඥානාදි) සප්තාකුශල විපාකයෝ දුගති සුගති වශයෙන් සියලු කාමභවයෙහි ද රූපභවයෙහි ද ද්වාරාලම්බනානුරූපව විපාක දෙත්. |
| 59 | කාමාවචර කුශලය කොතැන්හි පිළිසඳ හා ප්‍රවෘත්ති විපාක හා උපදවා ද? | කාමාවචර කුශලය තෙමේ කාම සුගති යයි කියන ලද සප්ත කාම ස්වර්ගයෙහි ම පිළිසඳ උපදවා එසේ ම පැවැත්මෙහි ද මහා විපාකයන් ද උපදව යි. |

* "කසිණුග්ඝාටිමාකාසං ආකාස විසයං මනො තදභාවො තදාලම්බං, විඤ්ඤාණාදි චතුබ්බිධං".

† උද්ධච්ච සහගත චිත්තයාගේ ප්‍රතිසන්ධි දාන ස්වභාවයෙන් නැති හෙයින් උද්ධච්ච සහගත චෙතනාව හැර යයි කියන ලදි.

අහෙතුක විපාකානි පන අට්ඨපි සබ්බත්ථාපි කාමලොකෙ රූපලොකෙ ච යථාරහං විපච්චති, තත්ථාපි තිහෙතුකමුක්කට්ඨං කුසලං තිහෙතුකං පටිසන්ධිං දත්වා පවත්තෙ සොළස විපාකානි විපච්චති. තිහෙතුකමොමකං ද්විහෙතුකමුක්කට්ඨඤ්ච කුසලං ද්විහෙතුකං පටිසන්ධිං දත්වා පවත්තෙ තිහෙතුක රහිතානි ද්වාදස විපාකානි විපච්චති.

ද්විහෙතුකමොමකං පන කුසලං අහෙතුකමෙව පටිසන්ධිං දෙති පවත්තෙ ච අහෙතුක විපාකානෙව විපච්චති.

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 60 | අහෙතුක විපාකයෝ කොතැන්හි විපාක දෙත් ද? | චක්ෂුර්විඥානාදි අෂ්ටවිපාකයෝ සියලු කාමලෝකයෙහි ද රූපලෝකයෙහි ද සුදුසු පරිද්දෙන් විපාක දෙත්. |
| 61 | ත්‍රිහෙතුකොත්කෘෂ්ට කුශලය කුමන පිළිසඳක් දී කොතෙක් විපාක උපදවා ද? | උත්කෘෂ්ට වූ * (අලෝභ අද්වේෂ අමෝහ වශයෙන්) ත්‍රිහෙතුක වූ කුශලය ත්‍රිහෙතුක ප්‍රතිසන්ධිය දේ.† පැවැත්මෙහි සහෙතුක අහෙතුක වූ සොළොස් විපාකයන් ද උපදවයි. |
| 62 | කවර කුශලයෙක් ද්විහෙතුක ප්‍රතිසන්ධිය දී කොතෙක් විපාක උපදවා ද? | ඕමක වූ‡ ත්‍රිහෙතුක කුශලය ද අලෝභ අද්වේෂ වශයෙන් ද්විහෙතුක උත්කෘෂ්ට කුශලය ද ද්විහෙතුක ප්‍රතිසන්ධිය දී පැවැත්මෙහි ඥානසම්ප්‍රයුක්ත ත්‍රිහෙතුක විපාක සතර හැර සෙසු දොළොස් විපාකයන් උපදවයි. |
| 63 | කවර කුශලයෙක් තෙමේ අහෙතුක ප්‍රතිසන්ධිය දී අහෙතුක විපාක උපදවා ද? | (අකුශලයන් විසින් පිරිවරන ලද ද පසුව මා විසින් කපුරක් කරන ලද්දක් ආසෙවනය කරන ලද ද) ඕමක වූ ද්විහෙතුක කුශලය අහෙතුක පිළිසඳ දී පැවැත්මෙහි ද අහෙතුක විපාක උපදවයි. |

* යම් කර්මයක් කමින් පවත්නා කල්හි පෙර පසු පැවැති කුශලාකුශල කර්මයන් විසින් පිරිවරන ලද ද පසුව නෝ ආසේවනා ලාභයෙන් පුරුදු කරන ලද ද එය උත්කෘෂ්ට කුශලකර්ම නම් වේ.

† 'ප්‍රතිසන්ධිය දේ' යනු එකම ප්‍රතිසන්ධියකි, එක් කර්මයකින් නොයෙක් ප්‍රතිසන්ධි නො දේ, ප්‍රවෘත්ති විපාක වූ කලී ජාති සියයෙක්හි ද දහසෙක්හි ද වෙත්. එහින් කීහ:-

"පටිසන්ධිකානි එකාමෙව පටිසන්ධිං ජායති එකෙන කම්මුනා අනෙකාසු ජාතීසු පටිසන්ධි නත්ථි පවත්ති විපාකො පන ජාති සතෙපි ජාති සහස්සෙපි හොති"

‡ යම් කුශලයක් කරන කල්හි පෙරපසු සිත් අකුශලයන් විසින් පිරිවරන ලද ද පසුව නෝ මා විසින් කරන ලද්ද කපුරුයි විප්‍රතිසාර ඉපැදීමෙන් පරිභාවිත ද ඒ කුශලය ඕමක නම් වේ. මෙම කීහ:-"යම්පන කරණ කාලෙ අකුසලෙහි පරිවාරිතං පච්ඡා දුක්කතමෙතං මයාති විප්පටිසාරුප්පාදනෙන පරිභාවිතං තං ඔමකන්ති දට්ඨබ්බං"

12-/

අසඞ්ඛාරං සසඞ්ඛාර විපාකානි න පච්චති
සසඞ්ඛාරමසඞ්ඛාර විපාකානීති කෙචන.

තෙසං ද්වාදස පාකානි දසාට්ඨ ච යථාක්කමං
යථා වුත්තානුසාරෙන යථා සම්භවමුද්දිසෙ.

රූපාවචර කුසලං පන පඨමජ්ඣානං පරිත්තං භාවෙත්වා බ්‍රහ්මපාරිසජ්ජෙසු උප්පජ්ජන්ති, තදෙව මජ්ඣිමං භාවෙත්වා බ්‍රහ්මපුරොහිතෙසු, පණීතං භාවෙත්වා මහාබ්‍රහ්මෙසු.

තථා දුතියජ්ඣානං තතියජ්ඣානඤ්ච පරිත්තං භාවෙත්වා පරිත්තාභෙසු, මජ්ඣිමං භාවෙත්වා අප්පමාණාභෙසු, පණීතං භාවෙත්වා ආභස්සරෙසු,

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 64 | අසංස්කාරික කුශලය සසංස්කාරික විපාක යන් ද සසංස්කාරික කුශලය අසංස්කාරික විපාක යන් ද දේ ද? | අසංස්කාරික කුශලය (තත්සාදෘශ්‍ය අසංස්කාරික විපාකයන් විනා) සසංස්කාරික විපාකයන් නො දේ; සසංස්කාරික කුශලය ද සසංස්කාරික විපාකයන් හැර අසංස්කාරික විපාකයන් ද නො දේ යයි කිසි කෙනෙක් කියත්.* |
| 65 | කෙචිවාද මත භේද යෙන් කෙනෙක් විපාක යන් කියන්නේ ද? | ඔවුන්ගේ මතභේදයෙන් ත්‍රිහේතුක උත්කෘෂ්ට සසංස්කාරිකාදි ක්‍රමයෙන් දොළොස් විපාකයන් ද ත්‍රිහේතුක නිකෘෂ්ට ද්විහේතුක උත්කෘෂ්ට සසංස්කාරිකාදි ක්‍රමයෙන් දස විපාකයන් ද ද්විහේතුක ඔමක වශයෙන් අට විපාකයන් ද යට කියන ලද ක්‍රමයෙන් ඒ ඒ සත්වයන්ට ලැබෙන පරිද්දෙන් කියන්නේය. |
| 66 | ප්‍රථම ධ්‍යානය වඩා කොතැන්හි උපදිත් ද? | රූපාවචර කුශල සංඛ්‍යාත ප්‍රථම ධ්‍යානය (උත්පාද මාත්‍ර අනාසේවිත බැවින් මඳ කොට වඩා බ්‍රහ්මපාරිෂද්‍ය දෙවියන් කෙරෙහි ද (අති සුභාවිත නො වූ අපරිපූර්ණ වශීභාවය ඇති හෙයින්) මධ්‍යම කොට වඩා බ්‍රහ්ම පුරොහිත දෙවියන් කෙරෙහි ද (අති සුභාවිත පරිපූර්ණ වශීභාවය ඇති බැවින්) උත්කෘෂ්ට කොට වඩා මහා බ්‍රහ්මයන් කෙරෙහි ද උපදිත්. |
| 67 | ද්විතීය තෘතීය ධ්‍යාන ද්වය ය වඩා කො තැන්හි උපදිත් ද? | ද්විතීය තෘතීය ධ්‍යාන ද්වය ය පරිත්ත මධ්‍යම ප්‍රණීත වශයෙන් වඩා පරිත්තාභ ය අප්පමාණාභ ය ආභස්සර ය යන තුන් තල වැසි දෙවියන් කෙරෙහි උපදිත්. |

* 'කිසිවෙක්' යනු මොරවාපි වාසී මහා ධර්මරක්ෂිත ස්ථවිරයන් සඳහා යයි ටීකාවෙහි කියන ලදී.

චතුත්ථජ්ඣානං පරිත්තං භාවෙත්වා පරිත්තසුභෙසු, මජ්ඣිමං භාවෙත්වා අප්පමාණසුභෙසු පණීතං භාවෙත්වා සුභකිණ්ණෙසු,

පඤ්චමජ්ඣානං භාවෙත්වා වෙහප්ඵලෙසු, තදෙව සඤ්ඤාවිරාගං භාවෙත්වා අසඤ්ඤසත්තෙසු, අනාගාමිනො පන සුද්ධාවාසෙසු උපපජ්ජන්ති.

අරූපාවචර කුසලඤ්ච යථාක්කමං භාවෙත්වා ආරුප්පෙසු උපපජ්ජන්තීති.

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 68 | චතුර්ථ ධ්‍යානය වඩා කොතැන්හි උපදිත් ද? | චතුර්ථධ්‍යානය පරිත්තාදි වශයෙන් වඩා පරිත්තසුභ ය අප්පමාණසුභ ය සුභකිණ්ණක ය යන තුන් තල වැසි දෙවියන් කෙරෙහි අනුක්‍රමයෙන් උපදිත්. |
| 69 | කුමන ධ්‍යානයක් වඩා වෙහප්ඵලයෙහි උපදිත් ද? | (පරිත්තාදි ත්‍රිවිධ වූ අභිඥ භාවයට නො පැමිණි) පඤ්චම ධ්‍යානය වඩා වෙහප්ඵල දෙවියන් කෙරෙහි උපදිත්. |
| 70 | කුමන ධ්‍යානයක් වඩා අසංඥ සත්ත්වයන් කෙරෙහි උපදිත් ද? | පඤ්චම ධ්‍යානය ම (සඤ්ඤාගණ්ඩො සඤ්ඤාරොගො ධිච්චිත්තං) යනාදි වශයෙන් සංඥ විරාග භාවනා කොට අසංඥසත්ත්වයන් කෙරෙහි උපදිත්.* |
| 71 | අනාගාමීහු කොතැන්හි උපදිත් ද? | අනාගාමීහු වනාහි (පඤ්චම ධ්‍යානය ත්‍රිවිධාකාරයෙන් වඩා ශ්‍රද්ධාදි ඉන්ද්‍රිය නානත්වානුක්‍රමයෙන්) පඤ්ච සුද්ධාවාසයෙහි උපදිත්.† |
| 72 | අරූපාවචර කුසල් වඩා කොතැන්හි උපදිත් ද? | අරූපාවචර කුශලය ද යථාක්‍රමයෙන් වඩා ප්‍රථමාදි අරූපභවයෙහි උපදිත්. |

* මෙහි යම් ඉරියව්වකින් මැරෙත් ද එම ඉරියව්වෙන් ම එහි උපදිති. ඔහු තුමූ නාම් ක්‍රියා වාදී තීර්ථකයෝ ම යයි කියනු ලදු.

† ශුෂ්කවිදර්ශක අනාගාමීහු මැරෙන කාලෙ සමාධියෙහි පරිපූර්ණකාරී හෙයින් ධ්‍යාන උපදවා බඹතලෙහි උපදිත්, අනාගාමීහු ම සුද්ධාවාසයෙහි උපදිත් යයි නියමය ඇති වේ; ඒ අනාගාමීහු අන් බඹතලෙක්හි නූපදිත් යයි නියමයෙක් නැත්තේ ය, එයින් කීහ පූර්වාචාර්යයන් විසින්:—

"සුද්ධාවාසෙසවනාගාමී පුග්ගලාවොපපජ්ජරෙ, කාමධාතුම්හි ජායන්ති අනාගාමි විවජ්ජිතා"යි—ස්ත්‍රීහු වනාහි ආර්යායෝ හෝ අනාර්යායෝ හෝ අෂ්ට සමාපත්ති ලාභිනීහු බ්‍රහ්මපාරිෂද්‍යයෙහි ම උපදිත්, මෙම කීහ, "ඉත්ථියො පන අරියා වා අනරියා වාපි අට්ඨසමාපත්ති ලාභිනියො බ්‍රහ්මපාරිසජ්ජෙසු යෙව නිබ්බත්තන්තීති අට්ඨකථාසු වුත්තං"—වෙහප්ඵලයෙහි ද අකනිට්ඨා බඹතලෙහි ද අරූපතල සතරෙහි ද උපන් ආර්යයෝ අන් තැනෙක්හි නූපදිත්; මෙද කියනු ලදී:- "වෙහප්ඵලෙ අකනිට්ඨෙ භවග්ගෙව පතිට්ඨිතා න පුනාඤ්ඤත්‍ර ජායන්ති සබ්බෙ අරිය පුග්ගලා බ්‍රහ්මලොකගතා හෙට්ඨා අරියානොපපජ්ජරෙ"යි. අභිධම්මත්ථ විභාවනී.

12-2

ඉත්ථං මහග්ගතං පුඤ්ඤං යථා භූමි වවත්ථිතං
ජනෙති සදිසං පාකං පටිසන්ධි පවත්තියං.
ඉදමෙත්ථ කම්ම චතුක්කං

---

ආයුක්ඛයෙන කම්මක්ඛයෙන උභයක්ඛයෙන උපච්ඡෙදක කම්මුනාචෙති චතුධා*මරණුප්පත්ති නාම.

තථාච මරන්තානං පන මරණ කාලෙ යථාරහං අභිමුඛීභූතං භවන්තරෙ පටිසන්ධි ජනකං කම්මංවා තං කම්ම කරණ කාලෙ රූපාදිකමුපලද්ධ පුබ්බමුපකරණ භූතඤ්ච කම්ම නිමිත්තං වා අනන්තරමුප්පජ්ජමාන භවෙ උපලභිතබ්බ උපභොග භූතඤ්ච ගති නිමිත්තංවා කම්ම බලෙන ඡන්නං ද්වාරානං අඤ්ඤතරස්මිං පච්චුපට්ඨාති,

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 73 | මහග්ගත කුශලය ඒ ඒ භූමිස්ථාන වශයෙන් විපාක උපදවා ද? | භූමි පරිච්ඡෙදෙන් නිශ්චිත වූ මහග්ගත කුශලය පිළිසිඳීම් පැවැත්ම දෙක්හි ඒ ඒ භූමි ධ්‍යානයන්ට සුදුසු විපාක උපදවයි. |
| 74 | මරණොත්පත්තිය* කොතෙක් ප්‍රකාර ද? | (ඒ ඒ ජාතියෙහි) ආයුඃ ක්ෂයවීමෙන් ද (ආයුෂ ඇත්තේ ද) කර්ම ක්ෂය වීමෙන් ද ආයු කර්ම දෙදෙනාගේ ක්ෂයවීමෙන් ද උපච්ඡේදක කර්මයෙන් ද යයි† මරණොත්පත්ති තොමෝ චතුර්විධ වේ. |
| 75 | මරණාසන්න කල්හි කුමක් එළඹ සිටී ද? | (ආයුඃ ක්ෂයාදියෙන්) මියන්නවුන්ගේ මරණාසන්න කල්හි (ඒ ඒ භවයෙහි උපදනා සත්ත්වයන්ට) සුදුසු පරිද් දෙන් හමු වූ අනතුරු වූ භවයෙහි පිළිසඳ උපදවන (කාමාවචර) කර්මයක් හෝ ඒ කර්මය කරන කල්හි (චෛත්‍ය දර්ශනාදි වශයෙන් ලැබිය යුතු වූ ද පුෂ්ප පූජාදි වශයෙන් උපකරණවූ ද) රූපාදි කර්මනිමිත්තක් හෝ අනතුරු උපදින භවයෙහි ලැබිය යුතු (දෙව්භවන කප්රුක් නිරයාග්නි ආදි) පරිභොග කටයුතු ගතිනිමිත්තක් හෝ කර්මබලයෙන් සදොරින් එක්තරා ද්වාරයෙක්හි එළඹ සිටියි. |

---

* සමහර පොතක "මරණුප්පවත්ති"යි පෙනේ. ටීකා පොත්වල ද "මරණස්ස පවත්ති මරණප්පවත්ති"යි ද; "මරණස්ස උප්පත්ති පවත්ති මරණුප්පත්ති"යි ද දෙයාකාරව පෙනේ.

† පෙර ජාතියක සිදු වූ කිසි උපච්ඡේදක කර්මබලයෙකින් ශස්ත්‍ර හරණාදි උපක්‍රමයකින් සිඳිනු ලබන සන්තාන ඇත්තවුන්ගේ මරණය ද මෙම ආත්මයෙහි ගුණ මහතුන් කෙරෙහි හෝ කරන ලද කිසි උපක්‍රමයකින් රැස්කරන ලද උපච්ඡේදක කර්ම බලයෙන් දූසිමාර කලාබුරාජාදීන්ට මෙන් එකෙණෙහි පුහුවිම වශයෙන් පැමිණි මරණය ද උපච්ඡේදක මරණ යි.

තතො පරං තමෙව තථොපට්ඨිතං ආලම්බනං ආරබ්භ විපච්චමානක කම්මානුරූපං පරිසුද්ධමුපක්කිලිට්ඨං වා උපලභිතබ්බ භවානුරූපං තත්ථොනතං'ව චිත්තසන්තානං අභිණ්හං පවත්තති බාහුල්ලෙන, තමෙව වා පන ජනකභූතං කම්මමභිනව කරණවසෙන ද්වාරප්පත්තං හොති...... පච්චාසන්න මරණස්ස තස්ස වීථිචිත්තාවසානෙ භවඞ්ගක්ඛයෙ වා චවනවසෙන පච්චුප්පන්න භව පරියොසාන භූතං චුතිචිත්තමුප්පජ්ජිත්වා නිරුජ්ඣති.

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 76 | කර්මනිමිත්තාදි වශයෙන් එළඹ සිටි අරමුණ කෙසේ පවතී ද? | ඉක්බිති එසේ (කර්මනිමිත්තාදි වශයෙන්) එළඹ සිටි එම (රූපාදි) අරමුණක් අරගෙන (කර්මනිමිත්තාදි විපාක දෙන කර්මානුරූප වූ කුශල ජවන් පැවැත්ම වශයෙන්) පිරිසිදු වූ හෝ (අකුශල ජවන් පැවැත්ම වශයෙන්) අපිරිසිදු වූ හෝ) ඉපැදිය යුතු සුගති දුගති භවයන්ට සුදුසු වූ) චිත්ත සන්තතිය එහි නිමිනව බොහෝ වශයෙන් නිරතුරුව පවතී. |
| 77 | කර්මය අභිනව කිරීම වශයෙන් ද්වාරප්‍රවර්තනය වේ ද? | ප්‍රතිසන්ධිය උපදවන්නා වූ එම කර්මය වනාහි අභිනව කරණ වශයෙන් හෙවත් අලුත් කිරීම් වශයෙන් ද්වාර ප්‍රවර්තනය වේ. |
| 78 | ජවනාදි කවර චිත්තයන්ගේ අවසන්හි ච්‍යුතිචිත්තය ඉපැද නිරුද්ධ වේ ද? | ආසන්න මරණ ඇති* හෙවත් සමීප මරණයෙන් යුත් ඒ පුද්ගලයාහට වීථිචිත්තයන්ගේ අවසානයෙහි† හෝ භවාඞ්ග චිත්තයන්ගේ ක්ෂයවීමෙහි‡ හෝ චුතවීම් වශයෙන් ප්‍රත්‍යුත්පන්න භවයාගේ අවසන්හි වූ ච්‍යුතිචිත්තය ඉපැද නිරුද්ධ වේ. |

* 'ආසන්න මරණ ඇති' යනු වීථිචිත්ත ප්‍රමාණ ආයු වශයෙන් හෝ ඊට මඳක් අධික ආයු වශයෙන් හෝ වේ. එයින් කීහ, "පච්චාසන්න මරණස්සාති එකවීථිප්පමාණ ආයුවසෙන තතො වා කිඤ්චි අධිකායුවසෙන සමාසන්න මරණස්ස."

† 'වීථිචිත්තයන්ගේ අවසානයෙහි' යනු තදාලම්බනයන්ගේ ද ජවනයන්ගේ ද අවසානය වේ. එහි කාමභවයෙන් චුතව කාමභවයෙහිම උපදනාවුනට චුතිචිත්තය තදාලම්බන අවසන් කොට ඇත්තේය. සෙසවුනට ජවනාවසාන කොට ඇත්තේ ය. එයින් කීහ, ධම්මානුසාරණියෙහි; "කාමභවතො චවිත්වා තත්ථෙව උපපජ්ජමානානං තදාලම්බන පරියොසානානි සෙසානං ජවන පරියොසානානී"ති.

‡ එක ජවන වීථියෙන් අධික තර වූ ආයු සෙසය ඇති කල්හි භවාඞ්ගචිත්තයන්ගේ ක්ෂයවීමෙහි යයි කියන ලදි. ආයුශෙෂය නම් ඒක් චිත්තක්ෂණයකි.

තස්මිං නිරුද්ධාවසානෙ තස්සානන්තරමෙව තථා ගහිතං ආලම්බනමාරබ්භ සවත්ථුකං අවත්ථුකමෙව වා යථාරහං අවිජ්ජානුසය පරික්ඛිත්තෙන තණ්හානුසය මූලකෙන සඞ්ඛාරෙන ජනීයමානං සම්පයුත්තෙහි පරිග්ගය්හමානං සහජාතානමධිට්ඨානභාවෙන පුබ්බඞ්ගමභූතං භවන්තර පටිසන්ධාන වසෙන පටිසන්ධි සඞ්ඛාතං මානසං උප්පජ්ජමානමෙව පතිට්ඨාති භවන්තරෙ.

මරණාසන්න වීථියං පනෙත්ථ මන්දප්පවත්තානි පඤ්චෙව ජවනානි පාටිකඞ්ඛිතබ්බානි, තස්මා යදි පච්චුප්පන්නාලම්බනෙසු ආපාථගතෙසු ධරන්තෙස්වෙව මරණං හොති තදා පටිසන්ධි භවඞ්ගානම්පි පච්චුප්පන්නාලම්බනතා ලබ්භතීති කත්වා කාමාවචර පටිසන්ධියා ඡද්වාරගහිතං කම්මනිමිත්තං ගතිනිමිත්තඤ්ච පච්චුප්පන්නමතීතාලම්බනං උපලබ්භති.

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 79 | ප්‍රතිසන්ධි විඥානය කවරකු විසින් පිරිවරන ලදුව කුමක් මුල්කොට කුමකින් උපදවනු ලැබීම් ආදියෙන් අන්‍ය භවයෙක්හි පිහිටා ද? | චුතිවිඥානය නිරුද්ධ වූ ක්ෂණෙහි ෂඩ් ද්වාරයකින් ගන්නා ලද අරමුණක් අරහයා සවස්තුක වූ ද අවස්තුක වූ ද* (කර්ම කරන කාලයට ද විපාක කාලයට ද) සුදුසු පරිද්දෙන් අවිද්‍යානුශයෙන් පිරිවරන ලදුව තෘෂ්ණානුශය මුල්කොට ඇති සංස්කාර (සඞ්ඛ්‍යාත කුශලාකුශල) යන් විසින් උපදවනු ලබමින් (ස්පර්ශාදි) සම්ප්‍රයුක්ත ධර්මයන් විසින් පිරිවරාගනු ලබන්නා වූ සහජාත ධර්මයන්ට පිහිටවන හෙයින් පූර්වාඞ්ගම වූ භවාන්තරයාගේ ගැළපීම් වශයෙන් ප්‍රතිසන්ධි සඞ්ඛ්‍යාත විඥානය උපදනේම අන්‍ය භවයෙක්හි පිහිටයි. |
| 80 | මරණාසන්න වීථියෙහි ජවන් කොතෙක් ද? | මරණාසන්න වීථියෙහි තමන්ගේ වස්තු දුර්වලත්වයෙන් ලස් වැ පැවැති ජවනයෝ පස් දෙනෙක් ම වෙත්. |
| 81 | කර්මනිමිත්තද ගතිනිමිත්ත ද වර්තමාන අතීතාලම්බන වශයෙන් කුමන ආලම්බනයෙක් ව ලැබේ ද? | වර්තමානාලම්බනයක් හමු වූ කලැ† ඒ ආලම්බනය ධරමාන කල්හි ම මරණය වේ ද එකල ප්‍රතිසන්ධි භවාඞ්ගයන්ගේ වර්තමානාලම්බන බව ලැබෙන බැවින්‡ කාමාවචර ප්‍රතිසන්ධියට සදොරින් ගන්නා ලද කර්මනිමිත්ත ද (මනොද්වාරයෙන් ගන්නා ලද) ගතිනිමිත්ත ද වර්තමානාලම්බනව ද අතීතාලම්බනව ද ලැබේ. |

* මෙහි හෘදය වස්තුව හා පැවැති හෙයින් 'සවස්තුක' යයි ද අරූපාවචර ප්‍රතිසන්ධි වශයෙන් 'අවස්තුක' යයි ද කියන ලදී.

† 'හමු වූ කලැ' යනු මනොද්වාරයෙහි ගතිනිමිත්ත වශයෙනි.

‡ වර්තමානාලම්බනව ලැබේ යනු මනොද්වාර වශයෙන් ප්‍රතිසන්ධි වන කලැ අතීත භවාඞ්ගාදි ක්‍රමයෙන් තදාලම්බනයාගේ ද චුතිවිඥානයාගේ ද අතර පැවැති භවාඞ්ග සිත් සතර වර්තමානාලම්බන බැව් ද පඤ්චද්වාර වශයෙන් පිළිසිඳීම වන කලැ සතළොස්වන ප්‍රතිසන්ධි විඥානය වර්තමානාලම්බන බැව් ද කියනලද්දේය යනු අභිප්‍රාය යි.

කම්මං පන අතීතමෙව, තඤ්ච මනොද්වාර ගහිතං, තානි පන සබ්බානිපි පරිත්ත ධම්මභූතානෙවාලම්බනානීති වෙදිතබ්බං.

රූපාවචර පටිසන්ධියා පන පඤ්ඤත්තිභූතං කම්මනිමිත්තමෙවාලම්බනං හොති, තථා ආරුප්ප පටිසන්ධියා ච මහග්ගත භූතං පඤ්ඤත්තිභූතඤ්ච කම්මනිමිත්තමෙව යථාරහං ආලම්බනං හොති. අසඤ්ඤසත්තානං පන ජීවිත නවකමෙව පටිසන්ධිභාවෙන පතිට්ඨාති, තස්මා තෙ රූපපටිසන්ධිකා නාම ආරුප්පා ආරුප්පපටිසන්ධිකා සෙසා රූපාරූප පටිසන්ධිකා.

ආරුප්ප චුතියා හොන්ති හෙට්ඨිමාරුප්ප වජ්ජිතා
පරමාරුප්ප සන්ධි ච තථා කාම තිහෙතුකා.

---

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 82 | කර්මය අතීතාදි වශයෙන් කෙසේ ද? | (මෙහානා) කර්මය වනාහි අතීත නම් වේ; හෙද මනොද්වාරයෙන්ම ගන්නා ලද්දේ ය. |
| 83 | කර්මාදීනු පරීත්තාදි කවර ආලම්බනයෝ වෙත් ද? | කර්ම කර්මනිමිත්තාදි සියලු ආලම්බනයෝ පරිත්ත ධර්ම සංඛ්‍යාත කාමාවචර ධර්ම වූවාහු ම ආලම්බනයෝ වෙති. |
| 84 | රූපාවචර ප්‍රතිසන්ධියට කුමක් අරමුණු වේ ද? | රූපාවචර ප්‍රතිසන්ධියට කසිණාදි ප්‍රඥප්ති වූ කර්මනිමිත්ත ම අරමුණු වේ. |
| 85 | අරූපාවචර ප්‍රතිසන්ධියට කුමක් අරමුණු වේ ද? | අරූපාවචර ප්‍රතිසන්ධියට මහද්ගත වූ ද ප්‍රඥප්තිවූ ද කර්මනිමිත්ත ම සුදුසු පරිද්දෙන් අරමුණු වේ. |
| 86 | අසංඥ සත්ත්වයන්ගේ ප්‍රතිසන්ධිය කෙසේ ද? | අසංඥ සත්ත්වයන්ට ජීවිත නවකය ම ප්‍රතිසන්ධි වශයෙන් පිහිටයි. |
| 87 | රූපාරූප ප්‍රතිසන්ධිකයෝ කවරහු ද? | අසංඥසත්ත්වයන් ද අරූපීකයන් ද හැර අවශිෂ්ටයෝ රූපාරූප ප්‍රතිසන්ධිකයෝ වෙති. |
| 88 | අරූපාවචර චුතියෙන් මතු කිනම් ප්‍රතිසන්ධිහු වෙත් ද? | අරූපාවචර චුතියෙන් මත්තෙහි යට අරූපාවචර හැර රූපාවචර ප්‍රතිසන්ධිහු ද කාමභවයෙහි ත්‍රිහෙතුක ප්‍රතිසන්ධිහු ද වෙත්. |
| 89 | රූපාවචර චුතියෙන් මතු කිනම් ප්‍රතිසන්ධිහු වෙත් ද? | රූපාවචර චුතියෙන් මත්තෙහි අහෙතුක ප්‍රතිසන්ධිය හැර ද්විහෙතුක ත්‍රිහෙතුක ප්‍රතිසන්ධිහු වෙත්. |
| 90 | කාමාවචර ත්‍රිහෙතුක චුතියෙන් මතු කිනම් ප්‍රතිසන්ධිහු වෙත් ද? | කාමාවචර ත්‍රිහෙතුක චුතිචිත්තයෙන් මතු කාමරූපාරූප භවයන්ට ඇතුළත් අහෙතුකාදි සියලු ප්‍රතිසන්ධිහු වෙත්. |

රූපාවචර චුතියා අහෙතු රහිතා සියුං
සබ්බා කාම තිහෙතුම්හා කාමෙසෙවව පනෙතරා.

අයමෙත්ථ චුති පටිසන්ධික්කමො.

---

ඉච්චෙවං ගහිත පටිසන්ධිකානං පන පටිසන්ධි නිරොධානන්තරතො පභුති තමෙවාලම්බනමාරබ්භ තදෙව චිත්තං යාව චුතිචිත්තුප්පාදා, අසති වීථිචිත්තුප්පාදෙ භවස්ස අඞ්ගභාවෙන භවඞ්ගසන්තති සඞ්ඛාතං මානසං අබ්බොච්ඡින්නං නදීසොතො විය පවත්තති.

පරියොසානෙ චවන වසෙන චුතිචිත්තං හුත්වා නිරුජ්ඣති, තතො පරඤ්ච පටිසන්ධාදයො රථචක්කමිව යථාක්කමං එව පරිවත්තන්තා පවත්තන්ති.

පටිසන්ධි භවඞ්ග වීථියො චුති චෙහ තථා භවන්තරෙ
පුන සන්ධි භවඞ්ගමිච්චයං පරිවත්තති චිත්ත සන්තති.

---

| | ප්‍රශ්න | උත්තර |
| --- | --- | --- |
| 91 | ද්විහෙතුක අහෙතුක චුතියෙන් මතු කිනම් ප්‍රතිසන්ධිහු වෙත් ද? | ද්විහෙතුක අහෙතුක චුතියෙන් මත්තෙහි කාම භවයෙහි ම ත්‍රිහෙතුකාදි සියලු ප්‍රතිසන්ධිහු වෙත්. |
| 92 | ප්‍රතිසන්ධි චිත්තය ඉපැද නිරුද්ධ වූ ඉක්බිති භවාඞ්ග සන්තතිය කෙසේ පැවැත නිරුද්ධ වේ ද? | ගන්නා ලද ප්‍රතිසන්ධි ඇත්තහුගේ ප්‍රතිසන්ධි සිත නිරුද්ධ වූ ඉක්බිති එතැන් පටන් ප්‍රතිසන්ධි චිත්තයට අරමුණු වූ එම අරමුණ අරභයා අහෙතුකාදි භෙද එම චිත්තය චුතිචිත්තයාගේ ඉපැදීම දක්වා (අතරතුර) වීථි සිත් ඉපැදීමක් නැති කලැ භවයාගේ නොසිඳ පැවැත්මට හෙතු බැවින් භවාඞ්ග සන්තති යයි කියන ලද චිත්තය ගංගාප්‍රවාහයක් මෙන් නොසිඳ පැවැත භවාඞ්ග සන්තතියගේ කෙළවර චුතිවශයෙන් චුතිචිත්තය වී නිරුද්ධ වේ. |
| 93 | චුතිචිත්තයෙන් මතු ප්‍රතිසන්ධ්‍යාදිහු කෙසේ පවතිත් ද? | චුතිචිත්තයෙන් මත්තෙහි ප්‍රතිසන්ධ්‍යාදිහු රථ සක්ක මෙන් යථාක්‍රමයෙන් වට්ටමූලයාගේ සමුච්ඡේදය දක්වා පෙරළෙන්නාහු වැ පවතිත්. |
| 94 | මේ භවයෙහි මෙන් අන් භවයෙහිත් චිත්ත සන්තතිය පෙරළේ ද? | මේ භවයෙහි ප්‍රතිසන්ධි භවාඞ්ග වීථි චුති යන මොහු යම් සේ පෙරළේ ද එසේම නැවත අන්‍ය භවයෙහි ද ප්‍රතිසන්ධි භවාඞ්ගාදි චිත්තසන්තති තොමෝ පරිවර්තනය වේ. |

පටිසඞ්ඛාය පනෙතමද්ධුවං අධිගන්ත්වා පදමච්චුතං බුධා
සුසමුච්ඡින්න සිනෙහ බන්ධනා සම්මෙස්සන්ති චිරාය සුබ්බතා.

ඉති අභිධම්මත්ථ සඞ්ගහෙ වීථිමුත්ත සඞ්ගහ විභාගො නාම

## පඤ්චමො පරිච්ඡෙදො.

එත්තාවතා විභත්තාහි සප්පභෙදප්පවත්තිකා
චිත්ත චෙතසිකා ධම්මා රූපං දානි පවුච්චති.
සමුද්දෙසා විභාගා ච සමුට්ඨානා කලාපතො
පවත්තික්කමතො චෙති පඤ්චධා තත්ථ සඞ්ගහො.
චත්තාරි මහාභූතානි චතුන්නඤ්ච මහාභූතානං උපාදාය

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 95 | චිත්ත ප්‍රවෘත්තිය දැන ප්‍රාඥයෝ කුමක් කෙරෙත් ද? | යථොක්ත චිත්තයාගේ පැවැත්ම වනාහි අස්ථිර යයි ප්‍රාඥයෝ නුවණින් සලකා බොහෝ කලක් යහපත් ව්‍රත ඇතිවැ අමරණීය ස්වභාව වූ නිර්වාණපදය (මාර්ගඵල ඥානයෙන්) දැන මනාව හාත්පසින් සිඳින ලද ස්නෙහ බන්ධන ඇත්තාහු නිරුපධිශෙෂ නිර්වාණ ධාතුවට පැමිණෙත්. |

## පස්වන පරිච්ඡේදය නිමියේ යි.

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 1 | චිත්ත චෛතසික කොපමණකින් දක්වා රූපය කියනු ලැබේ ද? | ප්‍රභෙද ප්‍රවෘත්ති සහිත වූ චිත්ත චෛතසික ධර්ම මෙපමණකින් හෙවත් පරිච්ඡේද පසකින් දක්වා දැන් යථානුප්‍රාප්ත රූපය කියනු ලැබේ. |
| 2 | රූපය කොතෙක් ප්‍රකාරයෙන් සඞ්ග්‍රහයට යේ ද? | සංක්ෂෙපොද්දෙශය, (එකවිධාදි) විභාගය, (කර්මාදි රූප ජනක ප්‍රත්‍යය වූ) සමුට්ඨානය, (චක්ෂුඃ ප්‍රසාදාදි) කලාපය, රූපොත්පත්ති ක්‍රම යයි පස් ප්‍රකාරයකින් සඞ්ග්‍රහයට යේ. |
| 3 | රූපය කොතෙක් ප්‍රකාර ද? | පෘථිවිධාත්වාදි මහාභූත * රූපයෝ සතර දෙන ද සතර මහාභූතයන් නිසා පවත්නා (චක්ෂුරාදි සූවිසි) රූපය දැයි ද්විප්‍රකාර වේ. |

* දෙවාදීන්ගේ හා භූතයන් පමණ අන් බව වශයෙන් මහත් ව පහළ වන හෙයින් ද නොයෙක් අද්භූත වූ වෙනසක් දක්වමින් නොහොත් මහත් අද්භූත දර්ශන [illegible] පවත්නා හෙයින් මායාකාරාදීන් හා සමාන හෙයින් ද මහා ලොකුවූ සණ්ඨානාදි වශයෙන් සත්ත්වයන් වඤ්චා කරන හෙයින් ද මහාභූතයෝ නම් වෙත්. මෙහි කීහ- "මහන්තා පාතුභූතානි මහාභූත සමානි වා, වඤ්චකත්තා අභූතෙන මහාභූතානි සම්මතා".

රූපනන්ති දුවිධමෙපෙතං රූපං එකාදසවිධෙන සඞ්ගහං ගච්ඡති.

කථං, පථවිධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතු භූතරූපං නාම, චක්ඛු සොතං ඝානං ජිව්හා කායො පසාදරූපං නාම.

රූපං සද්දො ගන්ධො රසො ආපොධාතු විවජ්ජිතං භූතත්තය සඞ්ඛාතං ඵොට්ඨබ්බං ගොචරරූපං නාම.

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 4 | ද්විප්‍රකාර රූපය කොතෙක් සඞ්ග්‍රහයට යේ ද? | ද්විප්‍රකාර රූප තෙමේ භූත රූප ය ප්‍රසාද රූප ය ගොචර රූප ය භාව රූප ය හෘදය රූප ය ජීවිත රූප ය ආහාර රූප ය පරිච්ඡේද රූප ය විඥප්ති රූප ය විකාර රූප ය ලක්ෂණ රූප යයි එකොළොස් ප්‍රකාරයකින් සඞ්ග්‍රහයට යේ. |
| 5 | භූත රූප ය යනු කුමක් ද? | ඝනබද්ධ ලක්ෂණ වූ පෘථිවිධාතුව ද ද්‍රව ලක්ෂණ වූ ආපොධාතුව ද උෂ්ණ ලක්ෂණ වූ තෙජොධාතුව ද සමුදීරණ ලක්ෂණ වූ වායොධාතුව ද භූත රූප නම් වේ. |
| 6 | ප්‍රසාද රූපය යනු කුමක් ද? | චක්ෂුඃ ප්‍රසාදය ද ශ්‍රොත්‍ර ප්‍රසාදය ද ඝ්‍රාණ ප්‍රසාදය ද ජිහ්වා ප්‍රසාදය ද කාය ප්‍රසාදය ද (මහාභූතයන්ගේ ප්‍රසන්නත්වයට හෙතු බැවින්) ප්‍රසාද රූප නම් වේ.‡ |
| 7 | ගොචර රූපය යනු කුමක් ද? | රූපායතනය ද ශබ්දායතනය ද ගන්ධායතනය ද රසායතනය ද ආපොධාතුව හැර* භූත ත්‍රය යයි කියන ලද ස්ප්‍රෂ්ටව්‍යායතනය ද ගොචර රූප † නම් වේ. |

‡ "දට්ඨුකාමතා සොතුකාමතා ඝායිතුකාමතා සායිතුකාමතා ඵුසිතුකාමතා නිදාන කම්මසමුට්ඨාන භූතප්පසාද ලක්ඛණං"

* ආපොධාතුව සූක්ෂම බැවින් ස්පර්ශයට අසම්බන්ධ හෙයින් ආපොධාතුව හැර යයි කියන ලදි.

† චක්ෂුර් විඥානාදීන්ට ගොචරත්ව ලක්ෂණ වූ හෙයින් ද චක්ෂුරාදියෙහි ප්‍රතිඝාත ස්වභාව වූ හෙයින් ද ගොචර රූප නම් වේ.

ඉත්ථත්තං පුරිසත්තං භාවරූපං නාම, හදයවත්ථු හදයරූපං නාම, ජීවිතින්ද්‍රියං ජීවිතරූපං නාම, කබලීකාරෝ ආහාරෝ ආහාරරූපං නාම.

ඉති ච අට්ඨාරසවිධම්පෙතං රූපං සභාවරූපං සලක්ඛණරූපං නිප්ඵන්නරූපං රූපරූපං සම්මසනරූපන්ති ච සඞ්ගහං ගච්ඡති.[1-5]

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 8 | භාව රූපය යනු කුමක් ද? | ස්ත්‍රී බව ද ‡ පුරුෂ බව ද භාව රූප නම් වේ. |
| 9 | හෘදය රූපය යනු කුමක් ද? | හෘදය වස්තුව හෘදය රූප නම් වේ.§ |
| 10 | ජීවිත රූපය යනු කුමක් ද? | සහජාත කර්මජ රූප පාලනයෙහි අධිපති බව කරන ජීවිතෙන්ද්‍රිය ය තෙමේ ජීවිත රූප නම් වේ. |
| 11 | ආහාර රූපය යනු කුමක් ද? | කබලීකාරාහාරය ආහාර රූප නම් වේ.* |
| 12 | අවිලොස් වැදෑරුම් වූ රූපය අන් කිසි සඞ්ග්‍රහයකට යේ ද? | අවිලොස් වැදෑරුම් වූ මේ රූපයම [1]ස්වභාව රූපය [2]සලක්ෂණ රූපය [3]නිෂ්පන්න රූපය [4]රූප රූපය [5]සම්මසන රූපය යි සඞ්ග්‍රයට යේ. |

‡ "ඉත්ථිලිඞ්ගනිමිත්තකුත්තාකප්පභෙදභාව ලක්ඛණං ඉත්ථත්තං" ස්ත්‍රීලිඞ්ග නිමිත්ත කෘත්‍ය ආකල්පයන්ට හේතු බව ලක්ෂණ කොට ඇත්තේ ස්ත්‍රී බව නම් වේ. "තත්ථ ඉත්ථීනං අඞ්ගජාතං ඉත්ථිලිඞ්ගං සරාධිප්පායො ඉත්ථියා නිමිත්තං ඉත්ථිසඤ්ජානනස්ස පච්චයභාවතො අවිසද ඨාන ගමන නිසජ්ජාදීනි ඉත්ථිකුත්තං ඉත්ථිසණ්ඨානං ඉත්ථාකප්පො" මෙසේ ස්ත්‍රීන්ගේ රහසඟ ස්ත්‍රීලිඞ්ග නම් වේ. ස්වරාති ප්‍රාය යනු මොහු ස්ත්‍රී නිමිත්ත නාම වේ. මේ ස්ත්‍රී යයි දැන්මට කාරණ වන බැවිනි. අවිසද වූ සිටීම් යෑම් හිඳීම් ආදිය ස්ත්‍රී කෘත්‍ය නම් වේ. ස්ත්‍රී යන සටහන ස්ත්‍රී කල්ප නම් වේ. පුරුෂලිඞ්ගාදිහු ද මෙසේ යි. අභිධානප්පදීපිකාවෙහි විභාගී අන් පරිද්දෙකින් වර්ණනා කරන ලදී. එහි මෙසේ යි: "ලිඞ්ගං තසණ්ඨානසණ්ඨානං නිමිත්තං මිහිතාදිකං කුත්තං තු සුප්පාදිනා කීළා ආකප්පො ගමනාදිකා."

§ යම් හෘදය වස්තුවක් ඇසුරු කොට මනොධාතු මනොවිඤ්ඤාණ ධාතු දෙවස ය පඤ්චවොකාර භවයෙහි පවතී ද ඒය හෘදය වස්තු යයි කියනු ලැබේ. "යං නිස්සාය මනොධාතු මනොවිඤ්ඤාණධාතු ච වත්තන්ති පඤ්චවොකාරෙ භවෙ වත්ථූති වුච්චති" හෘදය කෝෂාභ්‍යන්තරයෙහි අඩ පතක් පමණ ලෙයෙහි භූතරූපයන් නිසා චක්ෂුර් ද්‍රව්‍යාදීන්ට චක්ෂුරාදීහු මෙන් දෙධාතු ද්‍රව්‍යයට විස්ත භාවිය කාධිමින් පවතී. මෙම කීහ: "මජ්ඣෙ හදයකොසස්මිං අඩ්ඪපසත ලොහිතෙ, භූතරූපම්පාදාය වත්ථාදි විය වත්තති."

* "යාය ඔජාය යාපෙන්ති සබ්බෙ සත්තා ච පාණිනො, අයං හි කබලීකාරො ආහාරොති පවුච්චති". අභිධම්මත්ථ විභාවිනී.

1 සකසකලක්ඛණාදිනා අත්තනො අත්තනො සභාවෙන උපලබ්භනතො සභාවරූපං නාම.

2 උප්පාදාදීහි අනිච්චතාදීහි වා ලක්ඛණෙහි සහිතත්තා සලක්ඛණං.

3 පරිච්ඡේදාදි භාවං විනා අත්තනො සභාවෙන කම්මාදීහි පච්චයෙහි නිප්ඵන්නත්තා නිප්ඵන්නරූපං

4 රුප්පන සභාවො රූපං එතෙන යුත්තත්තා රූපරූපං.

5 පරිච්ඡේදාදි භාවං අතික්කමිත්වා සභාවෙනෙව උපලබ්භනතො ලක්ඛණත්තයං රොපෙත්වා සම්මසිතුං අරහත්තා සම්මසනරූපං

13-2

ආකාසධාතු පරිච්ඡෙදරූපං නාම, කායවිඤ්ඤත්ති වචීවිඤ්ඤත්ති විඤ්ඤත්තිරූපං නාම, රූපස්ස ලහුතා මුදුතා කම්මඤ්ඤතා විඤ්ඤත්තිද්වයං විකාරරූපං නාම, රූපස්ස උපචයො සන්තති ජරතා අනිච්චතා ලක්ඛණරූපං නාම, ජාතිරූපමෙව පනෙත්ථ උපචය සන්තති නාමෙන පවුච්චති, එකාදසවිධම්පෙතං රූපං අට්ඨවීසති විධං හොති සරූප වසෙන කථං,

---

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 13 | පරිච්ඡේද රූපය යනු කුමක් ද? | (චක්ඛු දසකාදි කලාපගත රූපයන් මිශ්‍ර නොවන මෙන් පිරිසිඳින ස්වභාව වූ) ආකාශ ධාතුව පරිච්ඡේද රූප යයි. |
| 14 | විඥප්ති රූපය යනු කුමක් ද? | (කයින් වචනයෙන් අභිප්‍රාය ඇඟවීම යයි කියන ලද) කායවිඥප්ති වාග්විඥප්ති ද්වය ය විඥප්ති රූප යයි. |
| 15 | විකාර රූපය යනු කුමක් ද? | රූපයාගේ ලඝු බව ද මෘදු බව ද කම්යට යෝග්‍ය බව ද විඥප්ති ද්වය ය ද (ලඝුතාදීන්ගේ ද චිත්තජ වායු පඨවි ධාතුන්ගේ ද විකාරයක් හෙයින්) විකාර රූප යයි. |
| 16 | ලක්ෂණ රූපය යනු කුමක් ද? | (ප්‍රථමොත්පත්ති වශයෙන් අභිවෘද්ධි සංඛ්‍යාත) උපචය ද (උපචිත රූපයන්ගේ ප්‍රබන්ධොත්පත්ති වශයෙන්) පැවැත්ම සංඛ්‍යාත සන්තතිය ද* (රූපොත්පාදයන්ගේ නිරොධාභිමුඛ වශයෙන් වූ) ජරතාව ද (පරිභෙදන ස්වභාව වූ) අනිත්‍යතාව ද ලක්ෂණ රූප නම් වේ. |
| 17 | ජාති රූපය කුමකින් කියනු ලැබේ ද? | උපචය සන්තති නමින් ජාති රූපය ම කියනු ලැබේ.‡ |

---

* පටිසන්ධිතො පට්ඨාය යාව චක්ඛු දසකානං උප්පත්ති එත්ථන්තරෙ උප්පාදො උපචයො නාම තතො පරං සන්තති නාම.

‡ රූපානමාචයො යොයි වුත්තො උපචයොති සො
අනුප්පබන්ධතො චෙසං සන්තතීති පවුච්චති;

අත්ථතො උභයම්පෙතං ජාතිරූපන්ති දීපිතො
වුත්තනමාකාර නානත්තා වෙනෙය්‍යානං වසෙනවා.

භූතප්පසාද විසයා භාවො හදයමිච්චපි
ජීවිතාහාර රූපෙහි අට්ඨාරස විධං තථා.
පරිච්ඡෙදො ච විඤ්ඤත්ති විකාරො ලක්ඛණන්ති ච
අනිප්ඵන්නා දසචෙති අට්ඨවීස විධං භවෙ.
අයමෙත්ථ රූප සමුද්දෙසො

---

සබ්බඤ්ච පනෙතං රූපං අහෙතුකං සප්පච්චයං සාසවං සඞ්ඛතං ලොකියං කාමාවචරං අනාරම්මණං අප්පහාතබ්බමෙවාති එකවිධම්පි අජ්ඣත්තික බාහිරාදි වසෙන බහුධා භෙදං ගච්ඡති.

කථං පසාද සඞ්ඛාතං පඤ්චවිධම්පි අජ්ඣත්තික රූපං නාම ඉතරං බාහිර රූපං.

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 18 | එකාදසවිධ වූ රූපය ස්වරූප වශයෙන් කොපමණ ප්‍රකාර ද? | (මහාභූත රූප සතරය ප්‍රසාදරූප පසය රූපශබ්දාදි විෂය රූප සතරය භාව රූප දෙකය හෘදයරූපය ජීවිතරූපය ආහාරරූපය යන මෙහි රූප) ස්වරූප වශයෙන් අටළොස් ප්‍රකාර වේ. (පරිච්ඡේදරූපය විඥප්තිරූප දෙකය විකාරරූප තුනය ලක්ෂණරූප සතරය යන මේ අනිෂ්පන්නරූප දශය* දෑයි (අටළොස් රූපය සමඟ) විසිඅට් වැදෑරුම් වේ. |
| 19 | රූපයාගේ එකවිධ නය කෙසේ ද? | මේ සියලු රූපය වනාහි (ලොභාදි හෙතු රහිත හෙයින්) අහෙතුකය, (කර්මාදි ප්‍රත්‍යයන් ගා පවත්නා හෙයින්) සප්‍රත්‍යය, (කාමාදි ආස්‍රව සහිත බැවින්) සාසවය, ප්‍රත්‍යයන් විසින් කරනලද හෙයින්) සඞ්ඛතය, (උපාදානස්කන්ධ සඞ්ඛ්‍යාත ලොකයෙහි නියුක්ත හෙයින්) ලොකිය ය, (කාම තෘෂ්ණාවට විෂය හෙයින්) කාමාවචරය, (අරමුණු නො ගන්නා හෙයින්) අනාරම්මණය, ක්ලේශයන් මෙන් දුරු නො කටයුතු හෙයින් අප්‍රහාතව්‍ය යයි මේ උක්ත ප්‍රකාරයෙන් එකවිධ වේ. |
| 20 | එකවිධ රූපය කොපමණ භෙද වේ ද? | එකවිධ වූ රූපය ආධ්‍යාත්මික බාහිරාදි වශයෙන් බොහෝ භෙදයට පැමිණේ. |
| 21 | ආධ්‍යාත්මික බාහිර රූපය යනු කුමක් ද? | ප්‍රසාද සඞ්ඛ්‍යාත චක්ෂුරාදි පඤ්චවිධ රූපය ආධ්‍යාත්මිකරූප නම් වේ; ඉතර තෙවිසි රූපය (ඔවුන්ගෙන් පිටත් හෙයින්) බාහිරරූප නම් වේ. |

* නිෂ්පන්න රූපයන්ගේ පරිච්ඡේද විකාරාදි ස්වභාවයන් විනා වෙන වෙනම ප්‍රත්‍යයන් විසින් අනිෂ්පන්න හෙයින් මේ දශය අනිෂ්පන්න රූප යයි කියනු ලදී.

පසාද හදය සඞ්ඛාතං ඡබ්බිධම්පි වත්ථුරූපං නාම ඉතරං අවත්ථුරූපං, පසාද විඤ්ඤත්ති සඞ්ඛාතං සත්තවිධම්පි ද්වාරරූපං නාම ඉතරං අද්වාරරූපං, පසාදභාව ජීවිතසඞ්ඛාතං අට්ඨවිධම්පි ඉන්ද්‍රිය රූපං නාම ඉතරං අනින්ද්‍රියරූපං, පසාදවිසය සඞ්ඛාතං ද්වාදසවිධම්පි ඔළාරිකරූපං සන්තිකෙරූපං සප්පටිඝරූපඤ්ච ඉතරං සුඛුමරූපං දූරෙරූපං අප්පටිඝරූපඤ්ච,

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 22 | වස්තුරූප අවස්තුරූප යනු කුමක් ද? | චක්ෂුරාදි පඤ්ච ප්‍රසාදය හා හෘදය වස්තු සඞ්ඛ්‍යාත ෂඩ්විධ වූ රූපය (සප්ත විඥානයන්ට නිශ්‍රය හෙයින්) වස්තුරූප නම් වේ. අවශෙෂ වූ තෙවිසි රූපය අවස්තු රූප යි. |
| 23 | ද්වාරරූප අද්වාරරූප යනු කුමක් ද? | පඤ්ච ප්‍රසාදය හා විඥප්ති ද්වය සඞ්ඛ්‍යාත සප්ත ප්‍රකාර වූ රූපය ද්වාර රූපය * වේ. අවශෙෂ වූ දෙවිසි රූපය අද්වාරරූප යි. |
| 24 | ඉන්ද්‍රියරූප අනින්ද්‍රිය රූප යනු කුමක් ද? | පඤ්ච ප්‍රසාදරූප භාවරූප ද්වය හා ජීවිතින්ද්‍රියයයි කියන ලද අෂ්ට ප්‍රකාර වූ රූපය ඉන්ද්‍රියරූප † නම් වේ. අවශෙෂ විංශති රූපය අනින්ද්‍රිය රූප යි. |
| 25 | ඖළාරිකාදි රූපයන්ගේ විශෙෂ කෙසේ ද? | පඤ්චප්‍රසාද රූපයද විෂය සඞ්ඛ්‍යාත රූප ශබ්ද ගන්ධ රස හා ස්පෘෂ්ටව්‍ය වූ භූතරූප ත්‍රය ය ද යන දොළොස් වැදෑරුම් වූ රූපය ඖළාරිකරූප ‡ නමුදු ආසන්නරූප § නමුදු [1] සප්‍රතිඝරූප නමුදු වේ; ඉතිරි සොළොස් රූපය සූක්ෂමරූප දූරෙරූප අප්‍රතිඝරූප නමුදු වේ. |

* චක්ෂුර් විඥානාදි පඤ්චවිඥානයන්ගේ ද කායවාක්කර්මයන්ගේ ද පැවැත්මට ද්වාර හෙයින් ද්වාරරූප නම් වේ.

† දර්ශනාදි ඉන්ද්‍රිය පඤ්චකයෙහි ද ස්ත්‍රී පුරුෂාදි සාමීජ රූපයෙහි ද ආධිපත්‍යය කරන හෙයින් ඉන්ද්‍රියරූප නම් වේ.

‡ "විසය විසයී භාවාපත්ති වසෙන ථූලත්තා ඔළාරිකරූපං" විෂය විෂයී භාව ප්‍රවෘත්ති වශයෙන් ස්ථූල හෙයින් ඖළාරිකරූප නම් වේ.

§ "තතො එව ගහණස්ස සුකරත්තා සන්තිකෙ රූපං" ඖළාරික හෙයින් ම විෂය ග්‍රහණයට සුකර බැවින් ආසන්නරූප නම් වේ.

1 "චක්ඛාදාරම්මණානං අඤ්ඤමඤ්ඤං පටිඝට්ටනං පටිඝො, තෙන සහ වත්තන්තීති සප්පටිඝං"—චක්ෂු ආරම්මණයන්ගේ අන්‍යොන්‍ය ප්‍රතිඝට්ටනය හෙවත් ඔවුනොවුන් ප්‍රතිවිරුද්ධව ගැටීම ප්‍රතිඝ වේ. ප්‍රතිඝට්ටනය සමඟ පැවැති හෙයින් සප්‍රතිඝ රූප යි.

කම්මජං උපාදින්නරූපං ඉතරං අනුපාදින්නරූපං, රූපායතනං සනිදස්සනරූපං ඉතරං අනිදස්සනරූපං, චක්ඛාදිද්වයං අසම්පත්ත වසෙන, ඝානාදිත්තයං සම්පත්ත වසෙනාති පඤ්චවිධම්පි ගොචරග්ගාහික රූපං ඉතරං අගොචරග්ගාහික රූපං෴ වණ්ණො ගන්ධො රසො ඔජාභූත චතුක්කඤ්චෙති අට්ඨවිධම්පි අවිනිබ්භොගරූපං, ඉතරං විනිබ්භොගරූපං෴

ඉච්චෙවමට්ඨවීසති විධම්පි ච විචක්ඛණා
අජ්ඣත්තිකාදි භෙදෙන විභජන්ති යථාරහං෴
අයමෙත්ථ රූප විභාගො

---

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 26 | උපාදින්න අනුපාදින්න යනු කුමක් ද? | කර්මයෙන් ජනිත වූ අෂ්ටාදශවිධ රූපය [1]උපාදින්නරූප වේ; අවශේෂ දශවිධ රූපය අනුපාදින්න රූප යි. |
| 27 | සනිදස්සන රූප අනිදස්සන රූප යනු කුමක් ද? | (නීල පීතාදි වර්ණ සංඛ්‍යාත) රූපායතනය දක්නා යුතු බව යයි කියන ලද නිදර්ශන රූපය සමග පැවැති හෙයින් සනිදස්සන රූපය වේ; සෙස්ස අනිදස්සන රූප යි. |
| 28 | ගොචර ග්‍රාහික අගොචර ග්‍රාහික රූප යනු කුමක් ද? | චක්ෂුඃ ශ්‍රොත්‍ර ද්වය ය අසම්ප්‍රාප්ත (ගොචර) වශයෙන් ද ඝ්‍රාණාදි ත්‍රය ය සම්ප්‍රාප්ත (ගොචර) වශයෙන් දැයි* පස් වැදෑරුම් වූ රූපය ගොචර ග්‍රාහික රූපය වේ;† ඉතිරි තෙවිස්ස අගොචර ග්‍රාහික රූප යි. |
| 29 | අවිනිර්භොග රූප විනිර්භොග රූප යනු කුමක් ද? | වර්ණ ගන්ධ රස ඕජා යන සතර ද පෘථිවිධාත්වාදි භූත චතුෂ්කය ද යන අට වැදෑරුම් වූ රූපය අවිනිර්භොග රූප නම් වේ.‡ අවශේෂ විංශති රූපය විනිර්භොග රූප යි. |
| 30 | රූපය කවර කොතෙක් විභජනය කෙරෙත් ද? | අටවිසි වැදෑරුම් වූ මේ රූපය අධ්‍යාත්මිකාදි භේදයෙන් යථානුරූපව ප්‍රාඥයෝ විභජනය කෙරෙත්. |

---

1 'තණ්හා දිට්ඨීහි උපෙතෙන කම්මුනා අත්තනො ඵලභාවෙන ආදින්නත්තා ගහිතත්තා උපාදින්නරූපං'.

* චක්ෂුඃ ශ්‍රොත්‍ර දෙදෙනා තම තමන් සිටි තැන්හි ම සිට රූප ශබ්ද දෙදෙනා ගන්නා හෙයින් අසම්ප්‍රාප්ත වශයෙන් ද ඝ්‍රාණාදි ත්‍රය ය ගන්ධ රස ස්පර්ශයන් තම තමන් කරා එළැඹි කල්හි ම ගන්නා හෙයින් සම්ප්‍රාප්ත වශයෙන් දැයි කියන ලදී.

† තම විෂයය ලබා ගොචරය ගන්නාහු යි 'ගොචරග්‍රාහික රූප' යි.

‡ ඔවුනොවුන් වෙන් විය නොහැකි හෙයින් 'අවිනිර්භොග රූප' යි.

කම්මං චිත්තං උතු ආහාරොචෙති චත්තාරි රූපසමුට්ඨානානි නාම, තත්ථ කාමාවචරං රූපාවචරඤ්චෙති පඤ්චවීසති විධම්පි කුසලාකුසල කම්ම මභිසඞ්ඛතං අජ්ඣත්තික සන්තානෙ කම්මසමුට්ඨාන රූපං පටිසන්ධිමුපාදාය ඛණෙ ඛණෙ සමුට්ඨාපෙති.

අරූපවිපාක ද්විපඤ්චවිඤ්ඤාණ වජ්ජිතං පඤ්චසත්තතිවිධම්පි චිත්තං චිත්තසමුට්ඨාන රූපං පඨම භවඞ්ගමුපාදාය ජායන්තමෙව සමුට්ඨාපෙති.

තත්ථ අප්පනා ජවනං ඉරියාපථම්පි සන්නාමෙති, වොට්ඨපන කාමාවචර ජවනාභිඤ්ඤා පන විඤ්ඤත්තිම්පි සමුට්ඨාපෙන්ති,

---

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 31 | රූපය කවරනු උපදවත් ද? | (අතීත) කර්මය ද,(උපදිනු ලබන)සිත ද, (ශීතොෂ්ණ සංඛ්‍යාත) ඍතුව ද, අහාරය ද යන සතර දෙන රූපය උපදවත්. |
| 32 | කර්මය කෙසේ රූප උපදවා ද? | කාමාවචර කුසල් අට ය අකුසල් දොළොස ය රූපාවචර කුසල් පස ය යන පස්විසි වැදෑරුම් වූ කුශලාකුශල කර්මය අතීත භවයෙහි රැස් කරන ලදුව ආධ්‍යාත්මික සන්තානයෙහි කම්මසමුට්ඨාන රූපය ප්‍රතිසන්ධි චිත්තයාගේ උත්පාද ක්ෂණයෙහි පටන් ක්ෂණ ක්ෂණයෙහි උපදව යි. |
| 33 | කොතෙක් ප්‍රකාර වූ චිත්තය තෙමේ කවර සිතක පටන් කුමන ක්ෂණයෙක්හි චිත්ත සමුට්ඨාන රූපය උපද වා ද? | අරූපාවචර විපාක සතරය ද්විපඤ්ච විඤ්ඤාණය යන තුදුස් සිත් හැර ඉතිරි කුශලාකුශල විපාක ක්‍රියා භෙද පන්සැත්තෑ ප්‍රකාර චිත්තය තෙමේ (ශුද්ධාෂ්ටක ශබ්ද නවකාදි භෙද) චිත්තසමුට්ඨානරූපය ප්‍රතිසන්ධි චිත්ත යට අනතුරු වූ ප්‍රථම භවාඞ්ග චිත්ත යෙහි පටන් උත්පාද ක්ෂණයෙහිම* උපදවයි. |
| 34 | කුමන සිතකින් ඊර්යා පථය පවත්වා ද? | මහද්ගත ලොකොත්තර භෙද අර්පණා ජවන චිත්තය තෙමේ (ස්ථාන නිෂද්‍යාදි වූ) ඊර්යාපථය ද පවත්ව යි. |

---

* චිත්තය තමාගේ උත්පාද ක්ෂණයෙහි ම රූප උපදවන ශක්තිය ඇති බව ත් ස්ථිති භඞ්ග ක්ෂණ දෙකෙහි රූප උපදවන ශක්තිය නැති හෙයින් උත්පාද ක්ෂණයෙහි ම යයි කියන ලදි.

සොමනස්ස ජවනානි පන තෙරස හසනම්පි ජනෙන්ති, සීතුණ්හොතු සමඤ්ඤාතා තෙජොධාතු ඨිතිප්පත්තාව උතුසමුට්ඨාන රූපං අජ්ඣත්තඤ්ච බහිද්ධා ච යථාරහං සමුට්ඨාපෙති.

ඔජාසඞ්ඛාතො ආහාරො ආහාර සමුට්ඨාන රූපං අජ්ඣොහරණ කාලෙ ඨානප්පත්තොව සමුට්ඨාපෙති. තත්ථ හදය ඉන්ද්‍රිය රූපානි කම්මජානෙව,

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 35 | කවර සිත්හු කාය වාග් විඥප්තිය උපදවත් ද? | ව්‍යවස්ථාපන චිත්තය ද, එකුන්තිස් කාමාවචර ජවන් සිත් ද, කුශල ක්‍රියා වශයෙන් අභිඥා සිත් ද යන මේ සිත්හු කාය වාග්විඥප්තිය ද උපදවත්. |
| 36 | කොතෙක් සිත්හු සිනා උපදවත් ද? | (කාමාවචර) සොම්නස් සහගත කුසල් ජවන් සතර ද, එසේ ම අකුසල් ජවන් සතර ද, සොම්නස් සහගත ක්‍රියා ජවන් පස ද යන මෙතෙක් සිත්හු සිනා උපදවත්.* |
| 37 | ඍතු තොමෝ කෙසේ රූප උපදවා ද? | සීතඍතු උෂ්ණඍතු යයි කියන ලද තෙජෝධාතු තොමෝ ස්ථිතියට පැමිණියේ ම ඍතුසමුට්ඨාන රූපය (ඉන්ද්‍රිය බද්ධ) සන්තානයෙහි ද, අනින්ද්‍රිය බද්ධ වූ පෘථිවි පර්වත විමානාදි පිටත්හි ද සුදුසු පරිද්දෙන් උපදවයි. |
| 38 | ආහාරය කවර කාලෙක රූප උපදවා ද? | ඕජා සඞ්ඛ්‍යාත ආහාරය තෙමේ (ශුද්ධාෂ්ටකාදි භේද) ආහාර සමුට්ඨාන රූපය අනුභව කරන කලැ (කර්මජ රූප නිසා) ස්ථිතිප්‍රාප්ත වූයේ ම උපදවයි. |
| 39 | කර්මජ රූප කවරහු වෙත් ද? | හෘදයරූප ඉන්ද්‍රියරූප යන මොහු (කර්මයෙන් උපන් හෙයින්) කර්මජ රූපයෝ වෙති. |

* පෘථග්ජනයෝ කුසල් අකුසල් සිත් අටින් ද ශෛක්ෂයෝ දෘෂ්ටිගත දෙකින් හැර සෙසු සිත් සයෙන් ද රහත්හු ක්‍රියා සිත් පසින් ද සිනා සෙති. බුදුහු [illegible] සොභනයුත ක්‍රියා සිත් සතරින් ඥානවිප්‍රයුක්ත ක්‍රියා දෙ සිත බුදුවරයනට නොව වන්නාහු නාම ක්‍රියා සතරකින් බුදුවරයෝ සෙත් යයි ටීකාවයෙහි ආ වචනය පරීක්ෂා කාට යුතු.

උපෙක්ෂා සහගත ඥානසම්ප්‍රයුක්ත ක්‍රියා දෙ සිතෙන් බුදුවරයෝ සිනාපහළ කොරත් නම් පෘථග්ජනාදීනට ද උපෙක්ෂා සහගත කුශලා කුශලයන්ගෙන් සිනා පහළ වටනැයි යන අර්ථය ලැබේ.

14-1

විඤ්ඤත්තිද්වයං චිත්තජමෙව, සද්දො චිත්තොතුජො, ලහුතාදිත්තයං උතුචිත්තාහාරෙහි සම්භොති, අවිනිබ්භොග රූපානි චෙව ආකාස ධාතු ච චතූහි සම්භූතානි, ලක්ඛණ රූපානි න කුතොචි ජායන්ති.

අට්ඨාරස පණ්ණරස තෙරස ද්වාදසා තිච
කම්මචිත්තොතුකාහාරජානි හොන්ති යථාක්කමං
ජායමානාදි රූපානං සභාවත්තාහි කෙවලං
ලක්ඛණානි නජායන්ති කෙහිචීති පකාසිතං

අයමෙත්ථ රූපසමුට්ඨාන නයො.

---

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 40 | කුමක් චිත්තජ රූපයෝ වෙත් ද? | (චිත්තජ වායු ප්‍රවෘත්තීන්ගේ විකාරයක් හෙයින්) කාය වාග්විඥප්ති දෙක චිත්තජ රූපයෝ වෙත්. |
| 41 | ශබ්දය කුමකින් උපදනේ වේ ද? | (සවිඥානක අවිඥානක භේද) ශබ්දය තෙම (චිත්ත ඍතු දෙකින් උපදනා හෙයින්) චිත්තෝතුජ නම් වේ. |
| 42 | ලහුතාදි ත්‍රය ය කුමකින් වේ ද? | (ලහුතා මුදුතා කම්මඤ්ඤතා යන තුන) ඍතු චිත්ත ආහාර යන තුනෙන් වේ. |
| 43 | කර්මජාදි සතරින් කුමන රූපයෝ වෙත් ද? | අවිනිර්භෝග රූපය ද ආකාසධාතු සඞ්ඛ්‍යාත පරිච්ඡේද රූපය ද යන මොහු කර්මාදි සතර දෙනාගෙන් වෙත්. |
| 44 | ලක්ෂණ රූපයෝ කුමකින් උපදිත් ද? | (උපචය සන්තති ජරතා අනිච්චතා සඞ්ඛ්‍යාත වූ)ලක්ෂණ රූපයෝ කර්මාදි කිසිවකින් නූපදිත්. |
| 45 | කර්ම චිත්ත ඍතු ආහාර යන සතරින් කොතෙක් කොතෙක් රූප උපදිත් ද? | කර්මජරූප නවය* කර්මාදි සතරින් වූ ශුද්ධාෂ්ටකය ආකාසධාතුය යන අටළොස කර්මයෙන් ද, පඤ්ච විකාර රූපය ශබ්දය ශුද්ධාෂ්ටකය පරිච්ඡේද රූපය යන පසළොස චිත්තයෙන් ද, ශබ්දය ලහුතාදි තුනය ශුද්ධාෂ්ටකය පරිච්ඡේද රූපය යන තෙළෙස ඍතුවෙන් ද, ලහුතාදි තුනය ශුද්ධාෂ්ටකය පරිච්ඡේද රූපය යන දොළොස ආහාරයෙන් ද උපදිත්. |
| 46 | ලක්ෂණ රූපයෝ කිසිවකින් උපදනාහු ද? | උපදිනු ලැබීමාදිය රූපස්වභාවයක් වූයේ ද හුදෙක් ලක්ෂණ රූපයෝ කිසිවකින් නූපදිත් යයි ප්‍රකාශ කරන ලදී. |

---

* චක්ඛුන්ද්‍රිය ශ්‍රෝත්‍රේන්ද්‍රිය ඝ්‍රාණේන්ද්‍රිය ජිව්හේන්ද්‍රිය කායේන්ද්‍රිය ස්ත්‍රීන්ද්‍රිය පුරුෂේන්ද්‍රිය ජීවිතේන්ද්‍රිය යන ඉන්ද්‍රිය රූප අට ද හෘදය රූපය ද යන නවය කර්මජ රූප යි.

ඒකුප්පාදා, ඒකනිරොධා ඒකනිස්සයා සහ වුත්තිනො ඒකවීසති රූපකලාපා නාම, තත්ථ ජීවිතං අවිනිබ්භොග රූපඤ්ච චක්ඛුනා සහ චක්ඛුදසකන්ති පවුච්චති, තථා සොතාදීහි සද්ධිං සොතදසකං ඝානදසකං ජිව්හාදසකං කායදසකං ඉත්ථිභාවදසකං පුම්භාව දසකං වත්ථුදසකඤ්චෙති යථාක්කමං යොජෙතබ්බං, අවිනිබ්භොග රූපමෙව ජීවිතෙන සහ ජීවිත නවකන්ති පවුච්චති, ඉමෙ නව කම්ම සමුට්ඨාන කලාපා.......අවිනිබ්භොගරූපං පන සුද්ධට්ඨකං තදෙව කාය විඤ්ඤත්තියා සහ කායවිඤ්ඤත්ති නවකං වචීවිඤ්ඤත්ති සද්දෙහි ච සහ වචීවිඤ්ඤත්ති දසකං ලහුතාදීහි සද්ධිං ලහුතාදෙකා දසකං, කායවිඤ්ඤත්ති ලහුතාදි ද්වාදසකං, වචීවිඤ්ඤත්ති සද්දලහු තාදි තෙරසකඤ්චෙති ඡ චිත්තසමුට්ඨාන කලාපා.......

| ප්‍රශ්න | උත්තර |
| --- | --- |
| 47 රූප කලාප කොතෙක් ද? | (එක්ව ඉපැදීම්* නිරුද්ධවීම් වශයෙන් එක් නිශ්‍රයක් පැවැත්මක් ඇති රූප කලාප) එක්විස්සෙකි. |
| 48 චක්ෂුර්දශක යනු කුමක් ද? | ජීවිතෙන්ද්‍රිය යද ශුද්ධාෂ්ටකය ද චක්ෂුඃ ප්‍රසාදය සමග චක්ෂුර් දශක යයි.‡ |
| 49 දශක කොතෙක් ද? | (චක්ඛු දසක ය සොත දසක ය ඝාන දසක ය ජිව්හා දසක ය කාය දසක ය ඉත්ථිභාව දසක ය පුම්භාව දසක ය වත්ථු දසක යයි) දසක අටෙකි. |
| 50 ජීවිත නවක යනු කුමක් ද? | අවිනිබ්භොග රූපයම ජීවිතෙන්ද්‍රිය ය සමග ජීවිත නවක යයි කියන ලදී. |
| 51 කම්ම සමුට්ඨාන කලාප කොතෙක් ද? | (චක්ෂුර්දශකාදි අට ය ජීවිත නවක ය යන) කම්මසමුට්ඨාන කලාප නව යෙකි. |
| 52 චිත්ත සමුට්ඨාන කලාප කොතෙක් ද? | (අවිනිබ්භොග රූප යයි කියන ලද ශුද්ධාෂ්ටක ය එම§ කායවිඥප්තිය හා කායවිඥප්ති නවකය වාග්විඥප්ති ශබ්දයන් සමග වාග්විඥප්ති දශකය ලඝුතාදි තුන සමග ලඝුතාදෙකාදස කය කායවිඥප්ති ලඝුතාදි ද්වාදසක ය වාග්විඥප්ති ශබ්දලඝුතාදි ත්‍රයොදශකය දැයි) චිත්තසමුට්ඨාන කලාප සයෙකි. |

* සාමීප්‍යයෙන් උපන් රූප එකී එකී සමුට්ඨානයන් හොට ඒ ක්‍ෂණ වශයෙන් උපදිනා හෙයින් එක්ව ඉපදීමාදිය කියන ලදී.

‡ චක්ෂුර් දශකය මෙන් සෙසු ශ්‍රොත්‍රාදි දශකය ද යෙදිය යුතු.

§ 'එම' යනු ශුද්ධාෂ්ටක යි මෙය හැම කලාපයෙහි ම යොදනු.

සුද්ධට්ඨකං සද්දනවකං ලහුතාදෙකාදසකං සද්දලහුතාදිද්වාදසකඤ්චෙති චත්තාරො උතුසමුට්ඨාන කලාපා෴

සුද්ධට්ඨකං ලහුතාදෙකාදසකඤ්චෙති ද්වෙ ආහාර සමුට්ඨාන කලාපා෴ තත්ථ සුද්ධට්ඨකං සද්දනවකඤ්චෙති ද්වෙ උතුසමුට්ඨාන කලාපා බහිද්ධාපි ලබ්භන්ති෴ අවසෙසා පන සබ්බෙපි අජ්ඣත්තිකමෙව෴

කම්මචිත්තොතුකාහාර සමුට්ඨානා යථාක්කමං
නව ඡ චතුරො ද්වෙති කලාපා එකවීසති෴
කලාපානං පරිච්ඡෙද ලක්ඛණත්තා විචක්ඛණා
න කලාපඞ්ගමිච්චාහු ආකාසං ලක්ඛණානි ච෴

අයමෙත්ථ කලාප යොජනා.

---

සබ්බානි පනෙතානි රූපානි කාමලොකෙ යථාරහං අනූනානි පවත්තියං උපලබ්භන්ති,

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 53 | උතුජ කලාප කෙතෙක් ද? | (ශුද්ධාෂ්ටක ය, ශබ්දනවක ය, ශුද්ධාෂ්ටකය හා ලහුතා මෘදුතා කම්මඤ්ඤතා ගුණ ය යන එකොළොස ය, ශුද්ධාෂ්ටකාදි එකොළොස සමග ශබ්දය හා දොළොස දැයි) උතුජ කලාප සතරෙකි. |
| 54 | ආහාරජ කලාප කෙතෙක් ද? | (ශුද්ධාෂ්ටක ය, ලහුතාදි එකාදසකය දැයි) ආහාරජ කලාප දෙකෙකි. |
| 55 | පිටත් තන්හිදු කලාප ලැබේ ද? | (පිටත් තන්හි ද ශුද්ධාෂ්ටක ය ශබ්ද නවකය යන) කලාප ද්වයයෙක් ලැබේ. |
| 56 | ආධ්‍යාත්මික කලාප කෙතෙක් ද? | බාහිර කලාප ද්වය ය හැර සියලු (එකුන්විසි)කලාප ආධ්‍යාත්මික වෙත්. |
| 57 | කර්මාදියෙන් වූ එකී නෙක කලාප කෙතෙක් කෙතෙක් ද? | (කර්මජ කලාප නවයෙක, චිත්තජ කලාප සයෙක, උතුජ කලාප සතරෙක, ආහාරජ කලාප දෙකෙකැ යි) කලාප එක් විස්සෙකි. |
| 58 | පරිච්ඡෙද රූපය හා ලක්ෂණ රූපයෝ කලාප සඞ්ඛ්‍යාවට නො යෙත් ද? | ශුද්ධාෂ්ටකාදි කලාප පිරිසිඳිනා හෙයින් ද ඔවුන්ගේ ලක්ෂණභාවයෙන් ද පරිච්ඡෙද රූප හා ලක්ෂණ රූප ප්‍රාඥයෝ කලාප සඞ්ඛ්‍යාවට නො ගනිත්. |
| 59 | සියලු රූප කොතැන්හි ලැබෙත් ද? | සියලු මේ රූපයෝ සුදුසු පරිද්දෙන් පරිපූර්ණ වූවාහු ප්‍රවෘත්ති කාලැ කාම ලොකයෙහි ලැබෙත්. |

පටිසන්ධියම්පන සංසේදජානඤ්චේව ඔපපාතිකානඤ්ච චක්ඛු සෝත ඝාන ජිව්හා කාය භාව වත්ථු දසක සඞ්ඛාතානි සත්ත දසකානි පාතුභවන්ති උක්කට්ඨවසෙන.

ඔමකවසෙන පන චක්ඛු සෝත ඝාන භාව දසකානි කදාචිපි නලබ්භන්ති, තස්මා තෙසං වසෙන කලාප හානි වේදිතබ්බා.... ගබ්භසෙය්‍යක සත්තානං පන කාය භාව වත්ථු දසක සඞ්ඛාතානි තීණි දසකානි පාතු භවන්ති, තත්ථාපි භාව දසකං කදාචි නලබ්භති, තතොපරං පවත්තිකාලෙ කමේන චක්ඛුදසකාදීනි ච පාතු භවන්ති....

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 60 | ප්‍රතිසන්ධියෙහි කොතෙක් දශකයෝ පහළ වෙත් ද? | ප්‍රතිසන්ධියෙහි වනාහි සංසේදජ වූ ද ඔපපාතික වූ ද සත්ත්වයන්ට චක්ෂුඃ ශ්‍රෝත්‍ර ඝ්‍රාණ ජිහ්වා කාය භාව වස්තු දශක යයි කියනලද සප්ත දශකයෝ උත්කෘෂ්ට වශයෙන් පහළ වෙත්. |
| 61 | පිළිසිඳීමෙහි සංසේදජාදීනට කලාප හානිය වේ ද? | (සංසේදජ ඔපපාතිකයනට පිළිසිඳීමෙහි) ඕමක වශයෙන් චක්ෂුර්දශක ශ්‍රෝත්‍රදශක ඝ්‍රාණදශක භාවදශක යන මොහු කිසිකලෙක නො ලැබෙත්* එහෙයින් ඔවුන්ගේ වශයෙන් කලාප හානිය වේ. |
| 62 | ගබ්භසෙය්‍යක සත්ත්වයනට කොතෙක් දශකයෝ පහළ වෙත් ද? | ගබ්භසෙය්‍යක සත්ත්වයනට වනාහි† කායදශක භාවදශක වස්තුදශක යයි කියන ලද දශක තුනෙක් පහළ වෙත්; එහිද භාවදශකය කිසිකලෙක නො ලැබේ.‡ |
| 63 | චක්ෂුර්දශකාදීහු කවර කලෙක පහළ වෙත් ද? | පිළිසිඳීමෙන් පසුව ප්‍රවෘත්ති කාලයෙහි ක්‍රමයෙන් චක්ෂුඃ ශ්‍රෝත්‍ර ඝ්‍රාණ ජිහ්වා යන දශකයෝ පහළ වෙත්.§ |

* ජාත්‍යන්ධ ජාතිබධිර ජාතඝ්‍රාණ නපුංසක ආදිකල්පික ඔපපාතිකයන්ගේ වශයෙන් කිසි කාලෙක නො ලැබෙත් යයි කියන ලදි. මෙයි [illegible] පෙනේ.

† ගර්භශය්‍යකයන්ගේ ගැනීමෙන් අණ්ඩජ යෝනිය ද ගත්තා ලදි.

‡ යම් කලෙක නපුංසක ව උපදී ද එකල භාවරූපය නූපදී.

§ සත් වන සතියෙහි පිණ්ඩාකාර මතයෙන් එකොළොස් වන සතියෙහි හෝ චක්ෂුර්දශකය ද එතැන් පටන් සතියෙන් සතිය ක්‍රමයෙන් ශ්‍රෝත්‍රාදි දශකයෝ ද පහළ වෙත්. අභිධම්මත්ථ විභාවනීය.

ඉච්චෙවං පටිසන්ධිමුපාදාය කම්මසමුට්ඨානා දුතියචිත්තමුපාදාය චිත්තසමුට්ඨානා ඨිතිකාලමුපාදාය උතුසමුට්ඨානා ඔජාඵරණමුපාදාය ආහාරසමුට්ඨානා චෙති චතුසමුට්ඨාන රූපකලාප සන්තති කාමලොකෙ දීපජාලා විය නදීසොතො විය ච යාවතායුකමබ්භොච්ඡින්නා පවත්තන්ති.

මරණකාලෙ පන චුතිචිත්තොපරි සත්තරසම චිත්තස්ස ඨිතිකාලමුපාදාය කම්මජරූපානි න උප්පජ්ජන්ති, පුරෙතරමුප්පන්නානි ච කම්මජ රූපානි චුතිචිත්ත සමකාලමෙව පවත්තිත්වා නිරුජ්ඣන්ති, තතො පරං චිත්තජාහාරජරූපං ච වොච්ඡිජ්ජති. තතො පරං උතුසමුට්ඨාන රූප පරම්පරා යාව මතකළෙබර සඞ්ඛාතා පවත්තන්ති.

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 64 | කවර තැනෙක පටන් කර්මජාදි චතු සමුට්ඨානික රූප කලාප සන්තතිය නො සිඳ පවතී ද? | පිළිසිඳීම පටන් කර්මජ රූපය ද, ප්‍රති සන්ධි චිත්තයට දෙවැනි භවාඞ්ග චිත්තය පටන් චිත්තජ රූපය ද, ප්‍රති සන්ධි චිත්තයාගේ ඨිතිය පටන් උතුජ රූපය ද, ඔජාව ශරීරයෙහි පැතිරෙන කාලයෙහි පටන් ආහාරජ රූපය ද යන චතුසමුට්ඨාන රූප කලාප සන්තති තොමෝ කාමලෝකයෙහි දීපජාලාවක් නදීස්‍රොතයක් මෙන් ද ආයු පමණින් නො සිඳ පවතී. |
| 65 | කවර චිත්තයක පටන් කර්මජ රූපයෝ නූපදිත් ද? | මැරෙන කලැ චුතිචිත්තයට ප්‍රති ලෝම වශයෙන් සතළොස් වන චිත්ත යාගේ ඨිති කාලයෙහි පටන් කර්මජ රූපයෝ නූපදිත්.* |
| 66 | කර්මජ රූපයෝ කොතැන්හි නිරුද්ධ වේ ද? | ප්‍රථමයෙන් උපන් කර්මජ 'රූපයෝ‡ (සතළොස් වන චුති චිත්තයට සමාන කාලයක් ම පැවත) නිරුද්ධ වෙත්. |
| 67 | චිත්තජ ආහරජ රූපය කොහැන්හි සිඳේ ද? | කර්මජ රූපයන්ගේ නිරොධයෙන් ඉක්බිති චිත්තජ රූපය ද ආහාරජ රූපය ද සිඳේ.† |
| 68 | ඍතුජ රූපය කොතෙක් කල් පවතී ද? | චිත්තජ ආහාරජ රූපයන්ගේ නිරොධයෙන් පසු ඍතුසමුට්ඨාන රූප පරම්පරාව මෘත ශරීරය ඇති තෙක් පවතී. |

* රූප ධර්මයන්ට සතළොස් චිත්තක්ෂණයක් හෙවත් උත්පාද ස්ථිති භඞ්ග වශයෙන් ක්ෂණ එක් පනසක් ආයු වේ; ස්ථිති කාලයෙහි හෝ පසුව හෝ කර්මජ රූප උපන හොත් ඒ තාක් සිටීමට පසු පසුව උපදනා චිත්තයන්ගෙන් ලැබිය යුතු පශ්චාජාත ප්‍රත්‍යය නො ලැබිය හැකි බැවින් නූපදින් ය යනු අභිප්‍රාය යි.

‡ සතළොස්වන චිත්තයාගේ ස්ථිති කාලයට ප්‍රථම එම චිත්තයාගේ උත්පාද ක්ෂණයෙහි උපන් කර්මජ රූපය සඳහා ප්‍රථම කොට උපන් කර්මජ රූප යයි කියන ලදී.

† "චිත්තජාහාරජඤ්ච තතො පරං කිඤ්චි කාලං පවත්තිත්වා නිරුජ්ඣති" චිත්තජ ආහාරජ රූපයෝ ද ඉක්බිති හෙවත් මැරුණු පසු මඳ කලක් පැවැත නිරුද්ධ වේ.

ඉච්චෙවං මත සත්තානං පුන දෙව භවන්තරෙ
පටිසන්ධිමුපාදාය තථා රූපං පවත්තති.

රූපලොකෙ පන ඝාන ජිව්හා කාය භාව දසකානි ච ආහාරජ කලාපානි ච න ලබ්භන්ති.

තස්මා තෙසං පටිසන්ධි කාලෙ චක්ඛු සොත වත්ථු වසෙන තීණි දසකානි ජීවිත නවකඤ්චාති චත්තාරො කම්මසමුට්ඨාන කලාපා පවත්තියං චිත්තොතුසමුට්ඨානා ච ලබ්භන්ති. අසඤ්ඤසත්තානං පන චක්ඛු සොත වත්ථු සද්දානිපි න ලබ්භන්ති, තථා සබ්බානිපි චිත්තජ රූපානි. තස්මා තෙසං පටිසන්ධි කාලෙ ජීවිත නවකමෙව පවත්තියඤ්ච සද්දවජ්ජිතං උතුසමුට්ඨාන රූපං අතිරිච්ඡති.

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 69 | මළාවූ සත්ත්වයන්ගේ අන්‍ය භවයෙහි රූපය කෙසේ පවතී ද? | කියන ලද ක්‍රමයෙන් මළ සත්ත්වයන් ගේ නැවත අන්‍ය භවයෙහි ප්‍රතිසන්ධිය පටන් එපරිද්දෙන් ම හෙවත් එම භවයෙහි රූපය පැවැති ක්‍රමයෙන් ම පවතී. |
| 70 | රූප ලොකයෙහි කවර දශක හා කලාප නො ලැබෙත් ද? | රූපලොකයෙහි වනාහි ඝ්‍රාණ ජිහ්වා කාය භාව* යන දශකයෝ ද ආහාරජ කලාපයෝ ද නො ලැබෙත්. |
| 71 | බ්‍රහ්මයන්ගේ ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති දෙක්හි කොතෙක් කලාප ලැබෙත් ද? | (බ්‍රහ්මයන්ගේ ප්‍රතිසන්ධි කාලයෙහි චක්ෂුර්දශක ශ්‍රොත්‍රදශක වස්තුදශක වශයෙන් දශක තුනක් හා ජීවිත නවකය ද යන) කර්මජ කලාප සතරෙක් ද ප්‍රවෘත්ති කාලයෙහි චිත්ත සමුට්ඨාන උතුසමුට්ඨාන යන කලාපයෝ ද ලැබෙත්. |
| 72 | අසංඥ සත්ත්වයන්ට කිනම් රූප නො ලැබෙත් ද? | අසංඥසත්ත්වයන්ට වනාහි ඝ්‍රාණාදීහු ද චක්ෂුශ්ශ්‍රොත්‍ර වස්තු ශබ්ද යන මොහු ද සියලු චිත්තජ රූපයෝ ද නො ලැබෙත්. |
| 73 | පිළිසිඳීමෙහි කුමක් ලැබේ ද? | (පිළිසිඳීමෙහි අසංඥ සත්ත්වයනට) ජීවිත නවකය ම ලැබේ. |
| 74 | අසංඥසත්ත්වයන්ගේ පැවැත්මෙහි කුමක් ඉතිරිව පවතී ද? | (අසංඥසත්ත්වයන්ගේ) පැවැත්මෙහි ද ශබ්දය හැර උතුසමුට්ඨාන රූපය (ප්‍රතිසන්ධියෙහි උපදනා කර්මජ රූප යෙන්) ඉතිරිව පවතී.§ |

* ඝ්‍රාණ ජිහ්වා කාය ඇත්තන් ද ඔවුන්ගේ ඉන්ද්‍රිය නැති බැවින් ඝ්‍රාණ ජිහ්වා කාය දශක ද ඝන වූ කාමරාගයට උපනිශ්‍රය නොවීන් භාව දශකය ද නො ලැබේ.

§ "සෙස බ්‍රහ්මානං පටිසන්ධියං පවත්තෙ ච උපලබ්භිතබ්බ රූපතො අතිරිච්ඡං හොති" අවශෙෂ බ්‍රහ්මයන්ගේ පිළිසිඳීමෙහි ද පැවැත්මෙහි ද ලැබිය යුතු රූපයන් කෙරෙන් ඉතිරි වේයි යේ යි.

ඉච්චෙවං කාමරූපාසඤ්ඤිසඞ්ඛාතෙසු තීසු ඨානෙසු පටිසන්ධි පවත්ති වසෙන දුවිධා රූපප්පවත්ති වෙදිතබ්බා.

අට්ඨවීසති කාමෙසු හොන්ති තෙවීස රූපිසු
සත්තරසෙවාසඤ්ඤීනං අරූපෙ නත්ථි කිඤ්චිපි.
සද්දො විකාරො ජරතා මරණඤ්චොපපත්තියං
නලබ්භන්ති පවත්තෙ තු නකිඤ්චිපි නලබ්භති.

අයමෙත්ථ රූපපවත්තික්කමො.

---

නිබ්බානං පන ලොකුත්තර සඞ්ඛාතං චතු මග්ග ඤාණෙන සච්ඡිකාතබ්බං මග්ගඵලානමාලම්බනභූතං වාන සඞ්ඛාතාය තණ්හාය නික්ඛන්තත්තා නිබ්බානන්ති පවුච්චති.

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 75 | කාමාදි තුන් තන්හි රූප පැවැත්ම කෙතෙක් ප්‍රකාර ද? | (කාම රූප අසඤ්ඤ යයි කියන ලද තුන් තන්හි පිළිසිඳීම් පැවැතීම් වශයෙන් රූපයන්ගේ පැවැත්ම) දෙප්‍රකාර යයි දත යුතු යි. |
| 76 | කාමභවයෙහි රූප කෙතෙක් ද? | (කාම භවයෙහි) රූප විසි අටෙකි. |
| 77 | රූපී බ්‍රහ්මයන්ට රූප කෙතෙක් ද? | රූපී බ්‍රහ්මයන්ට (ඝ්‍රාණ ජිහ්වා කාය හා භාව ද්වය යද හැර) රූප තෙවිස්සෙකි. |
| 78 | අසංඥසත්ත්වයන්ට රූප කෙතෙක් ද? | (ජීවිත නවක ය ලඝුතාදි තුන ය උපචය සන්තති ජරතා අනිච්චතා ආකාශ ධාතු ය යන) සතළොස් රූපයෝ වෙත්. |
| 79 | අරූප භවයෙහි රූප නැත්තේ ද? | (අරූප භවයෙහි කිසිම රූපයෙක් නැත්තේය. |
| 80 | ප්‍රතිසන්ධි කාලයෙහි කුමක් නො ලැබේ ද? | ශබ්ද ය ලඝුතාදි විකාර රූප ය ජරතා ය භඞ්ග ය යන මොහු නො ලැබෙත්; පැවැත්මෙහි සියලුම රූපයෝ ලැබෙත්. |
| 81 | කුමක් හෙයින් නිර්වාණ යයි කියනු ලැබේ ද? | (ලොකයෙන් නික්මෙන හෙයින්) ලොකොත්තර යයි කියන ලද චතුර්විධ මාර්ගඥානයෙන් පසක් කටයුතු වූ* මාර්ගඵලයන්ට අරමුණු වූ† වාන යයි කියන ලද තෘෂ්ණාවෙන් නික්මුණු බැවින් නිර්වාණ යයි කියනු ලැබේ. |

* මෙයින් ඒ ඒ ආර්ය පුද්ගලයන් ආර්යඥාන චක්ෂුසින් දක්ක යුතු හෙයින් නිර්වාණයාගේ ප්‍රත්‍යක්ෂයෙන් සිද්ධ බව දර්ශිත යි.

† මෙයින් කල්‍යාණ පෘථග්ජනයනට නිර්වාණය අනුමානයෙන් සිද්ධ බව දර්ශිත යි.

තදෙතං සභාවතො එකවිධම්පි සඋපාදිසෙස නිබ්බාන ධාතු අනුපාදිසෙස නිබ්බාන ධාතු චෙති දුවිධං හොති කාරණ පරියායෙන.

තථා සුඤ්ඤතං අනිමිත්තං අප්පණිහිතඤ්චෙති තිවිධං හොති ආකාර භෙදෙන.

පදමච්චුතමච්චන්තං අසඞ්ඛතමනුත්තරං
නිබ්බානමිති භාසන්ති වානමුත්තා මහෙසයො.

ඉති චිත්තං චෙතසිකං රූපං නිබ්බානමිච්චපි
පරමත්ථං පකාසෙන්ති චතුධාව තථාගතා.

ඉති අභිධම්මත්ථ සඞ්ගහෙ රූපසඞ්ගහ විභාගො නාම

## ඡට්ඨො පරිච්ඡෙදො.

---

ද්වාසත්තති විධා වුත්තා වත්ථුධම්මා සලක්ඛණා
තෙසං දානි යථා යොගං පවක්ඛාමි සමුච්චයං.

---

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 82 | නිර්වාණය කොතෙක් ප්‍රකාර ද? | (ස්වභාව වශයෙන් එකවිධ වූයේ ද කාරණ ව්‍යවහාරයෙන් සොපාදිශෙෂ නිර්වාණධාතු ය අනුපාදිශෙෂ නිර්වාණ ධාතු යයි) ද්විප්‍රකාර වේ.‡ |
| 83 | ආකාර භෙදයෙන් නිර්වාණය කොතෙක් ප්‍රකාර ද? | (රාගාදියෙන් සිස් බැවින්) සුඤ්ඤත ය (රාගාදි නිමිති රහිත බැවින්) අනිමිත්ත ය (තෘෂ්ණා ප්‍රණිධියක් නැති හෙයින්) අප්පණිහිත යයි තුන් ප්‍රකාර වේ. |
| 84 | පරමාර්ථය කොතෙක් ප්‍රකාරයකින් ප්‍රකාශ කෙරෙත් ද? | (සර්වඥවරයෝ චිත්තය චෛතසිකය රූපය නිර්වාණ යයි කියා පරමාර්ථය) සතර පරිද්දෙකින් ප්‍රකාශ කෙරෙත්. |

## හවන පරිච්ඡෙදය නිමියේ යි.

---

| | | |
|---|---|---|
| 1 | කුමක් ස්ථානය කොට සමුච්චය සඞ්ග්‍රහය කියනු ලැබේ ද? | (චිත්තාදී) ලක්ෂණ සහිත වූ (දෙපනස් චෛතසිකය ද චිත්තය ද නිර්වාණය ද අටළොස් නිෂ්පන්න රූපය ද යන) දෙසැත්තෑ භෙද ස්වභාව ධර්මයන් ස්ථානය කොට යෙදෙන පරිද්දෙන් ඔවුන්ගේ (අකුශලාදි භෙද වූ) සමුච්චය සඞ්ග්‍රහය කියනු ලැබේ. |

---

‡ පඤ්චස්කන්ධ සහිත ව පවත්නා හෙයින් සඋපාදිශෙෂ නිර්වාණධාතු යයි කියා ද ස්කන්ධශෙෂය නැති කල්හි අනුපාදිශෙෂ නිර්වාණ ධාතු යයි කියාද ද්විප්‍රකාර ය දත යුතු.

අකුසල සඞ්ගහො මිස්සක සඞ්ගහො බොධිපක්ඛිය සඞ්ගහො සබ්බ සඞ්ගහො චෙති සමුච්චය සඞ්ගහො චතුබ්බිධො වෙදිතබ්බො.

කථං: අකුසල සඞ්ගහෙ තාව, චත්තාරො ආසවා කාමාසවො භවාසවො දිට්ඨාසවො අවිජ්ජාසවො. චත්තාරො ඔඝා කාමොඝො භවොඝො දිට්ඨොඝො අවිජ්ජොඝො. චත්තාරො යොගා කාම යොගො භව යොගො දිට්ඨි යොගො අවිජ්ජා යොගො.

චත්තාරො ගන්ථා අභිජ්ඣා කායගන්ථො ව්‍යාපාදො කායගන්ථො සීලබ්බතපරාමාසො කායගන්ථො ඉදංසච්චාභිනිවෙසො කායගන්ථො.

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 2 | සමුච්චය සඞ්ග්‍රහය කොතෙක් ප්‍රකාර ද? | අකුසල සඞ්ග්‍රහය, (අකුශලාදීන් හා මිශ්‍ර හෙයින්) මිශ්‍රක සඞ්ග්‍රහය, බොධිපාක්ෂික සඞ්ග්‍රහය, (ස්කන්ධාදි වශයෙන්) සර්වසඞ්ග්‍රහය දයි සමුච්චය සඞ්ග්‍රහය සතර ප්‍රකාර වේ. |
| 3 | ආශ්‍රවයෝ කොතෙක් ද? | (කාමාශ්‍රව ය* භවාශ්‍රව ය‡ දෘෂ්ට්‍යාශ්‍රව ය† අවිද්‍යාශ්‍රව යයි§) ආශ්‍රව සතරෙකි. |
| 4 | ඕඝයෝ කොතෙක් ද? | (කාමෞඝ ය භවෞඝ ය දිට්ඨෞඝ ය අවිජ්ජෞඝ යයි) ඕඝ සතරෙකි ‡‡ |
| 5 | යොගයෝ කොතෙක් ද? | (කාම යොග ය භව යොග ය දිට්ඨි යොග ය අවිජ්ජා යොග යයි) යොග සතරෙකි. |
| 6 | කායග්‍රන්ථ කොතෙක් ද? | (අභිධ්‍යා කායග්‍රන්ථයෙක ව්‍යාපාද කායග්‍රන්ථයෙක සීලබ්බත පරාමාස කායග්‍රන්ථයෙක ඉදං සච්චාභිනිවෙස කායග්‍රන්ථයෙක යි) කායග්‍රන්ථ සතරෙකි. †† |

* "භවතො ආ භවග්ගං ධම්මතො ආ ගොත්‍රභුං සවන්ති පවත්තන්තීති ආසවා" භව වශයෙන් භවාග්‍රය ද ධර්ම වශයෙන් ගොත්‍රභූ ඥානය ද කෙළවර කොට පවත්නා හෙයින් ආශ්‍රවයෝ නම් වෙති.

† "රූපාරූප භවෙසු ඡන්දරාගො භවාසවො" රූප අරූප භවයන්හි බලවත් ඇල්ම භවාශ්‍රව යයි.

‡ "සස්සතුච්ඡෙද දිට්ඨි භෙදතො ද්වාසට්ඨිවිධා මිච්ඡාදිට්ඨි දිට්ඨාසවො" ශාස්වත උච්ඡෙද දෘෂ්ටි භෙදයෙන් දෙසැට වැදෑරුම් වූ මිථ්‍යාදෘෂ්ටිය දෘෂ්ට්‍යාශ්‍රව යයි.

§ "දුක්ඛාදිසු චතුසු සච්චෙසු පුබ්බන්තෙ අපරන්තෙ පුබ්බන්තාපරන්තෙ පටිච්චසමුප්පාදෙසු චාති අට්ඨසු ඨානෙසු අඤ්ඤාණං අවිජ්ජාසවො" දුඃඛාදි චතුරාර්‍ය්‍යසත්‍යයන්හි ද පූර්ව කෙළවරෙහි ද අපර කෙළවරෙහි ද පූර්ව අපර කෙළවර දෙක්හි ද ප්‍රතීත්‍යසමුත්පාද ධර්මයන්හි ද යන අට තැන්හි නොදැන්ම අවිද්‍යාව යි. 'අභිධම්මත්ථවිභාවනී'.

‡‡ කාමාදීහු සැඩ වතුරක් වැනි හෙයින් ඕඝ යයි කියනු ලැබේ.

†† වෙළනු හෙයින් ග්‍රන්ථයෝ වෙති, එයින් හීනඃ—"නාම කායෙන රූපකායං පච්චුප්පන්න කායෙන වා අනාගත කායං ගන්ථෙන්තීති දුප්පමුඤ්චං වෙඨෙන්තීති ගන්ථා" අභිධ්‍යාව ද ව්‍යාපාදය ද සීලබ්බතපරාමාසය ද මෙම සත්‍යය අනිකක් හිස් යයි දැඩිව ගන්නා ලද ඉදං සච්චාභිනිවේශය ද යන සතර කාය ග්‍රන්ථයෝ යයි කියනු ලැබෙත.

චත්තාරො උපාදානා කාමුපාදානං දිට්ඨුපාදානං සීලබ්බතුපාදානං අත්තවාදුපාදානං.....ඡ නීවරණානි කාමච්ඡන්ද නීවරණං ව්‍යාපාද නීවරණං ථීනමිද්ධ නීවරණං උද්ධච්චකුක්කුච්ච නීවරණං විචිකිච්ඡා නීවරණං අවිජ්ජා නීවරණං.....සත්තානුසයා කාමරාගානුසයො භවරාගානුසයො පටිඝානුසයො මානානුසයො දිට්ඨානුසයො විචිකිච්ඡානුසයො අවිජ්ජානුසයො.....

දස සංයොජනානි කාමරාග සංයොජනං රූපරාග සංයොජනං අරූපරාග සංයොජනං පටිඝ සංයොජනං මාන සංයොජනං දිට්ඨි සංයොජනං සීලබ්බතපරාමාස සංයොජනං විචිකිච්ඡා සංයොජනං උද්ධච්ච සංයොජනං අවිජ්ජා සංයොජනං සුත්තන්තෙ.....

| ප්‍රශ්න | උත්තර |
|---|---|
| 7 උපාදාන කොතෙක් ද? | (කාමුපාදාන ය දිට්ඨුපාදාන ය සීලබ්බතුපාදාන ය අත්තවාදුපාදාන යයි) සතරෙකි. † |
| 8 නීවරණ කොතෙක් ද? | (කාමච්ඡන්ද නීවරණ ය ව්‍යාපාද නීවරණ ය ථීනමිද්ධ නීවරණ ය උද්ධච්ච කුක්කුච්ච නීවරණ ය විචිකිච්ඡා නීවරණ ය අවිජ්ජා නීවරණ යයි) නීවරණ සයෙකි. ‡ |
| 9 අනුසය කොතෙක් ද? | (කාමරාගානුසය භවරාගානුසය පටිඝානුසය මානානුසය දිට්ඨානුසය විචිකිච්ඡානුසය අවිජ්ජානුසය යයි) සතෙකි. § |
| 10 සූත්‍ර පිටකයෙහි සංයෝජනයෝ කොතෙක් ද? | (කාමරාග සංයොජන ය රූපරාග සංයොජන ය අරූපරාග සංයොජන ය පටිඝ සංයොජන ය මාන සංයොජන ය දිට්ඨි සංයොජන ය සීලබ්බත පරාමාස සංයොජන ය විචිකිච්ඡා සංයොජන උද්ධච්ච සංයොජනය අවිජ්ජා සංයොජන යයි) සූත්‍රපිටකයෙහි සංයොජනයෝ දසයෙකි. * |

† "මණ්ඩූකං පන්නගො විය භුසං දළ්හං ආරම්මණං ආදියන්තීති උපාදානානි" නාගයෙක් මැඩියකු ගන්නාක් මෙන් අතිශයින් දැඩි ව අරමුණු ගනිත් නුයි උපාදානයෝ වෙති, කාමයෙ දැඩි කොට ගන්නේ කාමුපාදාන යි; සෙස්ස ද මෙසේ ය.

‡ "ඣානාදි වසෙන උප්පජ්ජනක කුසල චිත්තං නිවාරෙන්ති නිසෙධෙන්තීති නීවරණා" ධ්‍යානාදි වශයෙන් උපදිනා වූ කුසල චිත්තය වළක්වත් නුයි නීවරණයෝ වෙති.

§ අප්පහීනට්ඨෙන අනු අනු සන්තානෙ සෙන්තීති අනුසයා" අප්‍රහීණාර්ථයෙන් නැවත නැවත සන්තන්හි උපදිත් නුයි අනුසයන; සුදුසු කාරණක් ලැබූ උපදිය යන අර්ථ යි. 'අභිධම්මත්ථ විභාවනී'. සිත සමඟ උපදනා වූ රාගාදීහු රූපාදි තදනුරූප අරමුණක් ලැබූ පුබුදිති නෙවත් නැඟී සිටිති යන අභිප්‍රාය යි.

* "වට්ටස්මිං සත්තෙ සංයොජෙන්ති බන්ධන්තීති සංයොජනානි" සංසාර චක්‍රයෙහි සත්ත්වයන් බඳිත් නුයි සංයෝජනයෝ නාම වෙති.

15-2

අපරානි දස සංයොජනානි කාමරාග සංයොජනං භවරාග සංයොජනං පටිඝ සංයොජනං මාන සංයොජනං දිට්ඨි සංයොජනං සීලබ්බතපරාමාස සංයොජනං විචිකිච්ඡා සංයොජනං ඉස්සා සංයොජනං මච්ඡරිය සංයොජනං අවිජ්ජා සංයොජනං අභිධම්මෙ.

දස කිලෙසා ලොභො දොසො මොහො මානො දිට්ඨි විචිකිච්ඡා ථීනං උද්ධච්චං අහිරිකං අනොත්තප්පං. ආසවාදීසු පනෙත්ථ කාමභව නාමෙන තබ්බත්ථුකා තණ්හා අධිප්පෙතා, සීලබ්බතපරාමාසො ඉදං සච්චාභිනිවෙසො අත්තවාදුපාදානඤ්ච තථා පවත්තං දිට්ඨිගතමෙව පවුච්චති.

---

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 11 | අභිධර්මයෙහි සංයෝජනයෝ කොතෙක් ද? | (කාමරාග සංයොජන ය භවරාග සංයොජන ය පටිඝ සංයොජන ය මාන සංයොජන ය දිට්ඨි සංයොජන ය සීලබ්බතපරාමාස සංයොජන ය විචිකිච්ඡා සංයොජන ය ඉස්සා සංයොජනය මච්ඡරිය සංයොජන ය අවිජ්ජා සංයොජන යයි) අභිධර්මයෙහි සංයොජනයෝ දසයෙකි. |
| 12 | කෙලශයෝ කොතෙක් ද? | (ලොභ ය ද්වෙෂ ය මෝහ ය මාන ය දිට්ඨි ය විචිකිච්ඡා ය ථීන ය උද්ධච්ච ය අහිරික ය අනොත්තප්ප යයි) කෙලශයෝ දසයෙකි.† |
| 13 | කාමභව නමින් කුමක් අභිප්‍රාය කරනු ලැබේ ද? | ආශ්‍රවාදීන් අතුරෙහි කාම භව නාමයෙන් කාම භව දෙ දෙනාට වස්තුක වූ කාම තෘෂ්ණාව අභිප්‍රාය කරනු ලැබේ. |
| 14 | සීලබ්බතාදි තුනෙන් කුමක් කියනු ලැබේ ද? | සීලබ්බතපරාමාස ය ඉදං සච්චාභිනිවෙස ය අත්තවාදුපාදාන ය යන තුනෙන් විපරීත ග්‍රහණාදි වශයෙන් පැවැති දෘෂ්ටිය කියනු ලැබේ. |

---

† "චිත්තං කිලිස්සන්ති උපතාපෙන්ති බාධියන්ති වා එතෙහීති කිලෙසා" සිත කිලුටු කෙරෙයි, තවයි, මෙයින් පෙළෙනු ලැබේ නුයි හෝ කිලෙසයෝ නම් වෙති.

ආසවොඝා ච යොගා ච තයො ගන්ථා ච වත්ථුතො
උපාදානා දුවෙ වුත්තා අට්ඨනීවරණා සියුං—
ඡළෙවානුසයා හොන්ති නව සංයොජනා මතා
කිලෙසා දස වුත්තායං නවධා පාප සඞ්ගහො—

මිස්සක සඞ්ගහෙ ඡ හෙතූ ලොභො දොසො මොහො අලොභො අදොසො අමොහො—සත්ත ඣානඞ්ගානි විතක්කො විචාරො පීති එකග්ගතා සොමනස්සං දොමනස්සං උපෙක්ඛා—ද්වාදස මග්ගඞ්ගානි, සම්මාදිට්ඨි සම්මාසංකප්පො සම්මාවාචා සම්මාකම්මන්තො සම්මාආජීවො සම්මාවායාමො සම්මාසති සම්මාසමාධි මිච්ඡාදිට්ඨි මිච්ඡාසංකප්පො මිච්ඡාවායාමො මිච්ඡාසමාධි—

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 15 | අකුසල සඞ්ග්‍රහය කොතෙක් ප්‍රකාරයෙකින් කියන ලද්දේ ද? | ආසව ඕඝ යොග තුන් දෙන වස්තු වශයෙන් කාමභවාශ්‍රව ආදිය ය ලොභ ශීලි හෙයින් එකක් කොට ලොභ ද්වෙෂ මොහ වශයෙන් තුනෙක් ද, ග්‍රන්ථයෝ ද අභිධ්‍යා ව්‍යාපාද දෘෂ්ටි වශයෙන් තුනෙක් ද, ලොභ දෘෂ්ටි වශයෙන් උපාදාන ද්වයයෙක් ද, ථීන මිද්ධ උද්ධච්ච කුක්කුච්ච දෙදෙනා සතරක් කොට නීවරණ අටෙක් ද, කාමභව ආදිය ය තෘෂ්ණා වශයෙන් එකක් කොට අනුසය සයෙක් ද, දස සංයොජනයෝ තෘෂ්ණා දෘෂ්ටි සවභාවයෙන් එක් කොට දෙ හැන්ගී නව දෙනෙක්ද, එසේ ම කෙලශයෝ දස දෙනෙක් දූයි අකුසල සඞ්ග්‍රහය නව ප්‍රකාරයකින් කියන ලද්දේ ය. |
| 16 | මිශ්‍රකසඞ්ග්‍රහයෙහි හෙතු කොතෙක් ද? | (ලොභ ය ද්වෙෂ ය මොහය අලොභ ය අද්වෙෂ ය අමොහ යයි) හෙතු සයෙකි. |
| 17 | ධ්‍යානාඞ්ගයෝ කොතෙක් ද? | (විතර්ක ය විචාර ය ප්‍රීති ය එකාග්‍රතා ය සොමනස්ස ය දෞමනස්ස ය* උපෙක්ෂාව යයි) ධ්‍යානාඞ්ගයෝ සත් දෙනෙකි. |
| 18 | මාර්ගාඞ්ගයෝ කොතෙක් ද? | (සම්‍යක්දෘෂ්ටි ය සම්‍යක්සංකල්පනා ය සම්‍යග්වචන ය සම්‍යක්කර්මාන්ත ය සම්‍යග්ආජීව ය සම්‍යග්ව්‍යායාම ය සම්‍යක්සති ය සම්‍යක්සමාධි ය මිථ්‍යා දෘෂ්ටි ය† මිථ්‍යාසංකල්පනා ය මිථ්‍යා ව්‍යායාම ය මිථ්‍යාසමාධි යයි) මාර්ගාඞ්ගයෝ දොළොසෙකි. |

* "දොමනස්සමෙවෙත්ථ අකුසල ඣානඞ්ගං සෙසානි කුසලාකුසල ඣානඞ්ගානි" මෙහි දෞර්මනස්සය අකුසල ධ්‍යානාඞ්ග වේ. සෙස්ස කුසලාකුසල අව්‍යාකෘත ධ්‍යානාඞ්ගයෝ යි.

† "මිච්ඡාදිට්ඨි ආදයො දුග්ගති මග්ගත්තා මග්ගඞ්ගානි" මිථ්‍යාදෘෂ්ටි ආදීහු දුර්ගතියට මාර්ග බැවින් මාර්ගාඞ්ගයෝ යි.-අභිධම්මත්ථ විභාවනී.

බාවීසතින්ද්‍රියානි චක්ඛුන්ද්‍රියං සොතින්ද්‍රියං ඝානින්ද්‍රියං ජිව්හින්ද්‍රියං කායින්ද්‍රියං ඉත්ථින්ද්‍රියං පුරිසින්ද්‍රියං ජීවිතින්ද්‍රියං මනින්ද්‍රියං සුඛින්ද්‍රියං දුක්ඛින්ද්‍රියං සොමනස්සින්ද්‍රියං දොමනස්සින්ද්‍රියං උපෙක්ඛින්ද්‍රියං සද්ධින්ද්‍රියං විරියින්ද්‍රියං සතින්ද්‍රියං සමාධින්ද්‍රියං පඤ්ඤින්ද්‍රියං අනඤ්ඤාතඤ්ඤස්සාමිතින්ද්‍රියං අඤ්ඤින්ද්‍රියං අඤ්ඤාතාවින්ද්‍රියං.

නව බලානි සද්ධාබලං විරියබලං සතිබලං සමාධිබලං පඤ්ඤාබලං හිරිබලං ඔත්තප්පබලං අහිරිකබලං අනොත්තප්පබලං.

චත්තාරො අධිපති ඡන්දාධිපති විරියාධිපති චිත්තාධිපති වීමංසාධිපති.

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 19 | ඉන්ද්‍රියයෝ කොතෙක් ද? | (චක්ඛුන්ද්‍රිය සොතින්ද්‍රිය ඝානින්ද්‍රිය ජිව්හින්ද්‍රිය කායින්ද්‍රිය ඉත්ථින්ද්‍රිය පුරිසින්ද්‍රිය ජීවිතින්ද්‍රිය මනින්ද්‍රිය සුඛින්ද්‍රිය දුක්ඛින්ද්‍රිය සොමනස්සින්ද්‍රිය දොමනස්සින්ද්‍රිය උපෙක්ඛින්ද්‍රිය සද්ධින්ද්‍රිය විරියින්ද්‍රිය සතින්ද්‍රිය සමාධින්ද්‍රිය පඤ්ඤින්ද්‍රිය අනඤ්ඤාතඤ්ඤස්සාමිතින්ද්‍රිය අඤ්ඤින්ද්‍රිය අඤ්ඤාතාවින්ද්‍රිය යි) ඉන්ද්‍රිය දෙ විස්සෙකි.* |
| 20 | බල ධර්මයෝ කොතෙක් ද? | (ශ්‍රද්ධාබල ය වීර්‍ය්‍යබල ය සතිබල ය සමාධිබල ය ප්‍රඥාබල ය හිරිබල ය ඔත්තප්පබල ය අහිරිකබල ය අනොත්තප්පබල යයි) බල ධර්මයෝ නව යෙකි.† |
| 21. | අධිපති ධර්මයෝ කොතෙක් ද? | (ඡන්දාධිපති විරියාධිපති, චිත්තාධිපති වීමංසාධිපති යයි) අධිපති ධර්මයෝ සතරෙකි.‡ |

* "ආධිපච්චයට්ඨෙන ඉන්ද්‍රියානි"යි යු බැවින් අධිපති බව ය යන අර්ථයෙන් ඉන්ද්‍රිය නම් වේ. ඒ චක්ෂුරාදි පස් දෙන නොහොත් චක්ෂුරාදි ප්‍රසාද රූපයෝ පස් දෙන තම තමන්ගේ කලාප ගත රූපයෙහි ඓශ්වර්‍ය්‍ය බව කරන හෙයින් ඉන්ද්‍රිය නමි. අනිකුදු ඉන්ද්‍රියයෝ ඒ ඒ තැනින් ඉසුරු බව කරන හෙයින් ඉන්ද්‍රියයෝ යයි දත යුතුයි.

† "අස්සද්ධිය කොසජ්ජ පමාද උද්ධච්ච අවිජ්ජා අහිරිකානොත්තප්පසඞ්ඛාතෙහි පටිපක්ඛධම්මෙහි අකම්පියට්ඨෙන 'සම්පයුත්තධම්මෙසු ථිරභාවෙන ච සද්ධාදීනි සත්තබලානි" අශ්‍රද්ධා කෞසීද්‍ය ප්‍රමාද ඖද්ධත්‍ය අවිද්‍යා අහිරික අනොත්තප්ප යයි කියන ලද විරුද්ධ ධර්මයන් විසින් අකම්ප්‍යාර්ථයෙන් ද සම්ප්‍රයුක්ත ධර්මයන් අතුරෙහි ස්ථිරත්වයෙන් ද ශ්‍රද්ධාදි සත්දෙන බලධර්ම වෙති. අහිරික අනොත්තප්ප ද්වය ය ද සම්ප්‍රයුක්ත ධර්මයන් අතුරෙහි ස්ථිරත්වයෙන් බල නම් වේ. එසේ හෙයින් මෙතැන්හි බල නවයෙකැයි කියන ලදි.

‡ "යදා ඡන්දාදිසු අඤ්ඤතරං අධිපතිං ජෙට්ඨං පධානං කත්වා චිත්තමුප්පජ්ජති තදා ඡන්දාධිපති ආදයො නාම හොන්තීති වෙදිතබ්බා"

"ඡන්දන්තු ජෙට්ඨකං කත්වා ඡන්දං කත්වා ධුරං පන
චිත්තස්සුප්පත්ති කාලස්මිං ඡන්දාධිපති නාම සො"යි.

චත්තාරො ආහාරා කබලීකාරො ආහාරො ඵස්සො දුතියො මනොසඤ්චෙතනා තතියො විඤ්ඤාණං චතුත්ථං.

ඉන්ද්‍රියෙසු පනෙත්ථ සොතාපත්තිමග්ගඤාණං අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං අරහත්තඵලඤාණං අඤ්ඤාතාවින්ද්‍රියං මජ්ඣෙ ඡ ඤාණානි අඤ්ඤින්ද්‍රියානීති පවුච්චන්ති. ජීවිතින්ද්‍රියං ච රූපාරූපවසෙන දුවිධං හොති, පඤ්චවිඤ්ඤාණෙසු ඣානඞ්ගානි අවීරියෙසු බලානි අහෙතුකෙසු මග්ගඞ්ගානි න ලබ්භන්ති. තථා විචිකිච්ඡාචිත්තෙ එකග්ගතා මග්ගින්ද්‍රිය බල භාවං න ගච්ඡති, ද්විහෙතුක තිහෙතුක ජවනෙස්වෙව යථා සම්භවං අධිපති එකොව ලබ්භති.

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 22 | ආහාරයෝ කොතෙක් ද? | (කබලීකාහාර ආහාර ය දෙවෙනි ඵස්සාහාර ය තුන්වැනි මනොසඤ්චෙතනාහාර ය සතරවැනි විඤ්ඤාණාහාර යයි) ආහාර සතරෙකි.* |
| 23 | අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියාදි වූ තුන් ඉන්ද්‍රියයෝ කවරහු ද? | ඉන්ද්‍රියයන් අතුරෙන් සෝතාපත්ති මාර්ගඥානය අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය යයි ද අර්හත්ඵලඥානය අඤ්ඤාතාවින්ද්‍රිය යයි ද සෝවාන් ඵල ඥාණ ය පටන් අර්හත්මාර්ගඥානය දක්වා මැද පැවැති ෂඩ්විධ ඥානය අඤ්ඤින්ද්‍රිය යයි ද කියන ලදි. |
| 24 | ජීවිතෙන්ද්‍රිය ය කොතෙක් ප්‍රකාර ද? | ජීවිතෙන්ද්‍රිය ය (රූප ජීවිතෙන්ද්‍රිය ය අරූප ජීවිතෙන්ද්‍රිය යි) ද්විප්‍රකාර වේ. |
| 25 | ධ්‍යානාඞ්ගයෝ කවරෙක් අතුරෙහි නො ලැබෙත් ද? | චක්ෂුර්විඥානාදී වූ පඤ්චවිඥානයන් අතුරෙහි විතර්කය නැති හෙයින් ධ්‍යානාඞ්ගයෝ නො ලැබෙත්. |
| 26 | බලධර්මයෝ කවරෙක් අතුරෙහි නො ලැබෙත් ද? | ද්විපඤ්චවිඥාන මනොධාතුත්‍රිකසන්තීරණ ත්‍රික වශයෙන් සොළොස් ප්‍රකාර වූ වීර්‍ය්‍ය රහිත සිත් අතුරෙහි බල ධර්මයෝ නො ලැබෙත්. |
| 27 | කවරකු කෙරෙහි මාර්ගාඞ්ගයෝ නො ලැබෙත් ද? | අටළොස් අහේතුකයන් කෙරෙහි හේතු නැත්තෙන් සම්‍යග්දෘෂ්ට්‍යාදි මාර්ගාඞ්ගයෝ නො ලැබෙත්. |
| 28 | කවරකු කෙරෙහි වූ ඒකාග්‍රතාව මාර්ගාඞ්ගාදි යට නො යේ ද? | විචිකිත්සා සිත්හි පැවැති ඒකාග්‍රතා තොමෝ මාර්ගේන්ද්‍රිය ය බලභාවයට නො යේ. |
| 29 | ජවන් අතුරෙහි කොතෙක් අධිපති ධර්මයෝ ලැබෙත් ද? | ද්විහේතුක ත්‍රිහේතුක ජවන් අතුරෙහි සම්භව වන පරිද්දෙන් එක ම අධිපති ධර්මයෙක් ලැබේ.‡ |

* "කබලීකාරො ආහාරො ඕජට්ඨමකරූපානි ආහාරෙති, ඵස්සාහාරො තිස්සො වෙදනා මනොසඤ්චෙතනාහාරො තයො භවෙ විඤ්ඤාණාහාරො පටිසන්ධිවිඤ්ඤාණ හාති". මජ්ඣිමනිකායට්ඨකථා.

‡ ද්විහේතුක ජවන්හි විමංසාව හැර අනික් තුන්දෙනා අතුරෙන් අන්තරා අධිපති ධර්මයක් ලැබෙන හෙයින් සම්භව වන පරිද්දෙන් කියා ද එක සිට එකම අධිපති ධර්මයක් ලැබෙන හෙයින් එක ම අධිපතියෙකැයි කියා ද කියන ලදි.

ඡ හෙතු පඤ්ච ඣානඞ්ගා මග්ගඞ්ගා නව වත්ථුතො
සොළසින්ද්‍රිය ධම්මා ච බලධම්මා නවෙරිතා.

චත්තාරොධිපතී වුත්තා තථාහාරාති සත්තධා
කුසලාදි සමාකිණ්ණො වුත්තො මිස්සක සඞ්ගහො.

බොධිපක්ඛිය සඞ්ගහෙ චත්තාරො සතිපට්ඨානා කායානුපස්සනා සතිපට්ඨානං වෙදනානුපස්සනා සතිපට්ඨානං චිත්තානුපස්සනා සතිපට්ඨානං ධම්මානුපස්සනා සතිපට්ඨානං. චත්තාරො සම්මප්පධානා උප්පන්නානං පාපකානං පහානාය වායාමො අනුප්පන්නානං පාපකානං අනුප්පාදාය වායාමො අනුප්පන්නානං කුසලානං උප්පාදාය වායාමො උප්පන්නානං කුසලානං භිය්‍යොභාවාය වායාමො. චත්තාරො ඉද්ධිපාදා ඡන්දිද්ධිපාදො විරියිද්ධිපාදො චිත්තිද්ධිපාදො වීමංසිද්ධිපාදො.

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 30 | මිශ්‍රක සඞ්ග්‍රහය කොතෙක් ප්‍රකාරයකින් කියන ලද්දේ ද? | (ලොභාදි හෙතු සයෙක, විතර්කාදි ධ්‍යානාඞ්ග පසෙක, ධර්ම වශයෙන් සම්‍යක්දෘෂ්ටි ආදි මාර්ගාඞ්ග නවයෙක, චක්ෂුරාදි ඉන්ද්‍රියයෝ සොළොසෙක, ශ්‍රද්ධාදි බල නවයෙක, ඡන්දාදි අධිපති සතරෙක, කබලීකාහාරාදි ආහාර සතරෙකැ යි කුශලාදි වශයෙන් ආකීර්ණ වූ) මිශ්‍රක සඞ්ග්‍රහය සත් පරිද්ඡෙදකින් කියන ලද්දේ ය.* |
| 31 | සතිපට්ඨානයෝ කොතෙක් ද? | (කායානුපස්සනා සතිපට්ඨානය වෙදනානුපස්සනා සතිපට්ඨානය චිත්තානුපස්සනා සතිපට්ඨානය ධම්මානුපස්සනා සතිපට්ඨානය යි) සතිපට්ඨාන සතරෙකි. |
| 32 | සම්‍යක් ප්‍රධානයෝ කොතෙක් ද? | (උපන් අකුශලයන්ගේ දුරුකිරීම පිණිස කරන උත්සාහය ද, නූපන් අකුශලයන්ගේ නොඉපැදවීම පිණිස කරන උත්සාහය ද, නූපන්නා වූ කුශලයන්ගේ ඉපැදීම පිණිස කරන උත්සාහය ද, උපන්නා වූ කුශලයන්ගේ අභිවෘද්ධිය පිණිස කරන උත්සාහය ද යන) සම්‍යක් ප්‍රධාන සතරෙකි. |
| 33 | ඍද්ධිපාදයෝ කොතෙක් ද? | ඡන්දිද්ධිපාද ය විරියිද්ධිපාද ය චිත්තිද්ධිපාද ය වීමංසිද්ධිපාද යයි) ඍද්ධිපාද සතරෙකි. |

* මෙහි සොම්නස් දොම්නස් හා උපෙක්ෂාව ද ධර්ම වශයෙන් එකක් කොට ධ්‍යානාඞ්ග පසෙකැ යි ද මිථ්‍යාසංකල්පනාදි තුන් දෙනා විතර්ක වීර්ය්‍ය ඒකාග්‍රතාවන් හා එක් කොට මාර්ගාඞ්ග නවයෙකැ යි ද සුඛෙන්ද්‍රියාදි පස් දෙනා වෙදනා සාමාන්‍යයෙන් එකක් කොට ද ලොකොත්තර ඉන්ද්‍රියයන් තුන් දෙනා ඥාණ සාමාන්‍යයෙන් ප්‍රඥෙන්ද්‍රිය සමග එකක් කොට ද ජීවිතෙන්ද්‍රිය ය වනාහි රූපජීවිතෙන්ද්‍රිය නාමජීවිතෙන්ද්‍රිය යයි දෙකක් කොට ද ගෙන ඉන්ද්‍රිය ධර්මයෝ සොළොසෙකැ යි ද කියන ලදි.

පඤ්චින්ද්‍රියානි සද්ධින්ද්‍රියං විරියින්ද්‍රියං සතින්ද්‍රියං සමාධින්ද්‍රියං පඤ්ඤින්ද්‍රියං —— පඤ්ච බලානි සද්ධාබලං විරියබලං සතිබලං සමාධිබලං පඤ්ඤාබලං —— සත්ත බොජ්ඣඞ්ගා සති සම්බොජ්ඣඞ්ගො ධම්මවිචය සම්බොජ්ඣඞ්ගො විරිය සම්බොජ්ඣඞ්ගො පීති සම්බොජ්ඣඞ්ගො පස්සද්ධි සම්බොජ්ඣඞ්ගො සමාධි සම්බොජ්ඣඞ්ගො උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගො —— අට්ඨ මග්ගඞ්ගානි සම්මාදිට්ඨි සම්මාසඞ්කප්පො සම්මාවාචා සම්මාකම්මන්තො සම්මාආජීවො සම්මාවායාමො සම්මාසති සම්මාසමාධි —— එත්ථ පන චත්තාරො සතිපට්ඨානානි සම්මාසති එකාව පවුච්චති, තථා චත්තාරො සම්මප්පධානානි ච සම්මාවායාමො.

ඡන්දො චිත්තමුපෙක්ඛා ච සද්ධා පස්සද්ධි පීතියො
සම්මාදිට්ඨි ච සඞ්කප්පො වායාමො විරතිත්තයං ——

---

| ප්‍රශ්න | උත්තර |
|---|---|
| 34 ඉන්ද්‍රියයෝ කොතෙක් ද? | (සද්ධින්ද්‍රිය විරියින්ද්‍රිය සතින්ද්‍රිය සමාධින්ද්‍රිය පඤ්ඤින්ද්‍රිය යි) ඉන්ද්‍රිය පසෙකි. |
| 35 බලයෝ කොතෙක් ද? | (ශ්‍රද්ධාබල ය වීර්‍ය්‍යබල ය ස්මෘතිබල ය සමාධිබල ය ප්‍රඥාබල යයි) බල පසෙකි. |
| 36 බොධ්‍යඞ්ගයෝ කොතෙක් ද? | (ස්මෘති සම්බොධ්‍යඞ්ග ය ධර්මවිචය සම්බොධ්‍යඞ්ග ය වීර්‍ය්‍ය සම්බොධ්‍යඞ්ග ය ප්‍රීති සම්බොධ්‍යඞ්ග ය ප්‍රශ්‍රබ්ධි සම්බොධ්‍යඞ්ග ය සමාධි සම්බොධ්‍යඞ්ගය උපෙක්ෂා සම්බොධ්‍යඞ්ග යයි) බොධ්‍යඞ්ග සතෙකි. |
| 37 මාර්ගාඞ්ගයෝ කොතෙක් ද? | (සම්‍යක් දෘෂ්ටි ය සම්‍යක් සංකල්පනා ය සම්‍යක් වචන ය සම්‍යක් කර්මාන්ත ය සම්‍යක් ආජීව ය සම්‍යක් ව්‍යායාම ය සම්‍යක් ස්මෘති ය සම්‍යක් සමාධි ය යි) මාර්ගාඞ්ග අටෙකි. |
| 38 සතර සතිපට්ඨාන යන්නෙන් කුමක් කියන ලද්දේ ද? | එක ම සම්‍යක් ස්මෘතිය කියන ලදි. |
| 39 සතර සම්‍යක් ප්‍රධාන යන්නෙන් කුමක් කියන ලද්දේ ද? | එක ම සම්‍යක් ව්‍යායාමය කියන ලදි. |

සම්මාසති සමාධීති චුද්දසෙතෙ සභාවතො
සත්තතිංසප්පභෙදෙන සත්තධා තත්ථ සඞ්ගහො.

සඞ්කප්ප පස්සද්ධි ච පීතුපෙක්ඛා
ඡන්දො ච චිත්තං විරතිත්තයඤ්ච
නවෙකඨානා විරියං නවට්ඨ
සතී සමාධී චතු පඤ්ච පඤ්ඤා

සද්ධා දුඨානුත්තම සත්තතිංස
ධම්මානමෙසො පවරො විභාගො.

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 40 | බොධිපාක්ෂික ධර්මයෝ ස්වභාව ප්‍රභෙද සඞ්ග්‍රහ වශයෙන් කොතෙක් ප්‍රකාර ද? | ඡන්ද ය චිත්ත ය උපෙක්ෂාව ය ශ්‍රද්ධාව ය ප්‍රශ්‍රබ්ධි ය ප්‍රීති ය සම්‍යක් දෘෂ්ටි ය සම්‍යක් සංකල්ප ය සම්‍යක් ව්‍යායාම ය සම්‍යක් වාචාදි විරතිත්‍රය ය සම්‍යක් ස්මෘති ය සම්‍යක් සමාධිය යන මොහු ස්වභාව වශයෙන් තුදුසෙක් ද ප්‍රභෙද හෙයින් සතිසෙක් ද සඞ්ග්‍රහ වශයෙන් සත් ප්‍රකාරයෙක් ද වෙති. |
| 41 | එක් එක් තන්හි යුක්ත වූ මොහු කොතෙක් ද? | සම්‍යක්සංකල්ප ය ප්‍රශ්‍රබ්ධි ය ප්‍රීති ය උපෙක්ෂාව ය ඡන්ද ය චිත්ත ය විරතිත්‍රය ය යන මොහු එක් එක් තන්හි යුක්තවූමෝ වෙති. |
| 42 | වීර්‍ය්‍යය කොතෙක් තන්හි යුක්ත ද? | වීර්‍ය්‍යය නව තැනෙක්හි යුක්ත වේ.* |
| 43 | ස්මෘතිය කොතෙක් තන්හි යුක්ත ද? | ස්මෘති ය අට තැනෙක්හි යුක්ත වේ.† |
| 44 | සමාධිය කොතෙක් තන්හි යුක්ත ද? | සමාධි ය සතර තැනෙක්හි යුක්ත වේ.‡ |
| 45 | ප්‍රඥාව කොතෙක් තන්හි යුක්ත ද? | ප්‍රඥාව පස් තැනෙක්හි යුක්ත වේ.§ |
| 46 | ශ්‍රද්ධාව කොතෙක් තන්හි යුක්ත ද? | ශ්‍රද්ධාව (සද්ධින්ද්‍රිය ශ්‍රද්ධා බල වශයෙන්) දෙ තැනෙක්හි යුක්ත වේ. මේ උත්තම වූ සත්තිස් ධර්මයන්ගේ ප්‍රවර විභාග ය යි. |

* සම්‍යක් ප්‍රධාන චතුෂ්ක ය විරියිද්ධිපාද ය විරියින්ද්‍රිය ය විරියබල ය විරිය සම්බොජ්ඣඞ්ග ය සම්‍යග්ව්‍යායාම ය යන මේ වීර්‍ය්‍ය යුත් නව තැන් වේ.

† සතිපට්ඨාන චතුෂ්ක ය සතින්ද්‍රිය ය සතිබල ය සතිසම්බොජ්ඣඞ්ග ය සම්මාසතිය යන මේ ස්මෘතිය යුත් අට තැන් වේ.

‡ සමාධින්ද්‍රිය ය සමාධිබල ය සමාධිසම්බොජ්ඣඞ්ග ය සම්මාසමාධි ය යන මේ සමාධිය යුත් සතර තැන් වේ.

§ වීමංසිද්ධිපාද ය පඤ්ඤින්ද්‍රිය ය පඤ්ඤාබල ය ධම්මවිචය සම්බොජ්ඣඞ්ගය සම්මාදිට්ඨි ය යන මේ ප්‍රඥා යුත් පස් තැන් වේ.

සබ්බෙ ලොකුත්තරෙ හොන්ති නවා සංකප්ප පීතියො
ලොකියෙපි යථායොගං ඡබ්බිසුද්ධිපවත්තියං.

සබ්බසඞ්ගහෙ පඤ්චක්ඛන්ධා, රූපක්ඛන්ධො වෙදනාක්ඛන්ධො සඤ්ඤාක්ඛන්ධො සඞ්ඛාරක්ඛන්ධො විඤ්ඤාණක්ඛන්ධො. පඤ්චුපාදානක්ඛන්ධා, රූපුපාදානක්ඛන්ධො වෙදනුපාදානක්ඛන්ධො සඤ්ඤුපාදානක්ඛන්ධො සඞ්ඛාරුපාදානක්ඛන්ධො විඤ්ඤාණුපාදානක්ඛන්ධො. ද්වාදසායතනානි චක්ඛායතනං සොතායතනං ඝානායතනං ජිව්හායතනං කායායතනං මනායතනං රූපායතනං සද්දායතනං ගන්ධායතනං රසායතනං ඵොට්ඨබ්බායතනං ධම්මායතනං.

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 47 | ලොකොත්තර සිත්හි කොතෙක් ධම් වෙත් ද? | අට වැදෑරුම් වූ ලොකොත්තර සිත්හි සියලු සත්තිස් වැදෑරුම් ධම් යෝ වෙති. |
| 48 | විතක් ප්‍රීති ආදිය ය සියලු තන්හි වෙත් ද? | විතක් ප්‍රීති ආදිය ය කිසි තැනෙක්හි වේ.* |
| 49 | ලෞකික සිත්හි ද සත්තිස් ධම් කෙසේ වෙත් ද? | ලෞකික කුසල් සිත්හි ද ශීලාදි ෂඩ් විශුද්ධි පවත්නා කල්හි සත්තිස් ධම් යෝ යෙදෙන පරිද්දෙන් වෙති.† |
| 50 | ස්කන්ධයෝ කොතෙක් ද? | (රූප ස්කන්ධ ය වේදනා ස්කන්ධ ය සංඥා ස්කන්ධ ය සංස්කාර ස්කන්ධ ය විඥාන ස්කන්ධ යයි) ස්කන්ධ පසෙකි.‡ |
| 51 | උපාදාන ස්කන්ධයෝ කොතෙක් ද? | (රූපොපාදාන ස්කන්ධ ය වේදනොපාදාන ස්කන්ධ ය සංඥොපාදාන ස්කන්ධ ය සංස්කාරොපාදාන ස්කන්ධ ය විඥානොපාදාන ස්කන්ධ යයි) උපාදාන ස්කන්ධ පසෙකි.§ |
| 52 | ආයතනයෝ කොතෙක් ද? | (චක්ඛායතන ය සොතායතන ය ඝානායතන ය ජිව්හායතන ය කායායතන ය මනායතන ය රූපායතන ය සද්දායතන ය ගන්ධායතනය රසායතන ය ඵොට්ඨබ්බායතන ය ධම්මායතන යයි) ආයතන දොළොසෙකි.** |

* ද්විතීයාදි ධ්‍යාන පාදක කොට ඇති ලොකොත්තර සිත්හි විතර්කය ද චතුර්ථ පඤ්චම ධ්‍යාන පාදක කොට ඇති ලොකොත්තර සිත්හි ප්‍රීතිය ද නො උපදනා හෙයින් කිසි තැනෙක්හි වේ යි කියන ලදී.

† ලෞකික කුසල් සිත්හි විරති චෛතසිකයෝ අනියත ව උපදනා හෙයින් යෙදෙන පරිද්දෙන් යයි කීහ.

‡ සමූහාර්ථ වශයෙන් ස්කන්ධ යයි දත යුතු. අතීතාදි රූපය රූපස්කන්ධ නම් වේ. අතීතාදි භේද වේදනා චෛතසිකය ද සංඥා චෛතසිකය ද වේදනාසංඥා ද්වය ය හැර පනස් චෛතසික ද වේදනා ස්කන්ධ සංඥාස්කන්ධ සංස්කාරස්කන්ධ නම් වෙති. එකූන නවුති චිත්තය විඥානස්කන්ධ යි.

§ කාමුපාදානාදීන් විසින් දෘඪ කොට ගන්නා ලද හෙයින් උපාදාන නම් වෙති. උපාදානයන් විසින් දෘඪ කොට ගන්නා ලද රූපාදිය උපාදාන ස්කන්ධ යි. උපාදාන යන්ට විෂය භාවයෙන් ගන්නා ලද්දා වූ රූපාදිය ම දක්වන්නාහු "රූපුපාදානක්ඛන්ධො" යනාදිය කීහ.

** ද්වාරාලම්බන චිත්ත චෛතසිකයන් එකාන්තයෙන් ආය වන හෙයින් ද විස්තාර කරන හෙයින් ද සසර දුක්ට පමුණුවන හෙයින් ද ආයතනයෝ නම් වෙති. චක්ඛුව ම ආයතන වූයේ චක්ඛායතන යි. සෙස්ස ද එසේ නයයි.

16-2

අට්ඨාරස ධාතුයො චක්ඛුධාතු සොතධාතු ඝානධාතු ජිව්හාධාතු කායධාතු රූපධාතු සද්දධාතු ගන්ධධාතු රසධාතු ඵොට්ඨබ්බධාතු චක්ඛුවිඤ්ඤාණධාතු සොතවිඤ්ඤාණධාතු ඝානවිඤ්ඤාණධාතු ජිව්හාවිඤ්ඤාණධාතු කායවිඤ්ඤාණධාතු මනොධාතු ධම්මධාතු මනොවිඤ්ඤාණධාතු.

චත්තාරි අරියසච්චානි දුක්ඛං අරියසච්චං දුක්ඛසමුදයො අරියසච්චං දුක්ඛනිරොධො අරියසච්චං දුක්ඛනිරොධගාමිනිපටිපදා අරියසච්චං.

| ප්‍රශ්න | උත්තර |
|---|---|
| 53 ධාතූහු කොතෙක් ද? | (චක්ඛුධාතු ය සොතධාතු ය ඝානධාතු ය ජිව්හාධාතු ය කායධාතු ය රූපධාතු ය සද්දධාතු ය ගන්ධධාතු ය රසධාතු ය ඵොට්ඨබ්බධාතු ය චක්ඛුවිඤ්ඤාණධාතු ය සොතවිඤ්ඤාණධාතු ය ඝානවිඤ්ඤාණධාතු ය ජිව්හාවිඤ්ඤාණධාතු ය කායවිඤ්ඤාණධාතු ය මනොධාතු ය ධම්මධාතු ය මනොවිඤ්ඤාණධාතු යයි) ධාතු දස අටෙකි.† |
| 54 ආර්‍ය්‍ය සත්‍යයෝ කොතෙක් ද? | (දුක්ඛ ආර්‍ය්‍යසත්‍ය ය දුක්ඛසමුදය ආර්‍ය්‍යසත්‍ය ය දුක්ඛනිරොධ ආර්‍ය්‍ය සත්‍ය ය දුක්ඛනිරොධගාමිනීප්‍රතිපදා ආර්‍ය්‍යසත්‍ය යයි) ආර්‍ය්‍යසත්‍යයෝ සතරෙකි.* |

† "අත්තනො සභාවං ධාරෙන්තීති ධාතුයො" තමන්ගේ ස්වභාව දරන් නූ යි ධාතූහු නම් වෙති.

* "අරියකරණානි අරියානි තථානි භාවෙන සච්චානීති අරියසච්චානි" ආර්‍ය්‍යකාර බැවින් ආර්‍ය්‍යයහ. සත්‍ය භාවයෙන් සත්‍යයෝ නුයි. ආර්‍ය්‍ය සත්‍ය නම් වෙති. "ඉමානි හි චත්තාරො පටිපන්නකෙ චත්තාරො ඵලට්ඨෙ අට්ඨ අරියපුග්ගලෙ සාධෙන්ති" මොහු වනාහි සතර ප්‍රතිපන්නකයන් හෙවත් සතර මාර්ගස්ථයන් ද සතර ඵලස්ථයන් ද යන අෂ්ටාර්‍ය්‍ය පුද්ගලයන් සිද්ධ කෙරෙති. ආර්‍ය්‍යයන් විසින් පිළිපැද්ද යුතු බැවින් ඔවුන්ගේ හෝ සත්‍යය ආර්‍ය්‍ය සත්‍යයෝ නම් වෙති. "අරියස්ස වා සම්මාසම්බුද්ධස්ස සච්චානි තෙන දෙසිතත්තානි අරියසච්චානි" ආර්‍ය්‍ය වූ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේගේ සත්‍යයෝ හෝ උන්වහන්සේ විසින් දෙසනා කරන ලද බැවින් හෝ ආර්‍ය්‍යසත්‍යයෝ වෙති". "කුච්ඡිතත්තා තුච්ඡත්තා ච දුක්ඛං": නින්දිත බැවින් ද හිස් බැවින් ද දුක්ඛ නම් වේ. "සමුදෙති එතස්මා දුක්ඛන්ති සමුදයො" මේ කාරණ කොට ගෙන දුක් උපදවා නු යි සමුදය නම් වේ. තෘෂ්ණාව යි. දුක්ඛයාගේ සමුදය දුක්ඛසමුදය යයි. "දුක්ඛස්ස අනුප්පාදනිරොධො එත්ථ එතෙනවාති දුක්ඛනිරොධො". මෙයි මේ කාරණකොට ගෙන දුක්ඛයාගේ අනුප්පාදනිරොධය වේ නුයි දුක්ඛ නිරොධ නම් වේ. නිර්වාණ යයි. "දුක්ඛනිරොධං ගච්ඡති පටිපජ්ජති ච තං එතායාති දුක්ඛනිරොධගාමිනී පටිපදා" මෙය කාරණකොට ගෙන දුක් නිරුද්ධ කිරීමට පැමිණෙ යි ඒ පිළිපදින් නුයි දුක්ඛනිරොධගාමිනී ප්‍රතිපදා නම් වේ.- මාර්ගය යි.

එත්ථ පන චෙතසික සුඛුමරූප නිබ්බාන වසෙන එකූන සත්තති ධම්මා ධම්මායතන ධම්මධාතූති සංඛං ගච්ඡන්ති මනායතන මෙව සත්තවිඤ්ඤාණධාතු වසෙන භිජ්ජති෴

රූපඤ්ච වෙදනා සඤ්ඤා සෙසා චෙතසිකා තථා
විඤ්ඤාණමිති පඤ්චෙතෙ පඤ්චක්ඛන්ධාති භාසිතා෴

පඤ්චුපාදානක්ඛන්ධාති තථා තෙභූමකා මතා
භෙදාභාවෙන නිබ්බානං ඛන්ධ සඞ්ගහ නිස්සටං෴

ද්වාරාලම්බන භෙදෙන භවන්තායතනානි ච
ද්වාරාලම්බ තදුප්පන්න පරියායෙන ධාතුයො෴

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 55 | වේදනාදි එකුන් සැත්තෑවක් ධර්මයෝ කවර සංඛ්‍යාවකට යෙත් ද? | දෙපනස් චෛතසිකයන්ගේ ද (සොළොස්) සුඛුමරූප†යන්ගේ ද වශයෙන් එකුන් සැත්තෑවක් ධර්මයෝ ධර්මායතන සංඛ්‍යාවට ද ධර්මධාතු සංඛ්‍යාවට ද යෙත්.‡ |
| 56 | මනායතනය කෙසේ භෙද වේ ද? | මනායතනය ම සප්තවිඥාන ධාතු වශයෙන් භෙද වේ.* |
| 57 | පඤ්චස්කන්ධය යනු කුමක් ද? | රූපය ද වේදනාව ද සංඥාව ද වේදනා සංඥා දෙකින් අවශේෂ වූ දෙපනස් චෛතසිකයෝ ද විඤ්ඤාණය ද යන මොහු පස්දෙන පඤ්චස්කන්ධයෝ යයි කියන ලදහ. |
| 58 | පඤ්චෝපාදානස්කන්ධය යනු කුමක් ද? | (කාමරූපාරූප සංඛ්‍යාත) ත්‍රෛභූමික ධර්මයෝ පඤ්චෝපාදාන ස්කන්ධයෝයි. |
| 59 | නිර්වාණය ස්කන්ධ සංග්‍රහයට ඇතුළත් ද? | නිර්වාණය අතීතාදි භෙදයක් නැති හෙයින් ස්කන්ධ සංග්‍රහයෙන් වෙන් කරන ලදි. |
| 60 | කවරක්හුගේ භෙදයෙන් ද්වාදශායතනයෝ වෙත් ද? | චක්ෂුරාදි ද්වාරයන්ගේ ද ආලම්බනයන්ගේ ද ප්‍රභෙද හෙයින් චක්ෂ්වායතනාදි ද්වාදශායතනයෝ වෙත්. |
| 61 | කවර ක්‍රමයකින් අටළොස ධාතුහු වෙත් ද? | චක්ෂුරාදි ද්වාරයන්ගේ ද රූපාදි ආලම්බනයන්ගේ ද තද්ද්වාරාලම්බන දෙදෙනා නිසා උපන් චක්ෂුර්විඥානාදි ෂඩ්විධ විඥානයන්ගේ ද ක්‍රමයෙන් අටළොස ධාතුහු වෙත්. |

† සුඛුමරූප සොළොස 37 වැනි පිටේ දක්වා ඇත.

‡ දෙපනස් චෛතසිකයෝ ද සොළොස් සුඛුමරූපයෝ ද ධර්මායතන බවට ද ධම්මධාතු බවට ද පැමිණෙත් ය යනු අභිප්‍රාය යි.

* චක්ඛුවිඤ්ඤාණාදි පස ද මනොධාතු මනොවිඤ්ඤාණධාතු දෙක ද යන සත සප්තවිඥාන ධාතු යි.

දුක්ඛං තෙභූමකං වට්ටං තණ්හාසමුදයො භවෙ
නිරොධො නාම නිබ්බානං මග්ගො ලොකුත්තරො මතො.

මග්ගයුත්තා ඵලා චෙව චතුසච්චවිනිස්සටා
ඉති පඤ්චප්පභෙදෙන පවුත්තො සබ්බසඞ්ගහො.

ඉති අභිධම්මත්ථ සඞ්ගහෙ සමුච්චය සඞ්ගහ විභාගො නාම

## සත්තමො පරිච්ඡෙදො.

---

යෙසං සඞ්ඛත ධම්මානං යෙ ධම්මා පච්චයා යථා
තං විභාගමිහෙදානි පවක්ඛාමි යථාරහං.

---

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 62 | චතුසත්‍යය යනු කුමක් ද? | ත්‍රෛභූමික කාමාදි වෘත්තය දුඃඛ සත්‍ය යයි ද එක්සිය අටක් ප්‍රභේද ඇති තෘෂ්ණාව සමුදය සත්‍ය යයි ද නිර්වාණය තෙම මාර්ගඵලාලම්බන වූ නිරොධසත්‍ය යයි ද නිරොධගාමිනී ප්‍රතිපදා නාමයෙන් කියන ලද මාර්ගය තෙම ලොකොත්තර මාර්ග යයි ද දන්නා ලදී. |
| 63 | චතුසත්‍යයෙන් කුමක් වෙන් කරන ලද්දේ ද? | මාර්ගසම්ප්‍රයුක්ත ස්පර්ශාදි ධර්මයෝ ද සම්ප්‍රයුක්ත ධර්ම සහිත ඵලයෝ ද චතුසත්‍යයෙන් වෙන් කරන ලද්දෝය. |
| 64 | මිශ්‍ර සඞ්ග්‍රහය කොතෙක් ප්‍රකාරයකින් සඞ්ග්‍රහ කරන ලද්දේ ද? | මේ උක්ත නයින් පඤ්චස්කන්ධ පඤ්චොපාදානස්කන්ධ ද්වාදසායතන අෂ්ටාදශධාතු චතුස්සච්චය යන පඤ්ච ප්‍රකාරයෙන් සඞ්ග්‍රහ කරන ලදී. |

## සත්වන පරිච්ඡේදය නිමියේ යි.

---

| | | |
|---|---|---|
| 1 | සමුච්චය සඞ්ග්‍රහයට අනතුරුව කුමක් කියනු ලැබේ ද? | (ප්‍රත්‍යයන් විසින් කරන ලද යම් ප්‍රත්‍යයොත්පන්න ධර්මයෙකුන්ට යම් ධර්මයෙක් උත්පත්ති ස්ථිතිය පිණිස ප්‍රත්‍යයෝ වෙත් ද*) ඒ ප්‍රත්‍යයාකාර විභාගය සුදුසු පරිද්දෙන් කියනු ලැබේ. |

---

* "යො ධම්මො යස්ස ධම්මස්ස ඨිති යුප්පත්තියා පිච
උපකාරකොති සො තස්ස පච්චයොති පවුච්චති"

යම් ධර්මයෙක් යම් ධර්මයක්හුගේ සිටීම ඉපැදීම පිණිස යම් හෙයකින් උපකාර වේ ද ඒ එයට ප්‍රත්‍යය යයි කියනු ලැබේ.

පටිච්චසමුප්පාදනයො පට්ඨානනයොචෙති පච්චය සඞ්ගහො දුවිධො වෙදිතබ්බො.......තත්ථ තබ්භාවභාවීභාවාකාර මත්තොපලක්ඛිතො පටිච්චසමුප්පාදනයො පට්ඨාන නයො පන ආහච්ච පච්චයට්ඨිතිමාරබ්භ පවුච්චති උභයම්පන වොමිස්සෙත්වා පපඤ්චෙන්ති ආචරියා....... තත්ථ අවිජ්ජාපච්චයා සඞ්ඛාරා සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං,

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 2 | ප්‍රත්‍යය සඞ්ග්‍රහය කොතෙක් ප්‍රකාර ද? | (ප්‍රතීත්‍යසමුත්පාද නය පට්ඨාන නය යයි) ප්‍රත්‍යය සඞ්ග්‍රය දෙවි ප්‍රකාර වේ. |
| 3 | ප්‍රතීත්‍යසමුත්පාද නය යනු කුමක් ද? | ප්‍රත්‍යය ධර්මයන්ගේ භාවයෙහි වන සුලු වූ ප්‍රත්‍යයොත්පන්න ධර්මයන්ගේ වීම් සඞ්ඛ්‍යාත ආකාරමාත්‍රයෙන් උපලක්ෂිත වූ යේ ප්‍රතීත්‍යසමුත්පාද නයයි. |
| 4 | කුමකින් පට්ඨාන නයයි කියනු ලැබේ ද? | හෙතෙය් වශයෙන් පවත්නා ප්‍රත්‍යයන්ගේ ශක්තිය අරභයා පට්ඨාන නයයි කියනු ලැබේ.† |
| 5 | ප්‍රතීත්‍යසමුත්පාදාදිය කෙසේ විස්තර කෙරේ ද? | (ප්‍රතීත්‍ය සමුත්පාදනය ප්‍රස්ථාන නය යන දෙක වනාහි) මිශ්‍ර කොට ආචාර්යවරයෝ විස්තර කෙරෙති.‡ |
| 6 | අවිද්‍යාව හෙතුකොට කවර ධර්ම කොතෙක් වෙත් ද? | අවිද්‍යාව හෙතුකොට(කාමාවචර රූපාවචර තෙළෙස් කුශල චෙතනාවෝ ද ද්වාදශ අකුශල චෙතනාවෝ ද සතර අරූපාවචර කුශල චෙතනාවෝ ද යන පුණ්‍යාභිසංස්කාර අපුණ්‍යාභිසංස්කාර ආනෙඤ්ජාභිසංස්කාර සංඛ්‍යාත) එකුන් තිස් සංස්කාරයෝ වෙත්. |
| 7 | සංස්කාරය හෙතු කොට කවර ධර්මයෝ වේ ද? | සංස්කාරය හෙතු කොට (එකුන් විසි වැදෑරුම් වූ ද දෙතිස් වැදෑරුම් වූ ද විපාක චිත්ත නම් වූ)විඤ්ඤාණය වේ.§ |

† "නානාප්පකාරානි ඨානානි පච්චයා එත්ථාති පට්ඨානං" අයතක ප්‍රකාරවූ කාරණයෝ මෙහි ප්‍රත්‍යයෝ වෙත් නුයි පට්ඨාන නම් වේ.

‡ අමි වනාහි වෙන් වෙන් නොකොට දක්වන්න යනු අභිප්‍රාය යි.

§ පටිසන්ධි වසෙන එකූනවීසති විධං පවත්ති වසෙන ද්වත්තිංසවිධම්පි විපාක චිත්තං විඤ්ඤාණං නාම "උපෙක්ඛා සහගත සන්තීරණ ද්වය ද කාමාවචර මහාවිපාක අට ද රූපාවචර අරූපාවචර විපාක නවය යයි ප්‍රතිසන්ධි වශයෙන් එකුන්විසි වැදෑරුම් වූ ද ඒ එකුන් විස්ස සමඟ ද්විපඤ්චවිඤ්ඤාණයෝ ද සම්පටිච්ඡන ද්වය ද සොමනස්ස සහගත සන්තීරණය යයි පැවැතුම් වශයෙන් තෙතිස් වැදෑරුම්වූ ද විපාක චිත්තය විඤ්ඤාණ යයි කියන ලදි.

විඤ්ඤාණ පච්චයා නාමරූපං, නාමරූප පච්චයා සළායතනං, සළායතන පච්චයා ඵස්සෝ, ඵස්ස පච්චයා වේදනා, වේදනා පච්චයා තණ්හා, තණ්හා පච්චයා උපාදානං, උපාදාන පච්චයා භවෝ, භව පච්චයා ජාති, ජාති පච්චයා ජරා මරණං සෝක පරිදේව දුක්ඛ, දෝමනස්සුපායාසා සම්භවන්ති, එවමේතස්ස කේවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයෝ හෝතීති...... අයමෙත්ථ පටිච්ච සමුප්පාදනයෝ...

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 8 | විඤ්ඤාණය හේතු කොට කුමක් වේ ද? | විඤ්ඤාණය හේතු කොට (වේදනාදි ස්කන්ධ ත්‍රය සංඛ්‍යාත) නාමය ද භූත රූප උපාදායරූප භේද භෙයින් ද්විප්‍රකාර වූ කර්මජ) රූපය ද වේ.* |
| 9 | නාමරූපය හේතු කොට කුමක් වේ ද? | නාමරූපය හේතු කොට (චක්ෂුරාදි) ෂඩ්විධ වූ ආයතනය වේ. |
| 10 | ෂඩ් ආයතන හේතු කොට කුමක් වේ ද? | ෂඩ් ආයතනය හේතුකොට(චක්ෂූරාදි ෂඩ් ප්‍රකාර වූ) ස්පර්ශය වේ. |
| 11 | ස්පර්ශය හේතු කොට කුමක් වේ ද? | ස්පර්ශය හේතු කොට (සුඛදුඃඛොපෙක්ෂා වශයෙන් ත්‍රිවිධ) වේදනාව වේ. |
| 12 | වේදනාව හේතු කොට කුමක් වේ ද? | වේදනාව හේතු කොට(තෘෂ්ණාදි වශයෙන් ත්‍රිවිධ වූ ආලම්බනාදි වශයෙන් එක්සිය අටක් ප්‍රභේද වූ) තෘෂ්ණාව වේ. |
| 13 | තෘෂ්ණාව හේතු කොට කුමක් වේ ද? | තෘෂ්ණාව හේතු කොට (කාමෝපාදානාදි චතුර්විධ වූ) උපාදානය වේ. |
| 14 | උපාදානය හේතු කොට කුමක් වේ ද? | උපාදානය හේතුකොට (කාමභවාදි නවවිධ වූ)උපපත්තිභවය වේ. |
| 15 | භවය හේතු කොට කුමක් වේ ද? | භවය හේතු කොට (රූපාදි ස්කන්ධයන්ගේ) ඉපැදීම හෙවත් පහළ වීම වේ. |
| 16 | ඉපැදීම හේතු කොට කුමක් වේ ද? | ඉපැදීම හේතුකොට ජරාමරණය හා ශොක පරිදේව දුඃඛ දෞර්මනස්‍යොපායාස යන මොහු වෙත්. |
| 17 | සියලු දුඃඛයන්ගේ ඉපැදීම කෙසේ වේ ද? | මේ යථොක්ත ප්‍රත්‍යය පරම්පරා වශයෙන් චෘතාන දුඃඛ සංඛ්‍යාත වූ සියලු දුක් සමූහයාගේ ඉපැදීම වේ. |
| 18 | පටිච්ච සමුප්පාදන යෙහි විභාග කෙසේ දත යුතු ද? | පටිච්ච සමුප්පාදනයෙහි ද්වාදශාඞ්ගය, විංසත්‍යාකාරය, ත්‍රිසන්ධිය, චතුස්සංක්ෂේපය, ත්‍රිවෘත්තය, මූල් දෙදෙනය යන මේ විභාග දත යුතු. |

* "නාමන්ති වේදනාදිඛන්ධත්තයං රූපං පන භූතෝපාදාය භේදතෝ දුවිධං කම්මසමුට්ඨාන රූපං තදුභයම්පි ඉධ පටිසන්ධි විඤ්ඤාණ සහගතානි දට්ඨබ්බං". අභිධම්මත්ථ විභාවිනී.

තත්ථ තයො අද්ධා ද්වාදසඞ්ගානි වීසතාකාරා තිසන්ධි චතුසඞ්ඛෙපා තීණි වට්ටානි ද්වෙ මූලානි ච වෙදිතබ්බානි — කථං? අවිජ්ජා සඞ්ඛාරා අතීතො අද්ධා, ජාති ජරා මරණං අනාගතො අද්ධා, මජ්ඣෙ අට්ඨ පච්චුප්පන්නො අද්ධාති තයො අද්ධා — අවිජ්ජා සඞ්ඛාරා විඤ්ඤාණං නාම රූපං සළායතනං ඵස්සො වෙදනා තණ්හා උපාදානං භවො ජාති ජරා මරණන්ති ද්වාදසඞ්ගානි — සොකාදි වචනං පනෙත්ථ නිස්සන්ද ඵල නිදස්සනං, අවිජ්ජා සඞ්ඛාරග්ගහණෙන පනෙත්ථ තණ්හුපාදාන භවාපි ගහිතා භවන්ති, තථා තණ්හුපාදාන භවග්ගහණෙන ච අවිජ්ජා සඞ්ඛාරා ජාති ජරා මරණග්ගහණෙන ච විඤ්ඤාණාදි ඵලපඤ්චකමෙව ගහිතන්ති කත්වා —

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 18 | පටිච්ච සමුප්පාද නයෙහි විභාග කෙසේ දත යුතු ද? | පටිච්ච සමුප්පාද නයෙහි ද්වාදශාඞ්ගය, විංශත්‍යාකාරය, ත්‍රිසන්ධිය, චතුස්සංක්ෂේපය, ත්‍රිවෘත්තය, මූල් දෙදෙනය යන මේ විභාග දත යුතු. |
| 19 | ප්‍රතීත්‍ය සමුත්පාද නයෙහි අධ්වා හෙවත් කාල කොතෙක් ද? | අවිද්‍යා සංස්කාර ද්වය (අතීත හේතූන් ගෙන් ම මෙහි ග්‍රහණයෙන්) අතීත කාලය ද, ජරාමරණ ද්වය (දැන් හේතුවෙන් අනාගතයෙහි වන හෙයින්) අනාගත කාලය ද, මධ්‍යයෙහි වූ) විඥාන නාමරූපාදි අෂ්ටාඞ්ගයෝ (අතීත හේතුවෙන් මෙහි උපදනා හෙයින්) වර්තමාන කාලය දැයි කාල තුනෙකි. |
| 20 | ද්වාදශාඞ්ගයෝ කවරහු ද? | අවිද්‍යා ය සංස්කාර ය විඥාන ය නාම රූප ය ෂඩායතන ය ස්පර්ශ ය වේදනා ය තෘෂ්ණා ය උපාදාන ය භව ය ජාති ය ජරාමරණ ය යන මොහු ද්වාදශාඞ්ගයෝ යි.* |
| 21 | විංශත්‍යාකාරය කෙසේ ද? | අවිද්‍යා සංස්කාර ද්වය ගැනීමෙන් තෘෂ්ණා උපාදාන භවයන් ගැනේ. තෘෂ්ණා උපාදාන භවයන්ගේ ගැනීමෙන් අවිද්‍යා සංස්කාරයෝ ගැනෙත් යයි මෙසේ අවිද්‍යා සංස්කාර තෘෂ්ණා උපාදාන භවය යන අතීත හේතු පසෙක, ජාති ජරා මරණයන්ගේ ගැනීමෙන්ද විඥාන නාමරූප සළායතන ස්පර්ශ වේදනා යන ඵල පසම ගන්නා ලද හෙයින් දැන් ඵල පසෙක, දැන් අවිද්‍යාදි හේතු පසින් අනාගතයෙහි විඥානාදි ඵල පසෙකැයි මෙසේ විසති ආකාරය වේ. |

* සොකපරිදෙවාදි වචනය වනාහි ජාතියගේ අනුබන්ධ ඵල දැක්වීම හෙයින් අඞ්ගයන් කෙරෙහි නොකියන ලද්දේ යයි දත යුතු.

17-1

අතීතෙ හෙතවො පඤ්ච ඉදානි ඵල පඤ්චකං
ඉදානි හෙතවො පඤ්ච ආයතිං ඵල පඤ්චකන්ති

වීසතාකාරා තිසන්ධි චතුසංඛෙපා ච භවන්ති... අවිජ්ජා තණ්හුපාදානා ච කිලෙසවට්ටං, කම්මභව සඞ්ඛාතො භවෙකදෙසො සඞ්ඛාරා ච කම්මවට්ටං, උපපත්ති භව සඞ්ඛාතො භවෙකදෙසො අවසෙසා ච විපාක වට්ටන්ති තීණි වට්ටානි, අවිජ්ජා තණ්හා වසෙන ද්වෙ මූලානි ච වෙදිතබ්බානි...

තෙසමෙව ච මූලානං නිරොධෙන නිරුජ්ඣති
ජරා මරණමුච්ඡාය පීළිතා න මභිණ්හසො
ආසවානං සමුප්පාදා අවිජ්ජා ච පවත්තති...
වට්ටමබන්ධමිච්චෙවං තෙභූමක මනාදිකං
පටිච්ච සමුප්පාදොති පට්ඨපෙසි මහාමුනි...

---

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 22 | ත්‍රිසන්ධිය යනු කුමක් ද? | අතීත හෙතු පස හා වර්තමාන ඵල පස හා අතරද, වර්තමාන ඵල පස හා හෙතු ඵල පස හා අතරද, වර්තමාන හෙතු පඤ්චකය හා ආයති ඵල පඤ්චකය හා අතර ද යන අන්තර ත්‍රය ත්‍රිසන්ධි නම් වේ. |
| 23 | චතුස්සංක්ෂේපය යනු කුමක් ද? | අතීත හෙතුය, වර්තමාන විපාකය, වර්තමාන හෙතුය, අනාගත විපාකය යන සතර භාගය චතුස්සංක්ෂේප නම් වේ. |
| 24 | ත්‍රිවෘත්තය යනු කුමක් ද? | අවිද්‍යා තෘෂ්ණා උපාදාන යන ක්ලේශ වෘත්තය ද, කර්ම භව සඞ්ඛ්‍යාත භවෙකදේශය හා සංස්කාරයෝ ද යන කර්මවෘත්තය ද, උපපත්ති භව සඞ්ඛ්‍යාත භවෙකදේශය ද (විඥානාදි පඤ්චකය ජරා මරණ ආදිය වශයෙන්) අවශේෂයෝ ද යන විපාක වෘත්තය ද ත්‍රිවෘත්ත නම් වේ. |
| 25 | මුල් දෙදෙන කෙසේ දත යුතු ද? | අවිද්‍යාව එක් මූලෙක, තෘෂ්ණාව එක් මූලෙකැයි මුල් දෙදෙන මෙසේ දත යුතු. |
| 26 | වෘත්තය කෙසේ නිරුද්ධ වේ ද? | අවිද්‍යා තෘෂ්ණා යන වෘත්ත මූල දෙදෙනාගේ නිරුද්ධ වීමෙන් වෘත්තය නිරුද්ධ වේ. |
| 27 | අවිද්‍යාව කෙසේ වැඩේ ද? | (නිරතුරු ජරා මරණ සඞ්ඛ්‍යාත මූර්ච්ඡාවෙන් පීඩිත වූ සත්ත්වයන්ට) ආශ්‍රවයන්ගේ ඉපැදීම හෙතු කොට ගෙන අවිද්‍යාව වැඩේ. |
| 28 | පටිච්ච සමුප්පාදය කවරෙක් පැණැවූයේ ද? | (උක්තප්‍රකාරයෙන් නො සිඳ පවත්නා වූ ආදියක් නැත්තා වූ ත්‍රෛභූමික වූ ක්ලේශාදි වශයෙන් තුන් ප්‍රකාර වූ වෘත්තය පටිච්චසමුප්පාද යයි) සර්වඥයන් වහන්සේ විසින් පණවා වදාළේ ය. |

හෙතුපච්චයො ආරම්මණපච්චයො අධිපතිපච්චයො අනන්තරපච්චයො සමනන්තරපච්චයො සහජාතපච්චයො අඤ්ඤමඤ්ඤපච්චයො නිස්සයපච්චයො උපනිස්සයපච්චයො පුරෙජාතපච්චයො පච්ඡාජාතපච්චයො ආසෙවනපච්චයො කම්මපච්චයො විපාකපච්චයො ආහාරපච්චයො ඉන්ද්‍රියපච්චයො ඣානපච්චයො මග්ගපච්චයො සම්පයුත්තපච්චයො විප්පයුත්තපච්චයො අත්ථිපච්චයො නත්ථිපච්චයො විගතපච්චයො අවිගතපච්චයො අයමෙත්ථ පට්ඨානනයො.

| ප්‍රශ්න | උත්තර |
|---|---|
| 29 ප්‍රස්ථාන නය කෙසේද? | 1 හෙතු ප්‍රත්‍ය ය 2 ආරම්මණ ප්‍රත්‍ය ය 3 අධිපති ප්‍රත්‍ය ය 4 අනන්තර ප්‍රත්‍ය ය 5 සමනන්තර ප්‍රත්‍ය ය 6 සහජාත ප්‍රත්‍ය ය 7 අන්‍යොන්‍ය ප්‍රත්‍ය ය 8 නිශ්‍රය ප්‍රත්‍ය ය 9 උපනිශ්‍රය ප්‍රත්‍ය ය 10 පුරෙජාත ප්‍රත්‍ය ය 11 පශ්චාජ්ජාත ප්‍රත්‍ය ය 12 ආසෙවන ප්‍රත්‍ය ය 13 කර්ම ප්‍රත්‍ය ය 14 විපාක ප්‍රත්‍ය ය 15 ආහාර ප්‍රත්‍ය ය 16 ඉන්ද්‍රිය ප්‍රත්‍යය 17 ධ්‍යාන ප්‍රත්‍ය ය 18 මාර්ග ප්‍රත්‍ය ය 19 සම්ප්‍රයුක්ත ප්‍රත්‍ය ය 20 විප්‍රයුක්ත ප්‍රත්‍යය 21 අස්තිප්‍රත්‍යය 22 නාස්තිප්‍රත්‍ය 23 විගත ප්‍රත්‍ය ය 24 අවිගත ප්‍රත්‍ය ය යන මේ සූවිස්ස ප්‍රස්ථාන නය යි. |

1 "මූලට්ඨෙන හෙතු උපකාරට්ඨෙන පච්චයො" මූලාර්ථයෙන් හෙතු වූ උපකාරාර්ථයෙන් ප්‍රත්‍ය වූ ද ධර්මය හෙතු ප්‍රත්‍ය යයි.

2 අරමුණු භාවයෙන් උපකාර වූ ධර්මය ආරම්මණ ප්‍රත්‍ය යයි.

3 තමන් අයත් කොට පැවැතියන්ට ස්වාමි වූ ප්‍රත්‍යය අධිපති ප්‍රත්‍ය යයි.

4 ප්‍රත්‍යුත්පන්න ධර්මයන් හා අතුරක් නැත්තුයි අනන්තර ප්‍රත්‍ය යයි.

5 සංස්ථාන භාවයෙන් මනා වූ අනන්තර ප්‍රත්‍යය සමනන්තර ප්‍රත්‍ය යයි.

6 එක්ව ඉපැදීම වශයෙන් උපකාර වූ ධර්මය සහජාත ප්‍රත්‍ය යයි.

7 ඔවුනොවුන්ට උපස්ථම්භභාවයෙන් ප්‍රත්‍යය වූයේ අන්‍යොන්‍ය ප්‍රත්‍ය යයි.

8 නිශ්‍රයාකාරයෙන් උපකාර වූ ධර්මය නිශ්‍රය ප්‍රත්‍ය යයි.

9 බලවත් භාවයෙන් වූ නිශ්‍රයප්‍රත්‍යය උපනිශ්‍රය ප්‍රත්‍ය යයි.

10 පළමුව ඉපිද උපකාර වූ ධර්මය පුරෙජාත ප්‍රත්‍ය යයි.

[අනික් පිට බලනු.]

17-2

ඡධා නාමන්තු නාමස්ස පඤ්චධා නාමරූපිනං
එකධා පුන රූපස්ස රූපං නාමස්ස චෙකධා.

පඤ්ඤත්ති නාම රූපානි නාමස්ස දුවිධා ද්වයං
ද්වයස්ස නවධා චෙති ඡබ්බිධා පච්චයා කථං.

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 30 | ප්‍රත්‍යයෝ කොතෙක් ප්‍රකාර වෙත් ද? | (වෙදනාදි නාමය චිත්තාදි නාමයට ෂට් ප්‍රකාරයකින් ද, නාමය නාමරූපයන්ට පස් පරිච්ඡෙදකින් ද, නාමය රූපයට එක් පරිච්ඡෙදකින් ද, රූපය නාමයට එක් පරිච්ඡෙදකින් ද, ප්‍රඥප්ති නාම රූපයෝ නාමයට දෙපරිච්ඡෙදකින් ද, නාම රූප දෙක නාම රූප දෙකට නව පරිච්ඡෙදකින් දැයි) ප්‍රත්‍යයෝ ෂට් ප්‍රකාර වෙත්. |

11 පලමු උපන් රූපධර්මයන්ට උපස්ථම්භකත්වයෙන් උපකාර වූ ධර්මය පශ්චාජ්ජාත ප්‍රත්‍ය යයි.

12 ආසේවනාර්ථයෙන් උපකාර වූ ධර්මය ආසේවන ප්‍රත්‍ය යයි.

13 චිත්තප්‍රයෝග සඞ්ඛ්‍යාත කෘත්‍යයෙන් උපකාර වූ ධර්මය කර්ම ප්‍රත්‍ය යයි.

14 උත්සාහ රහිත ශාන්ත භාවයෙන් උපකාර වූ විපාකධර්මය විපාක ප්‍රත්‍ය යයි.

15 රූපාරූපයන්ට උපකාර වූ සිව් ආහාරයෝ ආහාර ප්‍රත්‍ය යයි.

16 ආධිපත්‍යාර්ථයෙන් උපකාර වූ විංශති ප්‍රකාර ඉන්ද්‍රියයෝ ඉන්ද්‍රිය ප්‍රත්‍ය යයි.

17 උපනිධ්‍යානාර්ථයෙන් උපකාර වූ විතර්කාදීහු ධ්‍යාන ප්‍රත්‍ය යයි.

18 සුගති දුගති පුණ්‍යාපුණ්‍යයෙන්ද නිර්යාණාර්ථයෙන් උපකාර වූ සම්‍යක්දෘෂ්ටි සම්‍යක්සංකල්පාදීහු මාර්ග ප්‍රත්‍ය යයි.

19 එකොත්පාදාදිභාව සඞ්ඛ්‍යාත සම්ප්‍රයොග ලක්ෂණයෙන් උපකාර වූ අරූප ධර්මයෝ සම්ප්‍රයුක්ත ප්‍රත්‍ය යයි.

20 විප්‍රයුක්ත භාවයෙන් උපකාර වූ ධර්මයෝ විප්‍රයුක්ත ප්‍රත්‍ය යයි.

21 අරූපධර්මයන්ගේ පැවැතීමට අවකාශදීමෙන් උපකාර වූ සමනන්තර නිරුද්ධ අරූපධර්මයෝ නාස්ති ප්‍රත්‍ය යයි.

22 ප්‍රත්‍යුත්පන්න ලක්ෂණයෙන් අස්තිත්වයෙන් උපකාර වූ සහජාත පුරෙජාතාදි ධර්මයෝ අස්ති ප්‍රත්‍ය යයි.

23 තමන් සවභාව විගතත්වයෙන් උපකාර වූ ධර්මයෝ විගත ප්‍රත්‍ය යයි.

24 නිරුද්ධයට පැමිණීම් වශයෙන් උපකාර වූ අස්තිප්‍රත්‍යය වූ ධර්මයෝ අවිගත ප්‍රත්‍ය යයි.

අනන්තර නිරුද්ධා චිත්ත චෙතසිකා ධම්මා පච්චුප්පන්නානං චිත්ත චෙතසිකානං ධම්මානං අනන්තර සමනන්තර නත්ථි විගත වසෙන, පුරිමානි ජවනානි පච්ඡිමානං ජවනානං ආසෙවන වසෙන, සහජාතා චිත්තචෙතසිකා ධම්මා අඤ්ඤමඤ්ඤං සම්පයුත්ත වසෙනෙති ඡද්ධා නාමං නාමස්ස පච්චයො හොති.

හෙතුජ්ඣානඞ්ගමග්ගඞ්ගානි සහජාතානං නාමරූපානං හෙත්වාදි වසෙන, සහජාතා චෙතනා සහජාතානං නාමරූපානං, නානාක්ඛණිකා චෙතනා කම්මාභිනිබ්බත්තානං නාමරූපානං කම්ම වසෙන, විපාකක්ඛන්ධා අඤ්ඤමඤ්ඤං සහජාතානං රූපානං විපාක වසෙනෙති ච, පඤ්චධා නාමං නාමරූපානං පච්චයො හොති.

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 31 | නාමය නාමයට ප්‍රත්‍යය වන්නා වූ ෂට් ප්‍රකාරය කෙසේ ද? | අනතුරුව නිරුද්ධ වූ චිත්ත චෛතසික ධර්මයෝ වර්තමාන චිත්ත චෛතසික ධර්මයන්ට අනන්තර සමනන්තර නාස්ති විගතප්‍රත්‍යය වශයෙන් ද පළමුකොට උපන් ජවනයෝ* පශ්චිම ජවනයන්ට ආසේවන ප්‍රත්‍යය වශයෙන් ද සහජාත චිත්ත චෛතසික ධර්මයෝ ඔවුනොවුන්ට සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය වශයෙන් දැයි මෙසේ ෂට් ප්‍රකාරයකින් නාමය නාමයට ප්‍රත්‍යය වේ. |
| 32 | නාමය නාමරූපයන්ට ප්‍රත්‍යය වන්නා වූ පස් ප්‍රකාරය කෙසේ ද? | හෙතුය, ධ්‍යානාඞ්ගය, මාර්ගාඞ්ගය, යන මොහු සහජාත නාමරූපයන්ට හෙත්වාදි වශයෙන් ද (හෙවත් හෙතු ප්‍රත්‍යය ධ්‍යානප්‍රත්‍යය මාර්ගප්‍රත්‍යය වශයෙන් ද) සහජාත චේතනා තොමෝ** සහජාත නාමරූපයන්ට ද† නානා ක්ෂණයෙහි (සිද්ධ වූ කුශලාකුශල) චේතනා කර්මයෙන් උපන් නාමරූපයන්ට‡ කර්ම (ප්‍රත්‍යය) වශයෙන් ද (ප්‍රතිසන්ධි විඥානාදි වූ) විපාක ස්කන්ධයෝ§ ඔවුනොවුන්ට හා සහජාත රූපයන්ට ද විපාක වශයෙන් දැයි මෙසේ පස් පරිද්දෙකින් නාමය නාමරූපයන්ට ප්‍රත්‍යය වේ. |

* පළමුකොට උපන් ජවනයෝ යනු මෙහි ඵලානන්තර ජවන් ආසේවන භාවයෙන් අනුද්ධෘත හෙයින් පළමුකියා කුශලාකුශල අව්‍යාකෘත ජවන යි. එයින් කීහ. පට්ඨානට්ඨකථායෙහි "ඵලානන්තරා පන ආසෙවන පච්චයො නත්ථි"යි.

** සහජාත චේතනා තොමෝ යනු යටත් පිරිසෙයින් චක්ඛුර්විඥානාදීන් සමග දැ උපදනා වූ චේතනා යි.

† සහජාත නාමරූපයන්ට යනු ප්‍රතිසන්ධියෙහි කර්මසමුට්ඨාන රූපයද පැවැත්මෙහි චිත්තසමුට්ඨානාදි රූප යි.

‡ නාමරූපයන්ට යනු මෙහි සියලු චේතනා තොමෝ නාමයන්ට ද පිළිසිඳීම එක්ව පැවැති චේතනා තොමෝ කර්මසමුට්ඨාන රූපයන්ට ද පැවැත්මෙහි රූපසමුට්ඨාපක සිත සහගියාවූ චේතනා තොමෝ චිත්තසමුට්ඨාන රූපයන්ට ද ප්‍රත්‍යය වේ.

§ විපාකස්කන්ධයෝ ය යනු ප්‍රතිසන්ධි විඥානාදි විපාක වූ අරූපස්කන්ධයෝ යි. කර්මසමුට්ඨාන රූපය වනාහි විපාක ව්‍යවහාරයක් නො ලබයි. අරූපධර්ම භාවයෙන් ද අරමුණු භාවයෙන් ද කර්මසමුට්ඨාන වූ අරූපධර්මයන්හි ම විපාකශබ්දය නාමා ආරූඪ වෙයිනි. 'අභිධම්මත්ථ විභාවනී'.

පච්ඡාජාතා චිත්ත චෙතසිකා ධම්මා පුරේ ජාතස්ස ඉමස්ස කායස්ස පච්ඡාජාත වසෙනෙති එකධාව නාමං රූපස්ස පච්චයො හොති......

ඡ වත්ථූනි පවත්තියං සත්තන්නං විඤ්ඤාණ ධාතූනං පඤ්චාලම්බනානි ච පඤ්චවිඤ්ඤාණවීථියා පුරේජාත වසෙනෙති එකධාව රූපං නාමස්ස පච්චයො හොති......ආරම්මණ වසෙන උපනිස්සය වසෙනෙති ච දුවිධා පඤ්ඤත්ති නාමරූපානි නාමස්සෙව පච්චයා හොන්ති......තත්ථ රූපාදි වසෙන ඡබ්බිධං හොති ආරම්මණං,

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 33 | නාමය රූපයට ප්‍රත්‍යය වන්නා වූ එක් ප්‍රකාරය කෙසේ ද? | පසුව උපන් චිත්ත චෛතසික ධර්මයෝ (ප්‍රත්‍යය ධර්මයන් කොරෙන්) පළමුකොට උපන් මේ රූපකායයට* පශ්චාජ්ජාත ප්‍රත්‍යය වශයෙන් දැයි මෙසේ එක් පරිද්දෙකින් නාමය රූපයට ප්‍රත්‍යය වේ. |
| 34 | රූපය නාමයට ප්‍රත්‍යය වන්නා වූ එක් ප්‍රකාරය කෙසේ ද? | ෂඩ්වස්තූහු පැවැත්මෙහි සප්තවිඥාන ධාතූනට ද රූපාදි පඤ්චාලම්බනයෝ පඤ්චවිඤ්ඤාණ වීථියට ද පළමු උපන් ප්‍රත්‍යය වශයෙනැයි එක් පරිද්දෙකින් ම රූපය තෙම නාමයට ප්‍රත්‍යය වේ.‡ |
| 35 | ප්‍රඥප්ති නාමරූපයෝ නාමයට ප්‍රත්‍යය වන්නා වූ දෙයාකාරය කෙසේ ද? | ආලම්බන (ප්‍රත්‍යය) වශයෙන් ද උපනිශ්‍රය(ප්‍රත්‍යය) වශයෙන් දැයි මෙසේ දෙපරිද්දෙකින් ප්‍රඥප්තිය නාමරූපය යන මොහු නාමයටම ප්‍රත්‍යයෝ වෙත්. |
| 36 | ආලම්බන ප්‍රත්‍යය යනු කුමක් ද? | රූපාරම්මණාදි වශයෙන් (හෙවත් රූපාරම්මණය සද්දාරම්මණය ගන්ධාරම්මණය රසාරම්මණය ඵොට්ඨබ්බාරම්මණය ධම්මාරම්මණය යන මෙයින්)ෂට් ප්‍රකාර වූ යේ ආලම්බන නම් වෙයි. |

* ප්‍රතිසන්ධියෙහි චක්ෂුරාදි වස්තූ හටගැන්මක් අවිද්‍යමාන හෙයින්ද විද්‍යමාන වුයේ ද ඡ ප් විඥානප්‍රත්‍යය බවකට නො පැමිණෙන හෙයින් ද හෘදයවස්තුව ද ප්‍රතිසන්ධිවිඥානය සමග උපන් හෙයින් ද ප්‍රථම කොටම උපන් රූපකායට යයි කියන ලදි.

‡ රූපධර්ම වූ චක්ෂුරාදි ෂඩ්වස්තූහු පැවැත්මෙහි චක්ෂුර්විඥානාදි නාම ධර්මයන්ට ද රූපාරම්මණාදි යම් කිසි අරමුණක් උපන් ඉක්බිති චක්ඛුවිඤ්ඤාණාදි නාමයෝ උපදිනා බැවින් ද එක් විධියකින් රූපය තෙම නාමයට පළමු උපන් ප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වේ යයි දත යුතු.

උපනිස්සයො පන තිවිධො හොති ආරම්මණූපනිස්සයො අනන්තරූපනිස්සයො පකතූපනිස්සයො චෙති,

තත්ථ ආලම්බනමෙව ගරුකතං ආරම්මනූපනිස්සයො අනන්තර නිරුද්ධා චිත්තචෙතසිකාධම්මා අනන්තරූපනිස්සයො.

රාගාදයො පන ධම්මා සද්ධාදයො ච සුඛං දුක්ඛං පුග්ගලො භොජනං උතු සෙනාසනඤ්ච යථාරහං අජ්ඣත්තඤ්ච බහිද්ධා ච කුසලාදි ධම්මානං කම්මං විපාකානන්ති ච බහුධා හොති පකතූපනිස්සයො.

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 37 | උපනිශ්‍රයප්‍රත්‍යය කොතෙක් ප්‍රකාර ද? | (ආලම්බනූපනිශ්‍රය අනන්තරූපනිශ්‍රය ප්‍රකෘතෝපනිශ්‍රය යි කියා) තුන් ප්‍රකාර යි. |
| 38 | ආලම්බනූපනිශ්‍රය යනු කුමක් ද? | රූපාදි අරමුණම ගරු කොට හෙවත් ප්‍රධාන කොට සිතනලද්දේ ආලම්බනූපනිශ්‍රය යයි. |
| 39 | අනන්තරූපනිශ්‍රය යනු කුමක් ද? | අනතුරුව නිරුද්ධ වූ චිත්ත චෛතසික ධර්මයෝ අනන්තරූපනිශ්‍ර යයි.† |
| 40 | කෙතෙක් ප්‍රකාරයෙන් ප්‍රකෘතෝපනිශ්‍රය වේ ද? | රාගාදි ධර්මයෝ ද* ශ්‍රද්ධාදි ධර්මයෝ ද‡ (විපාකාව්‍යාකෘත වූ) කායික සුවදුක් ද යහපත් පුද්ගලයන් හා සප්පායාදි භොජන ද එසේ ම වූ ඍතු සෙනාසන ද යන මෙය සුදුසු පරිද්දෙන් (රාගාදි ශ්‍රද්ධාදි සුවදුක් වශයෙන්) ආධ්‍යාත්මික වූයේ ද (පුද්ගල භෝජන ඍතු සයනාසන වශයෙන්) බාහ්‍ය වූයේ ද කුශල අව්‍යාකෘත ධර්මයන්ට ද (කුශලාකුශල) කර්මය තෙම විපාක යන්ට ද බොහෝ ප්‍රකාරයෙන් ප්‍රකෘතෝපනිශ්‍රය වේ. |

† යම් චිත්තචෛතසික ධර්මකෙනෙක් ඉපද නිරුද්ධ වෙත් ද ඒ නිරුද්ධ වූ චිත්තචෛතසිකයෝ අනන්තරූපනිශ්‍රය ය යනු භාව යි.

* ආදි ශබ්දයෙන් ද්වේෂ මෝහ මාන ප්‍රාර්ථනා යනා මොහු කියන ලදහ.

‡ ආදි ශබ්දයෙන් ශීල ශ්‍රැත ත්‍යාග ප්‍රඥා යනා මොහු ගනී.

අධිපති සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය ආහාර ඉන්ද්‍රිය විප්පයුත්ත අත්ථි අවිගත වසෙනෙති යථාරහං නවධා නාමරූපානි නාම රූපානං පච්චයා භවන්ති.

තත්ථ ගරුකතමාලම්බනං ආලම්බනාධිපති වසෙන නාමානං සහජාතාධිපති චතුබ්බිධොපි සහජාත වසෙන සහජාතානං නාම රූපානන්ති ච දුවිධො හොති අධිපති පච්චයො.

චිත්තචෙතසිකා ධම්මා අඤ්ඤමඤ්ඤං සහජාත රූපානඤ්ච මහාභූතා අඤ්ඤමඤ්ඤං උපාදාය රූපානඤ්ච පටිසන්ධික්ඛණෙ වත්ථු විපාකා අඤ්ඤමඤ්ඤන්ති ච තිවිධො හොති සහජාත පච්චයො.

චිත්තචෙතසිකා ධම්මා අඤ්ඤමඤ්ඤං මහාභූතා අඤ්ඤමඤ්ඤං පටිසන්ධික්ඛණෙ වත්ථුවිපාකා අඤ්ඤමඤ්ඤන්ති ච තිවිධො හොති අඤ්ඤමඤ්ඤ පච්චයො.

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 41 | නාමරූප ධර්මයෝ නාමරූප ධර්මයන්ට කොතෙක් පරිච්ඡෙදෙන් ප්‍රත්‍යයයෝ වෙත් ද? | (අධිපති ප්‍රත්‍යය සහජාත ප්‍රත්‍යය අන්‍යොන්‍ය ප්‍රත්‍යය නිශ්‍රය ප්‍රත්‍යය ආහාර ප්‍රත්‍යය ඉන්ද්‍රිය ප්‍රත්‍යය විප්‍රයුක්ත ප්‍රත්‍යය අස්ති ප්‍රත්‍යය අවිගත ප්‍රත්‍යය යන මොවුන්ගේ වශයෙන් සුදුසු පරිච්ඡෙදෙන්) නව පරිච්ඡෙදකින් ප්‍රත්‍යයයෝ වෙත්. ‡ |
| 42 | අධිපති ප්‍රත්‍යය තෙම කොතෙක් ආකාර ද? | ප්‍රත්‍යවෙක්ෂාදි වශයෙන් ගරු කොට සිතන ලද ආලම්බනය ආලම්බනාධිපති ප්‍රත්‍යය වශයෙන් නාමයන්ට ද ඡන්ද අධිපති වශයෙන් චතුර්විධ වූ සහජාතාධිපති තෙම සහජාත නාම රූපයන්ට (පැවැත්මෙහි සහජාතාධිපති වශයෙන් ද ප්‍රත්‍යය වන්නේ යයි අධිපති ප්‍රත්‍යය තෙම) ද්විප්‍රකාර වේ. |
| 43 | සහජාත ප්‍රත්‍යය කොතෙක් ප්‍රකාර ද? | [චිත්ත චෛතසික ධර්මයෝ ඔවුනොවුන්ට හා සහජාත රූපයන්ට ද, පෘථිව්‍යාදි මහාභූතයෝ ඔවුනොවුන්ට හා (වර්ණාදි) උපාදාය රූපයන්ට ද පිළිසිඳීම් කෙණෙහි හෘදය වස්තුව හා ප්‍රතිසන්ධි විඥානයෝ ඔවුනොවුන්ට දැයි] සහජාත ප්‍රත්‍යය තුන් ප්‍රකාර වේ. |
| 44 | අන්‍යොන්‍ය ප්‍රත්‍යය කොතෙක් ප්‍රකාර ද? | (චිත්ත චෛතසික ධර්මයෝ ඔවුනොවුන්ට ද, පඨවි ආදි මහා භූතයෝ ඔවුනොවුන්ට ද, පිළිසිඳීම් කෙණෙහි හෘදය වස්තුව හා ප්‍රතිසන්ධි විඥානාදීහු ඔවුනොවුන්ට දැයි අන්‍යොන්‍ය ප්‍රත්‍යය) තුන් ප්‍රකාර වේ. |

‡ මෙහි රාගාදිය ඇසුරු කොට කාම භවාදීන් අතුරෙහි ඉපැදීම පිණිස ද රාගාදිය සංසිඳීම පිණිස ද උපෝසථාදි කුශල ධර්මයන් කෙරෙති, රාගාදීහු හේතු කොට මතු මතුන් රාගාදීහු වෙත්; මෙහි ටීකා:- 'අභිධර්මාර්ථ විභාවනියෙහි' "කාමරාගාදයො නිස්සාය කාමභවාදීසු නිබ්බත්තනත්ථං රාගාදි වූපසමනත්ථඤ්චුපොසථ ඣානාභිඤ්ඤා විපස්සනා මග්ග භාවනා රාගාදි හෙතුකා ච උපරි උපරි රාගාදයො හොන්ති."

චිත්ත චෙතසිකා ධම්මා අඤ්ඤමඤ්ඤං සහජාත රූපානඤ්ච මහාභූතා අඤ්ඤමඤ්ඤං උපාදා රූපානඤ්ච ඡ වත්ථූනි සත්තන්නං විඤ්ඤාණධාතූනන්ති ච තිවිධො හොති නිස්සය පච්චයො. කබලීකාරො ආහාරො ඉමස්ස කායස්ස අරූපිනො ආහාරා සහජාතානං නාමරූපානන්ති ච දුවිධො හොති ආහාර පච්චයො.

පඤ්චප්පසාදා පඤ්චන්නං විඤ්ඤාණානං රූපජීවිතින්ද්‍රියං උපාදින්නරූපානං අරූපිනො ඉන්ද්‍රියා සහජාතානං නාමරූපානන්ති ච තිවිධො හොති ඉන්ද්‍රිය පච්චයො.

ඔක්කන්තික්ඛණෙ වත්ථු විපාකානං චිත්ත චෙතසිකා සහජාත රූපානං සහජාත වසෙන පච්ඡාජාතා චිත්ත චෙ... ධම්මා පුරෙජාතස්ස ඉමස්ස කායස්ස පච්ඡාජාත වසෙන ඡ වත්ථූ... පවත්තියං සත්තන්නං විඤ්ඤාණ ධාතූනං පුරෙජාත වසෙනාති ච තිවිධො හොති විප්පයුත්ත පච්චයො.

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 45 | නිශ්‍රය ප්‍රත්‍යය කොතෙක් ප්‍රකාර ද? | (චිත්ත චෛතසික ධර්මයෝ ඔවුනොවුන්ට හා සහජාත රූපයන්ට ද, මහා භූතයෝ ඔවුනොවුන්ට හා උපාදා රූපයන්ට ද, ෂට් වස්තූහු සප්තවිඥාන ධාතූන්ට දැයි නිශ්‍රය ප්‍රත්‍යය තෙමේ) තුන් ප්‍රකාර වේ. |
| 46 | ආහාර ප්‍රත්‍යය කොතෙක් ප්‍රකාර ද? | (කබලීකාර ආහාර තෙමේ මේ රූප කායට ද, අරූප ස්වභාව වූ ස්පර්ශ චේතනා විඥාන යයි කියන ලද ආහාරයෝ සහජාත නාමරූපයන්ට දැයි)ආහාර ප්‍රත්‍යය ද්විප්‍රකාර වේ.* |
| 47 | ඉන්ද්‍රිය ප්‍රත්‍යය කොතෙක් ප්‍රකාර ද? | (ප්‍රසාද රූපයෝ පස්දෙන පඤ්ච විඥානයන්ට ද, රූපජීවිතෙන්ද්‍රිය උපාදින්න සංඛ්‍යාත කර්මජ රූපයන්ට ද, අරූපස්වභා... ඉන්ද්‍රියයෝ සහජාතවූ නාමරූපයන්... ඉන්ද්‍රිය ප්‍රත්‍යය තුන් ප්‍රකාරයි. |
| 48 | විප්‍රයුක්ත ප්‍රත්‍යය කොතෙක් ප්‍රකාර ද? | (පිළිසිඳි ක්ෂණයෙහි හෘදය ව... ප්‍රතිසන්ධි විඥානාදීන්ට ද චිත්ත චෛතසික ධර්මයෝ සහජාත රූපයන්ට ද සහජාත ප්‍රත්‍යය වශයෙන් ද පසු උපන් චිත්ත චෛතසික ධර්මයෝ පළමු උපන් මේ රූපකායට පශ්චාජ්ජාත ප්‍රත්‍යය වශයෙන් ද ෂට් වස්තූහු පැවැත්මෙහි සප්ත විඥාන ධාතූන්ට පුරේජාත ප්‍රත්‍යය වශයෙන් දැයි විප්‍රයුක්ත ප්‍රත්‍යය තෙමේ ත්‍රිවිධ වේ. |

* අරූප වූ ස්පර්ශාදී ආහාරයෝ සහජාත නාමරූපයන්ට ප්‍රත්‍යයෝ වෙති යි ... ඒ හෙයින් අසංඥ සත්ත්වයන්ට සහජාතාහාරයක් නැති බැවින් "සබ්බෙ සත්තා ආහාරට්ඨිතිකා"යි කුමකට කියන ලද්දේ ද යත්? මෙහි සංඥාවෙනාහාර වශ ... ප්‍රාප්ත වූ සත්ත්වයන්ගේ හෝ ඒ එක්ව ගියාවූ සෙසු ආහාරයන්ගේ හෝ නාමරූප ... ප්‍රත්‍යයන් සොරෙන් පරිභාග ගෙන සියලු සත්ත්වයන්ගේ ආහාර ස්ථිතිබව කියන ලද්දේ යයි දත යුතු.

185-1

සහජාතං පුරේජාතං පච්ඡාජාතඤ්ච සබ්බථා
කබළීකාරො ආහාරො රූපජීවිතමිච්චයන්ති.

පඤ්චවිධො හොති අත්ථිපච්චයො අවිගතපච්චයො ච. ආරම්මණූපනිස්සය කම්මත්ථිපච්චයෙසු ච සබ්බෙපි පච්චයා සමොධානං ගච්ඡන්ති.

සහජාතරූපන්ති පනෙත්ථ සබ්බත්ථාපි පවත්තෙ චිත්තසමුට්ඨානානං, පටිසන්ධියං කටත්තාරූපානඤ්ච වසෙන දුවිධං හොතීති වෙදිතබ්බං.

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 49 | අස්තිප්‍රත්‍යය හා අවිගත ප්‍රත්‍යය කොතෙක් ප්‍රකාර ද? | (ත්‍රිවිධ වූ සහජාත ප්‍රත්‍යය ද, ද්විවිධ වූ පුරෙජාතය ද, එකවිධ වූ පශ්චාජ්ජාතය ද, කබලීකාර ආහාරය ද, රූපජීවිතෙන්ද්‍රිය ද යන මේ පඤ්ච ප්‍රකාර ප්‍රත්‍යය හෙවත් අස්තිප්‍රත්‍යය අවිගත ප්‍රත්‍යය ද වන හෙයින්) පඤ්ච ප්‍රකාරයි. |
| 50 | සියලු ප්‍රත්‍යයෝ කොතෙක් ප්‍රත්‍යයන් කෙරෙහි සඞ්ග්‍රහයට යෙත් ද? | සියලු ප්‍රත්‍යයෝ ආලම්බන ප්‍රත්‍යය, උපනිශ්‍රය ප්‍රත්‍යය, කර්ම ප්‍රත්‍යය, අස්ති ප්‍රත්‍යය යන ප්‍රත්‍යයන් සතරදෙනා කෙරෙහි සඞ්ග්‍රහයට යෙති.* |
| 51 | සහජාත රූපය කොතෙක් ප්‍රකාර ද? | මෙහි සහජාත රූපය සර්වප්‍රකාරයෙන්ම ප්‍රවෘත්ති ක්ෂණයෙහි චිත්තජ රූපයන්ගේ වශයෙන්ද පිළිසිඳි ක්ෂණෙහි කටත්තාරූප‡ හෙවත් කර්මජ රූපයන්ගේ වශයෙන් ද ද්වි ප්‍රකාර වේ. |

* සුවිසි ප්‍රත්‍යයන් අතුරෙහි වනාහි ඥෙය්‍යධර්මයන්ට අරමුණු නොවන ප්‍රත්‍යයෙක් නැති බැවින් ආලම්බනප්‍රත්‍යයෙහි ද, තමා තමන් ප්‍රත්‍යය වනලින් උපදනාවුන්ට උපනිශ්‍රය නොවන ප්‍රත්‍යයෙක් නැති හෙයින් උපනිශ්‍රය ප්‍රත්‍යයෙහි ද කර්මය නොහොත් ඉෂ්ටානිෂ්ට සියලු ප්‍රත්‍යය උපදවන බැවින් කර්මප්‍රත්‍යයෙහි ද, සියලු ප්‍රත්‍යයෝ පරමාර්ථ හෙයින් ලොක සම්මුති වශයෙන් විද්‍යමානයෝමැයි. අස්තිප්‍රත්‍යයෙහි ද ඇතුළු වෙති. 'අභිධම්මත්ථ විභාවිනියෙහි' මෙසේ කියන:—

"නාසිකො කොචි පච්චයො අත්ථි යො චිත්තචෙතසිකානං ආරම්මණභාවං න ගච්ඡෙය්‍ය සො සො පච්චුප්පන්නානං ච උපනිස්සය භාවං න ගච්ඡෙය්‍ය කම්ම හෙතුකත්තා ච ලොකප්පවත්තියා ඵල හෙතුපචාර වසෙන සබ්බෙපි කම්මසභාවං නාතිවත්තන්ති කෙවල පරමත්ථතො ලොකසම්මුති වසෙනාපි විජ්ජමානා යෙවාති සබ්බෙපි චතුසු සමොධානං ගච්ඡන්ති."

‡ 'කම්මස්ස කතත්තා නිබ්බත්තමානානි රූපානි කටත්තාරූපානි'

ඉති තෙකාලිකා ධම්මා කාලමුත්තා ච සම්භවා
අජ්ඣත්තඤ්ච බහිද්ධා ච සංඛතා සංඛතා තථා.

පඤ්ඤත්තිනාමරූපානං වසෙන තිවිධා ඨිතා
පච්චයා නාම පට්ඨානෙ චතුවීසති සබ්බථා.

තත්ථ රූපධම්මා රූපක්ඛන්ධොච චිත්ත චෙතසික සඞ්ඛාතා චත්තාරො අරූපිනො ඛන්ධා නිබ්බානඤ්චාති පඤ්චවිධම්පි අරූපන්ති ච නාමන්ති ච පවුච්චති.

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 52 | ත්‍රෛකාලිකාදි භෙද ප්‍රත්‍යයෝ ප්‍රස්ථාන ප්‍රකරණයෙහි කොතෙක් ප්‍රකාර ද? | මේ දක්වා ප්‍රකාරයෙන් ලැබෙන පරිද්දෙන් කාලත්‍රයයෙන් ඇත්තා වූ ද නිර්වාණ ප්‍රඥප්ති වශයෙන් කාලවිනිර්මුක්ත වූ ද (චක්ෂුරාදි රාගාදි ශ්‍රද්ධාදි වශයෙන්) ආධ්‍යාත්මික වූ ද පුද්ගල භොජන ඍතු වශයෙන් බාහ්‍ය වූ ද ප්‍රත්‍යය සමුත්පන්න බැවින් සංස්කෘත වූ ද අසමුත්පන්න බැවින් අසංස්කෘත වූ ද (ප්‍රඥප්ති නාම රූපයන්ගේ වශයෙන්) ත්‍රි ප්‍රකාරයෙන් සිටියා වූ ද ප්‍රත්‍යය ධර්මයෝ ප්‍රස්ථාන ප්‍රකරණයෙහි සූවිස්සෙකැයි කියන ලදහ.† |
| 53 | රූපස්කන්ධය යනු කුමක් ද? | ප්‍රඥප්ති නාමරූපයන් අතුරෙහි භූතොපාදාය භෙද සියලු රූපයෝ රූපස්කන්ධ යයි කියනු ලැබේ. |
| 54 | අරූපය හොහොත් නාමය යනු කුමක් ද? | චිත්ත චෛතසික යයි කියන ලද සතර අරූපස්කන්ධයෝ ද නිර්වාණය ද යන මේ පඤ්චප්‍රකාර ධර්මය තෙම අරූප යයි කියා ද නාම යයි කියා ද කියනු ලැබේ. |

† අනන්තර සමනන්තර ආසේවන නාස්ති විගත ප්‍රත්‍යය වශයෙන් පඤ්චවිධ වූ අතීත කාලික ප්‍රත්‍යයන්ගේ ද අතීත පච්ඡාජාත වශයෙන් ද්විකාලික වූ සෑම ප්‍රත්‍යයන්ගේ ද ආලම්බනාධිපති උපනිශ්‍රය ප්‍රත්‍යය වශයෙන් ත්‍රෛකාලික ප්‍රත්‍යයන්ගේ ද අවශේෂ හේතු ප්‍රත්‍යයාදී වූ පච්ඡාජාත පශ්චාද් ප්‍රත්‍යයන්ගේ ද වශයෙන් ත්‍රෛකාලික ප්‍රත්‍යයෝ ද දත යුතු. මෙම ටීකාවෙහි "අනන්තර සමනන්තරා සෙවන නත්ථි විගතා වසෙන ද්විකාලිකාය ආලම්බනාධිපති උපනිස්සය පච්චයානං තිකාලිකානං ඉතරෙසං පඤ්ඤත්තිකානං පච්චුප්පන්නකාලිකානඤ්ච වසෙන කාලත්තය වසෙනාහ".

18-2

තතො අවසෙසා පඤ්ඤත්ති පන පඤ්ඤාපියත්තා පඤ්ඤත්ති පඤ්ඤාපනතො පඤ්ඤත්තීති ච, දුවිධා හොති..........

කථං තං තං භූත විපරිණාමාකාරමුපාදාය තථා තථා පඤ්ඤත්තා භූමි පබ්බතාදිකා සම්භාර සන්නිවෙසාකාරමුපාදාය ගෙහ රථ සකටාදිකා, ඛන්ධපඤ්චකමුපාදාය පුරිස පුග්ගලාදිකා,

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 55 | ප්‍රඥප්තිය කොතෙක් ප්‍රකාර ද? | නාම රූප දෙකින් අවශෙෂ වූ ප්‍රඥප්තිය වනාහි පණවන ලද බව හෙයින් ප්‍රඥප්ති යයි කියා ද* පණවන හෙයින් ප්‍රඥප්ති යයි කියා ද† ද්වි ප්‍රකාර වේ. |
| 56 | භූමිපර්වතාදි ප්‍රඥප්තිය කෙසේ ද? | පඨවි ආදි ඒ ඒ මහාභූතයන්ගේ විපරිනාමාකාරය නිසා ඒ ඒ ප්‍රකාරයෙන් පණවන ලද භූමි පර්වතාදිය භූමි ප්‍රඥප්ති පර්වතප්‍රඥප්ති ආදිය නම් වේ. |
| 57 | ගෙහ රථාදි ප්‍රඥප්තිය කෙසේ ද? | දරුමත්තිකාදි උපකරණයන්ගේ සන්නිවෙසාකාරය හෙවත් රචනාදි විශිෂ්ට වූ ඒ ඒ සංස්ථානාකාරය නිසා ගෘහප්‍රඥප්ති රථප්‍රඥප්ති සකට ප්‍රඥප්ති ආදිය වේ. |
| 58 | පුරුෂ පුද්ගලාදි සත්ත්ව ප්‍රඥප්තිය කෙසේ ද? | හෙතු ඵලාදි වශයෙන් පවත්නා වූ රූපාදි ස්කන්ධපඤ්චකය නිසා පුරුෂ ප්‍රඥප්ති පුද්ගලප්‍රඥප්ති ආදි සත්ත්ව ප්‍රඥප්තිය වේ. |

*"පඤ්ඤාපියන්ති තෙන තෙන පකාරෙන ඤාපියන්ති බොධියන්තීති පඤ්ඤත්ති' ඉමිනා රූපාදි ධම්මානං සමූහ සන්තානාදි අවත්ථා විසෙසාදි භෙද සම්මුති සච්චභූතා උපාදාය පඤ්ඤත්ති සඞ්ඛාතා අත්ථපඤ්ඤත්ති වුත්තා.

මේ (කර්මසාධන ප්‍රඥප්ති) ශබ්දයෙන් රූපාදි ධර්මයන්ගේ සමූහ සන්තානාදි අවස්ථා විශෙෂාදි භෙද ඇති සම්මුතිසත්‍ය නම් වූ උපාදාය ප්‍රඥප්ති සඞ්ඛ්‍යාත වූ අර්ථප්‍රඥප්තිය කියන ලදී.

† "පඤ්ඤාපියතීතිපි පඤ්ඤත්ති ඉමිනායි පඤ්ඤාපෙතීති ලද්ධනාමා අත්ථානං අභිධාන සඞ්ඛාතා නාම පඤ්ඤත්ති වුත්තා"—මෙ (කර්තෘ සාධන ප්‍රඥප්ති) ශබ්දයෙන් වනාහි පණවා යයි ලබන ලද නාමින් (සම්මුති පරමාර්ථ සඞ්ඛ්‍යාත අර්ථයන්ගේ) අභිධාන යයි කියන ලද නාම ප්‍රඥප්තිය කියන ලදී. 'අභිධම්මත්ථ විභාවිනී යෙයි "සද්දසඤ්ඤෙත්"යනාදියෙහි මෙන් අර්ථ භාගවත ශබ්දය ද ඒ ශබ්දයෙන් හැඟෙවූ අර්ථය ද වශයෙන් ප්‍රඥප්තිය නොහොත් පණවන ලද නාමය වාච්‍ය වාචක භෙදයෙන් ද්විප්‍රකාර කොට කියන ලද්දේය යන අභිප්‍රාය යි.

චන්දාවත්තනාදිකමුපාදාය දිසා කාලාදිකා අසම්ඵුට්ඨාකාරමුපාදාය කූප ගුහාදිකා තං තං භූත නිමිත්තං භාවනා විසෙසඤ්ච උපාදාය කසිණනිමිත්තාදිකා චෙති......

එවමාදිප්පභෙදා පන පරමත්ථතො අවිජ්ජමානාපි අත්ථච්ඡායාකාරෙන චිත්තුප්පාදානමාලම්බනභූතා තං තං උපාදාය උපනිධාය කාරණං කත්වා තථා තථා පරිකප්පියමානා සඞ්ඛායන්ති සමඤ්ඤායන්ති වොහරීයන්ති පඤ්ඤපීයන්තී ති පඤ්ඤත්තී ති පවුච්චති, අයං පඤ්ඤත්ති පඤ්ඤපියත්තා පඤ්ඤත්ති නාම......

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 59 | දිසා කාලාදි ප්‍රඥප්තිය කෙසේ ද? | චන්ද්‍ර සූර්‍ය්‍ය නක්ෂත්‍රයන්ගේ මේරුව ප්‍රදක්ෂිණා වශයෙන් උදයාදි ආවර්ත්තනාකාරය නිසා දික් ප්‍රඥප්ති කාල ප්‍රඥප්ති ආදිය වේ. |
| 60 | කූප ගුහාදි ප්‍රඥප්තිය කෙසේ ද? | (ඒ ඒ රූප කලාපයන් විසින්) අසංස්පෘෂ්ට වූ (සුසිරාදි) ආකාරය නිසා කූප ප්‍රඥප්ති ගුහා ප්‍රඥප්ත්‍යාදිය වේ. |
| 61 | කසිණ නිමිත්තාදි ප්‍රඥප්තිය කෙසේ ද? | ඒ ඒ (පෘථිවි කසිණාදි) මහාභූත නිමිත්ත ද (පරිකර්මාදි භේද) භාවනා විශේෂය ද නිසා කසිණ නිමිත්තාදි වූ ප්‍රඥප්ත්‍යාදිය වේ. |
| 62 | පණවනු ලබන අර්ථ ප්‍රඥප්තිය කෙසේ ද? | කසිණුග්ඝාටිමාකාසාදි භේද ඇති (චිත්ත චෛතසිකාදි) පරමාර්ථ හෙයින් අවිද්‍යමාන වූ ද පරමාර්ථ ධර්මයන්ට සදෘශාකාරයෙන් චිත්තෝත්පාදයන්ට ආලම්බන වූ ඒ ඒ දෙය කාරණකොට ගෙන ඒ ඒ ආකාරයෙන් (ශාසනයෙහි ද ලෝකයෙහි ද ශරීරය සත්ත්වය නිරෝධය යනාදි ක්‍රමයෙන්) කල්පනා කරනු ලබන්නේ ප්‍රකාශ කරනු ලැබෙයි, දන්නා ලැබෙයි, ව්‍යවහාර කරනු ලැබෙයි, පණවනු ලැබෙනුයි ප්‍රඥප්ති යයි කියනු ලැබේ. මේ අර්ථප්‍රඥප්ති තොමෝ පණවනු ලබන හෙයින් ප්‍රඥප්ති නම් වේ. |

පඤ්ඤාපනතො පඤ්ඤත්ති පන නාම නාමකම්මාදි නාමෙන පරිදීපිතා.

සා විජ්ජමාන පඤ්ඤත්ති අවිජ්ජමාන පඤ්ඤත්ති විජ්ජමානෙන අවිජ්ජමාන පඤ්ඤත්ති අවිජ්ජමානෙන විජ්ජමාන පඤ්ඤත්ති විජ්ජමානෙන විජ්ජමාන පඤ්ඤත්ති අවිජ්ජමානෙන අවිජ්ජමාන පඤ්ඤත්ති චෙති ඡබ්බිධා හොති.

තත්ථ යදා පන පරමත්ථතො විජ්ජමානං රූපවෙදනාදිං එතාය පඤ්ඤාපෙන්ති තදායං විජ්ජමාන පඤ්ඤත්ති.

යදා පන පරමත්ථතො අවිජ්ජමානං භූමිපබ්බතාදිං එතාය පඤ්ඤාපෙන්ති තදායං අවිජ්ජමාන පඤ්ඤත්තීති පවුච්චති.

| ප්‍රශ්න | උත්තර |
|---|---|
| 63 ශබ්ද ප්‍රඥප්ති යනු කොතෙකින් ප්‍රකාශ කරන ලද්දේ ද? | පඤ්ඤපන හෙයින් ශබ්ද ප්‍රඥප්තිය වනාහි නාමය නාමකර්මය නාමධෙයය නිරුක්තිය ව්‍යඤ්ජනය අභිලාපය යන ෂට් විධ වූ නාම හෝ ප්‍රකාශ කරන ලදි.* |
| 64 නාම ප්‍රඥප්ති කොතෙක් ප්‍රකාර ද? | නාම ප්‍රඥප්ති තොමෝ විද්‍යමාන ප්‍රඥප්තිය, අවිද්‍යමාන ප්‍රඥප්තිය, විද්‍යමානයෙන් අවිද්‍යමාන ප්‍රඥප්තිය, අවිද්‍යමානයෙන් විද්‍යමාන ප්‍රඥප්තිය, විද්‍යමානයෙන් විද්‍යමාන ප්‍රඥප්තිය. අවිද්‍යමානයෙන් අවිද්‍යමාන ප්‍රඥප්ති යයි ෂට් ප්‍රකාර වේ. |
| 65 විද්‍යමාන ප්‍රඥප්ති යනු කුමක් ද? | යම් කලෙක පරමාර්ථ වශයෙන් හෙවත් ස්වභාව වශයෙන් පවත්නා වූ රූප වේදනාදි සමස්ත කාරණ කොට රූප වේදනා සඤ්ඤා යනාදීන් ප්‍රකාශ කෙරෙත් ද එකල (එය පවත්නා ස්වභාවයක් ම හෙයින්) විද්‍යමාන ප්‍රඥප්ති යයි කියන ලදි. |
| 66 අවිද්‍යමාන ප්‍රඥප්ති යනු කුමක් ද? | යම් කලෙක්හි ස්වභාව වශයෙන් නොපවත්නා වූ භූමි පර්වතාදි සමස්ත කාරණ කොට භූමිය පර්වතය සත්වය බාලය තරුණය වෘද්ධය ආකාශය යනාදීන් කියත් නම් එකල්හි එය අවිද්‍යමාන ප්‍රඥප්ති නම් වේ. |

* “අත්ථෙ නමතීති නාමං තං අන්වත්ථරූළ්හී වසෙන දුවිධං සාමඤ්ඤ ගුණ ක්‍රියා යදිච්ඡා වසෙන චතුබ්බිධං නාමමෙව කරීයතීති නාමකම්මං නාමමෙව නාමධෙය්‍යං අක්ඛර ද්වාරෙන අත්ථං නීහරිත්වා උපපත්තිතො කථනං නිරුත්ති, අත්ථං බ්‍යඤ්ජයතීති බ්‍යඤ්ජනං, අභිලපතීති අභිලාපො, සද්දගත අක්ඛර සන්නිවෙසක්කමො” අර්ථයන් කරා නැමේ නු යි නාම නම. ඒ අන්වර්ථ රූඪි වශයෙන් ද්වි ප්‍රකාර යි. සාමාන්‍ය ගුණ ක්‍රියා යදෘච්ඡක වශයෙන් සතර ප්‍රකාර යි. නාමය ම නාමකර්ම යි. නාමධෙයය ද එසේ යි. අක්ෂර මුඛයෙන් අර්ථ ගෙන කීම නිරුක්ති යයි. අර්ථ ප්‍රකාශ කිරීම ව්‍යඤ්ජනයි. කීම අභිලාපයි. (ඒ) ශබ්දගත අක්ෂරයන්ගේ සන්නිවේශ ක්‍රමය යි.

උභින්නං පන වොමිස්සක වසෙන සෙසා යථාක්කමං ඡළභිඤ්ඤො, ඉත්ථිසද්දො, චක්ඛුවිඤ්ඤාණං රාජපුත්තො ති ච වෙදිතබ්බා.

වචීඝොසානුසාරෙන සොතවිඤ්ඤාණවීථියා
පවත්තානන්තරුප්පන්න මනොද්වාරස්ස ගොචරා.
අත්ථා යස්සානුසාරෙන විඤ්ඤායන්ති තතො පරං
සායං පඤ්ඤත්ති විඤ්ඤෙය්‍යා ලොකසඞ්කෙත නිම්මිතා.

ඉති අභිධම්මත්ථ සඞ්ගහෙ පච්චය සඞ්ගහ විභාගො නාම

## අට්ඨමො පරිච්ඡෙදො.

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 67 | විද්‍යමානයෙන් අවිද්‍යමානය යනාදි ප්‍රඥප්තිහු කෙසේ ද? | විද්‍යමාන අවිද්‍යමාන දෙදෙනාගේ ව්‍යාමිශ්‍ර වශයෙන් අවශේෂ ප්‍රඥප්තීහු ද පිළිවෙළින් ෂඩභිඥය, ස්ත්‍රී ශබ්දය, චක්ෂුර්විඥානය, රාජපුත්‍ර යයි කියා ද දත යුතුයි.* |
| 68 | නාම ප්‍රඥප්තිය මනොද්වාරයට කෙසේ ගොචර වේ ද? | භූමි පර්වත රූප වේදනාදි වාග්ඝොෂානුසාරයෙන් හෙවත් ආලම්බන කාරණයෙන් ශ්‍රොත්‍රවිඥාන වීථියගේ ප්‍රවෘත්ති අනන්තරයෙහි උපන්නා වූ නාමචින්තනාකාරයෙන් පැවැත් මනොද්වාරික විඥානයට ගොචර වේ. |
| 69 | සම්මුතිපරමාර්ථ ධර්මයෝ කෙසේ දැනගනු ලැබෙත් ද? | නාම ප්‍රඥප්තිය මනොද්වාරික විඥානයට ගොචර වූ ඉක්බිති යම් ඒ නාමප්‍රඥප්ති අනුව පැවැත්මෙන් සම්මුති පරමාර්ථ භෙද වූ භූමි පර්වත රූප වේදනාදි අර්ථයෝ දැනගනු ලැබෙති. |
| 70 | අර්ථාදි භෙද වූ නාමප්‍රඥප්ති තොමෝ කෙසේ සිද්ධ වී ද? | මනො ද්වාරයෙන් ගන්නා ලද අර්ථාදි භෙද වූ අක්ෂරාවලි සඞ්ඛ්‍යාත ඒ නාමප්‍රඥප්ති තොමෝ ලොක සඞ්කෙතයෙන් (හෙවත්) ලොක ව්‍යවහාරයෙන් සිද්ධ වී යයි දත යුත්තීය.† |

## අට වන පරිච්ඡෙදය නිමියේ යි.

* “ඡළභිඤ්ඤො” යන්නෙහි ෂට් අභිඥා ඇත්තේය ප්‍රකාශ වේ. ෂට් අභිඥා නාම පඤ්චාභිඥා හා ආශ්‍රවක්ෂයඥානයයි. මෙහි අභිඥාවන් විද්‍යමාන හෙයින් ද එම පුද්ගලයාගේ අවිද්‍යමානභාවයෙන් ද විද්‍යමානයෙන් අවිද්‍යමාන ප්‍රඥප්ති නම් වේ. “ඉත්ථි සද්දො” යනු ස්ත්‍රීන්ගේ අවිද්‍යමානභාවය ද ශබ්දයාගේ විද්‍යමානභාවය ද ඇති හෙයින් අවිද්‍යමානයෙන් විද්‍යමාන ප්‍රඥප්ති නම් වේ. “චක්ඛු විඤ්ඤාණං” යනු ප්‍රසාද චක්ෂුෂ්හුගේ ද නාමාතිශ්‍රිත විඥානයාගේ ද විද්‍යමාන බව හෙයින් විද්‍යමානයෙන් විද්‍යමාන ප්‍රඥප්ති නම් වේ. “රාජපුත්තො” යනු රජහුගේ ද පුත්‍රයාගේ ද සම්මුති සත්‍ය බව හෙයින් අවිද්‍යමානයෙන් අවිද්‍යමාන ප්‍රඥප්ති නම් වේ.

† මෙහි ශ්‍රොත්‍ර විඥාන වීථියට අනතුරුව නැඟී වූ මනොද්වාරික වීථිය ද ශ්‍රොත්‍ර

[අනික් පිට බලනු.]

සමථ විපස්සනානං භාවනානමිතො පරං
කම්මට්ඨානං පවක්ඛාමි දුවිධම්පි යථාක්කමං.

තත්ථ සමථ සඞ්ගහෙ තාව දස කසිණානි දස අසුභා දස අනුස්සතියො, චතස්සො අප්පමඤ්ඤායො, එකා සඤ්ඤා, එකං වවත්ථානං චත්තාරො ආරුප්පා චෙති සත්තවිධෙන සමථකම්මට්ඨාන සඞ්ගහො,

රාග චරිතා දොස චරිතා මොහ චරිතා සද්ධා චරිතා බුද්ධි චරිතා විතක්ක චරිතා චෙති ඡබ්බිධෙන චරිත සඞ්ගහො.

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 1 | ප්‍රත්‍යය නිර්දේශයට ඉක්බිති කුමක් කියන්නේ ද? | ප්‍රත්‍යය නිර්දේශයෙන් මත්තෙහි නීවරණයන්ගේ ව්‍යුපසමනාර්ථයෙන් සමථ සඞ්ඛ්‍යාත වූ ද අභිඥාදි විවිධාකාර දර්ශනාර්ථයෙන් විදර්ශනා සඞ්ඛ්‍යාත වූ ද ද්විප්‍රකාර වූ සමථ විදර්ශනාවන්ගේ කර්මස්ථානය යථාක්‍රමයෙන් කියන්නේය. |
| 2 | පළමුකොට කවර සඞ්ග්‍රහයක විභාග කියනු ලැබේ ද? | (සමථ විදර්ශනා සඞ්ඛ්‍යාත වූ ද්විප්‍රකාර භාවනාවන් අතුරෙන් ප්‍රථමකොට) සමථභාවනා සඞ්ග්‍රහයෙහි විභාග කියනු ලැබේ. |
| 3 | සමථ භාවනා කමට හන් කොතෙක් ප්‍රකාර ද? | (දස කසිණයෝය, දස අශුභයෝය, දස අනුස්මෘතිහුය, සතර අප්‍රමාණ්‍යයෝය එක ම සංඥය, එක ම ව්‍යවස්ථාන[ය], සතර ආරූප්‍යයෝ යයි) සමථභාවනා කමටහන සත් ප්‍රකාර යහ. |
| 4 | චරිතයෝ කොතෙක් ප්‍රකාර ද? | රාග චරිතය, දෝස චරිතය, මෝහ චරිතය, සද්ධා චරිතය, බුද්ධි චරිතය, විතර්ක චරිත යයි ෂට් ප්‍රකාරයහ.* |

විඥානයෙන් ම සඞ්ග්‍රහ කොට ශ්‍රොත්‍රවිඥාන වීථියයි කියන ලදි. 'ඝටාදි සද්දං' යි සුණන්තස්ස එකොකං සද්දං ආරබ්භ පච්චුප්පන්නාතීතාරම්මණ වසෙන දෙව දෙව ජවන වාරා බුද්ධියා ගහිතං නාම පණ්ණත්තිභූතං අක්ඛරාවලිමාරබ්භ එකොහි එවං සොත විඤ්ඤාණ වීථියා අනන්තරාය සද්දාරම්මණාය ජවනවීථියා අනන්තරං නාමපණ්ණත්ති ගහණං තතොපරං අත්ථාවබොධොති ආචරියා" ඝටාදි ශබ්ද අසන්නාහට වනායි එකී එකී ශබ්දයක් අරභයා වර්තමානාරම්මණ අතීතාරම්මණ වශයෙන් ජවන් වාරයෝ දෙදෙක දෙදෙක ද බුද්ධියෙන් ගන්නා ලද නාම ප්‍රඥප්ති වූ අක්ෂරාවලිය නිසා එක් ජවනවාරයකැයි මෙසේ ශ්‍රොත්‍ර විඥානවීථියට අනතුරු වූ ශබ්දාරම්මණ ජවනවීථියට අනතුරුව නාම ප්‍රඥප්තියගේ ගැනීම වන්නේය, එයින් මත්තෙහි අර්ථාවබොධ වන්නේ යයි ආචාර්‍ය්‍යවරයෝ කියත්. 'අභිධම්මත්ථ විභාවිනී'.

* මෙයි දක්වූ ෂඩ්විධ චරිතය විස්තර හෙයින් තෙසැට ආකාරයක් කොට දක්වති. ඒ සඳහා පූර්වාචාර්‍ය්‍යයන් විසින් මෙසේ කියන ලදි.

රාගාදිකො තිකො සත්ත සත්ත සද්ධාදිකො තිකො
එක ද්වි තික මූලම්හි මිස්සතො සත්ත සත්තකං.—

දෘෂ්ටියක් සමග සිව්සැට ආකාරයෙක් ද වර්ණිතා කෙරෙති. විස්තර අභිධර්මාර්ථ විභාවිනියෙන් බලනු.

පරිකම්ම භාවනා, උපචාර භාවනා, අප්පනා භාවනාචෙති තිස්සො භාවනා......

පරිකම්ම නිමිත්තං උග්ගහනිමිත්තං පටිභාග නිමිත්තඤ්චෙති තීණි නිමිත්තානි ච වෙදිතබ්බානි......

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 5 | භාවනාවෝ කොතෙක් ප්‍රකාර ද? | [1]පරිකම් භාවනා ය, [2]උපචාර භාවනා ය, අර්පණා භාවනා යයි භාවනා තුනෙකි. |
| 6 | නිමිති කොතෙක් ද? | [3]පරිකම් නිමිත්ත ය [4]උද්ග්‍රහ නිමිත්ත ය [5]ප්‍රතිභාග නිමිත්ත යයි නිමිති තුනෙකි. |

1 “භාවනාය ආදිකම්මභූතා පුබ්බභාග භාවනා පරිකම්ම භාවනා නාම” භාවනාවට ආදිකම් වූ පූර්වභාග භාවනා තොමෝ ‘පරිකම් භාවනා’ නම් වේ.

2 “නීවරණානං වික්ඛම්භනතො පට්ඨාය ගොත්‍රභූ පරියොසානා කාමාවචර භාවනා උපචාරභාවනා නාම” කාමච්ඡන්දාදී පඤ්ච නීවරණයන්ගේ විෂ්කම්භනයෙහි පටන් ගොත්‍රභූ විථාය කෙළවර කොට ඇති කාමාවචර භාවනා තොමෝ අර්පණා භාවනාවට සමීප චාරී හෙයින් ‘උපචාර භාවනා’ නම් වේ.

3 “පරිකම්මස්ස නිමිත්තං ආරම්මණත්තාති පරිකම්ම නිමිත්තං” අරමුණු වන බැවින් පරිකම් සංඛ්‍යාත ආදිභාවනා කර්මයට නිමිත්ත ‘පරිකම් නිමිත්ත’ නම් වේ. කසිණ මණ්ඩලාදිය යි.

4 “තදෙව චක්ඛුනා දිට්ඨං විය මනසා උග්ගහෙතබ්බං නිමිත්තං උග්ගණ්හන්තස්ස වා නිමිත්තං උග්ගහනිමිත්තං”......අරමුණු ඇසින් දක්නා ලද්දක්හු මෙන් සිතින් උගත යුතු වූ නිමිත්ත උද්ග්‍රහණය කරන්නහුගේ හෝ නිමිත්ත ‘උග්ගහනිමිත්ත’ නම් වේ.

5 “වණ්ණාදි කසිණ දොස රහිතං තප්පටිභාගං භාවනාමයං නිමිත්තං උපචාර අප්පනාහමාරම්මණත්තාති පටිභාග නිමිත්තං”...... වර්ණාදි කසිණ දෝෂ රහිත වූ තත්සදෘශ වූ භාවනාමය නිමිත්ත උපචාර අර්පණාවන්ට අරමුණු වන බැවින් ‘පටිභාග නිමිත්ත’ නම් වේ.

“පඨවියෙව පඨවිකසිණං පටිභාග නිමිත්තං තදාරම්මණඤ්ච ඣානං පඨවි කසිණන්ති වුච්චති” පෘථිවියම පෘථිවි කසිණ යි. ප්‍රතිභාග නිමිත්ත ද ඊට අරමුණු වූ ධ්‍යානය ද පෘථිවි කසිණ යයි කියනු ලැබේ. සෙස්ස ද මෙසේ යි. “පඨවි ආදීනි චත්තාරි භූත කසිණානි නීලාදීනි චත්තාරි වණ්ණ කසිණානි පරිච්ඡින්නො ආකාසො ආකාසකසිණං චක්ඛුදි ආලොකො ආලොක කසිණං”.

කථං? පඨවි කසිණං ආපො කසිණං තෙජො කසිණං වායො කසිණං නීල කසිණං පීත කසිණං ලොහිත කසිණං ඔදාත කසිණං ආකාස කසිණං ආලොක කසිණඤ්චෙති ඉමානි දස කසිණානි නාම.— උද්ධුමාතකං විනීලකං විපුබ්බකං විච්ඡිද්දකං වික්ඛායිතකං වික්ඛිත්තකං හතවික්ඛිත්තකං ලොහිතකං පුළවකං අට්ඨිකඤ්චෙති ඉමෙ දස අසුභා නාම.— බුද්ධානුස්සති ධම්මානුස්සති සඞ්ඝානුස්සති සීලානුස්සති චාගානුස්සති දෙවතානුස්සති උපසමානුස්සති මරණානුස්සති කායගතාසති ආනාපානසතිචෙති ඉමා දස අනුස්සතියො නාම.—

| ප්‍රශ්න | උත්තර |
|---|---|
| 7 කසිණ කොතෙක් ද? | පඨවි කසිණය, ආපො කසිණය, තෙජො කසිණය, වායො කසිණය, නීල කසිණය, පීත කසිණය, ලොහිත කසිණය, ඔදාත කසිණය, ආකාශ කසිණය, ආලොක කසිණ යයි කසිණ දසයකි. |
| 8 අසුභ කොතෙක් ද? | ඉදිමී ගියා වූ මළසිරුරය, නිල් වූ මළ සිරුරය, (නව දොරින්) පුයා වහනය වන මළසිරුරය, මැදින් දෙකඩව සිඳි මළසිරුරය (සොණ සිගාලාදීන් විසින්) කඩා කනු ලබන මළසිරුරය, ඒ ඒ තැන්හි විසිරෙණ ලද මළසිරුරය, කාකපදාකාර ආයුධයෙන් පැහැර අනෙකප්‍රකාරව දමනලද මළසිරුරය, ලෙහෙ වැගිරෙන මළ සිරුරය, කෘමීන් වහනය වන මළ සිරුරය, ඇටසැකිල්ල (හෝ අස්ථික) යයි අශුභ දශයෙකි. |
| 9 අනුස්මෘති කොතෙක් ද? | [1]බුද්ධානුස්මෘතිය, [2]ධම්මානුස්මෘතිය, [3]සඞ්ඝානුස්මෘතිය, [4]ශීලානුස්මෘතිය [5]ත්‍යාගානුස්මෘතිය, [6]දෙවතානුස්මෘතිය, [7]උපසමානුස්මෘතිය, [8]මරණානුස්මෘතිය, [9]කායගතාසතිය, [10]ආනාපානස්මෘතිය යන මේ අනුස්මෘතීනු දශ දෙනෙකි. |

1 "ඉතිපිසො භගවා අරහං" යනාදි වූ බුදුගුණ සිහිකිරීම 'බුද්ධානුස්මෘති' යයි.

2 "ස්වාක්ඛාතො" යනාදි වූ දහම් ගුණ සිහි කිරීම 'ධර්මානුස්මෘති' යයි.

3 "සුපටිපන්නො" යනාදි සඞ්ඝ ගුණ සිහි කිරීම 'සඞ්ඝානුස්මෘති' යයි.

4 තමන්ගේ සුපිරිසුදු සිල් ගුණ සිහි කිරීම 'ශීලානුස්මෘති' යයි.

5 නොමසුරු බැව් ආදි තමන්ගේ ත්‍යාග ගුණ සිහි කිරීම 'ත්‍යාගානුස්මෘති' යයි.

[අනික් පිට බලනු]

මෙත්තා කරුණා මුදිතා උපෙක්ඛා චෙති ඉමා චතස්සො අප්පමඤ්ඤායො නාම බ්‍රහ්මවිහාරොති ච පවුච්චති......ආහාරෙ පටිකූල සඤ්ඤා එකාසඤ්ඤා නාම, චතුධාතු වවත්ථානං එකං වවත්ථානං නාම, ආකාසානඤ්චායතනාදයො චත්තාරො ආරුප්පා නාමාති සබ්බථාපි සමථනිද්දෙසෙ චත්තාලීස කම්මට්ඨානානි භවන්ති......

චරිතාසු පන දස අසුභා කායගතාසති සඞ්ඛාතා කොට්ඨාස භාවනා ච රාග චරිතස්ස සප්පායා......

| ප්‍රශ්න | උත්තර |
|---|---|
| 10 අප්‍රමාණ්‍ය යනු කුමක් ද? | මෛත්‍රී ය කරුණා ය මුදිතා ය උපෙක්ෂා ය යන මොහු සතර දෙන අප්‍රමාණ්‍යයෝ යි. |
| 11 අප්‍රමාණ්‍යයන්ට කුමක් කියත් ද? | අප්‍රමාණ්‍යයන්ට උත්තම විහාර භාවයෙන් හෝ උත්තමයන්ගේ විහාර භාවයෙන් බ්‍රහ්මවිහාරයෝ යයි ද කියති. |
| 12 එකාම සංඥා යනු කුමක් ද? | ආහාරයෙහි ප්‍රතිකූල වශයෙන් පැවැති සංඥාව එකාම සංඥා නම් වේ. |
| 13 ඒකාම ව්‍යවස්ථානය යනු කුමක් ද? | පඨවි ආදි වූ සතර ධාතුන්ගේ ලක්ෂණාදි යෙයින් නිශ්චය කිරීම එකව ව්‍යවස්ථාන නම් වේ. |
| 14 ආරූප්‍යයෝ යනු කුමක් ද? | ආකාසානඤ්චායතනාදි වූ සතර දෙන ආරූප්‍යයෝ නම් වෙති. |
| 15 කම්සථාන කොතෙක් ද? | සර්වප්‍රකාරයෙන් සමථනිර්දෙශයෙහි මේ සතළිස් කම්සථාන කොතෙක් වෙති. |
| 16 රාගචරිතයාහට කවර කම්සථාන සප්පාය ද? | රාග චරිතයාහට* දස අසුභයෝ ද කායගතාසති සඞ්ඛ්‍යාත වූ කෙසාදි කොට්ඨාශ භාවනාව ද යන කම්සථානයෝ (එකොළොස) සප්පාය යි හෙවත් සැප එළවන්නෝ ය.‡ |

*"රාගොච්චරිතං එතස්සාති රාගචරිතො රාග බහුලො පුග්ගලො" රාගය මොහුගේ ස්වභාවකොට ඇත් තු යි රාගචරිත නම්. රාගබහුල පුද්ගලයා යි. ද්වේෂ චරිතාදීන් කෙරෙහි ද මෙසේ යි.

‡"රාගස්ස උජුවිපච්චනීකා භාවනා අසුභකම්මට්ඨානං තස්ස සප්පායං" රාගයට ඉතාම විරුද්ධ බැවින් අශුභ කර්මස්ථානය ඒ රාගචරිත පුද්ගලයාහට සප්පාය යි.

6 දෙවතාවන් සාක්ෂිස්ථානයෙහි තබා තමන්ගේ ශ්‍රද්ධාදි ගුණ සිහි කිරීම 'දෙවතානුස්මෘති' යයි.

7 සියලු දුක් සංසිඳීම සඞ්ඛ්‍යාත වූ නිවන් ගුණ සිහි කිරීම 'උපසමානුස්මෘති' යයි.

8 ජීවිතෙන්ද්‍රියොපච්ඡෙදක වූ මරණයාගේ සිහි කිරීම 'මරණානුස්මෘති' යයි.

9 කෙසාදි කොට්ඨාසයන්හි පැවැති සිහිය 'කායගතාසති' යයි.

10 ආශ්වාස ප්‍රශ්වාස අරමුණු කොට පැවැති සිහිය 'ආනාපාන සති' යයි.

19-2

චතස්සො අප්පමඤ්ඤායො නීලාදීනි ච චත්තාරි කසිණානි දොසචරිතස්ස, ආනාපානං මොහචරිතස්ස විතක්කචරිතස්ස ච, බුද්ධානුස්සති ආදයො ඡ සද්ධාචරිතස්ස, මරණ උපසමසඤ්ඤා වවත්ථානානි බුද්ධිචරිතස්ස...... සෙසානි පන සබ්බානිපි කම්මට්ඨානානි සබ්බෙසම්පි සප්පායානි...... තත්ථාපි කසිණෙසු පුථුලං මොහචරිතස්ස ඛුද්දකං විතක්කචරිතස්සෙව......

අයමෙත්ථ සප්පායභෙදො.

---

භාවනාසු පන සබ්බත්ථාපි පරිකම්මභාවනා ලබ්භතෙව, බුද්ධානුස්සති ආදිසු අට්ඨසු සඤ්ඤාවවත්ථානෙසු චාති දසසු කම්මට්ඨානෙසු උපචාරභාවනාව සම්පජ්ජති, නත්ථි අප්පනා......

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 17 | ද්වේෂ චරිතයාහට කවර කම්ස්ථාන සප්පාය ද? | සතර අප්‍රමාණ්‍යයෝය, නීලාදි වූ වර්ණකසිණයෝ සතරදෙනය යන (අට)කම්ස්ථානයෝ ද්වේෂ චරිතයාහට සප්පාය වෙයි. |
| 18 | මොහ විතර්ක චරිත දෙදෙනාට කවර කමටහනක් සැප ද? | ආශ්වාස ප්‍රශ්වාස නිමිත්තාලම්බන සඞ්ඛ්‍යාත වූ ආනාපානසති කමටහන සැප යි. |
| 19 | ශ්‍රද්ධා චරිතයාහට කවර කම්ස්ථානයක් සප්පාය ද? | බුද්ධානුස්මෘති ආදි වූ ෂට් අනුස්මෘති කම්ස්ථානයෝ ශ්‍රද්ධා බුද්ධි චරිත යන්ට හෙතුස්වභාවයක් හෙයින් සප්පාය යි. |
| 20 | බුද්ධි චරිතයාහට කුමන කම්ස්ථාන සප්පාය ද? | මරණානුස්මෘතිය, උපසමානු ස්මෘතිය, ප්‍රතිකූලසංඥය, චතුර්ධාතුව්‍යවස්ථානය යන මොහු(සත් දෙන)ගම්භීරත්වයෙන් බුද්ධියට විෂය හෙයින් බුද්ධි චරිතයාහට සප්පාය යි. |
| 21 | සියල්ලන්ට සප්පාය වූ කම්ස්ථාන කුමක් ද? | ඉතිරි සියලු කම්ස්ථාන හෙවත් භූත කසිණ සතර ද ආකාස කසිණය ද ආලොක කසිණය ද අරූප චතුෂ්කය ද යන මේ දශකම්ස්ථානයෝ සියල්ලන්ට සප්පායයෝ යි. |
| 22 | මොහ චරිතයාහට කොබඳු කසිණයක් සැප ද? | මොහ චරිතයාහට (දස) කසිණයෙහි ඖදාරික කසිණය සැපයි. |
| 23 | විතර්ක චරිතයාහට කොබඳු කසිණයක් සැප ද? | විතර්ක චරිතයාහට (දස) කසිණයෙහි කුඩා කසිණය සැපයි. |
| 24 | සියලු කම්ස්ථානයෙහි කුමන භාවනාවක් ලැබේ ද? | සියලු සතළිස් කම්ස්ථානයෙහි පරිකර්ම භාවනා තොමෝ ලැබේමය(හැම තන්හි) අර්පණාභාවනාව නැත්තිය. |
| 25 | කොතෙක් කම්ස්ථානයන්හි උපචාර භාවනාව සිද්ධ වන්නී ද? | බුද්ධානුස්මෘති ආදි වූ අට අනුස්මෘතියෙහි ද සංඥ ව්‍යවස්ථාන දෙක්හි ද යන දශවිධ කම්ස්ථානයෙහි උපචාර භාවනා සිද්ධ වන්නීය. අර්පණා නැත්තීය. |

සෙසෙසු පන සමතිංස කම්මට්ඨානෙසු අප්පනා භාවනාපි සම්පජ්ජති. තත්ථාපි දස කසිණානි ආනාපානඤ්ච පඤ්චකජ්ඣානිකානි, දස අසුභා කායගතාසති ච පඨමජ්ඣානිකා, මෙත්තාදයො තයො චතුක්කජ්ඣානිකා, උපෙක්ඛා පඤ්චමජ්ඣානිකා, ඉති ඡබ්බීසති රූපාවචරජ්ඣානිකානි කම්මට්ඨානානි, චත්තාරො පන ආරුප්පා ආරුප්පජ්ඣානිකා.

අයමෙත්ථ භාවනාභෙදො.

---

නිමිත්තෙසු පන පරිකම්මනිමිත්තං උග්ගහනිමිත්තඤ්ච සබ්බත්ථාපි යථාරහං පරියායෙන ලබ්භන්තෙව,

| ප්‍රශ්න | උත්තර |
|---|---|
| 26 කෙතෙක් කම්ස්ථානයන්හි අර්පණාව සිද්ධ වන්නී ද? | අවශෙෂ වූ දශකසිණයෙහි හා දස අසුභයෙහි ද කායගතාසති ආනාපානසති දෙක්හි ද සතර අප්‍රාමාණ්‍යයන් හා සතර ආරූප්‍යයන්හි ද යන සමතිස් කම්ස්ථානයන්හි සිද්ධ වන්නීය. |
| 27 පඤ්චක ධ්‍යාන ඇත්තා වූ කම්ස්ථානයෝ කවරහු ද? | සමතිස් කම්ස්ථානයන් අතුරෙහි පෘථිවිකසිණාදි දස කසිණයෝ ද ආනාපානසතිය ද යන මොහු(එකොළොස් දෙන) පඤ්චකධ්‍යාන ඇත්තාහු වෙති |
| 28 ප්‍රථමධ්‍යානිකයෝ කවරහු ද? | දස අසුභයෝ ද කායගතාසතිය ද යන මොහු (එකොළොස) ප්‍රථමධ්‍යානිකයෝයි. |
| 29 චතුෂ්කධ්‍යානිකයෝ කවරහු ද? | මෛත්‍රී කරුණා මුදිතා යන තුන් දෙන චතුෂ්ක ධ්‍යානිකයෝයි. |
| 30 පඤ්චම ධ්‍යාන ඇත්තේ කුමක් ද? | උපෙක්ෂා තොමෝ පඤ්චමධ්‍යාන ඇත්තීය. |
| 31 රූපාවචර ධ්‍යාන ඇති කම්ස්ථානයෝ කෙතෙක් ද? | දස කසිණයෝ ද ආනාපානසතිය ද දස අසුභයෝ ද කායගතා සතිය ද මෛත්‍රී ආදී වූ සතර අප්‍රාමාණ්‍යයෝ ද යන මේ රූපාවචර ධ්‍යාන ඇති කම්ස්ථානයෝ සවිස්සෙකි. |
| 32 අරූපාවචර ධ්‍යානිකයෝ කවරහු ද? | කසිණුග්ඝාටිමාකාසාදි චතුර්විධ අරූපාවචරාලම්බනයෝ* අරූපාවචර ධ්‍යානිකයෝති. |
| 33 පරිකර්ම උද්ග්‍රහ නිමිත්ත ද්වය කෙතෙක් කම්ස්ථානයන්හි ලැබේ ද? | නිමිත්තයන් අතුරෙහි පරිකර්ම උද්ග්‍රහ නිමිත්ත ද්වය ඒ ඒ අරමුණට අනුරූප පරිද්දෙන් පර්යායයෙන්§ සියලු සමසතළිස් කම්ස්ථානයන්හි ලැබේමය. |

*කසිණුග්ඝාටිමාකාසයද එහි පැවැති විඥානය ද ඒ විඥානයාගේ අභාව සඞ්ඛ්‍යාත නාස්තිභාවප්‍රඥප්තිය ද එහි පැවැති තෘතීයාරූප්‍ය විඥානය ද අරමුණු කොට ඇති හෙයින් කසිණුග්ඝාටිමාකාසාදි චතුර්විධ අරූපාවචරාලම්බනිකයෝ යයි කියන ලදී.

§ තිබි අරමුණුකාගේ අපරිච්ඡින්න බව හෙයින් පර්යායයෙන් යයි කීය. දස කසිණ දස අසුභ කොට්ඨාස ආනාපාන සම්මුති යන ආරම්මණයන්හිම පරිච්ඡින්න නිමිත්ත සම්භව වන බැවි කියන ලදී.

පටිභාග නිමිත්තං පන කසිණාසුභකොට්ඨාස ආනාපානෙසෙවව ලබ්භති, තත්ථ හි පටිභාග නිමිත්තමාරබ්භ උපචාරසමාධි අප්පනාසමාධිච පවත්තන්ති෴ කථං ආදිකම්මිකස්ස හි පඨවිමණ්ඩලාදිසු නිමිත්තං උග්ගණ්හන්තස්ස තමාලම්බනං පරිකම්ම නිමිත්තන්ති පවුච්චති සා ච භාවනා පරිකම්ම භාවනා නාම෴ යදා පන තං නිමිත්තං චිත්තෙන සමුග්ගහිතං හොති චක්ඛුනා පස්සන්තස්සෙව මනොද්වාරස්ස ආපාථමාගතං තදා තමෙවාලම්බනං උග්ගහ නිමිත්තං නාම සා ච භාවනාසමාධියති෴ තථා සමාහිතස්ස පනෙතස්ස තතො පරං තස්මිං උග්ගහනිමිත්තෙ පරිකම්මසමාධිනා භාවනමනුයුඤ්ජන්තස්ස යදා තප්පටිභාගං වත්ථු ධම්මවිමුච්චිතං පඤ්ඤත්ති සඞ්ඛාතං භාවනාමයමාලම්බනං චිත්තෙ සන්නිසින්නං සමප්පිතං හොති තදා තං පටිභාගනිමිත්තං සමුප්පන්නන්ති පවුච්චති෴

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 34 | ප්‍රතිභාග නිමිත්ත කුමන ආරම්මණ යන්හි ලැබේ ද? | ප්‍රතිභාග නිමිත්ත වනාහි දශ කසිණය අසුභ කොට්ඨාසයන්ට අයත් කායගතාසතිය ආනාපානසතිය යන මේ ආරම්මණයන්හිම ලැබේ. |
| 35 | උපචාර අර්පණා සමාධි කුමන නිමිත්තක් අරභයා පවතී ද? | කසිණ අසුභකොට්ඨාස ආනාපාන සති යන මෙහි ප්‍රතිභාග නිමිත්ත අරභයා පවතී. |
| 36 | පරිකර්ම නිමිත්ත ය පරිකර්ම භාවනා ය යනු කුමක් ද? | ආදිකර්මිකයාගේ පඨවිකසිණ මණ්ඩලාදී ඒ ඒ ආරම්මණයෙහි නිමිත්ත උද්ග්‍රහණය කරන්නාහට† ඒ ඒ අරමුණු පරිකර්ම නිමිත්ත යයි කියනු ලැබේ ඒ භාවනාව ද පරිකර්ම භාවනා නම් වේ. |
| 37 | උද්ග්‍රහ නිමිත්ත යනු කුමක් ද? | යම් කලෙක ඒ පරිකර්ම නිමිත්ත සිහින්ම ගන්නා ලද්දේ වේ ද ඇසින් බලන්නාහට මෙන්ම මනොද්වාරික චිත්තයට හමු වූයේ වේ ද‡ එකල්හි ඒ අරමුණ උද්ග්‍රහ නිමිත්ත නම් වේ. ඒ භාවනාව මනාව පිහිටයි. |
| 38 | පටිභාග නිමිත්ත කෙසේ උපදී ද? | සමාධි සම්පන්න වූ යොගාවචරයාහට එයින් මත්තෙහි ඒ උද්ග්‍රහ නිමිත්ත විෂය කොට පරිකර්මසමාධියෙන් භාවනාවෙහි යෙදෙන්නාහට යම් කලෙක ඒ උද්ග්‍රහ නිමිත්ත සදෘශ වූ පරමාර්ථධර්මයෙන් මිදුනා වූ කසිණමණ්ඩල දොෂයෙන් මිදුනා වූ ප්‍රඥප්ති යයි කියන ලද භාවනාවෙන් නිපන් අරමුණ චිත්තයෙහි මනා කොට පිහිටුවන ලද්දේ ද එකල්හි ප්‍රතිභාග නිමිත්ත උපදී. |

† සතපරිසිඳු සිල් ශුද්ධකොට කල්‍යාණමිත්‍රයකු කරා එළඹ චරිතානුකූල කමටහන් ගෙන පලිබොධ දුරුකොට අනුරූප වෙහෙරක වැස ඌතාමියක් සතරඟුල් පුළුල ඇති වට වූ කසිණ මණ්ඩලය ඉදිරිකොට ආනාපාන කොට්ඨාසාදීන් අතුරෙකි සිත පිහිටුවා මනාව හිඳ එකග වූ සිතින් “පඨවි පඨවි” යනාදි ඒ ඒ භාවනා කුම සිහි කරන්නාහට යනුයි.

‡ ඇස පියා හෝ අන් තැනකට ගොස් හෝ සිත්හි කරන්නාහට කසිණ මණ්ඩල සදෘශව මනොද්වාරික චිත්තයට හමුවන බැව් කියන ලදි.

තතො පට්ඨාය පරිබන්ධ විප්පහීනා කාමාවචර සමාධිසඞ්ඛාතා උපචාරභාවනා නිප්ඵන්නා නාම හොති. තතො පරං තමෙව පටිභාගනිමිත්තං උපචාර සමාධිනා සමාසෙවන්තස්ස රූපාවචර පඨමජ්ඣානමප්පෙති...... තතො පරං තමෙව පඨමජ්ඣානං ආවජ්ජනං සමාපජ්ජනං අධිට්ඨානං වුට්ඨානං පච්චවෙක්ඛණාචෙති ඉමාහි පඤ්චහි වසිතාහි වසීභූතං කත්වා විතක්කාදිකමොළාරිකඞ්ගප්පහානාය විචාරාදි සුඛුමඞ්ගුප්පත්තියා පදහතො යථාක්කමං දුතියජ්ඣානාදයො යථාරහමප්පෙන්ති......

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 39 | උපචාර භාවනා සම්පූර්ණව කෙසේ උපදී ද? | ප්‍රතිභාග නිමිත්ත උපන් තැන් පටන් නීවරණ සඞ්ඛ්‍යාත සතුරන් කෙරෙන් විශෙෂයෙන් දුරු වූ කාමාවචර සමාධි යයි කියන ලද උපචාර භාවනාව උපන්නේ නම් වේ. |
| 40 | ප්‍රථමධ්‍යාන චිත්තය කෙසේ පිහිටා ද? | උපචාර සමාධියෙන් මත්තෙහි ඒ ප්‍රතිභාග නිමිත්ත උපචාර සමාධියෙන් නිරතුරු සෙවනය කරන්නා හට රූපාවචර සඞ්ඛ්‍යාත ප්‍රථම ධ්‍යාන චිත්තය පිහිටයි. |
| 41 | ද්විතීය ධ්‍යානාදිහු කෙසේ පිහිටත් ද? | ප්‍රථමධ්‍යාන චිත්තයෙන් මත්තෙහි ඒ ප්‍රථමධ්‍යානය ආවජ්ජන වසිතාය, සමාපජ්ජන වසිතාය, වුට්ඨාන වසිතාය, අධිට්ඨාන වසිතාය, පච්චවෙක්ඛණ වසිතාය යන මේ පඤ්ච වසිතාවෙන් වසීභූත කොට විතර්කාදී ඖලාරික අංගයන්ගේ දුරුකිරීමෙන් විචාරාදී සූක්ෂ්ම සූක්ෂ්මඅඞ්ගයන්ගේ උත්පාදය පිණිස ව්‍යායාම කරන්නා හට පිළිවෙළින් ද්විතීයධ්‍යානාදිහු (ඒ ඒ සම්ස්ථානයන්ට) සුදුසු පරිද්දෙන් පිහිටත්.* |

* මෙහි පඤ්ච වසිතාව නම් "පඤ්චසු ඣානඞ්ගෙසු යථාකාරමිච්ඡිතෙ උප්පන්නාවජ්ජනානන්තරං චතුපඤ්ච ජවනා කතිපය භවඞ්ගන්තරාපරං අනන්තරා අපරාපරං ඣානඞ්ගාවජ්ජනා සමත්ථතා ආවජ්ජන වසිතා නාම" විතර්කාදි පඤ්චම ධ්‍යානාඞ්ගයන් අතුරෙහි එකී එකී අරමුණෙහි උපන්නාවූ ආවර්ජන චිත්තයට ඉක්බිති ජවන් සතර පස් දෙනකුගෙන් ද භවාඞ්ග සිත් කීපයකින් ද මත්තට නොගොස් නැවත නැවත ධ්‍යානාඞ්ගයන් ආවර්ජනාකාරන්නාට සමර්ථ බව 'ආවර්ජනාවසිතා' නාම වේ.

"සමාපජ්ජිතු කාමතානන්තරං කතිපය භවඞ්ගතොපරං අනන්තරා උප්පන්නාවජ්ජනානන්තරං සමාපජ්ජිතුං සමත්ථතා සමාපජ්ජන වසිතා නාම" ධ්‍යානයට සම වදිනු කැමති සිතට ඉක්බිතිව භවාඞ්ගයින් කීපයකින් මත්තට නොගොස් උපන් ආවර්ජන සිතට අනතුරුව සමවදනාට සමර්ථ බව 'සමාපජ්ජන වසිතා' නාම වේ.

"සෙතුවිය සීඝසොතාය නදියා ඔඝං භවඞ්ග වෙගං උපච්ඡින්දිත්වා යථාපරිච්ඡින්න කාලං ඣානං ඨපෙතුං සමත්ථතා භවඞ්ගපාතතො රක්ඛණ යොගතො අධිට්ඨාන වසිතා නාම" සැඩපහර ඇති නදී ඔඝය රඳවා සිටි සෙතුයක් මෙන් භවාඞ්ගවේගය සිඳ පිරිසිඳිනා කල් වශයෙන් ධ්‍යාන චිත්තය පිහිටුවන්නාට සමර්ථ බව හෙවත් භවාඞ්ගපාතයෙන් රක්ෂාකාරන්නාට යොග්‍ය බව 'අධිට්ඨාන වසිතා' නාම වේ.

"පච්චවෙක්ඛණ වසිතා පන ආවජ්ජන වසිතායෙව සිද්ධා, ආවජ්ජනානන්තර ජවනානෙවෙත්ථ පච්චවෙක්ඛණ ජවනානි නාම" ප්‍රත්‍යවේක්ෂා වසිතා වනාහී එනයින් ආවර්ජන වසිතාවෙන්ම සිද්ධවිය. ආවර්ජනයට ඉක්බිති ජවනයෝම 'ප්‍රත්‍යවේක්ෂා ජවනයෝ' නාම වෙති.

ඉච්චෙවං පඨවිකසිණාදීසු ද්වාවීසති කම්මට්ඨානෙසු පටිභාගනිමිත්තමුපලබ්භති, අවසෙසෙසු පන අප්පමඤ්ඤා සත්තපඤ්ඤත්තියං පවත්තන්ති.–ආකාසවජ්ජිත කසිණෙසු පන යංකිඤ්චි කසිණං උග්ඝාටෙත්වා ලද්ධමාකාසං අනන්ත වසෙන පරිකම්මං කරොන්තස්ස පඨමාරුප්පමප්පෙති.–තමෙව පඨමාරුප්පවිඤ්ඤාණං අනන්ත වසෙන පරිකම්මං කරොන්තස්ස දුතියාරුප්පමප්පෙති, තමෙව පඨමාරුප්පවිඤ්ඤාණාභාවම්පන නත්ථි කිඤ්චීති පරිකම්මං කරොන්තස්ස තතියාරුප්පමප්පෙති, තතියාරුප්පං සන්තමෙතං පණීතමෙතන්ති පරිකම්මං කරොන්තස්ස චතුත්ථාරුප්පමප්පෙති.–

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 42 | කොතෙක් කම්ස්ථානයන්හි ප්‍රතිභාග නිමිත්ත ලැබේ ද? | මේ උක්තප්‍රකාරයෙන් පඨවි කසිණාදි වූ (දස කසිණය දස අසුභය කායගතාසතිය ආනාපානසතිය යන) දෙවිසි කම්ස්ථානයන්හි ප්‍රතිභාග නිමිත්ත ලැබෙයි. |
| 43 | අප්‍රමාණ්‍යයෝ කුමක් විෂය කොට පවතිත් ද? | (අවශෙෂ වූ බුද්ධානුස්මෘති ආදිවූ අට ළොස්) කම්ස්ථානයන් අතුරෙහි අප්‍රමාණ්‍යයෝ සතරදෙන සත්ත්ව සඞ්ඛ්‍යාත ප්‍රඥප්ති විෂයකොට පවත්. |
| 44 | ආකාසානඤ්චායතනය හෙවත් ප්‍රථමාරූප්‍ය විඤ්ඤාණය කොසේ පිහිටා ද? | ආකාශ කසිණය හැර ඉතිරි (නව) කසිණයන්හි(පෘථිවි කසිණාදි වූ)යම් කිසි කසිණයක් උගුළුවා ලබන ලද කිසුණු ඉගුළු ආකාශය අනන්ත වශයෙන් හෙවත් "අනන්තො ආකාසො" කියා ආකාශය අරභයා පරිකම් කරන්නාහට (එම අරමුණුවිෂය කොට ආකාසානඤ්චායතන සඞ්ඛ්‍යාත) ප්‍රථමාරූප්‍යවිඥානය පිහිට යි. |
| 45 | විඤ්ඤාණඤ්චායතනය හෙවත් ද්විතීයාරූප්‍ය විඥානය කොසේ පිහිටා ද? | ප්‍රථමාරූප්‍ය විඥානය අනන්ත වශයෙන් පරිකම් කරන්නාහට හෙවත් "අනන්තං විඤ්ඤාණං, අනන්තං විඤ්ඤාණං"යි භාවනා කරන්නාහට විඤ්ඤාණඤ්චායතන යයි කියන ලද ද්විතීයාරූප්‍ය විඥානය පිහිට යි. |
| 46 | ආකිඤ්චඤ්ඤායතනය හෙවත් තෘතීයාරූප්‍ය විඥානය කෙසේ පිහිටා ද? | ප්‍රථමාරූප්‍ය විඥානයාගේ අභාවය වනාහි "නත්ථි කිඤ්චි, නත්ථි කිඤ්චි"යි භාවනා කරන්නාහට ආකිඤ්චඤ්ඤායතන යයි කියන ලද තෘතීයාරූප්‍ය විඥානය පිහිට යි. |
| 47 | නෙවසඤ්ඤානාසඤ්ඤායතනය හෙවත් චතුර්ථාරූප්‍යවිඥානය කෙසේ පිහිටා ද? | "සන්තමෙතං පණීතමෙතං"යි භාවනා කරන්නාහට චතුර්ථාරූප්‍ය විඥානය පිහිට යි. |

අවසෙසෙසු ච දසසු කම්මට්ඨානෙසු බුද්ධගුණාදිකමාරම්මණමාරබ්භ පරිකම්මං කත්වා තස්මිං නිමිත්තෙ සාධුකමුග්ගහිතෙ තත්ථෙව පරිකම්මඤ්ච සමාධියති, උපචාරො ච සම්පජ්ජති. අභිඤ්ඤාවසෙන පවත්තමානං පන රූපාවචරපඤ්චමජ්ඣානං අභිඤ්ඤාපාදකපඤ්චමජ්ඣානා වුට්ඨහිත්වා අධිට්ඨෙය්‍යාදිකමාවජ්ජිත්වා පරිකම්මං කරොන්තස්ස රූපාදීසු ආලම්බනෙසු යථාරහමප්පෙති.

අභිඤ්ඤා ච නාම

ඉද්ධිවිධං දිබ්බසොතං පරචිත්තවිජානනා
පුබ්බෙනිවාසානුස්සති දිබ්බචක්ඛූති පඤ්චධා.

අයමෙත්ථ ගොචරභෙදො.
නිට්ඨිතො ච සමථකම්මට්ඨානනයො.

---

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 48 | බුද්ධානුස්සති ආදි දශකර්මස්ථානයන්හි කුමන සමාධියෙක් උපදී ද? | අර්පණා එළඹෙන්නා වූ සමතිස් කර්මස්ථානයන්ගෙන් අවශෙෂ වූ බුද්ධානුස්සති ආදි දශකර්මස්ථානයන්හි බුද්ධගුණාදි වූ අරමුණු අරභයා භාවනා කොට ඒ බුද්ධගුණාදි වූ නිමිති මනා කොට සිතින් උගත් කල්හි බුද්ධගුණාදි අරමුණෙහි ම පරිකර්මය මනාකොට පිහිටයි. උපචාර සමාධිය ද උපදී. |
| 49 | පඤ්චාභිඥාවෝ කෙසේ පිහිටද්ද? | ලෞකික පඤ්චාභිඥා වශයෙන් පවත්නා වූ රූපාවචර පඤ්චමධ්‍යානය වනාහි අභිඥාපාදක වූ පඤ්චමධ්‍යානයෙන් නැගී සිට අධිෂ්ඨාතව්‍යාදිය ආවර්ජනා කොට භාවනා කරන්නාහට රූපාදි ආරම්මණයන්හි ඒ ඒ පරිකර්මයට අනුරූප පරිද්දෙන් පිහිටයි.* |
| 50 | අභිඥාව කොතෙක් ප්‍රකාර ද? | අධිෂ්ඨානාදි ප්‍රභෙද ඇති ඍද්ධිවිධය දිව්‍යශ්‍රොත්‍රය පරචිත්තවිජානනය පූර්වේනිවාසානුස්මෘතිය දිව්‍යචක්ෂුස යයි ලෞකික අභිඥාව පස් ප්‍රකාර යි. |
| 51 | ගොචර භෙදය යනු කුමක් ද? | අභිඥාවන්ගේ ආලම්බන භෙදය ගොචර භෙද යයි. |

* ඍද්ධිවිධ ඥානයට පරිකර්ම කාලයෙහි [illegible] රූපාදිය ද, එසේ ම දිව්‍යශ්‍රොත්‍රයට ස්ථූල සූක්ෂ්මභෙද ශබ්දය ද, චෙතොපරිය ඥානයට පරහෘදය ගතවණ්ණ දක්ෂිණයෙන් සරාගාදි භෙද චිත්තය ද, පූර්වේනිවාසානුස්මෘතිඥානයට පූර්වනිවාසාදි භෙද වූ පෙරවිසූ ස්කන්ධපිළිවෙළ ද, දිව්‍යචක්ෂුසට ආලොකය පැතිර හැරීම පැමිණි රූපය ද, යථාක්‍රමයෙන් ආවර්ජනා කරන්නාහු ඒ ඒ අභිඥාවන්ට පැමිණෙන බැව් කියනු ලදි.

20–1

විපස්සනාකම්මට්ඨානෙ පන සීලවිසුද්ධි චිත්තවිසුද්ධි දිට්ඨිවිසුද්ධි කඞ්ඛාවිතරණවිසුද්ධි මග්ගාමග්ගඤාණදස්සනවිසුද්ධි පටිපදාඤාණදස්සනවිසුද්ධි, ඤාණදස්සනවිසුද්ධි චෙති, සත්තවිධෙන විසුද්ධි සඞ්ගහො. අනිච්චලක්ඛණං දුක්ඛලක්ඛණං අනත්තලක්ඛණඤ්චෙති තීණිලක්ඛණානි, අනිච්චානුපස්සනා දුක්ඛානුපස්සනා අනත්තානුපස්සනා චෙති තිස්සො අනුපස්සනා.

සම්මසනඤාණං උදයබ්බයඤාණං භඞ්ගඤාණං භයඤාණං ආදීනවඤාණං නිබ්බිදාඤාණං මුඤ්චිතුකම්‍යතාඤාණං පටිසඞ්ඛාඤාණං සඞ්ඛාරුපෙක්ඛාඤාණං අනුලොමඤාණං චෙති දසවිපස්සනාඤාණානි.

| ප්‍රශ්න | උත්තර |
|---|---|
| 52 විසුද්ධිහු කොතෙක් ද? | ශීලවිසුද්ධිය, චිත්තවිසුද්ධිය, දෘෂ්ටි විශුද්ධිය, කඞ්ඛාවිතරණවිසුද්ධිය, මාර්ගාමාර්ගඥාන දර්ශනවිශුද්ධිය, ප්‍රතිපදාඥාන දර්ශන විශුද්ධිය, ඥානදර්ශනවිශුද්ධි යයි කියා විශුද්ධිහු සතෙකි. |
| 53 ලක්ෂණයෝ කොතෙක් ද? | අනිත්‍යලක්ෂණය, දුඃඛලක්ෂණය, අනාත්ම ලක්ෂණ යයි ලක්ෂණ තුනෙකි.* |
| 54 අනුපස්සනාවෝ කොතෙක් ද? | අනිච්චානුපස්සනාය, දුක්ඛානුපස්සනාය, අනත්තානුපස්සනා යයි අනුපස්සනාවෝ තුනෙකි. |
| 55 විදර්ශනාඥානයෝ කොතෙක් ද? | ([1] සම්මසනඤාණය [2] උදයබ්බයඤාණය [3] භඞ්ගඤාණය, [4] භයඤාණය [5] ආදීනවඤාණය [6] නිබ්බිදාඤාණය [7] මුඤ්චිතුකම්‍යතාඤාණය [8] පටිසඞ්ඛාඤාණය [9] සඞ්ඛාරුපෙක්ඛාඤාණය [10] අනුලොම ඤාණ යයි) විදර්ශනාඥානයෝ දශයෙකි. |

* “අනිච්චතා එව ලක්ඛණං අනිච්චලක්ඛණං” අනිත්‍ය බව ම ලක්ෂණ වූයේ අනිත්‍ය ලක්ෂණයි. ඉපැද නැසීමයි. “උදයබ්බය පටිපීළන සඞ්ඛාත දුක්ඛතාවො ව ලක්ඛණන්ති දුක්ඛලක්ඛණං” ඉපැදීම් නැසීම් දෙකින් පෙළීම යයි කියන ලද දුක් බව ම ලක්ෂණ කොට ඇත්තේ දුඃඛලක්ෂණයි. “පර පරිකප්පිතස්ස අත්තනො අභාවො අනත්තතා තදෙව ලක්ඛණන්ති අනත්තලක්ඛණං” පරසමය වාදීන් විසින් කල්පනාකරන ලද ආත්මයක්හුගේ නො වීම අනාත්ම බව නම් වේ. එම අනාත්ම බවම ලක්ෂණ කොට ඇත්තේ අනාත්ම ලක්ෂණයි. තම වසඟයෙහි නො පැවැත්මයි.

1 ස්කන්ධාදීන්ගේ කලාප ගෙයින් සම්මසන වශයෙන් පැවැති ඤාණය ‘සම්මසනඤාණ’ යයි.

2 ඉපැදීම බිඳීම නැවත නැවත බැලීම් වශයෙන් පැවැති ඤාණය ‘උදයබ්බයඤාණ’ යයි.

[අනික් පිට බලනු.]

සුඤ්ඤතො විමොක්ඛො අනිමිත්තො විමොක්ඛො අප්පණිහිතො විමොක්ඛො චෙති තයො විමොක්ඛා......

| ප්‍රශ්න | උත්තර |
| --- | --- |
| 56 විමොක්ෂයෝ කෙතෙක් ද? | සුඤ්ඤතවිමොක්ඛය, අනිමිත්තවිමොක්ඛය, අප්පණිහිතවිමොක්ඛය යි විමොක්ෂයෝ තුනෙකි.* |

3 උදයව්‍යය හැර නැසීමෙහි පැවැති ඤාණය 'භඞ්ගඤාණ' යයි.

4 සංස්කාරයන් භය හෙයින් අනුව බැලීම් වශයෙන් පැවැති ඤාණය 'භයඤාණ' යයි

5 දක්නාලද භය ඇත්තවුන්ගේ ආදීනව හෙයින් දක්නා වශයෙන් පැවැති ඤාණය 'ආදීනව ඤාණ' යයි.

6 දක්නාලද ආදීනවයන් ඇත්තවුන් කෙරෙහි උත්කණ්ඨිත වශයෙන් පැවැති ඤාණය 'නිබ්බිදාඤාණ' යයි.

7 උත්කණ්ඨිතව සංස්කාරයන් කෙරෙන් මිදෙනු කැමැති බැව් වශයෙන් පැවැති ඤාණය 'මුඤ්චිතුකම්‍යතා ඤාණ' යයි.

8 මිදීමට උපාය දැනගැනීම පිණිස නැවත නැවත සංස්කාරයන්ගේ පරිග්‍රහ (නුවණින් ගැනීම) වශයෙන් පැවැති ඤාණය 'පටිසඞ්ඛා ඤාණ' යයි

9 දක්නාලද සංස්කාරධර්මයන් කෙරෙහි භය ආලය දෙකින් වැලැකීම් වශයෙන් මධ්‍යස්ථව පැවැති ඤාණය 'සඞ්ඛාරුපෙක්ඛා ඤාණ' යයි.

10 පළමු නවවිධ ඥානයන්ගේ කටයුතු සිද්ධිය පිණිස ද මතු සත්තිස් බොධිපාක්ෂිකධර්මයන්ගේ නිෂ්පත්තිය පිණිස ද අනුකූලව පැවැති ඤාණය 'අනුලොම ඤාණ' යයි.

* සුඤ්ඤතවිමොක්ඛාදිය මෙසේ යි, "අනත්තානුපස්සනාය සුඤ්ඤතො" අනාත්මයාගේ ශූන්‍යත්වයෙන් සුඤ්ඤත නම් වේ. "සංයොජනාදීහි විමුච්චනතෙන විමොක්ඛො" (කාමරාගාදි වූ) සංයොජනයන් කෙරෙන් මිදෙන අර්ථයෙන් විමොක්ඛයි, "නිච්චනිමිත්තාදීනං අභාවතො අනිමිත්තො" නිත්‍යනිමිත්තාදීන්ගේ අභාව හෙයින් අනිමිත්ත නම් වේ. "පණිහිතස්ස තණ්හාපණිධිස්ස අභාවතො අප්පණිහිතො". ප්‍රණිහිත නම් තෘෂ්ණා ප්‍රණිධියගේ අභාව හෙයින් 'අප්‍රණිහිත' නම් වේ.

20-2

සුඤ්ඤතානුපස්සනා අනිමිත්තානුපස්සනා අප්පණිහිතානුපස්සනා චෙති තීණි විමොක්ඛමුඛානි ච වෙදිතබ්බානි෴ කථං පාතිමොක්ඛ සංවරසීලං ඉන්ද්‍රියසංවරසීලං ආජීවපාරිසුද්ධිසීලං පච්චය සන්නිස්සිතසීලං චෙති චතුපාරිසුද්ධිසීලං සීලවිසුද්ධි නාම෴

උපචාරසමාධි අප්පනාසමාධි චෙති දුවිධොපි සමාධි චිත්තවිසුද්ධි නාම෴ ලක්ඛණ රස පච්චුපට්ඨාන පදට්ඨාන වසෙන නාමරූප පරිග්ගහො දිට්ඨිවිසුද්ධි නාම෴ තෙසමෙව ච නාමරූපානං පච්චය පරිග්ගහො කඞ්ඛාවිතරණ විසුද්ධි නාම෴

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 57 | විමොක්ෂ මුඛයෝ කෙතෙක් ද? | සුඤ්ඤතානුපස්සනාය, අනිච්චානුපස්සනාය, අප්පණිහිතානුපස්සනා යයි විමොක්ෂමුඛ* තුනෙකි. |
| 58 | සීලවිශුද්ධි යනු කුමක් ද? | ප්‍රාතිමෝක්ෂසංවරශීලය, ඉන්ද්‍රියසංවර ශීලය, ආජීවපාරිශුද්ධිශීලය, ප්‍රත්‍යය සන්නිශ්‍රිතශීලය, යන චතුපාරිශුද්ධි ශීලය ශීලවිශුද්ධි නම් වේ. |
| 59 | චිත්තවිශුද්ධි යනු කුමක් ද? | කාමාවචරසමාධි සඞ්ඛ්‍යාත උපචාර සමාධිද රූපාවචරධ්‍යාන සඞ්ඛ්‍යාත අර්පණාසමාධිද යන ද්විප්‍රකාර සමාධි හුම චිත්තවිසුද්ධි නම් වේ.† |
| 60 | දෘෂ්ටිවිශුද්ධි යනු කුමක් ද? | ලක්ෂණ රස ප්‍රත්‍යුපස්ථාන පදස්ථාන වශයෙන්‡ නාමරූපයන්ගේ පිරිසිඳ දැනගැනීම දෘෂ්ටිවිශුද්ධි නම්වේ.†† |
| 61 | කාඞ්ක්ෂාවිතරණ විශුද්ධි යනු කුමක් ද? | ත්‍රෛභූමික නාමරූපයන්ගේ(අවිද්‍යා තෘෂ්ණාදි වූ) ප්‍රත්‍යයන්ගේ පරිග්‍රහය කාඞ්ක්ෂාවිතරණ විසුද්ධි නම් වේ.‡‡ |

* "විමොක්ඛස්ස මුඛානි ද්වාරානි විමොක්ඛමුඛානි" නිර්වාණයට මුඛ සඞ්ඛ්‍යාත ද්වාර වූවාහු 'විමොක්ෂ මුඛයෝ' යි.

† "චිත්තස්ස නීවරණ මල විසොධනතො චිත්තවිසුද්ධි නාම" චිත්තයාගේ නීවරණ සඞ්ඛ්‍යාත මල විශෝධනය කරන හෙයින් 'චිත්තවිසුද්ධි' නම් වේ.

‡ "ධම්මානං සාමඤ්ඤසභාවො ලක්ඛණං කිච්චසම්පත්තියො රසො, උපට්ඨානාකාරො ඵලඤ්ච පච්චුපට්ඨානං" ධර්මයන්ගේ සාමාන්‍ය ස්වභාව ලක්ෂණ යි, කෘත්‍ය සම්පත්තීහු රස ය යි, උපස්ථානාකාරය ද ඵලය ද ප්‍රත්‍යුපස්ථාන යි.

†† "නාමරූපානං යථාසභාවදස්සනං අත්ත දිට්ඨිමල විසොධනතො දිට්ඨිවිසුද්ධි නාම" නාම් රූ හැර අන් අත්බවෙක් නැත්තේ යයි දක්නා බැවින් ආත්මදෘෂ්ටිමල විශෝධනය කරන හෙයින් 'දෘෂ්ටිවිශුද්ධි' නම් වේ.

‡‡ "අහොසිං නු ඛො අහං අතීතමද්ධානං" යනාදි ශෝඩශ විධවූ ද "සත්ථරි කඞ්ඛති" යනාදි අෂ්ටවිධ වූ ද විචිකිත්සාවන්ගේ (දුරුකිරීම ද) 'කාඞ්ක්ෂාවිතරණ විසුද්ධි' නම් වේ.

තතො පරං පන තථා පරිග්ගහිතෙසු සප්පච්චයෙසු තෙභූමක සඞ්ඛාරෙසු අතීතාදිභෙදභින්නෙසු ඛන්ධාදි නයමාරබ්භ කලාප වසෙන සංඛිපිත්වා අනිච්චං ඛයට්ඨෙන දුක්ඛං භයට්ඨෙන අනත්තා අසාරකට්ඨෙනාති අද්ධාන වසෙන සන්තති වසෙන ඛණ වසෙන වා සම්මසනඤාණෙන ලක්ඛණත්තයං සම්මසන්තස්ස තෙස්වෙව පච්චය වසෙන ඛණ වසෙන ච උදයබ්බය ඤාණෙන උදයබ්බයං සමනුපස්සන්තස්ස ච—

ඔභාසො පීති පස්සද්ධි, අධිමොක්ඛො ච පග්ගහො,
සුඛං ඤාණමුපට්ඨානමුපෙක්ඛා ච නිකන්ති චෙති—

ඔභාසාදිවිපස්සනුපක්කිලෙස පරිබන්ධ පරිග්ගහ වසෙන මග්ගාමග්ග ලක්ඛණ වවත්ථානං මග්ගාමග්ගඤාණ දස්සන විසුද්ධි නාම—

| ප්‍රශ්න | උත්තර |
| --- | --- |
| 62 මාර්ගාමාර්ගඥාන දර්ශන විශුද්ධිය යනු කුමක් ද? | සංඛාවිතරණ විශුද්ධියෙන් මතු එසේ පරිග්‍රහ කරනලද අතීතාදි භෙදයෙන් බිඳුනාවූ* (අවිද්‍යාදි) ප්‍රත්‍යය සහිත වූ ත්‍රෛභූමක සංස්කාරයන් කෙරෙහි ස්කන්ධ ආයතනාදි නය අර ගෙන කලාප වශයෙන් හකුළුවා ක්‍ෂයාර්ථයෙන් අනිත්‍යය, භයාර්ථයෙන් දුක්ඛය, අසාරකාර්ථයෙන් අනාත්ම යයි ද (අතීතාදි) කාල වශයෙන් ද (රූපාරූප) සන්තති වශයෙන් ද ක්‍ෂණ වශයෙන්ද (කලාප)සම්මර්ශන ඥානයෙන් අනිත්‍යාදි ලක්‍ෂණත්‍රය සම්මර්ශනය කරන්නාහට ද ඒ නාම රූපයන්හිම අවිද්‍යාදි ප්‍රත්‍යය වශයෙන්ද (නිර්වෘත්ත විපරිණාම) ඥාන වශයෙන්ද උදයව්‍යය දක්නා නුවණින් උදයව්‍යය අනුව දක්නාහට සිරුරෙන් නික්මුත් ආලෝකයද(පඤ්චවිධ) ප්‍රීතියද (ද්විප්‍රකාරවූ) ප්‍රශ්‍රබ්ධියද අධිමොක්‍ෂයද වීර්‍ය්‍යසංඛ්‍යාත පරිග්‍රහයද (කායික චෛතසිකවූ) සුවද විදර්ශනා ඥානයද ස්මෘතියද උපෙක්‍ෂාවද නිකාන්තිය† ද යන ආලෝකාදි විදර්ශනා උපක්ලේශයන් මාර්ගයට සතුරු යයි (ඥානයෙන්) පරිග්‍රහ වශයෙන් මාර්ග ලක්‍ෂණ ව්‍යවස්ථා කිරීම මාර්ගාමාර්ගඥානදර්ශන විශුද්ධි නම් වේ. |

* "යංකිඤ්චි රූපං අතීතානාගත පච්චුප්පන්නං අජ්ඣත්තං වා" යනාදි නය වශයෙන් එකාදශ ප්‍රකාරයෙන් වූ බිඳීම කියන ලදී.

† "ඔභාසාදිසු උප්පන්නෙසු හි වත මෙ ඉතො පුබ්බෙ එව රූපො ඔභාසො උප්පන්නපුබ්බොති ආදිනා නයෙන තත්ථ ආලයං කුරුමානා සුඛුමා තණ්හා රූපං නිකන්ති" ආලෝකය උපන් කල්හි ඒකාන්තයෙන් මට මින් පෙර මෙබඳු ආලෝකයක් නූපන්විරූය යනාදි ක්‍රමයෙන් එහි ආලය කරණු ලබන්නා වූ සූක්‍ෂම තෘෂ්ණා ස්වරූපය නිකාන්ති යයි කියනා ලදී.

තථා පරිබන්ධ විමුත්තස්ස පන තස්ස උදයබ්බයඤාණතො පට්ඨාය යාවානුලොමා තිලක්ඛණෙ විපස්සනා පරම්පරාය පටිපජ්ජන්තස්ස නව විපස්සනාඤාණානි පටිපදාඤාණදස්සන විසුද්ධි නාම.

තස්සෙවං පටිපජ්ජන්තස්ස පන විපස්සනා පරිපාකමාගම්ම ඉදානි අප්පනා උප්පජ්ජිස්සතීති භවඞ්ගං වොච්ඡින්දිත්වා උප්පන්න මනොද්වාරාවජ්ජනානන්තරං ද්වේ තීණි විපස්සනා චිත්තානි යංකිඤ්චි අනිච්චාදි ලක්ඛණමාරබ්භ පරිකම්මොපචාරානුලොම නාමෙන පවත්තන්ති, යා සිඛාප්පත්තා සානුලොමා සඞ්ඛාරුපෙක්ඛා වුට්ඨානගාමිනීවිපස්සනාති පවුච්චති.

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 63 | ප්‍රතිපදා ඥානදර්ශන විශුද්ධිය යනු කුමක් ද? | (උපක්ලේශ සඞ්ඛ්‍යාත වූ සතුරු ධර්මයන්ගෙන් මිදුනා වූ උදයව්‍යය ඥානයෙහි පටන් සත්‍යානුලොම ඥානය දක්වා ත්‍රිලක්ෂණ විදර්ශනා පරම්පරාවෙන් පිළිපදින්නාහට උදයව්‍යයාදි වූ) නවවිදර්ශනා ඥානයෝ* ප්‍රතිපදා ඥානදර්ශන විශුද්ධි නම් වේ. |
| 64 | අර්පණා ඉපදීමට ප්‍රථම වූ විදර්ශනා චිත්තයෝ කවර නමින් පවතිත් ද? | (මෙසේ භාවනා කරන්නා වූ ඒ යොගීහට වනාහි විදර්ශනාව මිහිකිරිමට පැමිණ දැන් අර්පණා උපදී යයි කියයුතු කල්හි භවාඞ්ගසන්තතිය සිඳගෙන උපන් මනොද්වාරාවර්ජන යට ඉක්බිතිව දෙතුන් විදර්ශනා සිත් කොතෙක් යම් කිසි අනිත්‍යාදි ලක්ෂණයක් අරභයා) පරිකර්ම උපචාර අනුලොම යන නාමයෙන් ව්‍යවහාර කරත්. |
| 65 | අර්පණා ඉපදීමට ප්‍රථම වූ විදර්ශනාවන්ට කෙබඳු නම් කියත් ද? | යම් විදර්ශනාවක් මුදුන්පත් හෙයින් ශිඛාප්‍රාප්තවිදර්ශනා යයි ද අනුලොම ඥාණ සහිත බැවින් සානුලොම යයි ද (සංස්කාරයන් කෙරෙන් උදාසීන බැවින්) සඞ්ඛාරුපෙක්ඛා විපස්සනා යයි ද (අපායාදි දුකින් ද සංස්කාර නිමිත්තෙන් ද නගින හෙයින්) වුට්ඨානගාමිනී විපස්සනා යයි ද මෙබඳු නම් කියත්. |


* උදයව්‍යය පිරිසිඳ දක්නාහට උදයබ්බයඤාණයද, උදය හැර භඞ්ගමාත්‍රයක්ම බලන්නාහට භඞ්ගඤාණයද, භඞ්ග වශයෙන් දක්නාහට හුණුවන් දවන අඟුරුවළක් වැනි සෙයින් භයඤාණයද, භය දක්නාහට ගිනිගත් ගෙයක් මෙන් ආදීනවඤාණයද, දක්නාලද ආදීනව ඇත්තාහට උත්කණ්ඨිත වශයෙන් පැවැති නිබ්බිදාඤාණයද, උත්කණ්ඨිතයාහට දැලින් මිදෙනු කැමති මසකු සෙයින් මුඤ්චිතුකම්‍යතා ඤාණය ද, මිදෙනු කැමැත්තාහට දක්නා ලද ආදීනවයන්හි අනිත්‍යාදි වශයෙන් නැවත නැවත පරීක්ෂා කරමින් උපදනා පටිසඞ්ඛා ඤාණය ද, ඒ ඥානය ඇත්තාහට සංස්කාරයන්හි මැදහත්ව උපදනා සඞ්ඛාරුපෙක්ඛා ඤාණයද, ඒ ඤාණය ඇත්තාහට අනිත්‍යාදිය මෙහෙතුකොට යට කියනලද අෂ්ටවිධ ඥානයන්ට ද මතු මාර්ග ඤාණයෙහි පැමිණිය යුතු සත්තිස් බොධිපාක්ෂිකධර්මයන්ට ද අනුකූල හෙයින් අනුලොම ඥානය ද යන මේ නවඤාණයෝ නම් විදර්ශනා ඥානයෝයි.

තතො පරං ගොත්‍රභුචිත්තං නිබ්බානමාලම්බිත්වා පුථුජ්ජනගොත්තමභිභවන්තං අරියගොත්තමභිසම්භොන්තඤ්ච පවත්තති.

තස්සානන්තරමෙව මග්ගං දුක්ඛසච්චං පරිජානන්තො සමුදයසච්චං පජහන්තො නිරොධසච්චං සච්ඡිකරොන්තො මග්ගසච්චං භාවනාවසෙන අප්පනාවීථිමොතරති. තතො පරං ද්වෙ තීණි ඵලචිත්තානි පවත්තිත්වා භවඞ්ගපාතොව හොති. පුන භවඞ්ගං වොච්ඡින්දිත්වා පච්චවෙක්ඛණඤාණානි පවත්තන්ති.

| ප්‍රශ්න | උත්තර |
| --- | --- |
| 67 ගොත්‍රභූ චිත්තය කෙසේ පවතී ද? | අනුලෝම චිත්තයෙන් මත්තෙහි නිවන් අරමුණු කොට පෘථග්ජන ව්‍යවහාරය ඉක්මවමින් ආර්‍ය්‍යව්‍යවහාරයට පමුණුවමින් ගොත්‍රභූ නම් වූ විදර්ශනා චිත්තය පවතී. |
| 68 මාර්ග චිත්තය තෙමේ කෙසේ අර්පණාවට බසී ද? | ගොත්‍රභූ චිත්තයට අනතුරුවම මාර්ග චිත්තය තෙමේ දුඃඛසත්‍යය ප්‍රතිවේධ වශයෙන් දකිමින් දුක් ඉපදීමට හෙතු වූ සමුදය සත්‍යය දුරු කෙරෙමින් නිරොධසත්‍යය ප්‍රත්‍යක්ෂ කරමින් මාර්ගසත්‍යය වැඩීම් වශයෙන් අර්පණා වීථියට බසී.* |
| 69 මාර්ගචිත්තයට ඉක්බිති කුමක් පැවැත භවාඞ්ග පාතය වේ ද? | මාර්ගචිත්තයෙන් මතු ඵලසිත් දෙදෙනෙක් හෝ තිදෙනෙක් හෝ පැවැත ඉක්බිති භවාඞ්ගපාතයම වේ. |
| 70 භවාඞ්ගපාතයට ඉක්බිති කුමක්නු පවතිත් ද? | භවාඞ්ගසන්තතිය සිඳ මාර්ගඵල විෂය කොට ඇති ප්‍රත්‍යවෙක්ෂා ඥානයෝ පවතිත්. |

* අර්පණාවීථින්ට ඇතුළත් ව කොටුන් වූ සංකේතාක්ෂර මෙසේයි. ප- පරිකර්මය, උ-උපචාරය, නු-අනුලෝමය, ගො-ගොත්‍රභූය, ගග-මග්ගචිත්තය, ඵ-ඵල චිත්තය, වො-වොදානය යන මොහුයි.



මග්ගං ඵලඤ්ච නිබ්බාණං පච්චවෙක්ඛති පණ්ඩිතො,
හීනෙ කිලෙසෙ සෙසෙ ච පච්චවෙක්ඛති වා නවා......
ඡබ්බිසුද්ධික්කමෙනෙවං භාවෙතබ්බො චතුබ්බිධො,
ඤාණදස්සනවිසුද්ධි නාම මග්ගො පවුච්චති......
අයමෙත්ථ විසුද්ධිභෙදො......

---

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 70 | ප්‍රාඥ වූ ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ කුමක් ප්‍රත්‍යවෙක්‍ෂා කෙරේ ද? | පණ්ඩිත වූ ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ (මේ නම් මාර්ගයකින් ආමි යි) මාර්ගයද (මේ නම් අනුසස් ලබනලදැයි) ඵලයද (මෙනම් ධර්මයක් ප්‍රත්‍යක්‍ෂ කරන ලදැයි) නිර්වාණයද ප්‍රත්‍යවෙක්‍ෂා කෙරෙයි.* |
| 71 | කෙලෙශ ප්‍රත්‍යවෙක්‍ෂාව කෙසේ ද? | (මාර්ගයෙන්) ප්‍රහීණ කරන ලද කෙලෙශයන්ද අප්‍රහීණ වූ අවශෙෂ කෙලෙශයන්ද ප්‍රත්‍යවෙක්‍ෂා කිරීම කෙලෙශ ප්‍රත්‍යවෙක්‍ෂා නම් වේ. හෙද ඇතැම් ශෛක්‍ෂයෙක් ප්‍රත්‍යවෙක්‍ෂා නො කෙරෙත්. |
| 73 | ඥානදර්ශන විශුද්ධිය යනු කුමක් ද? | ශීලවිශුද්ධි ආදි ෂඩ්විශුද්ධින්ගේ අනුක්‍රමයෙන් වැඩිය යුතු වූ ශ්‍රොතාපත්‍යාදි වූ චතුර්විධ මාර්ගය තෙමේ ඥානදර්ශන විශුද්ධි යයි කියන ලදි. |

* ඵලසමාපත්තියෙන් නැගී ඒ ඵල හා නිවන් පසක් කිරීම ද මාර්ග නිර්වාණ ප්‍රත්‍යවෙක්‍ෂිත චිත්තද්වය වේ යි. මෙම නයින් සකෘදාගාමි මාර්ගඵලාදි විථි ද දත යුතු. ගොත්‍රභූ නැණින් වොදානය ගැන්ම ද රහතන්හට අවශෙෂ කෙලෙශ ප්‍රත්‍යවෙක්‍ෂා වක් නැති බව ද වෙනයි.



තත්ථ අනත්තානුපස්සනා අත්තාභිනිවෙසං මුඤ්චන්තී සුඤ්ඤතානුපස්සනා නාම විමොක්ඛමුඛං හොති, අනිච්චානුපස්සනා විපල්ලාස නිමිත්තං මුඤ්චන්තී අනිමිත්තානුපස්සනා නාම විමොක්ඛමුඛං හොති, දුක්ඛානුපස්සනා තණ්හාපණිධිං මුඤ්චන්තී අප්පණිහිතානුපස්සනා නාම විමොක්ඛමුඛං හොති...... තස්මා යදි වුට්ඨානගාමිනී විපස්සනා අනත්තතො විපස්සති සුඤ්ඤතො විමොක්ඛො නාම හොති මග්ගො, යදි අනිච්චතො විපස්සති අනිමිත්තො විමොක්ඛො නාම, යදි දුක්ඛතො විපස්සති අප්පණිහිතො විමොක්ඛො නාමාති ච,

---

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 74 | සුඤ්ඤතානුපස්සනා විමොක්ෂ මුඛය යනු කුමක් ද? | අනාත්ම යයි පැවැති අනත්තානුපස්සනා තොමෝ ආත්මාභිනිවේශය යන දෘඪ ග්‍රහණය හරින්නී ආත්මය ශූන්‍ය වශයෙන් දක්නා හෙයින් සුඤ්ඤතානුපස්සනා නම් වූ විමොක්ෂ මුඛය වේ. |
| 75 | අනිමිත්තානුපස්සනා විමොක්ෂ මුඛය යනු කුමක් ද? | සංස්කාරයන් කෙරෙහි අනිත්‍ය යයි පැවැති අනුපස්සනා තොමෝ අනිත්‍යයෙහි නිත්‍ය යයි පැවැති විපර්යාස නිමිත්ත හරින්නී අනිමිත්තානුපස්සනා නම් වූ විමොක්ෂමුඛය වේ. |
| 76 | අප්‍රණිහිතානුපස්සනා විමොක්ෂ මුඛය යනු කුමක් ද? | දුක්ඛ යයි පැවැති අනුපස්සනා තොමෝ "එතං මම එතං සුඛං" යනාදි නයින් පැවැති කාම භව තෘෂ්ණා සඞ්ඛ්‍යාත වූ ප්‍රණිධිය හරින්නී අප්පණිහිතානුපස්සනා නම් වූ විමොක්ෂ මුඛය වේ. |
| 77 | සුඤ්ඤත විමොක්ෂ මාර්ගය යනු කුමක් ද? | (වෘත්ත දුඃඛයෙන් නගන හෙයින්) ව්‍යුත්ථාන ගාමිණී නම් වූ විදර්ශනා තොමෝ ඉදින් අනාත්ම හෙයින් විදර්ශනා කෙරේ ද එහෙයින් මාර්ගය තෙම සුඤ්ඤත විමොක්ෂ නම් වේ. |
| 78 | අනිමිත්ත විමොක්ෂ මාර්ගය යනු කුමක් ද? | ඉදින් වුට්ඨාන ගාමිණී විපස්සනා තොමෝ අනිත්‍ය හෙයින් විදර්ශනා කෙරේ ද මාර්ගය තෙම අනිමිත්ත විමොක්ෂ නම් වේ. |
| 79 | අප්‍රණිහිත විමොක්ෂ මාර්ගය යනු කුමක් ද? | ඉදින් වුට්ඨාන ගාමිණී විපස්සනා තොමෝ දුක් හෙයින් විදර්ශනා කෙරේ ද (එකල්හි මාර්ගය තෙම විදර්ශනා ගමන වශයෙන්) අප්‍රණිහිත විමොක්ෂ නම් වේ. |

21-1

මග්ගො විපස්සනාගමනවසෙන තීණි නාමානි ලභති.

තථා ඵලඤ්ච මග්ගාගමනවසෙන මග්ගවීථියං, ඵලසමාපත්තිවීථියං පන යථාවුත්තනයෙන විපස්සන්තානං යථාසකං ඵලමුප්පජ්ජමානම්පි විපස්සනාගමනවසෙනෙව සුඤ්ඤතාදිවිමොක්ඛොති ච පවුච්චති. ආලම්බනවසෙන පන සරසවසෙන ච නාමත්තයං සබ්බත්ථ සබ්බෙසම්පි සමමෙව ච.

අයමෙත්ථ විමොක්ඛභෙදො.

---

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 80 | මාර්ගය තෙමේ කෙබඳු නම් ලබා ද? | විදර්ශනාගමන වශයෙන් සුඤ්ඤත විමොක්ඛය අනිමිත්ත විමොක්ඛය අප්පණිහිත විමොක්ඛ යයි තුන් නාමයන් ලබයි. |
| 81 | ඵලචිත්තය තෙමේ කිනම් නම් ලබා ද? | මාර්ගවීථියෙහි ඵලචිත්තය තෙමේ මාර්ගාගමන භාවනා වශයෙන් එයේ ම ශූන්‍යත විමොක්ෂය, අනිමිත්ත විමොක්ෂය, අප්‍රණිහිත විමොක්ෂය යන නම් ලබයි* |
| 82 | ඵල සමවතට සමවදනා කාලැ ඵලචිත්තය තෙමේ සුඤ්ඤතාදි කවර නම් ලබා ද? | ඵලසමාපත්ති වීථියෙහි වනාහි යට කියනලද (අනත්තානුපස්සනාදි වූ) ක්‍රමයෙන් විදර්ශනා කරන්නා වූ ආර්‍ය්‍ය පුද්ගලයන්ට තම් තමාට අනුරූප වූ ඵලචිත්තය උපදනේද විදර්ශනාගමන වශයෙන් ම ශූන්‍යතාදි විමොක්ෂ නම් ලබන්නේ යයි කියනු ලැබේ.† |
| 83 | සුඤ්ඤතාදි නම් කෙසේ ලැබේ ද? | විදර්ශනා ආරම්මණයන්ගේ වශයෙන් ද මාර්ගයාගේ කෘත්‍ය වශයෙන් ද ශූන්‍යතාදි නාම ත්‍රය සියලු මාර්ග ඵල සමාපත්ති වීථි අතුරෙහි සියලුම මාර්ගඵලයන්ට සමානවම ලැබෙයි. |

---

* ප්‍රථමයෙන් යම් විදර්ශනාවක් හේතුකොට මාර්ගඵල සිත් ප්‍රතිලාභවී ද පසුව සමවතට සමවදනා කාලැ ඵලාරම්මණයි කරනලද භාවනා බලයෙන් ඒ චිත්තය තෙමේ සුඤ්ඤතාදි නාම ලබාය යන අභිප්‍රා යයි. එයින් කීහ අභිධම්මාර්ථ විභාවිනියෙහි:- ‘මග්ගාගමන වසෙන අලද්ධනාමා විපස්සනාගමන වසෙන තීණි නාමානි ලභති යනූති”

† යම් විදර්ශනාවක් කාරණකොට ශෛක්ෂ චිත්තය විසින් ප්‍රතිලබ්ධ නාමයක් ඒ ද ඒ නාමයම ඵලචිත්තය තෙමේත් ලබාය යනු අභිප්‍රා යයි.

එත්ථ පන සොතාපත්ති මග්ගං භාවෙත්වා දිට්ඨි විචිකිච්ඡා පහාණෙන පහීණාපායගමනො සත්තක්ඛත්තු පරමො සොතාපන්නො නාම හොති.

සකදාගාමි මග්ගං භාවෙත්වා රාග දොස මොහානං තනු කරත්තා සකදාගාමී නාම හොති සකිදෙව ඉමං ලොකං ආගන්තා. අනාගාමි මග්ගං භාවෙත්වා කාමරාගබ්‍යාපාදානමනවසෙසප්පහාණෙන අනාගාමී නාම හොති අනාගන්තා ඉත්ථත්තං. අරහත්ත මග්ගං භාවෙත්වා අනවසෙස කිලෙසප්පහාණෙන අරහා නාම හොති ඛීණාසවො ලොකෙ අග්ගදක්ඛිණෙය්‍යො.

අයමෙත්ථ පුග්ගල භෙදො.

ඵලසමාපත්තියං පනෙත්ථ සබ්බෙසම්පි යථා සක ඵල වසෙන සාධාරණාව.

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 84 | කෙසේ සෝතාපන්න වේ ද? | (ෂඩ් විශුද්ධික්‍රමයෙන්) සෝවාන් මාර්ගය වඩා දෘෂ්ටිවිචිකිත්සා සම්ප්‍රයුක්ත වූ පස් අකුසල චිත්තයන් සමුච්ඡේද ප්‍රහාණ වශයෙන් දුරුකිරීමෙන් ප්‍රහීණ කරන ලද අපාය ප්‍රතිසන්ධි ගමන් ඇති සත් වරක් කාමසුගතියෙහි ප්‍රතිසන්ධිග්‍රහණය පරමකොට ඇති හෙයින් සත්තක්ඛත්තු පරම සෝතාපන්න නම් වේ. |
| 85 | කෙසේ ශකෘදාගාමි වේ ද? | ශකෘදාගාමි මාර්ගය වඩා රාග ද්වේෂ මෝහයන් තුනී බවට පමුණුවන ලද හෙයින් මේ මිනිස් ලොවට පිළිසිඳීම් වශයෙන් එක්වරක් පැමිණීම් ඇත්තේ ශකෘදාගාමි නම් වේ. |
| 86 | කෙසේ අනාගාමි වේ ද? | අනාගාමි මාර්ගය උපදවා කාම රාග ව්‍යාපාද සංයෝජනයන් නිරවශේෂ ප්‍රහාණයෙන් මිනිසත් බවට නොපැමිණෙන ස්වභාව ඇත්තේ අනාගාමි නම් වේ. |
| 87 | කෙසේ අර්හත් වේ ද? | අර්හත් මාර්ගය වඩා පඤ්චවිධ ඌර්ධ්වභාගිය සංයෝජන යයි කියන ලද සියලු කෙලෙසුන් නැසීම හෙවු කොටගෙණ ක්ෂය කරන ලද ආශ්‍රවයන් ඇති හෙයින් ලොවට අග්‍රදක්ෂිණාර්හ වූයේ අර්හත් නම් වේ. |
| 88 | ඵල සමාපත්තීහු සියල්ලන්ට සාධාරණ ද? | ඵලසමාපත්ති වීථි ආර්ය පුද්ගලයන්ටම තමතමන්ගේ ඵලවශයෙන් සාධාරණ ම වේ. |

21-2

නිරොධ සමාපත්ති සමාපජ්ජනං පන අනාගාමීනඤ්චෙව අරහන්තානඤ්ච ලබ්භති.

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 89 | නිරොධසමාපත්තියට සමවැදීම කවරකුට ලැබේ ද? | නිරොධ සමාපත්තියට සමවැදීම වනාහි අෂ්ටසමාපත්ති ලාභී අනාගාමීන්ට ද රහතුන්ට ද ලැබේ.* |

* නිරොධසමාපත්ති වීථි බිම්බාකාරය දක්වනු පිණිස තදනුරූප සංඥාක්ෂර දක්වම්හ. ඒ මෙසේයි.

ඨ=පඨමජ්ඣානය, වි=විපස්සනා ජවනය, දු=දුතියජ්ඣානය, ති=තතියජ්ඣානය, ච=චතුත්ථජ්ඣානය, ආ=ආකාසානඤ්චායතනය, ඤ=විඤ්ඤාණඤ්චායතනය, කි=ආකිඤ්චඤ්ඤායතනය, ධි=අධිෂ්ඨාන ජවනය, නෙ=නෙවසඤ්ඤානාසඤ්ඤායතනය, නි=නිරොධ සමාපත්තිය, අ=අනාගාමීන්ගේ හෝ රහතුන්ගේ හෝ ඵලචිත්තය යන මොහුයි.

පඨමජ්ඣාන සමාපත්ති

කසිණාදි පටිභාග නිමිත්තමාලම්බති.

ල ජේ | ම ප උ නු ගො ඨ ඨ ඨ ඨ ඨ ඨ ඨ | භ භ භ
ශ ශ | ශ ශ ශ ශ ශ ශ ශ ශ ශ ශ ශ ශ | ශ ශ ශ

මෙයින් නැගී සංස්කාරයන් ප්‍රත්‍යවේක්ෂා කෙරේ.

සංඛාර විපස්සනා

ල ජේ | ම වි වි වි වි වි වි වි | භ භ භ භ භ භ භ
ශ ශ | ශ ශ ශ ශ ශ ශ ශ ශ | ශ ශ ශ ශ ශ ශ ශ

සෙසු ඒ ඒ සමාපත්තියෙන් නැගී සංස්කාර විදර්ශනාවද මෙම ක්‍රමයයි.

දුතියජ්ඣාන සමාපත්ති

කසිණාදි පටිභාගනිමිත්තමාලම්බති

ල ජේ | ම ප උ නු ගො දු දු දු දු දු දු දු | භ භ භ
ශ ශ | ශ ශ ශ ශ ශ ශ ශ ශ ශ ශ ශ ශ | ශ ශ ශ

මෙයින් නැගී සංස්කාරධර්මයන් විදර්ශනා කෙරේ.

තතියජ්ඣාන සමාපත්ති

කසිණාදි පටිභාගනිමිත්තමාලම්බති

ල ජේ | ම ප උ නු ගො ති ති ති ති ති ති ති | භ භ භ
ශ ශ | ශ ශ ශ ශ ශ ශ ශ ශ ශ ශ ශ ශ | ශ ශ ශ

මෙයින් නැගී සංස්කාර ධර්මයන් විදර්ශනා කෙරේ.

චතුත්ථජ්ඣාන සමාපත්ති

කසිණාදි පටිභාග නිමිත්තමාලම්බති

ල ජේ | ම ප උ නු ගො ච ධ ච ච ච ච ච | භ භ භ
ශ ශ | ශ ශ ශ ශ ශ ශ ශ ශ ශ ශ ශ ශ | ශ ශ ශ .

මෙයින් නැගී සංස්කාර ධර්මයන් විදර්ශනා කෙරේ.

[අනික් පිට බලනු.]

තතො යථාක්කමං පඨමජ්ඣානාදි මහග්ගත සමාපත්තිං සමාපජ්ජිත්වා වුට්ඨාය තත්ථගතෙ සඞ්ඛාරධම්මෙ තත්ථ තත්ථෙව විපස්සන්තො යාව ආකිඤ්චඤ්ඤායතනං ගන්ත්වා තතොපරං අධිට්ඨෙය්‍යාදිකං පුබ්බකිච්චං කත්වා නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමාපජ්ජති.

| ප්‍රශ්න | උත්තර |
|---|---|
| 90 නිරොධසමාපත්තියට සමවදිනු කැමැත්තහු විසින් කවර සමාපත්ති යක පටන් කුමණ සමාපත්තියකට සමවදී ද? | නිරොධ සමාපත්තියට සමවදිනු කැමැති ආර්‍ය්‍ය පුද්ගල තෙමේ පිළිවෙළින් ප්‍රථමධ්‍යානාදි වූ (රූපාරූප) මහද්ගත සමාපත්තින්ට සමවැද එයින් නැගී ඒ ධ්‍යානයෙහි ඇතුළත් (චිත්තචෛතසික සඞ්ඛ්‍යාත වූ) සංස්කාර ධර්‍මයන් ඒ සමවතින් නැගී කෙණෙහි (ලක්‍ෂණ ත්‍රයට ආරොපනය කොට අනිත්‍යාදි වශයෙන්) විදර්‍ශනා කරන්නේ එයින් මතු අධිෂ්ඨාන කටයුතු ආදි වූ (චතුර්විධ) පූර්‍ව කෘත්‍ය කොට *නෙවසඤ්ඤානාසඤ්ඤායතන ධ්‍යාන සමාපත්තියට සමවදී. |

ආකාසානඤ්චායතන සමාපත්ති

කසිණුග්ඝාටිමාකාසමාලම්බති

| | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ල | ජේ | ම | ප | උ | නු | ගො | ආ | ආ | ආ | ආ | ආ | ආ | ආ | භ | භ | භ |
| ɯ | ɯ | ɯ | ɯ | ɯ | ɯ | ɯ | ɯ | ɯ | ɯ | ɯ | ɯ | ɯ | ɯ | ɯ | ɯ | ɯ |

මෙයින් නැගී සංස්කාර ධර්මයන් විදර්ශනා කෙරේ.

විඤ්ඤාණඤ්චායතන සමාපත්ති

ආකාසානඤ්චායතන චිත්තමාලම්බති

| | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ල | ජේ | ම | ප | උ | නු | ගො | ඤ | ඤ | ඤ | ඤ | ඤ | ඤ | ඤ | භ | භ | භ |
| ɯ | ɯ | ɯ | ɯ | ɯ | ɯ | ɯ | ɯ | ɯ | ɯ | ɯ | ɯ | ɯ | ɯ | ɯ | ɯ | ɯ |

මෙයින් නැගී සංස්කාර ධර්මයන් විදර්ශනා කෙරේ.

ආකිඤ්චඤ්ඤායතන සමාපත්ති

නත්ථිභාව සඞ්ඛාත පඤ්ඤත්ති නිමිත්තමාලම්බති

| | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ල | ජේ | ම | ප | උ | නු | ගො | කි | කි | කි | කි | කි | කි | කි | භ | භ | භ |
| ɯ | ɯ | ɯ | ɯ | ɯ | ɯ | ɯ | ɯ | ɯ | ɯ | ɯ | ɯ | ɯ | ɯ | ɯ | ɯ | ɯ |

මෙයින් නැගී සංස්කාර ධර්මයන් විදර්ශනා කෙරේ.

අධිට්ඨානං

චතුබ්බිධ පුබ්බ කිච්චං පරිත්තාරම්මණමාලම්බති

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ල | ජේ | ම | ඕ | ඕ | ඕ | ඕ | ඕ | ඕ | ඕ | ඕ | භ | භ | භ | භ | භ |
| ɯ | ɯ | ɯ | ɯ | ɯ | ɯ | ɯ | ɯ | ɯ | ɯ | ɯ | ɯ | ɯ | ɯ | ɯ | ɯ |

[අනික් පිට බලනු.]

*චීවර පරිෂ්කාර නිවාසාදීන් නො නස්නා පරිද්දෙන් ඉටීමද බුද්ධ සංඝ ආමන්ත්‍රණයට පෙරටුව නැගෙමි යන අධිෂ්ඨාන දවසද ආයුප්‍රමාණය බැලීමද යන මේ චතුර්විධ අධිෂ්ඨාන යි.

තස්ස ද්විත්තං අප්පනාජවනානං පරතො වොච්ඡිජ්ජති චිත්ත සන්තති තතො නිරොධ සමාපන්නො නාම හොති, වුට්ඨාන කාලෙ පන අනාගාමිනො අනාගාමි ඵලචිත්තං අරහතො අරහත්ත ඵලචිත්තං එකවාරමෙව පවත්තිත්වා භවඞ්ගපාතො හොති.

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 91 | කුමන චිත්තයකින් මතොහි චිත්ත සන්තතිය සිඳී නිරොධයට සමවැදුනා නම් වේ ද? | නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට සම වැදුනහුගේ චතුර්ථාරූප්‍යයයි කියන ලද අර්පණාජවන් සිත් දෙදෙනකු ගේ ඉපදීමෙන් මත්තෙහි චිත්ත සන්තතිය සිඳේ; ඉක්බිති නිරොධ සමාපත්තියට සමවැදුනේ නම් වේ. |
| 92 | නිරොධයෙන් නැගි කල්හි කවර සිතක් පැවත භවාඞ්ගපාතය වේ ද? | නිරොධයෙන් නැගි කල්හි අනාගාමි හට අනාගාමි ඵලචිත්තයද රහත්හට අර්හත්ඵල චිත්තයද (නිවන් අරමුණු කොට) එක් වරක් ම පැවැත භවාඞ්ගපාතය වේ. |

නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්ති

| | [ආකිඤ්චඤ්ඤායතනමාලම්බති] | නිරොධ [නිබ්බානමාලම්බති] | | |
|---|---|---|---|---|
| ල ජේ | ම ප උ නු ගො නෙ නෙ | නි නි නි නි නි | අ | භ භ |
| ııı ııı | ııı ııı ııı ııı ııı ııı ııı | ııı ııı ııı ııı ııı | ııı | ııı ııı |

මෙයින් නැගි චිත්ත චෛතසික ධර්මයන් ප්‍රත්‍යවෙක්ෂා කෙරේ.

අයං නිරොධසමාපත්ති සමාපජ්ජනාකාරො.

චුති ප්‍රතිසන්ධි වීථිබිම්බාකාරය ද මෙහි සැකෙවින් දක්වම්හ. චු=චුති චිත්තය, ටි=පටිසන්ධි චිත්තය, ලො=භවනිකන්ති ලොභමූල චිත්තය.

මරණාසන්න චක්ඛුද්වාර වීථි

අතීතපටිසන්ධිග්ගහිත කම්මාදිමාරම්මණමාලම්බති

| | [පච්චුප්පන්නාරම්මණමාලම්බති] | | [පච්චුප්පන්නාරම්මණමාලම්බති] |
|---|---|---|---|
| ල ජෙ | ප ච සං ණ වො ජ ජ ජ ජ ජ ද ද | භ චු | ටි භ භ භ භ භ |
| ııı ııı | ııı ııı ııı ııı ııı ııı ııı ııı ııı ııı ııı ııı | ııı ııı | ııı ııı ııı ııı ııı ııı |

භවනිකන්ති ලොභ මූලජවනං

| | [සහ පටිසන්ධි නාම රූපානි මාලම්බති] | [පටිසන්ධි ගොචරානි] |
|---|---|---|
| ල ජෙ | ම ලො ලො ලො ලො ලො ලො ලො | භ භ භ භ භ භ භ |
| ııı ııı | ııı ııı ııı ııı ııı ııı ııı ııı | ııı ııı ııı ııı ııı ııı ııı |

චක්ෂුර්ද්වාරවීථියෙහි පඤ්චද්වාරාවර්ජන තදාරම්මණයන්ගෙන් පෙර පසු භවාඞ්ගද චුතිචිත්තයද ප්‍රතිසන්ධියට විෂය වූ කර්ම කර්ම නිමිත්ත ගතිනිමිත්තයන්ගෙන් එක්තරා අරමුණක් අරමුණු කෙරේ. පඤ්ච ද්වාරාවර්ජනය පටන් තදාරම්මණය කෙලවර කොට ඇති

[අනික් පිට බලනු.]

තතොපරං පච්චවෙක්ඛණ ඤාණං පවත්තති, අයමෙත්ථ සමාපත්ති භෙදො.

නිට්ඨිතොච සමථ කම්මට්ඨාන නයො.

---

භාවෙතබ්බං පනිච්චෙවං භාවනා ද්වය මුත්තමං
පටිපත්ති රසස්සාදං පත්ථයන්තෙන සාසනෙ.

---

| | ප්‍රශ්න | උත්තර |
|---|---|---|
| 93 | නිරොධයෙන් නැගි ඉක්බිති කුමන ඥාණයක් පවතී ද? | නිරොධයෙන් නැග භවාඞ්ගපාතයෙන් ඉක්බිති නෙවසඤ්ඤානාසඤ්ඤායතන විපාකයෙහි චිත්ත චෛතසික ධර්මයන් ආවර්ජනා කිරීම් වශයෙන් ප්‍රත්‍යවෙක්ෂා ඥානය පවතී. |
| 94 | ප්‍රතිපත්ති රසාස්වාදය විඳිනු කැමැත්තහු විසින් කුමක් වැඩිය යුතු ද? | බුද්ධ ශාසනයෙහි ධ්‍යානඵලසුඛාදි භෙද සමථවිදර්ශනා ප්‍රතිපත්ති රසාශ්වාදය ප්‍රාර්ථනාකරන්නහු විසින් උක්තප්‍රකාරයෙන් සමථ විදර්ශනා සඞ්ඛ්‍යාත වූ උතුම් භාවනාද්වය වැඩිය යුතු. |

---

වීථි සිත් වනාහි ඇයින් ගන්නාලද කර්මනිමිත්ත සඞ්ඛ්‍යාත ප්‍රත්‍යුත්පන්නවූ රූපාරම්මණය ආලම්බනය කෙරේ. ප්‍රතිසන්ධි චිත්තයද සොළොස් භවාඞ්ග සිත්හුද යන මොහු චක්ෂුර්ද්වාර මරණාසන්න ජවනයන් විසින් ගන්නාලද රූපාරම්මණයද මනොද්වාරාවර්ජන භවනිකන්ති වශයෙන් ප්‍රවෘත්තවූ ලොභමූල ජවනය සවනිය ප්‍රතිසන්ධි නාමස්කන්ධය කර්මජරූපය යන මොවුන් ආලම්බනය කෙරෙති. ශ්‍රොත්‍රද්වාරාදි මරණාසන්නවීථිද මෙම ක්‍රමයයි. ශබ්දාදි අරමුණු පමණක් වෙනසි. මරණාසන්න මනොද්වාර වීථියද මෙහි දක්වනු ලැබේ.

මරණාසන්න මනොද්වාරවීථි

අතීත පටිසන්ධියා ගහිත කම්මාදි මාරම්මණමාලම්බති

[කම්මාදිමාරම්මණමාලම්බති][කම්මාදිමාරම්මණමාලම්බති]

| | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ලං | ජේ | ම | ජ | ජ | ජ | ජ | ජ | ද | ද | භ | චු | පි | භ | භ | භ | භ |
| ⊙ | ⊙ | ⊙ | ⊙ | ⊙ | ⊙ | ⊙ | ⊙ | ⊙ | ⊙ | ⊙ | ⊙ | ⊙ | ⊙ | ⊙ | ⊙ | ⊙ |

භවනිකන්ති ලොභමූල ජවනං

[සභපටිසන්ධි නාමරූපානිමාලම්බති][පටිසන්ධි ගොචරානි]

| | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ලං | ජේ | ම | ලො | ලො | ලො | ලො | ලො | ලො | ලො | භ | භ | භ | භ | භ |
| ⊙ | ⊙ | ⊙ | ⊙ | ⊙ | ⊙ | ⊙ | ⊙ | ⊙ | ⊙ | ⊙ | ⊙ | ⊙ | ⊙ | ⊙ |

ඉති අභිධම්මත්ථසඞ්ගහෙ කම්මට්ඨාන සඞ්ගහ විභාගො නාම

## නවමො පරිච්ඡෙදො.

චාරිත්තසොභිත විසාල කුලොදයෙන
සද්ධාභිවුද්ධ පරිසුද්ධ ගුණොදයෙන
නම්බව්හයෙන පණිධාය පරානුකම්පං
යම්පත්ථිතං පකරණං පරිනිට්ඨිතං තං

පුඤ්ඤෙන තෙන විපුලෙන තු මූලසොමං
ධඤ්ඤාධිවාසමුදිතොදිතමායුගන්තං
පඤ්ඤාවදාත ගුණසොභිත ලජ්ජිභික්ඛූ
මඤ්ඤන්තු පුඤ්ඤවිභවොදය මඞ්ගලාය

ඉති අනුරුද්ධාචරියෙන විරචිතො අභිධම්මත්ථ සඞ්ගහො සමත්තො.

## නවවන පරිච්ඡේදය නිමියේ යි.

---

සිද්ධිරස්තු